

# සුජනප්පමෝදනී

## නම් වූ

## විනය ගාථා' ත් ව්‍යාඛ්‍යාව.

# සුජනප්පමොදනී

නම් වූ

## විනය ගාථා'ර්ථ ව්‍යාඛ්‍යාව.

සත් කීර්තිමත්

**සූ. බි උනම්බුවේ කොත්මලේ රටේ මැතිඳුන්ගේ**

සමාරාධනයෙන්

**කොත්මලේ ඥානෝදය පාරිවෙණික**

## වටද්දර මෙධානන්ද

**ස්වාමීන් වහන්සේ විසින් ව්‍යාඛ්‍යාත යි.**

**ඥානොදය පරිවෙණාධිපති පූජ්‍ය පණ්ඩිත ධර්මකීර්ති**

**ශ්‍රී ධර්මානන්දා'භිධාන ස්ථවිර පාදයන් වහන්සේ**

**විසින්**

අවසාන ශුද්ධපත්‍රා'වලොකනයෙන්

ප්‍රතිගෘහීත යි.

වටද්දර

**කේ. ඇම්. ජී. කිරිබණ්ඩාර මහතා**

විසින්

සීමා සහිත සිලොන් ස්ටේෂනර්ස් යන්ත්‍රාලයේ මුද්‍රාපිත යි

**2472.**

**1929.**

# SUJANAPPAMODANI

- OR -

# COMMENTARY OF VINAYAGATHA

COMPOSED

BY

WATADDARA MEDHANANDA

GNANODAYA PIRIVENA

at the Request of U. B. UNAMBOOWA

R. M. KOTMALE.

---

APPROVED

BY

**Dharmakirti Sri Dhammananda Pandit**

PRINCIPAL OF

GNANODAYA PIRIVENA

**KOTMALE.**

---

Published by K. M. G. KIRIBANDARA

**WATADDARA**

AT THE

CEYLON STATIONERS LTD., COLOMBO.

2472

1929

# සමර්පණය.

---

සුජනප්පමොදනී

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

---

මහනුවර

**ශ්‍රී භයගිරි විජය සුන්දරාරාම**

විහාරවංශාධිපති අතිගරු

**ගුන්නැපාන ධම්මසිද්ධි ශ්‍රී සරණංකරාභිධාන**

ස්‍යාමෝපාලි මහානිකායේ මහානායක මහා ස්වාමීන්ද්‍ර
ප්‍රමුඛ ගරුතර මහා සංඝසභාව වෙත

**සවිය අධිශීල ශික්ෂා සම්ප්‍රාප්තිය**

නිමිති කොට ග්‍රන්ථ කර්තෘන් විසින් සාතිශය
ගෞරව ප්‍රණති පූර්වකව මේ ග්‍රන්ථය
**සමර්පිතයි**

# සූචි පත්‍රය.


පට

| | | |
|---|---|---|
| 1 | 3 | පාරාජික පාළි ගාථාවලී |
| | 5 | පාචිත්තිය පාළි ගාථාවලී |
| 6 | 31 | මහාවග්ග පාළි ගාථාවලී |
| 32 | 42 | චුල්ලවග්ග පාළි ගාථාවලී |
| 43 | 176 | පරිවාර පාළි ගාථාවලී |


## පරිවාර පාළි.


| | | |
|---|---|---|
| 43 | 84 | සමුට්ඨාන සීස සංඛෙප ගාථාවලී |
| 83 | 87 | ආපත්ති සමුට්ඨාන ගාථාවලී |
| 87 | 109 | ගාථා සඞ්ගණික ගාථාවලී |
| 109 | 114 | අපර ගාථා සඞ්ගණික ගාථාවලී |
| 115 | 119 | චොදනා කාණ්ඩ ගාථාවලී |
| 120 | 122 | චූළ සඞ්ගාම ගාථාවලී |
| 122 | 122 | මහා සඞ්ගාම ගාථාවලී |
| 123 | 126 | කඨිනභෙද ගාථාවලී |
| 126 | 157 | දුතිය ගාථාසඞ්ගණික ගාථාවලී |
| 158 | 176 | සෙදමොචක ගාථාවලී |

උපග්‍රන්ථය.

# ශුද්ධි පත්‍රය.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 20 | 24 | නැවත කිරීමක් | නැවත රැස් කිරීමක් |
| 24 | 8 | බබලන්නවුන් අතුරෙන් | බබලන්නවුන්ට |
| ,, | 13 | යුක්තවූවාහු | යුක්තවූවාවූ |
| 25 | 18 | කියන්නාවූ | කියන්නාහු |
| 28 | 15 | ර්වඥයන් | සර්වඥයන් |
| 29 | 20 | කියුයුතු | කියයුතු |
| 30 | 23 | වසතුන්හි | වස්තුන්හි |
| 37 | 18 | පොෂ්‍ය න්නාවූ | ජාලික වූ නොහොත් පොෂ්‍යවන්නාවූ |
| 37 | 26 | බුද්ධානුසාසනං | බුධානුසාසනං |
| 41 | 26 | නති වසසති | නාතිවසසති |
| 50 | 26 | වෙසෙමිත් | වෙසෙමින් |
| 51 | 1 | රහොගෙවව | රහොගෙවච |
| ,, | 10 | නිසජ්ජන ශික්ෂාපදය ද | නිසජ්ජන ශික්ෂාපද වයයද |
| 52 | 14 | සත් සැත්තෑවක් | ස ඈත්තෑවක් |
| ,, | 16 | පඪමං | පඨමං |
| 53 | 8 | වොදනකල | වොදනාකල |
| ,, | 14 | මගමක් | මාගමක් |
| 93 | 23 | දෙතිසකි | වත්තිංස, දෙතිසකි |
| 101 | 24 | ආවාවූ... | පඤ්චසත්තති, පන්සැත් තෑවකි |
| 106 | 18 | භික්ෂුණියක් | භික්ෂුණියක් |
| 116 | 12 | කිමත්ථායං | කිමත්ථාය |
| 137 | 26 | අවදන්නේද | අවදනේද |
| 143 | 19 | උක්ෂෙපණිය | උත්ක්ෂෙපණිය |
| 163 | 14 | ඔඝියන ඔගියන | ඔඝියන |
| 163 | 17 | එකෙකී පක්ෂයෙන් | එකෙකී පක්ෂයෙන් එකවර |
| 168 | 28 | අෂ්ට සම්මුඛ කම්යන් | අෂ්ටාසම්මුඛ කම්මයන් |
| 169 | 25 | උභතොබ්‍යඤ්ජන කෙසී | උභතොබ්‍යඤ්ජන කාංසී |

# ප්‍ර ස්තා ව නා.

විශ්ව විනේය සත්ව සන්තානගත ක්ලේශාන්ධකාර දූරීකරණයෙහි සාරද මාර්තණ්ඩ මණ්ඩලායමාන සකලඥෙය මණ්ඩල ව්‍යාපන අප්‍රතිහත ප්‍රඥා ගති ඇති පරම කාරුණික ශ්‍රී ශාක්‍යසිංහ ජිනවර විපශ්‍යෝත්තම සර්වඥයන්වහන්සේ විසින් සකල සත්ත්ව වර්ගයා කෙරෙහි පතළ මහත් කුළුණෙන් උභය ලෝකාර්ථ සිද්ධිය උදෙසා සුදේශිත ශාසන සද්ධර්මය සූත්‍රාභිධර්ම විනය වශයෙන් ත්‍රිභේද වූයේ, නිකාය වශයෙන් පඤ්චවිධ වෙයි. සූත්‍ර ගෙය්‍යාදි අඞ්ග විසින් නවවැදෑරුම් වූයේ, ස්කන්ධ වශයෙන් අසූසාර දහසකි. මෙසේ සද්ධර්මය ප්‍රමාණ වශයෙන් අපරිමිත වූයේ නමුත් සර්වසංග්‍රාහ වශයෙන් ධර්ම විනය යයි ද්විවිධ වන්නේය. i ප්‍රඥප්ති විනිර්මුක්තවූ දේශනා තොමෝ ධර්මයයි ප්‍රකාශිත යි. ii භික්ෂු භික්ෂුණීන්ගේ කායවාග්ව්‍යතික්‍රම සංඛ්‍යාත සාවද්‍යයෙහි දසවිධ ආනිසංසයන් අනුස්මරණයෙන් සඞ්ඝයාගේ පරිහරණය පිණිස දේශනා කරනලද ප්‍රඥප්ති පද්ධතිය විනය නම් වේ.

"විනෙන්ති සත්තෙන එතෙනවාති විනයො, කායවාචානං විනයනතො පි විනයො" යනු තත්වාර්ථ ප්‍රකාශක වචන හෙයින් සත්ත්වයන් මෙහි හෝ මෙයින් විනයනය (හික්මවීම) කරණ හෙයින් හෝ කාය වාක් ද්වාරයන් හික්මවන හෙයින් හෝ විනය නම්. අතිවිස්තාරාර්ථයන් විනයාර්ථෝද්ධාරය කරන්නාහු;—

"විවිධ විසෙස නයත්තා
විනයනතො චෙව කාය වාචානං
විනයත්ථ විදූහි අයං
විනයො විනයො ති අක්ඛාතො" යි කීහ.

පඤ්චවිධ ප්‍රාතිමොක්ෂෝද්දෙශ සප්තාපත්ති ස්කන්ධ මාතෘකා පද භාජනාදී විවිධ ක්‍රමයෝය, වස්තු-පුද්ගල-අනුප්‍රඥප්ති ආදී විශෙෂ ක්‍රමයෝය, යන මොවුහු සඞ්ගෘහිත හෙයින් ද ප්‍රඥප්ති ව්‍යතික්‍රම නොකොට ත්‍රිවිධ ගෞරවයෙන් යුක්තව ශ්‍රද්ධාවෙන් රක්නාහුගේ කය වචන හික්මවන හෙයින් මේ ප්‍රවචන පද්ධතිය" විනය-විනය යයි මෙසේ ප්‍රකාශිතය" යනු මෙහි භාවය යි.

## ii විනයාභිධාන.

තථාගතයන් වහන්සේගේ පරම කාරුණික භාවය සුප්‍රකට වන විනය වනාහි ආඥාරහවූ සර්වඥයන්වහන්සේ විසින් ආඥාබාහුල්‍යයෙන් දේශිත හෙයින් "ආඥාදේශනා" යයි ද ප්‍රචුරපරඛ

ඇති සත්ත්වයෝ **යථා**පරාධව මෙහි අනුශා**ස**නය කරණ **ලද** හෙයින් **හෝ අ**නුශාසනය කරණ හෙයින් "**යථාපරාධශාසන** යයි **ද**, අධ්‍යාචාරයට ප්‍රතිවිරොධී වූ සංවරා සංවරය මෙහි කථිතනු යි" **සංවරා'සංවර කථා** ය"යි **ද** ශාසනයෙහි ප්‍රකට ය.

## iii විනය ප්‍රභේද.

සුවිසාලාර්ථ ප්‍රකාශක මේ විනය වනාහි විනයනාර්ථයෙන් එක ප්‍රභේද වුව**ද** නැවත **සංවර විනය**, **ප්‍රහාණ විනය** යයි දෙපරිදි වේ. **සංවර විනය, ප්‍රහාණ විනය, සමථ විනය,** ප්‍රඥප්ති**විනය** යි **සි**වුපරිදි හෝ වෙයි.

**i සංවර විනය** **චිත්තය** තමා අකුශලෝත්පත්තියට අනවකාශ කොට තත්තද්වාරණයන්ගෙන් සංවර කිරීම **සංවර විනය** නමි. **1 සති සංවරය** 2 **සීල සංවරය** **3 ඥාණ සංවරය** 4 **ඛ**න්ති **සංවරය**. 5, **විරිය සංවර යයි** එය පඤ්චවිධ වේ.(1)චක්ෂුරාදී ඉන්ද්‍රියයන් **ස**මෘතිමත්ව සංවර කරගැණීම **සති සංවර යයි**. '**රක්ඛ**ති **ච**ක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ **සං**වරං ආපජ්ජති" යනාදීන් එය සුප්‍රකටය. (2) ප්‍රාතිමොක්ෂාදි සිවු පිරිසිදු **සි**ල්ගුණින් යුක්ත ප්‍රයුක්තව සංවර වේ නම් ඒ **සීල සං**වරය යි.'ඉමිනා පාතිමො**ක්ඛ** සංවරෙන උපෙතො **හො**ති සමුපෙතො, යනාදී තැන එය පළ වෙයි (3) යානිසොතානි ලොකස්මිං (අජිතාති භගවා) **සති** තෙසං නිවාරණං සොතානං **සං**වරං බ්‍රෑමි පඤ්ඤායෙතෙ පිථියරෙ"යි අජිතමානව පුච්ඡාහි සුප්‍රකාශ වූයේ ඥාන **සංවර**යය. කාමාදී අකුසලයන් යොනිසොමනසිකාරයෙන් මැඩලීම යනු නාමාර්ථයි. (4)ශීතොෂ්ණාදී අන්තර විෂම ප්‍රත්‍යයයන් ඉවසමින් කායාදිය හික්මවීම **ඛන්ති සංවරය යි.** (5)කාමාදී විතර්ක වීර්‍ය්‍යයෙන් ප්‍රතිබාහණය **කිරීම වීර්‍ය්‍ය සංවර** නමි. "උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති **පජ**හති විනොදෙති,, **ය**නාදීන් ඒ සුප්‍රකාශ යි

**ii පහාණ විනය** **තදඞ්ග**, **වි**ක්ඛම්භන, **සමුච්ඡෙද**, **පටිප්පස්සද්ධි**, **නිස්සරණ ය**න **පඤ්ච** භෙදයෙන් ඒ ඒ අඞ්ගයන් කරණ කො**ට** ගෙණ කෙලෙසුන් අනුත්පාද භාවයට පැමිණවීම **ප්‍රහාණ විනය** නම් වේ. එහි (1) **තදඞ්ග ප්‍රහාණ විනය** නම්:— ප්‍රදීපාලොකය නිමිතිකොට අන්ධකාර විනමනය **මෙන් ඒ ඒ අකුසල** ධර්මයන්ට ප්‍රත්‍යනීකවූ කුසලධර්මයන් කරණ **කො**ට ගෙණ තත්තද්කු**ස**ලාඞ්ගයන්ගේ ප්‍රහාණය කිරීම **තදඞ්ග** ප්‍ර**හාණ විනය** යි. (2) දියමතුයෙහි වූ **සෙ**වෙල් පරඬලා **කලය සිසාරවා** පලවා **හැ**රීම මෙන් අපිර්ණාපචාර **භෙද** ඇති

සමාධියෙන් කාමාදි පඤ්චනීවරණ ධර්මයන් ප්‍රහාණකිරීම **විෂ්කම්භන ප්‍රහාණ** නමි. (3) **ලෝකෝත්තර** කුසලයන් අතුරෙහි සෝතාපත්ති ආදී ඒ ඒ මාර්ගාඞ්ගයන්ගෙන් වධ්‍යවූ කෙලෙසුන් මුලිනුපුටා හැරීම **සමුච්ඡෙද ප්‍රහාණ** නම් වේ. රුකක් හෙන පහර ලැබ **සමූල**යෙන් ම නැසීම මෙනි. (3) ඵලසිත් එකක් හෝ රාශියක් උපදවා ඒ ඒ කෙලෙස් වාසනාව (වැසපුරුද්ද) බිඳීමෙන් විඩා සංසිඳුවීම **පටිප්පස්සද්ධි පහාණය යි** කියනු ලැබේ. ගිනි දල්වන ලද තැන්හි උෂ්ණ ප්‍රතිඝාතය පිණිස දිය ඉසීම මෙනි. (5) ප්‍රහීණවූ සියලු සංස්කාර ඇති ශාන්ත නිර්වාණ ධාතුව **නිස්සරණ ප්‍රහාණයයි**. මෙකී දශවිධ විනය ධර්මය විෂයෙහි විනීත නොවූයේ (නොහික්මුනේ) **අවිනීතය යි** කියනු ලැබේ. විනය ධර්මයෙහි එනාහි ප්‍රකට **සමථ විනය-පඤ්ඤත්ති විනය** යන විනයවය මොවුන්ට තුඩු දී පවත්නේමය.

iii **සමථ විනය**

භික්ෂූන් අතර හටගන්නා **විවාදාධිකරණ, අනුවාදාධිකරණ, ආපත්තාධිකරණ, කිච්චාධිකරණ** යන චතුර්විධ අධිකරණයන්ගේ සමථය (සංසිඳවීම) පිණිස පණවා වදාරණ ලද **(1) සම්මුඛා විනය, (2) සතිවිනය, (3) අමූළ්හවිනය, (4) පටිඤ්ඤාතකරණ (5) යෙභුය්‍යසිකා, (6) තස්සපාපිය්‍යසිකා, (7) තිණවත්ථාරක** යන සප්ත සමථයෝ සමථ නාමයෙන් දැක්වෙති. එහි **(1) සම්මුඛා විනය නම්:-** සඞ්ඝසම්මුඛතා (සඞ්ඝයාගේ හමුවීම) ධම්මසම්මුඛතා (ආපත්තිය හමුවීම-එළඹීම) පුග්ගලසම්මුඛතා (ඇවැත් අවන් පුහුලාගේ එළඹීම) යන ත්‍රිවිධ සම්මුඛතාවයෙන් යුක්තව පැමිණි අධිකරණය සංසිඳවීම යි **(2) සති විනය නම්:-** දබ්බමල්ලපුත්තාදී සතිවෙපුල්ලප්‍රාප්ත (අධිගම ලාභයෙන් පිරිසිදු සිහිය ඇති බවට) පැමිණි ක්ෂීණාශ්‍රවයන් වහන්සේට දැහැමි සඞ්ඝයා විසින් කම් වදනින් (1) සුද්ධො හොති භික්ඛු අනාපත්තිකො (සමෘති විනය ලාභී භික්ෂුව අනාපත්තික භාවයෙන් යුත්වූයේ පිරිසිදුද) (2) අනුවදන්ති ච නං (ඒ භික්ෂුවට උපවාද කෙරේද) (3) යාචති ච (සති විනය ඉල්වා ද) (4) තස්ස සඞ්ඝො සතිවිනයං දෙති (සඞ්ඝ තෙමේ ඔහට සති විනය දේද) (5) ධම්මෙන සමග්ගෙන (දැහැමිව සමගිව දේද)යි කියනලද පසඟකින් යුක්තව ක්ෂීණාශ්‍රවයන් හැර අනිකෙකුට අධිගම ලාභී පමණකින් දිය නො හැකි සමථය වේ. සටත් පිරිසෙයින් අනාගාමිහු ද මිට අභව්‍යයෝ වෙති. **(3) අමූළ්හ විනය නම්:-** "ගග්ග" භික්ෂුව වැනි උම්මත්තකභාවයෙන් මුළාවූ භික්ෂූන්ට ත්‍රිවිධ ධාර්

ණිකයන්ගේ වශයෙන් දිය යුතු විනය යි. (4) **පාරාජික සඞ්ඝාදි සෙසාදි** ඇවැතකට පැමිණියේය යි පිළිණ දුන් කල්හි ධම්මාවවාදානුශාසනයෙන් ආයති සංවරයෙහි පිහිටුවන විනය **පටිඤ්ඤාතකරණ නම් වේ.** ජබ්බග්ගිය **භික්ෂූන්ට පිරිවෙස්** මානත් දීම මෙනි. (5) යම් කිසි අධිකරණයෙක්හි ධම්මවාදී සුවිනීත පිරිස අධික නම් දශධාර්මික සලාකගාහාපනාදියෙන් **කලහ** විවාද වනාශ නොවන පරිදි බහුතර සම්මතයෙන් **සමථය කිරීම යෙභුය්‍යසිකා නම් වේ.** (6) **‘උවාල’ භික්ෂුව** වැනි **පාපොත්සන්න** පුද්ගලයන්ට **(1)**සම්මුඛයේදී කිරීමය,(2) ප්‍රතිපාච්ඡාවෙන් **කිරීමය (3)**ප්‍රතිඥවෙන් කිරීමය**,**යන ත්‍රිවිධාඞ්ගයෙන් යුක්තව භණ්ඩනකාරක කලහ කාරක විවාදකාරක භස්සකාරක හෝ වේ ද අව්‍යක්ත ආපත්ති බහුල **බාලයෙක්** හෝ වේ **ද** අනනුලොමික ගිහි සංසග්ගයෙන් සංසෘෂ්ට හෝ වේද ශීල**,** දෘෂ්ටි**,** ආචාරයන්හි විප්‍රත්පන්න හෝ වේද බුද්ධාදි රත්නත්‍රයයෙහි අගුණ හෝ කියා නම් එබඳු පුද්ගලයාට කළ යුතු සමථය **තස්සපාපියාසිකා** නම් වේ. පාපොත්සන්න පුද්ගලයන්ට ම කටයුතු හෙයින් මෙ **නම්** විය (7) යම් අධිකරණයක් කක්ශ භාවය ව්‍යාල භාවය පිණිස පවතී නම් හෙදය පිණිස පවත්නා ඒ අධිකරණය දුර්ගන්ධවූ යමක් **තෘණපණ්ණාදියෙන් ප්‍රති**ච්ඡාදනය කිරීම මෙන් උභය පක්ෂයෙහි වූවන්ගේ ඥපනයෙන් **සං**සිඳවන සමථය **තිණවත්ථාරකය යි** ප්‍රකාශිත යි.

iv **පඤ්ඤත්තිවිනය**

පඤ්ඤත්ති විනය වනාහි **සුත්ත** සුත්තානු**ලොම ආචරියවාද අත්තනොමතියයි** සිවු පරිදි වේ. සියලු විනය පිටකයට අන්තර්ගීතවූ i **මාතිකා** ii **විභඞ්ග*** iii **ඛන්ධක** iv **පරිවාර** වශයෙන් හෙදවූ පාලි ධර්මය සූත්‍ර නම්. විභඞ්ග ඛන්ධකයන්හිවූ නිර්දෙශයන්හට උද්දෙශ මාත්‍රයවූ ප්‍රාතිමොක්ෂය **මාතිකායයි ද,** භික්ෂු භික්ෂුණී වශයෙන් හෙදවූ **පාරාජික පාචිත්තිය** යන ග්‍රන්ථවයාන්තර්ගත ශික්ෂා රාශිය **විභඞ්ගයයි ද,** චුල්ලවග්ග-**මහාවග්ග** යන්හි ආ දෙවිසි කඳුවත් **ඛන්ධක** නමින් **ද** සොළොස් පරිවාරය **පරිවාර** නමින් **ද,** ප්‍රකට වූයේය. ඔවුන් පිළිබඳ සංක්ෂෙප ප්‍රවෘත්ති මෙහි සඳ කරමු.

**මාතිකා (හෙවත්) පාතිමොක්ඛ.**

“මාතිකාති උද්දෙසො සො හි නිද්දෙස පදානං ජනනිඨානෙ ඨිතත්තා මාතා වියාති මාතිකා” මාතිකා යනු උද්දෙශයයි. ඒ වනාහි නිදාන පුග්ගල වත්ථු අඞ්ග පද භාජනීය තික පරිච්ඡ

* නිද්දෙසය”යි ද යෙති.

ආපත්ති-අනාපත්ති-අනන්තරාපත්ති සඞ්ඛ්‍යාත නිර්දෙශ පදයන්ගේ උත්පත්ති ස්ථානයෙහි සිටි හෙයින් මාතෘවක් බඳුනු යි මාතිකා නම්. මෙය භික්ෂු භික්ෂුණී වශයෙන් විභේද වූයේ පාතිමොක්ඛ නාමයෙන් බහුව්‍යාපනය.

කුශල ධර්ම විෂයයෙහි අත්‍යුත්තමය යන අර්ථයෙන් හෝ යමෙක් මේ උත්තම ශීලය අනුරක්ෂණය කෙරේ නම් ඔහු අත්තානුවාද පරානුවාදාදීන් හා සියලු වෘත්ත දුඃඛයන්ගෙන් ද මුදනු යි ප්‍රාතිමොක්ෂ නම් වේ. එය ඔවාද පාතිමොක්ඛ-ආණා පාතිමොක්ඛ වශයෙන්ද, සීල පාතිමොක්ඛ-ගන්ථ පාතිමොක්ඛ වශයෙන් ද භේද වේ. (1) දීර්ඝායුෂ්ක සම්බුද්ධයන් වහන්සේගේ ශාසන පර්‍යන්තය දක්වා ද, අල්පායුෂ්ක බුදුවරයින්ගේ ශික්ෂා ප්‍රඥප්තිය දක්වා හෙවත් ප්‍රථම බෝධියෙහි ද උදෙසනු ලබන්නේ ඔවාද පාමොක්ඛය යි. ඒ වනාහි,

1. "ඛන්තී පරමං තපො තිතික්ඛා
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා
නහි පබ්බජිතො පරූපඝාතී
සමණො හොති පරං විහෙඨයන්තො

2. සබ්බපාපස්ස අකරණං—කුසලස්ස උපසම්පදා.
සචිත්තපරියොදපනං—එතං බුද්ධාන සාසනං.

3. අනූපවාදො අනූපඝාතො – පාතිමොක්ඛෙ ච සංවරො,
මත්තඤ්ඤුතා ච භත්තස්මිං—පන්තඤ්ච සයනාසනං.
අධිචිත්තෙ ච ආයොගො—එතං බුද්ධාන සාසනං" යන

ගාථාත්‍රයයෙන් ප්‍රමිතවූ සියලු බුදුවරුන් විසින් පමණක් උදෙසනු ලබන්නකි. බුද්ධ ශ්‍රාවකයෝ මෙය නො උදෙසත්. (2) භික්ෂු භික්ෂුණීන්ගේ සදොෂ වූ කායවාක් සමාචාරයෙහි දශවිධ වූ අනුසස් සලකා ශ්‍රාවකයන්ගේ සාධු සමාචාරය පිණිස අල්පායුෂ්ක බුද්ධ ශාසනයන්හි පවත්නා "මෙ නම් දොෂයෙහි මෙනම් ඇවැතය"යි නියමිතවූ ආපත්ති විධි ඇති භික්ෂු භික්ෂුණීන් විසින් අඩ මාසයක් පාසා උදෙසිය යුතු ශ්‍රාවක ශ්‍රාවිකාවන්හට පමණක් සාධාරණ වූ ප්‍රාතිමොක්ෂය ආණාපාතිමොක්ඛ නම් වේ.

2—(1) ආදිමෙතං මුඛමෙතං පමුඛමෙතං කුසලානං ධම්මානං තෙන වුච්චති පාතිමොක්ඛං යනාදී තන්හි ප්‍රකාශිතවූ උත්කෘෂ්ට තම ශීලය සීලපාතිමොක්ඛ නම්. (2) "උභයානි ඛො පන'ස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවි

හත්තාති"යි කියන ලද්දේ **ගන්ථපාතිමොක්ඛය** සඳහායි. භේද= භික්ෂු=භික්ෂුණී භේදයෙන් දෙපරිදි වේ. භික්ෂු ග්‍රන්ථපාතිමොක්ඛය, නිදානුද්දෙස, පාරාජිකුද්දෙස, සඞ්ඝාදිසෙසුද්දෙස, අනියතුද්දෙස විත්ථාරුද්දෙස යන උද්දෙස පසකින් හා අනියතුද්දෙසය හැර උද්දෙස සතරකින් භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය ද සමුල්ලසිත යි. එහි "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො"යනාදීන් ප්‍රකාශිත පුබ්බකරණ, පුබ්බකිච්ච, පත්තකාලයන් පිළිබඳ විභාග ඇතුළත් නිර්දේශය නිදානුද්දෙසය යි ද, මෙථුන, අදින්නාදාන, මනුස්සවිග්ගහ, උත්තරිමනුස්සධම්ම යන සතර පාරාජිකයන් ඇතුළත් කාණ්ඩය පාරාජිකුද්දෙසය යි ද, සුක්කවිසට්ඨි ආදී තෙළෙස් සඟවශෙස් සඞ්ගෘහිත පරිච්ඡේදය සඞ්ඝාදිසෙසුද්දෙසය යි ද, විවිධ අනියතයන් ඇතුළත් කොටස අනියතුද්දෙසය යි ද, "අවසෙසං සුත්තානසාවෙතබ්බං"යි ප්‍රකාශිත තිස් නිස්සග්ගි පචිත්තිය, දෙයානූ පචිත්තිය, පන්සැත්තෑ සෙඛියාවෝය, සතර පාටිදෙසනීයය, හා සත් අධිකරණ සමථය යන මොවුන් සඞ්ගෘහිත උද්දේශය විත්ථාරුද්දේශය යි ද කියනු ලැබේ. මෙසේ අඩ මාසයක් පාසා උදෙසියයුතු නිදාන සමථයන්ගෙන් අවධි වූ දෙසිය විස්සක් ශික්ෂාවන් අන්තර්ගතවූයේ භික්ෂු ග්‍රන්ථ ප්‍රාතිමෝක්ෂය යි. නිදානුද්දේශ සහිත වූ සාධාරණ'සාධාරණ පරිජි අටක් උදෙසූ පාරාජිකුද්දෙසය, සපත දශයක් ශික්ෂාවන්ගෙන් යුත් සඞ්ඝාදි සෙසුද්දෙසය, තිස් නිසගිය, එක්සිය සූසැටක් පචිත්තිය, අටක් ඛුද්දකයෝය, පන්සැත්තෑවක් සෙඛියාවෝය, යන මෙතෙක් දෑ උදෙසූ විත්ථාරුද්දෙසය, යන සතර උද්දෙසයන්ගෙන් ප්‍රමිත සමථයන්ගෙන් ද යුත් තුන්සිය සතරක් ශික්ෂාවන්ගෙන් සමපූර්ණවූයේ භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය යි. මෙ කී තාක් ශික්ෂාවෝ ග්‍රන්ථා'ගත හෙයින් **ගන්ථපාතිමොක්ඛ නම්** වන්නේ ය.

**විභඞ්ග**

**1 පාරාජික පාළි.**

විභඞ්ගයෙහි ප්‍රථම ග්‍රන්ථය වූ **පාරාජික පාළිය** භික්ෂු විභඞ්ගයෙන් ශොභමාන වේ. (1) පාරාජික, (2) තෙරසක, (3) අනියත, (4) තිංසක යන මොව්හු මෙහි ආන්තර භෙදයෝ යි. එහි

**1 පාරාජික කාණ්ඩයෙහි:**—වෙරඤ්ජක බමුණා බුදුන් වෙතට එළඹීම, අරසරූපාදි කරුණින් බුදුනට නිග්‍රහ කිරීම හා ඊට තථාගතයන් වහන්සේගේ පිළිතුරු, වෙරඤ්ජා නුවර මහා දුර්භික්ෂය, මෞද්ගල්‍යාන යන ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ ඍද්ධිවිෂය, ශික්ෂා ප්‍රඥප්තිය පිණිස ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ ආරාධනාව, විපස්සී, සිඛී, වෙස්සභූ බුදුවරයන්ගේ සසුන් නා නා කුලික ප්‍රව

ජ්‍යාව නිසා චිරස්ථායී නොවූ පරිදි, කකුසඳ, කොණාගම, කස්සප බුදුවරයන්ගේ සසුන් චිරස්ථායීවූ පරිදී හා ඊට හේතු, සුදින්න කුලපුත්‍ර ප්‍රව්‍රජ්‍යාව, ප්‍රථම පාරාජික ශික්ෂාව පැණවීම, එහි පද භාජන වත්‍ථු ආදී විස්තර, **අදින්නාදාන මනුස්සවිග්ගහ උත්තරි මනුස්සධම්මුල්ලපන** යන තුන් පරිජ් පිළිබඳ නිදාන වත්‍ථු පුග්ගල පද භාජන, ආපත්ති, අනාපත්ති ආදිය අනුක්‍රමයෙන් වර්ණිතය.

(2.) **තෙරසකය:**—සුක්කවිස්සට්ඨි, කාය සංසග්ග, දුට්ඨුල්ලවාචා අත්තකාම පාරිචරිය, සඤ්චරිත්ත, කුටිකාරාපන, මහල්ලක විහාර කාරාපන, අමූලක පාරාජික අනුද්ධංසන, අඤ්ඤභාගිය අධිකරණ සඞ්ඝ භේදක, භේදානුවත්තක, දුබ්බච කුල දූසන යන තෙළෙස් සඟ වෙසෙස් පිළිබඳ නිදාන වත්‍ථු පුග්ගල ආපත්ති අනාපත්ති පද භාජන හා තද්දීය සුබුම ප්‍රභේදන් සවිස්තරව ප්‍රකාශ වේ (3) භික්ෂූන්ට පමණක් සාධාරණවූ ප්‍රථම විතීය'නියත ධර්මයන්ගේ විස්තර කථා අනියතයෙහි ඇතුළත් වේ. (4) තිංසකයෙහි චීවර වග්ග, කොසිය වග්ග, පත්ත වග්ග යන වර්ගත්‍රයයට ඇතුළත් තිංස නිස්සග්ගිය පාචිත්තිය ධර්ම පිළිබඳ පරිකථා සන්දර්ශිතය **එහි තිස් නිසගි නම්:—**

(i චීවර වග්ග) 1. අතිරෙක චීවර ධාරණ 2 විප්පවාස 3. අකාල චීවර පටිග්ගහණ 4 පුරාණ චීවරධොවාපන 5. චීවර පටිග්ගහණ 6 අඤ්ඤාතක විඤ්ඤත්ති 7 තදුත්තරි 8. ගහපති උපක්ඛට 9 උභින්නං උපක්ඛට 10. තික්ඛත්තු චොදනා යන දසය ද (ii කොසියවග්ග) 1. කොසිය මිස්සක 2. සුද්ධකාලක 3 සන්ථත කාරාපන 4 ඡබ්බස්සානි ධාරණ 5. නිසීදනසන්ථත 6. එළකලොම 7. එළකලොමධොවාපන 8 ජාතරූපරජත සාදි යන 9. රූපියසංවොහාර 10. කයවික්කය සමාපජ්ජන යන දශයද (iii පත්ත වග්ග) 1. අතිරෙක පත්තධාරණ 2. ඌනපඤ්චබන්ධන 3 භෙසජ්ජ 4. වස්සිකසාටික 5 අච්ඡින්දන 6. සුත්ත විඤ්ඤත්ති 7. චීවරවායාපන 8. අච්චෙකචීවර නික්ඛිපන 9. ජාරත්තපරම 10. අත්තනොපරිනාමන යන දසයද එක්ව සමතිසයි.

ii **පාචිත්තිය පාළි** විභඞ්ගයෙහි විතීය ග්‍රන්ථය වූ පාචිත්තිය පාළිය වනාහි භික්ෂු භික්ෂුණී විභඞ්ග වශයෙන් යුත් 1 ඛුද්දක, 2 පාටිදෙසනීය, 3 සෙඛිය, 4 අධිකරණ සමථ, 5 පාරාජික, 6 සත්තරසක, 7 නිස්සග්ගිය, 8 ඛුද්දක, 9 පාටිදෙසනීය, 10 සෙඛියා, 11 අධිකරණ සමථ

යන් එකෝලොස් කාණ්ඩයන්ගෙන්ද සමුපලක්ෂිතයි. එහි ප්‍රථම චතුෂ්කය භික්ෂු විභඞ්ගයෙහි ද සෙස්සෝ භික්ෂුණී විභඞ්ගයෙහි ද උපයුක්ත වෙත්.

i **භික්ෂුවිභඞ්ගය;**—( ඛුද්දකයෙහි ) 1. මුසාවාද 2 භූතගාම 3. භික්ඛුණොවාද 4 භොජන 5. අචෙලක 6. සුරාපාන 7 සප්පාණක 8. රාජ යන දශය දශය බැගින් ශික්ෂාපදාන්තර්ගත වර්ග අටය, ශික්ෂා දොළොසක් ඇති සහධම්මික වර්ගය යන නව වර්ගයකින් යුත් දෙයානූවක් සිකපදයන්ගේ නිදානාදී තොරතුරු ඛුද්දකයෙහි නිදර්ශිතය. **2 පාටිදෙසනීය:**—1. ඇතුළුගෙට පිවිසි නො නෑ මෙහෙණක අතින් ඛාදනීය ය ( කෑයුතු දෙය ) ක් හෝ භොජනීය ය ( බුදිය යුතු දෙය ) ක් සියතින් පිළිගෙණ වළඳීම 2. කුලයෙහි වළඳන තැන විධානයෙහි යෙදුන මෙහෙන පහ නොකිරීම 3 සෙඛසම්මත කුලයෙහිදී පිඬු සියතින් ගෙණ වැළඳීම 4. ආරණ්‍යක සෙනාසනයෙහි නොදන්වා එළවූ පිඬු සියතින් ගෙණ වැළඳීම යන සතර ප්‍රාතිදෙශනීය යන් පිළිබඳ විභාග මෙහි ඇතුළත් වෙති

**5 සෙඛියා:**— 1 පරිමණ්ඩල වග්ග 2 උජ්ජග්ඝික වග්ග 3. ඛම්භකත වග්ග 4 සක්කච්ච වග්ග 5. කබළ වග්ග 6 සුරු සුරු කාරක වග්ග යන වර්ගයක් පාසා දශය බැගින් ශික්ෂා ඇති ශික්ෂා හැටෙහි ද ශික්ෂා පසළොසක් ඇති පාදුකා වර්ගයෙහි වූ ශික්ෂාවෙහි ද යන පන් සැත්තෑවක් ශෛක්ෂ ධර්මයන් සම්බන්ධ වූ නිදානාදිය ප්‍රකාශ වේ ආභිසමාචාරිකවත් ප්‍රධාන වශයෙන් සෙඛියාවන්හි අන්තර්ගත යි.

**4 අධිකරණ සමථ:**— සම්මුඛා විනය, සති විනය, අමූළ්හ විනය, පටිඤ්ඤාත කරණ, යෙභුය්‍යසිකා, තස්සපාපිය්‍යසිකා, තිණවත්ථාරක යන සප්ත සමථයන්ගේ උද්දේශ මාත්‍රය මෙහි ප්‍රාශිතයි.

ii **භික්ෂුණී විභඞ්ගය** ( පාරාජිකයෙහි ) 1 උබ්භජානු මණ්ඩල 2 වජ්ජපටිච්ඡාදක 3 උක්ඛිත්තානුවත්තක 4 අට්ඨවත්ථුක යන භික්ෂුණී සාධාරණ සතර පරිජි භෙද විභාගය සඳහන් වේ. පූර්වෝක්ත මෛථුන ධර්මාදී සතරත් සමග මෙසේ භික්ෂුණීන් විෂයෙහි පරිජි අටක් ලැබෙන්නේය. ( 2 සත්ත දසකයෙහි ) 1 උස්සයවාදිකා විහාර 2 වුට්ඨාපන 3 ගාමන්තර ගමන 4 ඔසාරණ 5 අවස්සුත 6 උය්‍යොජන 7 පච්චක්ඛා 8 අධිකරණ 9 සංසට්ඨ විහාර 10 දුතිය සංසට්ඨ විහාර යන දස සඞ්ඝාදි සෙසයන්ගේ විස්තර කථා ඇතුළත් වෙති.

භික්ෂු විභඞ්ගයෙහි කියන ලද සඤ්චරිත්ත, දුට්ඨ දොසවය, සඞ්ඝ භෙද, භෙදානුවත්තක, දුබ්බච, කුලදූසක යන සතත් සහි තව සපත දශ (17) සඞ්ඛ්‍යාව ලැබේ. (**3 නිස්සග්ගිය**) 1 පත්ත සන්නිචය 2 අකාල චීවර භාජාපන 3 චීවර පරිවත්තන 4 අඤ්ඤ විඤ්ඤාපන 5 අඤ්ඤ චෙතාපන 6 අඤ්ඤ දත්තික 7 සඞ්ඝික සඤ්ඤාචික 8 මහාජනික 9 සඤ්ඤාචික 10 පුග්ගලික 11 ගරුපාපුරණ 12 ලහුපාපුරණ යන දොළොස් නිසගි සහිතව ප්‍රකාශ වේ. නිඨිත චීවර විප්පවාස, අකාල චීවර, චීවර විඤ්ඤාපන, උත්තරි සාදියන, උපක්ඛට, පච්චෙක චීවර චෙතාපන, රජ ජාතරූප සාදියන, රූපියසංවොහාර, කයවික්කය සමාපජ්ජන, නවපත්තචෙතාපන, භෙසජ්ජ, චීවර අච්ඡාදන, චීවරවායාපන, චීවර විකප්ප, අච්චෙක චීවර, අත්තනො පරිනාමන යන අටළොසින් නිසගි තිස පිරෙන්නේය.

(**4 ඛුද්දකය**) 1 ලසුණ වග්ග 2 අන්ධකාර වග්ග 3 නග්ග වග්ග තුවට්ට වග්ග 5 චිත්තාගාර වග්ග 6 ආරාම වග්ග 7 ගබ්භිනී වග්ග යන සම දසය බැගින් සිකපද ඇති වර්ග සතෙහි සම සැත්තෑවක් හා 8 කුමාරීභූත වග්ග 9 ඡත්තුපාහන වග්ග යන වර්ග වලෙහි සිකපද තෙවිස්සක් ද යන සයානූවක් ඛුද්දක ශික්ෂාවන් නිදානාපත්ති ආදී විස්තරත් සහිතව ප්‍රකාශ වේ. "ඡසට්ඨිසතා පාචිත්තියා"යි පෙළේ ප්‍රකාශවූයේ මේ සයානූව සහිත භික්ෂු විභඞ්ගයෙහි කී භික්ෂුණී සාධාරණ ශික්ෂා සම සැත්තෑවත් සංකලනයෙනි. (**5 පාටිදෙසනීය**) නොගිලන්ව සිට– 1 ගිතෙල් 2 තෙල් 3 මී 4 පැණි 5 මච්ඡ 6 මංස 7 ඛීර 8 දධි යන මොවුන් විනවා වැළඳීමෙන් වන ප්‍රති දෙශනීයයන් පිළිබඳ විස්තර සන්දර්ශිත යි. (**6 සෙඛියා**) භික්ෂුණීන් වහන්සේ විසින් පිළිපැදිය යුතු සෙඛියා ධර්ම රාශියක් සඞ්ඛ්‍යා විභාග රහිතව ප්‍රඥප්ති ආදියෙන් විඥාපිතයි. (**7 අධිකරණ සමථය**) පූර්වොක්ත සප්තාධිකරණයන්ගේ නාම මාත්‍රය සඳහන් වේ. මෙසේ විභඞ්ගවූයේ විභඞ්ගය යි දත යුතුයි.

**iii ඛන්ධක.**

**i මහාවග්ග පාළි.**

ඛන්ධකයෙහි **මහා වග්ග පාළිය** ආදිම ග්‍රන්ථය වේ. ඒ වනාහි 1 මහා ඛන්ධක 2 උපොසථක්ඛන්ධක 3 වස්සූපනායික ක්ඛන්ධක 4 පවාරණක්ඛන්ධක 5 චම්ම ක්ඛන්ධක 6 භෙසජ්ජක්ඛන්ධක 7 කඨිනක්ඛන්ධක 8 චීවරක්ඛන්ධක

**9.** චම්පෙය්‍යක්ඛන්ධක 10 කොසම්බක්ඛන්ධක යන ඛන්ධක **දශය** කින් උපලක්ෂිත වේ.

එහි **1 මහා ඛන්ධකය:-** බොධිකථා, අජපාල කථා, මුචලින්ද කථා, රාජායතන කථා, බ්‍රහ්මයාචන කථා, ධර්මගම්භීර සම්මර්ශණය, ඉසිපතනාරාම ප්‍රවෙශය, ධර්මචක්‍ර සූත්‍ර දෙශනාව, පඤ්චවර්ගීය මහණුන්ගේ මාර්ගඵල ප්‍රතිවෙධය, අනත්තලක්ඛණ සූත්‍රය යනාදීන් යුත් ප්‍රථම බණවර ද, යශකුල පුත්‍ර ප්‍රව්‍රජ්‍යාව, ඔහු සතර සහායයන් පිළිබඳ කථා, මාර කථා, සරණාගමන උපසම්පදා කථා, භද්දවර්ගීය සහාය කථා යන මෙයින් යුත් දෙවැනි බණවර ද, උරුවෙලාවතරණය, තුන්බෑදුළුල් දමනය, ආදිත්ත පරියාය සූත්‍රය යන මෙයින් සඞ්ගෘහීත තෙවැනි බණවර ද, බිම්සර රජ බුදුරජුන් කරා එළඹීම, උරුවෙල් කසුප් තෙරුන්ගේ පෙළහර, වෙළුවනාරාමය පිළිගැන්වීම, පඤ්චප්‍රකාරාරාම ලක්ෂණ, දෙ අග සව්වන්ගේ මහණවීම හා මාර්ගඵල ලාභය, අනාගත සතරවන බණවර ද, උපාධ්‍යාය වත් සද්ධිවිහාරික වත් ආදියෙන් යුත් පස්වෙනි බණවර ද, ආචාර්‍ය්‍යවත් අන්තෙවාසිකවත් ඇතුළත් සවැනි බණවර ද, උපසපන් කටයුතු නොකටයුතු පුඟුලන්, සමා කටයුතු නොකටයුතු පුඟුලන්, නිශ්‍රය දියයුතු නොදිය යුතු පුඟුලන්, යන මොවුන් පිළිබඳ විභාග, අන්‍ය තීර්ථකයන් පැවිදි කිරීමේදී පිළිපැදිය යුතු විධි ආදියෙන් ශොභමාන සත්වන බණවර ද, පැවිදි කටයුත්තන්ගේ හා නොකටයුත්තන්ගේ ද, උපසපන් කටයුත්තන්ගේ හා නොකට යුත්තන්ගේ ද තොරතුරු, අනිස්සිත වාස කථාදියෙන යුත් අටවෙනි බණවර ද, කිඹුල්වත් පුරට වැඩමවීම, රාහුල කුමාර ප්‍රව්‍රජ්‍යාව, අනනුඥාතයෙන් කුල දරුවන් පැවිදි නොකිරීමේ ප්‍රඥප්තිය හා තදීය හෙතු, සාමණෙර ශික්ෂා, උපසම්පදා උක්කොටනය කටයුතු පුග්ගල විසභිචාරය ද, ප්‍රව්‍රජ්‍යා නොකොට යුත්තන් ද යන මෙතෙක් දෑ වර්ණිත නවම බණවර ද සහිත උපසම්පදා කර්ම, සතර නිශ්‍රය, සතර අකරණීයයන් ද මෙහි දක්වා ඇත්තේය. මෙහි වස්තු දෙසැත්තෑව කි.

**2. උපොසථක්ඛන්ධකය:-** අඤ්ඤතිත්ථිය චොදනා, ආපත්ති පණ්ණරසක, වග්ගාවග්ග සඤ්ඤී පණ්ණරසක, වෙමතික පණ්ණරසක, කුක්කුච්චපකතපණ්ණරසක, භෙදපුරෙක්ඛාර පණ්ණරසක යන සප්ත ආනන්තර භෙදයකින් මෙය උපශොභිතය. උපොසථ පිළිබඳ විභාග, සීමා භෙද, උපොසථයෙහි කොප්‍යාකොප්‍යභාවය යන මෙතෙක් දෙය මෙහි විස්තර වෙත්. මෙහි වස්තු සියල්ල එක තුළ අසූ යකි.

**3. වස්සූපනායිකක්ඛන්ධකය:-** වස්සාන සමයෙහි චාරිකා කිරීම ගැන භික්ෂූන්ට දෝෂාරෝපණය කිරීම, වස් විසීමට අනු දැනීම, පුරිමිකා-පච්ඡිමිකා වස්සූපනායිකා භේද, බිම්සර රජහු විසින් වස්සුක්කඩ්ඪනය කිරීම, සත්තාහකරණ [=සතිකරණ] යෙන් යා යුතු නොයා යුතු තැන් හා පුද්ගලයන් වස් විසිය යුතු නොවිසිය යුතු තැන් ද අනු ක්‍රමයෙන් සංගෘහීතයි.

**4. පවාරණක්ඛන්ධකය:—** වාග්ව්‍යවහාර රහිතව අඵාසුව වස් විසූ භික්ෂූන්ට බුදුන් විසින් නිග්‍රහ කරණු ලැබීම, පවාරණ භේදය, ගිලනුන් විසින් පැවතිය යුතු අයුරු, පවාරණාහාරක විභාග, සඞ්ඝ ගණ පුද්ගල වශයෙන් පවාරණ ක්‍රම, ධාර්මිකාධාර්මික වර්ගාවර්ග පවාරණ, ආගන්තුකයන් විසින් පැවතිය යුතු අයුරු ද මෙහි ප්‍රකාශ වේ. බණවර දෙකක් සහිත කථා සතළිසෙකින් ප්‍රමිතය.

**5 චම්මක්ඛන්ධකය:-** සෝණ කොළිවීස සිටුවරයාගේ පැවිදිවීම, ආශ්චර්යවත් වීර්යය, මධ්‍යම ප්‍රතිපදාව, අධිමුක්ත ධර්ම සය, කැප නොකැප වහන් සම්බන්ධ විභාග, සම්පරිහරණය පිළිබඳ විස්තර, පඤ්චවර්ගී උපසම්පදාව, ගණඞ්ගණූපාහන, ධුව න හා යන චම්මත්ථරණ, ගණනූපගය යන පඤ්චවරයන් ලැබීම ද, මොවුන්ගේ විස්තර කථා ද ඇතුළත් වස්තු තෙසැටකින් ප්‍රතිමණ්ඩිත වේ.

**6 භෛෂජ්‍යක්ඛන්ධකය:-** පඤ්ච භෛෂජ්‍යයන් අනු දැනීම, පිලින්දිවච්ඡ තෙරුන් වහන්සේට බිම්සර රජතුමා විසින් ආරාමිකයන් පන්සියයක් සහිත ගම්වරයක් පිදීම, බුදුරජාණන් වහන්සේගේ උදරාබාධය, කප්පිය විභාගය, සුප්පියා උපාසිකාවගේ ආශ්චර්යවත් ස්වශරීර මාංස දානය, කප්පිය අකප්පිය මාංස, තරුණප්පසන්න අමාත්‍යයාගේ මාංස දානය, සිල්වතාට ලැබෙන ආනිසංස පස, පාටලී ග්‍රාමය නිර්මාණය කිරීම, නවගෘහාභිනිවේශය පිළිබඳ බෞද්ධ චාරිත්‍ර, කොටිග්‍රාම සම්ප්‍රාප්තිය. අම්බපාලී ගණිකාවගේ දානය, සීහ සේනාපතිහට දහම් දෙසීම, මාර්ගඵල ප්‍රතිවේධය, තීර්ථකයන්ගේ දෝෂාරෝපණය, ත්‍රිකෝටික පාරිශුද්ධ මාංසය අනුදැනීම, මෙණ්ඩක සිටු පවුලෙහි තුබූ අසිරිමත් අනුභාව, ඔහු බුදුන් වෙත පැමිණ බණ ඇසීම සහ මගඵල පිළිලැබීම, කෙණිය ජටිලයාගේ දානය, කුසිනාරා නුවරට වැඩමවීම, නහාපිත පුබ්බක ශික්ෂාපදය පැණවීම, සතර මහා ප්‍රදේශාදිය ද ප්‍රකාශ වේ මෙහි බණවර සතරෙකි වස්තු එක්සිය සයකි මේ ග්‍රන්

සෙහි මෙතෙක් ප්‍රකාශ වූයේ අභිසම්බොධියෙහි පටන් පරිනිර්වාණ සමය තෙක් බුඩ චරිතය අනුක්‍රමයෙන් එක දෙශයකිනි.

**7 කඨිනක්ඛන්ධකය:-** කඨිනත්ථාර නිදාන, අට්ඨකඨිනානිසංසනුබහාර විස්තර, කඨින පළිබොධ කථාදිය දොළොස් පෙය්‍යාලයකින් හා වස්තු එක්සිය අටලොසකින් ද විස්තර කර තිබේ.

**8 චීවරක්ඛන්ධකය,-** ජීවක කොමාරභච්චයන්ගේ උත්පත්තිය, ශිල්පාභ්‍යාශය, ඔහුගේ සවිස්මයවූ වෙදකම්, බුදුරජානන් වහන් සේට කළ පුදුම විරේචනය, ගෘහපති චීවර අනුඥාතය, චීවර නිද හකයන් පිළිබඳ විභාග, පඬුගැන විස්තර, මගධ ක්ෂෙත්‍රය හා සිවුරු ගෙත්තම් කිරීමේ පිළිවෙළ, තුන් සිවුරු අනු දැනීම, විශාඛා උපාසිකාවගේ අෂ්ටවර යාචනය, මුළාසිහියෙන් නිදීමේ පඤ්ච ආදීනව, කණ්ඩුපටිච්ඡාදන, මුඛපුඤ්ඡන, චීවර අධිෂ්ඨාන විධි, ගිලානොපට්ඨායක භෙද, මළ භික්ෂූන්ගේ සිවුරු ආ පිරිකර ගිලා නොපස්ථායකයාට අයත් බව, අකප්පිය චීවර විභාග, චීවරුප්පාද මාතිකා අට යනාදිය මෙහි සමර්පිතයි. සාතිරෙක බණවර අටකින් හා වස්තු සයානුවකින් ද යුක්ත වේ

**9 චම්පෙය්‍යක්ඛන්ධකය:-** චම්පා නුවරදී කළ උත්ක්ෂෙපණීය කර්මය, පඤ්ච වර්ග, දශ වර්ග, විංශති වර්ග, අතිරෙක විංශති වර්ග කර්ම විස්තර, නිස්සාරණවය, ඔසාරණවය, චොදනා ක්‍රම හා අධිකරණ ප්‍රවෘත්ති ද අන්තර්ගතයි. වස්තු සතිසෙකි. බණවර දෙකකි.

**10 කොසම්බක්ඛන්ධකය;-** කොසඹෑ නුවර භික්ෂූන්ගේ මහා අරගලය, කලහාදීනව, කාසිරාජ කථාව, භෙදාදීනව සන්දර්ශිත ගාථා, පාරිලෙය්‍ය වනවාසයට වැඩමවීම, අෂ්ටාරස අධම්මවාදී ලක්ෂණ, සැවැත් නුවරට පෙරළා වැඩමවීම, ධාර්මිකාධාර්මික සඞ්ඝ සාමග්‍රිය හා විනිශ්චයාභීයන් ද මෙහි විස්තර වෙත්.

ii **චුල්ලවග්ග පාළි.** 1. කම්මක්ඛන්ධක 2. පාරිවාසිකක්ඛන්ධක 3. සමුච්චයක්ඛන්ධක 4. සමථක්ඛන්ධක 5. ඛුද්දකවත්ථුකක්ඛන්ධක 6. සෙනාසනක්ඛන්ධක 7. සඞ්ඝභෙදක්ඛන්ධක 8. වත්තක්ඛන්ධක 9 පාතිමොක්ඛට්ඨපනක්ඛන්ධක 10. භික්ඛුණික්ඛන්ධක 11. පඤ්චසතිකක්ඛන්ධක 12. සත්තසතිකක්ඛන්ධක යන දොළොස් ඛන්ධකයන්ගෙන් සමූප ශොභිත වූයේ චුල්ලවග්ග පාළිය වේ. සුළුවූ වර්ග මෙහි උප යුක්ත හෙයින් මෙ නම් වී.

**1 කම්මක්ඛන්ධකය:-** (1) තජ්ජනීය කම්ම, (2) නියස්ස කම්ම, (3) පබ්බාජනීය කම්ම (4) පටිසාරණීය කම්ම, (5) ආපත්තියා දස්සනෙ උක්ඛෙපනීය කම්ම, (6) ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීය කම්ම, 7 පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීය කම්ම යන සප්ත කර්මයන් නිදාන, කෘත්‍ය විධි, ප්‍රභෙද, අඞ්ග, සම්මාවත්තනයන් ද තදුපයොගි කර්ම වාක්‍යයන් ද ඇතුළත් වෙති.

**2 පාරිවාසිකක්ඛන්ධකය:-** 1 පාරිවාසික වත් 2 මූලාය පටිකස්සනාරහ වත් 3 මානත්තාරහ වත් 4 මානත්තචාරික වත් 5 අබ්භානාරහ වත් යන වත් පස පිළිබඳ නිදානාඞ්ගාදිය ද සම්මාවත්තනයන් ද විස්තර වෙත්.

**3 සමුච්චයක්ඛන්ධකය:** සුක්කවිස්සට්ඨි, පාරිවාස විසුද්ධි කථාදිය සම්බන්ධ විස්තර දීර්ඝ වශයෙන් ආපත්ත්‍යාදි නිර්දේශ මුඛයෙන් සන්දර්ශිතයි

**4 සමථක්ඛන්ධකය;-** ධම්ම වර්ගාදි කර්ම සය, දබ්බමල්ල පුත්ත ස්ථවිර චරිතය හා සෙනාසන පඤ්ඤාපක ධුරය ලැබීම, අසිරිමත් ලෙස අසුන් පැනවීමාදිය, මෙත්තිය භුම්මජකයන්ගේ චොදනාව හා තදනන්තරව සප්ත සමථයන්ගේ විස්තර නිදාන භෙද ධාර්මිකා'ධාර්මික දානවිධි ද දැක් වේ. දස සලාක ගාහාපන සප්ත සමථයන්ගේ අර්ථ ද විස්තර වේ.

**5 ඛුද්දකක්ඛන්ධකය;-** නෑම, හිසකෙහෙ කැපීම, ධර්ම දෙශනාදිය පිළිබඳ පැණවීම්, සතර නා කුල, පාත්‍රා විභාගය, කුදුසිකයන්ගේ විස්තර ද පැණේ මෙයින් භික්ෂු වෘත්තියෙහි නිතර පැවතිය යුතු සෞඛ්‍යා කරුණු දත හැක.

**6 සෙනාසනක්ඛන්ධකය,-** පඤ්චවිධ සෙනාසනයන් අනුදැනීම, එහි තොරතුරු, අනාථ පිණ්ඩික සිටුතුමාගේ ප්‍රශාදය, පදවීතිහාරානිසංස, ජේතවනාරාමය කරවීම, වෘද්ධාපසේවායෙහි ගුණ, විහාර දානානිසංස, උපාලි ස්ථවිරයන් වහන්සේගේ විනය වාචනය, අවිස්සජ්ජිය අවෙභඞ්ගිය වස්තු, කීටාගිරි ප්‍රවෙශය ද මෙහි විස්තර වේ මෙහි බණවර තුණ කි.

**7 සංඝ භෙදක්ඛන්ධකය:-** මහානාම ආදි ශාක්‍යයන්ගේ ප්‍රව්‍රජ්‍යාව, මාර්ගඵල ප්‍රතිවේධය, දෙවදත්තයන්ගේ සෘද්ධිපරිහවය, දෙව්දත්හු අජාසත් කුමරු පහදවා ගැණීම, බුදුන් මරණු පිණිස දුනුවායන් යෙදූ පරිදි, නාලාගිරි නාග දමනය, දෙවදත්තයන්ගේ පඤ්චවර යාචනය, සංඝ භෙදය, අෂ්ටවිධ දූතාඞ්ග, ආපා

යික ධම් අට හා නෛරයික ධම් තුණ, උපාලි තෙරුන් වහන්සේ සංඝ භෙදය ගැන බුදුරජානන් වහන්සේගෙන් කරුණු විචාරීම, සංඝ භෙද්‍ය දීනව හා සංඝ සාමග්‍රියෙහි අනුසස්, අපාගත වන නොවන පුගුලන්ගේ තොරතුරු ද මෙහි අන්තර්ගතයහ.

**8 වත්තක්ඛන්ධකය:**- මෙහි ආගන්තුකාදී තුදුස්වත් විස්තර වෙත්.

**9 පාතිමොක්ඛට්ඨපනක්ඛන්ධකය:**-පාමොක් දෙසීම පිණිස අනඳ මහ තෙරුන්ගේ ආරාධනාව, සාගරයෙහිහා ශාසනයෙහි අෂ්ටවිධ ආශ්චය්‍ය ධර්මයන්ගේ වශයෙන් සමානත්වය, ධාර්මිකාධාර්මික ප්‍රාතිමොක්ෂ විස්තර, අදත්තාදානාදී විෂයයෙහි මෙනෙහි කටයුතු විශෙෂ දේ, චොදක භික්ෂුව විසින් මෙනෙහි කටයුතු දේ ද ඇතුලතින්, විප්පටිසාර කථාදිය ප්‍රකාශිත බණවර දෙකකින් යුක්තය.

**10 භික්ඛුනික්ඛන්ධකය:**- මහා පජාපතී ගොතමියගේ ආයාචනය, අටඝ ගරු ධම්ම, පජාපතී ගොතමියගේ ප්‍රව්‍රජ්‍යාව හා උපසම්පදාව, භික්ෂුණීන් විසින් සංඝ කර්ම කටයුතු ක්‍රම, භික්ෂුණී ශික්ෂා ධර්ම, චතුවීසති අන්තරායික ධම්, උපසම්පදා කටයුතු විධිය, ත්‍රිවිධ නිශ්‍රය ධර්ම හා අෂ්ට අකරණීය ධම් ද ප්‍රකාශිත සි මෙය වස්තු එක්සිය සයකින් සම්පූර්ණය.

**11 පඤ්චසතිකක්ඛන්ධකය:**-මෙහි ප්‍රථම සඞ්ගායනාව විස්තර වේ.

**12 සත්තසතිකක්ඛන්ධකය:**- විතීය ධම් සඞ්ගායනා කථා ඇතුලත් වේ. මෙහි ශාසනොපක්ලෙශ ධම් සතර, දශ වස්තු, ථෙර රාසිකරණාදිය ඇතුලත් වස්තු පස් විස්සකි.

iii **පරිවාර**

i **පරිවාර පාළි**

විභඞ්ග ඛන්ධකයන්ගේ විශෙෂ පරිච්ඡිය ප්‍රකාශ වන පරිවාර පාළිය වනාහි සියලු විනය පිටක නැමැති මිණ බහා තිබෙන රන් කරඬුවයි. එය පඤ්ඤත්තිවාර, කතාපත්තිවාර, විපත්තිවාර, සඞ්ගහ වාර, සමුට්ඨාන වාර, අධිකරණ වාර, සමථ වාර, සමුච්චය වාර යන මහා වාර අටකින් ද ප්‍රශ්න විචාරණ විසජ්ජන ප්‍රත්‍යය වාර අටකින්ද, භික්ෂු විභඞ්ගය වාර දෙළසකින් ද, මහා වාර දෙතිසකින් ද, සමුට්ඨාන සීස, ඛන්ධක පුච්ඡා, එකුත්තරිකනය, උපොසථාදි විස්සජ්ජන, අත්ථවස විභාග, ගාථා සඞ්ගණික, අධිකරණ භෙද, දුතිය ගාථා සඞ්ගණික, අනුවිජ්ජක කිච්ච, චොදනාකණ්ඩ, චූලසඞ්ගාම, මහා සඞ්ගාම, පඤ්ඤත්ති වග්ග, අනිස්සිත වග්ග, අප්පටිපස්සම්භන වග්ග, චොහාර

වග්ග, දිඝාවිකම්ම වග්ග, මුසාවාද වග්ග, භික්ඛුනී වග්ග, උබ්බාහික වග්ග, අධිකරණවූපසම වග්ග, සංඝ භෙද වග්ග, ආවාසික. වග්ග, කඨිනත්ථාර වග්ග, ඡෙදමොචන ගාථා, කම්ම වග්ග, සික්ඛාපද, අත්ථවසපකරණ, ආනිසංස වග්ග, නවසඞ්ගහිත වග්ග යන ප්‍රකරණාංශයන්ගෙන් සමුල්ලසිතය. මෙසේ **ඛන්ධක විභඞ්ග පරිවාර** යන ත්‍රි භෙදයෙන් යුත් ග්‍රන්ථ පඤ්චකය සූත්‍රාභිධානයෙන් ප්‍රචලිත යි.

ii **සුත්තා'නුලොම** එනි සතර මහා ප්‍රදෙශ නය සූත්‍රානුලොම නම් වේ සතර **මහා ප්‍රදෙශයෝ** නම්- 1 ''යං භික්ඛවෙ මයා ඉදං න කප්පතීති අප්පටික්ඛිත්තං **තඤ්චෙ** අකප්පියං අනුලොමෙති කප්පියං පටිබාහති තං වො න කප්පති- (තථාගතයන් වහන්සේ විසින්) මහණෙනි! මා විසින් මෙය අකැප යයි ප්‍රතික්‍ෂෙප නොකරණ ලද්ද එය ඉදින් කැපබවට අනුලොම් වේද කැප බව ප්‍රතිබාහනය කෙරේද එය නො කැපය 2 යං භික්ඛවෙ මයා ඉදං න කප්පතීති අප්පටික්ඛිත්තං තං චෙ කප්පියං අනුලොමෙති අකප්පියං පටිබාහති තං වො කප්පති (මහණෙනි! මා විසින් යමක් මේ නො කැපය යි අප්‍රතික්‍ෂෙපවූයේ කැප පක්‍ෂයට අනුලොම් වේ ද අකැප පක්‍ෂය ප්‍රතිබාහනය කෙරේ ද එය කැප වේ. 3 යං භික්ඛවෙ මයා ඉදං කප්පතීති අනනුඤ්ඤාතං තං චෙ අකප්පියං අනුලොමෙති කප්පියං පටිබාහති තං වො න කප්පති-මෙය කැපය යි අනුදන්නා ලද යමක් ඉදින් අකැප පක්‍ෂයට අනුලොම් වේ ද කැප පක්‍ෂය ප්‍රතිබාහනය කෙරේ ද එය අකැපය 4. යං භික්ඛවෙ මයා ඉදං කප්පතීති අනනුඤ්ඤාතං තඤ්චෙ කප්පියං අනුලොමෙති අකප්පියං පටිබාහති තං වො කප්පති-මෙය කැපය යි නො අනුදන්නා ලද්දක් ඉදින් කැප පක්‍ෂයට අනුලොම් වේ ද අකැප පක්‍ෂය ප්‍රතිබාහනය කොට සිටී ද එය කැපවේය යි භෙසජ්ජක්ඛන්ධකයෙහි දක්වන ලද මොහුය. සූත්‍ර සඞ්ඛ්‍යාත පාළියට අනුලොම්ව ගත යුතු හෙයින් **සුත්තානුලොමය** යි කියනු ලැබේ.

iii **ආචරියවාද** ධම්ම සඞ්ග්‍රාහක පන්සියයක් රහතුන් වහන්සේ විසින් තබන ලද පාලි විනිර්මුක්ත වූ ඔක්කන්තික විනිච්ඡයවූ අට්ඨ කථා පාළිය **ආචරියවාද** නම්. **පාළිමුත්තකවිනය** යනු ද මීට නමි.

සුත්ත **සුත්තානුලෝම** ආචරිය වාදයන්හි පිහිටි
iv **අත්තනොමති** විනයධරයාගේ සිතෙහි අනුබුද්ධියෙන් ජනිත
වන නයග්‍රාහ කථාව හෝ **සූත්‍රා**භිධර්ම විනයාර්ථ කථා ගත සිංහල ථෙර වාදය හෝ අත්තනොමති යයි ප්‍රකාශිතයි ශ්‍රී මූලපාළිය **සූත්‍රය** යි ද ශ්‍රාවක භාෂිතය **සුත්තානුලෝමය** යි ද අර්ථකථාපාළිය **ආචරිය වාදය** යි ද ටීකාපාළිය **අත්තනොමතිය** යි ද නයග්‍රාහ වශයෙන් කිය හැකි වේ. මොව්හු උත්පත්ති පාටි වශයෙන් ප්‍රබල භාවයට පැමිණෙන අයුරු විනයාර්ථ කථාවෙන් දත්තේය.

## iv විනයසංගීති.

සංයුක්ත විනය ග්‍රන්ථ පඤ්චකය **පඤ්ච සතික සත්ත සතික සාහස්සික** යන සඞ්ගීතිත්‍රයට අනුගීතවූයේ පරම පාරිශුද්ධභාවයෙන් භාසුරවිය. එහෙයින් ම තත්කාලොත්පන්න ශාසන මල යන් ද අපගතවිය. ඒ ඒ සඞ්ගීති සම්බන්ධවූ ප්‍රවෘත්ති ග්‍රන්ථාගත ප්‍රපඤ්ච කථාවන්ගෙන් දත හැකි නිසා මෙහි ඒ නො දක්වමු. ලක් දිව්හිදී ද විනය සඞ්ගායනාවක් කළ බව විනයාර්ථකථාවෙහි පෙණේ. එහි ලුහුඬු පුවත මෙසේයි. ලඞ්කාශාසන ප්‍රදීපායමාන මහා මහින්ද ක්ෂීණාශ්‍රවයන් වහන්සේ දේවානම්පියතිස්ස නරේන්ද්‍රානුග්‍රහය පරිදි ලක්දිව බුදුසසුන පිහිටුවා වදාළ සේක. රුවන් මැලිසෑය සඳහා සෙල්ටැඹ පිහිටුවා දෙවනපෑතිස් රජතුමා මිහිඳු මාහිමියන් වෙත එළඹ ස්වාමිනි! දැන් තාම්‍රපර්ණී ද්වීපයෙහි සුගත ශාසනය පිහිටියේදැයි විචාළේය. මහරජ! ලක්දිව බුදුසසුන පිහිටියේ යි එතකුදු වුවත් මූලප්‍රතිෂ්ඨාපනය (මුල් බැසීම) නොවී යයි මහරහතුන් වහන්සේගේ පිළිතුර විය. කවර නම් දවසක මුල්පිහිටන්නේ දැ? යන රජතුමාගේ විචාරණයට මහරජ! යම් දිනයක ලක්දිව්හි උපන් කුල පුත්‍රයෙක් ලක්දිවම මහණව මෙහි ම විනය උගෙණ ලක්දිව දී ම වාචනය කෙරේ නම් එදා මුල්පිහිටන්නේය යි කරුණාධර තෙරුන් වහන්සේ පිළිතුරු දුන් සේක. එබඳු භික්ෂුවක් ඇද්දැයි රජතුමාගේ පිළිවිසීමට 'මහා අරිට්ඨයෝ ප්‍රතිබලයයි කී දූය. එයින් මහත් ප්‍රසාදයට පැමිණි රජතුමා ඊට මා විසින් කුමක් කටයුතුදැයි විචාළ කල්හි මණ්ඩපයක් කරවීම වටනේයයි තෙරුන් වහන්සේ වදාළ සේක. එය යහපතැයි පිළි

ගෙණ තුඹරුප් සෑ මුල මෙඝවණ්ණ පරිවෙණා සන්නයෙහි අජාසත් මහරජතුමන් විසින් සප්තපණ්ණි ගුහාවාරයෙහි කරවන ලද මණ්ඩපය ආකාරයට මහත් රාජානුභාවයෙන් මාහැඟි මණ්ඩපයක් කොට විශෙෂයෙන් අලඞ්කාර කරවා ශාසනයාගේ මූල ප්‍රතිෂ්ඨාව දකිනු රිසියෙන් අමාත්‍යගණයා විසින් පිරිවරණ ලදුව ථූපාරාම යට ගියෝය. එදවස සැටදහසක් භික්ෂූන් වහන්සේ ථූපාරාම යට රැස්වූවාහුය. එහි රහතුන් වහන්සේට වැඩසිටීමට දකුණු දිග්භාගයෙහි ද මහා අරිඨ මහරහතන් වහන්සේට වැඩසිටීමට උතුරු දිග්භාගයෙහි ධර්මාසනවූහ. මිහිඳු මාහිමියන් වහන්සේගේ අදහස් පරිදි සව ප්‍රාප්තාසනයෙහි සිවු පිළි සිඹියාපත් රහතුන් අවසැටදහසක් පිරිවරව මහා අරිඨ තෙරනුවෝ ධර්මාසනා රූඪවූහ. ඉක්බිති මිහිඳු මාහිමියානන් වහන්සේ විසින් විචාරණ ලද්දේ මහාඅරිඨ ස්ථවිරයන් වහන්සේ "තෙන සමයෙන බුද්ධෝ භගවා වෙරඤ්ජායං විහරති නළෙරුපුචිමන්දමූලෙ" යනාදින් විනය නිදානය වදාළ කල්හි මහා පෘථිවිතොමෝ රාවප්‍රතිරාව දෙමින් සාධුග්‍රහණය කළාය. , නොකල විදුලි දිලූහ. දෙවියෝ සාධුකාර දුන්හ. මෙසේ ආශ්චර්යාද්භූතයන් පවතිද්දී මේ ධර්මසඞ්ගාය නාව ඉල්මස පවාරණ දින අවසන් වූයේය. මින්පසු පාලි අට්ඨ කථා රචනය මෙඝවණ්ණාභය මහානාමරාජ සමයෙහි ශ්‍රීමත් බුද්ධ ඝෝෂ ස්ථවිරයන් වහන්සේ විසින් සිදුකළසේක.

## V විනය'ඨකථා සහ ටීකා

මෙසේ සඞ්ගායනාවන්ගෙන් උජ්වලිතවූ විනය පිටකයට අට්ඨ කථාචාර්ය ශ්‍රීමද්බුද්ධඝෝෂ ස්ථවිරපාදයන් වහන්සේ විසින් පුරාත නයෙහි තුබූ කුරුන්දි මහාපච්චරියආදී සිංහල අටුවාඅශෙෂදෙශ වාසීන්ගේ විශෙෂ ඵල සිද්ධිය සඳහා ස්ථවිරවාදයන් ද ඇතුලත් කෙරෙමින් මහා නිගමසාමීන්ගේ පහයෙහි වෙසෙමින් බුද්ධසිරි නම් ස්ථවිරයන් වහන්සේගේ සාදරාරාධනය පරිදි මහානාම රජ හට විසි (20) වෙනි වර්ෂයේදී ආරම්භකොට් වර්ෂයකින් සමන්ත පාසාදිකා නම් විනය අටුවාව මාගධ නිරුක්තියෙන් රචනා කළ සේක. මෙය මුළු විනය පිටකයට ඇති එකම පිරිසිදු අටුවාව වේ. මීට කරණලද සාරත්ථදීපනී වජ්රබුද්ධි විමති විනොදනී යන ටීකාත්‍රයය විබුධජන ප්‍රශස්තය. ප්‍රාතිමොක්ෂයට බුද්ධඝෝෂ ස්ථවිර ප්‍රණීත කඞ්ඛාවිතරණී නම් අටුවාවක් සහ විනයත්ථ මඤ්ජූසා නම් ටීකාවක් සහ පුරාණ සන්නයක් සහ අළුත් සන්නයක් ද

ගැටපදයක් ද ඇත්තේය. **පාළිමුත්තක විනය විනයාලඞ්කාරය විනය විනිච්ඡය, ඛුද්දසික්ඛා** ආදී පාලි ග්‍රන්ථරාශියක් සහ **සිකවළඳ විනිස, විනයසන්නය** ආදී සිංහල පොත් ස්වල්පයක් ද විනය පිටකයෙහි - පරිවාර ග්‍රන්ථයි. **පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා** විසින් විරචිත **වනවිනිස** නම් ග්‍රන්ථය ලබා එල ලැබීමට නොහැකි වීම සිංහල භාෂාවට සහ සිංහල බෞද්ධයින්ට ද තදබල පාඩුවක් බව මෙහි සඳහන්කරනු කැමැත්තම්හ.

## vi විනයානි'සංස

**සද්ධර්ම** ශාසනායුෂයයි බුද්ධ ප්‍රශස්තවූ විනය වනාහි ශාසන විෂයයෙහි **ආනිසංස දශයක්** හා තදුපයෝගීව පවත්නාහට අපරිමිත ආනිසංස ද ලබා දෙන්නේය.

**සඞ්ඝානිසංස** පරම කාරුණික තථාගතයන් වහන්සේ විසින් දශවිධ ආනිසංසයක් මෙනෙහි කෙරෙමින් පණවා වදාළ සේක. ඔහු නම්:- **1** සඞ්ඝ සුට්ඨුතාය—සඞ්ඝයාගේ යහපත් භාවය පිණිස ද 2 සඞ්ඝඵාසුතාය—සඞ්ඝයාගේ සුඛ විහරණ සංඛ්‍යාත පහසුව පිණිස ද 3 දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය—දුශ්ශීල පුද්ගලයන්ට නිග්‍රහය පිණිස ද 4 පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය—ප්‍රියශීලී භික්ෂූන්ට (පාප භික්ෂූන්ගෙන් පැමිණෙන දුෂ්කරතාවයන්ගෙන් දුරුව) සැප විහරණය පිණිස ද 5 දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය—(අසංවරයෙහි සිටියහු විසින් ඉහාත්මයෙහි අසංවරය නිසා ලබන දුක්ඛ විශේෂයන්ගේ නැති වීම පිණිස ද 6 සම්පරායිකානං ආසවානං පටිඝාතාය= (අසංවරයෙහි පිහිටියහු විසින්) පරලොවදී ලබන නරකාදී දුක්ඛයන්ගේ විශේෂ ප්‍රතිඝාතය පිණිස ද 7 අප්පසන්නානං වා පසාදය=ශාසනය විෂයෙහි නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස ද 8 පසන්නානං භියොභාවාය=පැහැද සිටින්නන්ගේ විශේෂ ප්‍රසාදය පිණිස ද 9 සද්ධම්මට්ඨිතියා=පර්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවේධ සංඛ්‍යාත සද්ධර්මයාගේ චිරස්ථායි භාවය පිණිස ද 10 විනයානුග්ගහාය—චතුර්විධ විනයන්ට අනුග්‍රහ පිණිස ද යන දශය යි.

**ii පුග්ගලානිසංස** විශුද්ධ වූ විනය වනාහි බුදෙක් ශාසනායුෂ පමණක් නොව තදුපයෝගී පුද්ගලයාගේ දිට්ඨධම්මික සම්පරායිකාභිවෘද්ධිය ද සාධා දෙන්නේ වේ. විනය පර්‍යාප්තිය ඇති භික්ෂු තෙමේ ශ්‍රද්ධා ඇති මහ

ඥුන්ගේ ගරු තනතුරු දරන්නෙක් වේ. එහෙයින්ම විනය ප්‍රඥප්තියෙහි සාධු සංවර සහිත වේ. යමෙකු අධිශීලශික්‍ෂා රහිත ද ඔහු අධි චිත්තශික්‍ෂාවෙන් ද තොරය. එහෙයින් ම අධි ප්‍රඥා ශික්‍ෂාව ද නො ලැබිය හැකිය. එහෙයින් ශිවසුඛාන්වේෂීන් විසින් වෙසෙසින් විනය උද්ග්‍රහණ කටයුතු මය. "විනයො සංවරත්ථාය සංවරො අවිප්පටිසාරත්ථාය අවිප්පටිසාරො පාමොජ්ජත්ථාය-පාමොජ්ජං පීතත්ථාය පීති පස්සද්ධත්ථාය පස්සද්ධි සුඛත්ථාය සුඛං සමාධත්ථාය සමාධි යථාභූත ඤාණ දස්සනත්ථාය යථාභූත ඤාණ දස්සනං අනුපාදා පරි නිබ්බාණත්ථාය" යනු වදාළ හෙයින් විනය තෙමේ කාය වාක් සංවරය පිණිස ද කාය වාක් සංවරය අවිපිළිසර බව පිණිස ද විපිළිසර රහිත බව කාය චිත්ත ප්‍රමෝදය පිණිස ද කාය චිත්ත ප්‍රමෝදය ප්‍රීතිය පිණිසද ප්‍රීතිය කාය චිත්ත ප්‍රශ්‍රබ්ධිය පිණිස ද එය සැපය පිණිසද සැපය චිත්ත සමාධානය පිණිසද සමාධිය යථාභූත ඥාන දර්ශනය පිණිසද යථාභූත ඥාන දර්ශනය අභිනමාගීඥානයෙන් සකල කෙලශ මූලොත්පාටනය පිණිස දපවත්නේය.

## vii විනය ගාථා

විභඞ්ග-ඛන්ධක-පරිවාරයන්හි ආ ගාථාවෝ වනාහි අර්ථ ගම්භීර්‍යයෙන් යුක්තවූයේ අවබොධයට දුෂ්කර වෙත්. පරිවාර ගාථා වෙසෙසින් සාරගර්භවූයේ ගම්භීරතර වෙති. පාරාජිකපාළියෙහි ගාථා අටකි. පාචිත්තිය පාළියෙහි හත (7) කි. මහාවග්ග පාළියෙහි අනූපහ (95) කි. චුල්ලවග්ග පාළියෙහි සත්සතළිස (47) කි පරිවාරයෙහි තුන්සියඅනූව (390) කි. සියල්ල එකතුව විනය පිටකාගතගාථාවෝ පන්සිය සතළිස් සතකි.

## viii සුජනප්පමෝදනී විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව

මෙසේ මහත් සඞ්ඛ්‍යාවකින් ප්‍රමිතවූ සියලු විනය පිටකාගත ගාථාවන්ට විස්තරාර්ථ වර්ණනා සහිත ව්‍යාඛ්‍යාවක් ලිවීම උදාර වූ ලොක ශාසනොපකාරයකැ යි සලකා විනය ග්‍රන්ථ පසින් ගාථොද්ධරණය කොට විනයට්ඨකථාව සහ ටීකා ද ඇසුරුකොට ගෙණ ස්වකීය වූ ආචාර්‍ය පරම්පරායෙහි නිර්මල වූ අර්ථ වාචනා මාර්ගය ද අනුල්ලඞ්ඝනය කොට සුජනප්පමෝදනී නම්වූ මේ විනය ගාථාර්ථ ව්‍යාකඛ්‍යාව අප විසින් නිපදවන ලදි. පරිවාර ගාථා ව්‍යාඛ්‍යානයෙහිදී පරිවාර ගැටපදය ද අපට උපකාර විය. මෙහි ගාථා සඞ්ගණිකයන්හි හා සමුට්ඨාන ගාථාවන්හි ද ශික්‍ෂා සඞ්ඛ්‍යා

පිළිබඳ ඌනාතිරික්තත්වයක් පෙනේ. ලැබුන තාක් පෙළ පොත්වල එසේ ම තිබුන හෙයින් වෙනසක් නො කොට ව්‍යාඛ්‍යා කරණලදි. එහෙයින් මෙය විචාරණය කිරීම විනයධාරී උගතුන් වෙත පවතීවා. විනය ගාථාවන්ට මෙසේ ව්‍යාඛ්‍යාවක් ලිවීම උසස් ශාසන සඞ්ග්‍රහයක් වුවත් එහි දුෂ්කර භාවය කාහට මුත් වැටහේ මය. එහෙයින් මෙහි අර්ථ ව්‍යාඛ්‍යාව සැම සම්පූර්ණයයි අපි නො කියමු. බුදුවරයන්ගෙන් අවධිවූ වැරදීම ලෝකස්වභාවයයි යනනිගමනය තෙමේ අපද අත්නොහල හෙයිනි. එබැවින් මෙහි අපගේ අනවධානත්වයෙන්වූ අවද්‍යයෙක් වේත් නම් අප වෙත ඒ දන්වා එවීම අපට කරණ විශේෂානුග්‍රහයකි. මෙහි දෙවන ශෝධනයෙහි එය උපකාරවිය හැකි හෙයිනි.

## XI උපකාරානුස්මෘති

අපගේ මේ සත්කෘතියෙහිදී කොත්මලේ වටද්දර "ඥානෝදය" පරිවෙණාධිපති රාජකීය පණ්ඩිත ධර්මකීර්ති ශ්‍රී ධර්මානන්‍දාභිධාන මගේ පූජ්‍යාචාර්යපාදයන් වහන්සේ අවසාන ශුද්ධපත්‍රාවලෝකන පූර්වක ප්‍රතිග්‍රහණයෙන් අනුග්‍රහ කළ වදාළ බව ගුරු භක්ති පූර්වකාභිවාදනයෙන් සඳහන් කරමි.

එසේම මේ ග්‍රන්ථය යථාකාලයෙහි ප්‍රකාශ කිරීමෙහි උද්‍යෝගවත්ව කෘත්‍ය සංවිධාන කිරීම ගැන මාවතුරේ විහාරාධිපතිව වැඩ විසූ පල්ලේගම ශ්‍රී ධර්මරක්ෂිත මහා ස්ථවිරපාදයන් වහන්සේගේ සහ ඥානෝදය පරිවෙණාධිපති අස්මදාචාර්යපාදයන් වහන්සේගේ ද ශිෂ්‍ය වූ මාවතුරේ විහාරාධිපති ගෞරවාර්හ ඉල්ලවතුරේ සාරානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත අපගේ සාදර ගෞරවය හිමිවේ.

මේ සත්කෘතියෙහිදී නොයෙක් සදුපදේශ ප්‍රදානයෙන් අස්මදාචාර්ය වටද්දර ක්ෂේත්‍රාරාමාධිපති පවර විනයාචාර්ය සිරි රතනජෝත්‍යාභිධාන කොත්මලේ පළාතේ ප්‍රධාන සඞ්ඝනායක මාහිමියන් වහන්සේ ද මුල පටන් ෆෝරම සයක ඇතැම් මුද්‍රණීය පත්‍ර [ප්‍රෑෆ්]බලාදීමෙන් දැනට එංගලන්තයෙහි ධර්මප්‍රචාරක කටයුතුවල යෙදී වැඩවසන විද්‍යෝදය පිරිවෙණේ ආචාර්ය පරවාහැර ශ්‍රීවජිරඥාණ ස්ථවිරපාදයන් වහන්සේද බාල්‍යයෙහි පටන් අපගේ අභිවෘද්ධියෙහි සාපේක්ෂකවූ ඥානෝදය පිරිවෙණේ උපාචාර්ය ගරු වටද්දර ධීරානන්දස්වාමීන්ද්‍රයන් වහන්සේ ලිපිභාණ්ඩ සපයා දීමාදියෙන් ද උපකාර කළ බව කෘතඥතා පූර්වකව ප්‍රකාශකරමු.

තවද "ඔබ වහන්සේගේ උපසම්පදාව නිමිති කොට පොතක් ලියා ගරු මහා සඞ්ඝසභාවට ඔප්පු කිරීම ඉතා මැනවැ'යි කියා ඥානෝදය පරිවෙණාරක්ෂක **ශාසනෝපකාර** සමිතියෙහි ප්‍රධාන සභාපති වූ සද්ගුණවත් **රාජකරුණා එකනායක වාසල මුදියන්සේ රාලහාමිල්ලාගේ උක්කුබණ්ඩාර උනම්බුවේ** කොත්මලේ **රවේ මැතිඳුන්** කළ සාමාරාධනය ගෞරවයෙන් මෙහි සඳහන් කරමි.

මෙසේ ශ්‍රී සම්බුද්ධ ශාසනායුෂයයි වර්ණිත වූ විනයපිටකාගත ගාථාවන්ට මේ ව්‍යාඛ්‍යානය ලිවීමෙන් ජනිත කුශල සම්භාරය අපගේ ක්ලේශ විනයනය පිණිස ප්‍රත්‍යය වේවායි ප්‍රීතියෙන් ප්‍රාර්ථනා කරමු.

## සිවං

වටද්දර මේධානන්දයති

ශ්‍රී බුද්ධ වර්ෂ 2472 ක් වූ බක් මස
පුර තියවක නම් තිථිය ලත්
කිවි දින කොත්මලේ වටද්දර
ඥානෝදය පිරිවෙන්හි දීය.

# සුජනප්පමෝදනී

නම් වූ

# විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.**

---

## පාරාජික පාළි.

---

1. අසුද්ධො සන්ත'මත්තානං—අසුද්ධො යො පවෙදයෙ
නිකච්ච කිතවස්සෙ'ව—භුත්තං ථෙය්‍යෙන තස්ස තං

---

දෙවබ්‍රහ්මනරෙසානං කිරීට'ග්ගෙසු භාසුරං
ජිනපාදම්බුජරජං සිරස්මිං සම්පුනාතු මං

සමුච්චිනිත්වා ගන්ථේ'ස්මිං ගාථා විනය පාළිතො
සබ්බා'චෙරා'නුගතං තාසං විමල'ත්ථප්පකාසනං

ආසිංසමානො සම්බුද්ධ සාසනස්සා'භිවඩ්ඪනං
පටුබුද්ධි විහිනො'පි කරිස්සාමි යථාබලං

1. යො, පිරිසිදු නොවූ කායාදී හැසිරීම් ඇති යම්කිසි ශ්‍රමණ වෙෂ මාත්‍රධාරී දුශ්ශීල පුද්ගලයෙක්තෙම්; අසුද්ධො, අපරිශුද්ධ සමාචාරාදී අන්‍යාකාරයකින්; සන්තං, විද්‍යමානවූ; අත්තානං, දුශ්ශීල ගුණ ඇති තමා; අසුද්ධො, (පරම පාරිශුද්ධියෙන් යුක්තවෙම්, මා තුළ ලොවුතුරා දහම් ඇතැයි ඇඟවීම් වශයෙන්) අන්‍යප්‍රකාරයකින්; පවෙදයෙ, ලාභ කීර්ති ආදී ලාමක ආශාවෙන් ප්‍රකාශ කෙරේ ද; **නිකච්ච**, (අතුකොළාදිය තමා මත හෙළා පඳුර මෙන් දක්වීමෙන්) රවටා; **කිතවස්ස ඉව**, කපටි ලිහිණි වැද්දාගේ පක්ෂිග්‍රහණය මෙන්; **තස්ස**, නොරහත්ව රහත්බැව් අඟවා ශ්‍රද්ධා දෙයය බුදින්නාවූ ඔහු **විසින්**; **තං**, ඒ රාෂ්ට්‍රපිණ්ඩානුභවය; **ථෙය්‍යෙන**, මිනිසුන් රවටා සොරසිතින්; **භුත්තං**, අනුභව කිරීම නම් වෙයි.

## සුජනප්පමොදනී

2. කාසාවකණ්ඨා බහවො–පාපධම්මා අසඤ්ඤතා
පාපා පාපෙහි කම්මෙහි–නිරයං තෙ උපපජ්ජරෙ

3. සෙය්‍යො අයොගුළො භුත්තො–තත්තො අග්ගිසිඛූපමො
යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො–රට්ඨපිණ්ඩං අසඤ්ඤතො

4. මම'න්නපානං විපුලං උළාරං–උප්පජ්ජතී'මස්ස මණිස්ස හෙතු
තං තෙ න දස්සං අතියාචකො'සි–න චා'පි තෙ අස්සමමාගමිස්සං

5. සුසූ යථා සක්ඛරධොතපාණී–තාසෙසි මං සෙලං යාචමානො
තං තෙ න දස්සං අතියාචකො'සි–න චා'පි තෙ අස්සමමාගමිස්සං

---

2. අසඤ්ඤතා, කායාදීන් සංවර රහිතවූ; බහවො, පුද්ගලයන් වශයෙන් බොහෝවූ; පාපධම්මා, ලාමකස්වභාව ඇත්තාවූ; කාසාවකණ්ඨා, කසාවතින් වෙළූ ගෙල ඇති; තෙ පාපා, ඒ දුශ්ශීල පුද්ගලයෝතුමූ; පාපෙහි කම්මෙහි, ආදීනව නොදැන මෙරමා රවටා කෑමාදීන් කළ පාපකර්මයන් හෙතු කොට ගෙණ; නිරයං, නිරස්වාද දුර්ගතියෙහි; උපපජ්ජරෙ, උපදිත්.

3. අසඤ්ඤතො, ලාමකාචාරයෙහි පිහිටීම් වශයෙන් අසංයතවූ; දුස්සීලො, කුහන ගුණයෙන් ලෝකයා රවටා කන දුශ්ශීල පුද්ගලතෙම; චෙ, ඉදින්; යං රට්ඨපිණ්ඩං, ශ්‍රද්ධාවත් රටවැසියන් දෙන යම් අහරක්; භුඤ්ජෙය්‍ය, අනුභව කෙරේද; තත්තො, මොනවට තැවුනාවූ; අග්ගිසිඛූපමො, ගිනිසිළුවක් බඳුවූ; අයොගුළො, ගිනිගත් යගුළියක්; භුත්තො, අනුභවකරණලද්දේනම්; සෙය්‍යො, (කොහඤ්ඤයෙන් ශ්‍රද්ධාදෙයය රවටා කෑමට වඩා) උතුම්; යගුළි ගිලීමෙන් ක්ෂණික මරණදුක පමණෙකි; ඉන් පරලොව දුකක් නොවෙයි; දුශ්ශීලව ලොව රවටා කෑමෙන් අපමණ අපායදුක විඳියයුතු හෙයින් මෙසේ වදාරණලදි.

4. විපුලං, මහත්වූ; උළාරං, ප්‍රණීතවූ; අන්නපානං, ආහාර පාන; මම, මට; ඉමස්ස මණිස්ස හෙතු, මේ මාණික්‍යමහිමය හෙතු කොටගෙණ; උප්පජ්ජති, උපදී. තං, ඒ මාගේ මහඟුමිණ; තෙ, තට; න දස්සං, නොදෙමි; අතියාචකො අසි, නුඹ (ඉෂ්ට වස්තුව නැවත නැවත ඉල්වන හෙයින්) 'අතියාචක' වෙහිය; (එහෙයින්) තෙ, තාගේ; අස්සමං අපි, ආශ්‍රමයට පවා; නච ආගමිස්සං, නැවත නොපැමිණෙන්නෙමි.

5. සක්ඛරධොතපාණි, කලුගලින් මැද මුවහත් තබනලද කඩුගත් අතැති; සුසූ, තරුණ පුරුෂයෙක් තෙමේ; යථා, යම්

## විනයගාථාදීපිකා ව්‍යාඛ්‍යාව.

6. න තං යාචෙය්‍ය යස්ස පියං ජිගිංසෙ, දෙස්සො හොති අතියාචනාය
නාගො මණිං යාචිතො බ්‍රාහ්මණෙන, අදස්ස
නඤ්ඤෙව තදජ්ඣගමාසි

7. අපාහං තෙ න ජානාමි-රට්ඨපාල! බහුජ්ජනා
තෙ මං සඞ්ගම්ම යාචන්ති-කස්මා මං ත්වං න යාචසි

8. යාචකො අප්පියො හොති-යාචං අදදමප්පියො
තස්මාහං තං න යාචාමි-මා මෙ† විද්දෙස්සනා අහු

---

සේද එසේ; සෙලං, මැණික්ගල; යාචමානො, ඉල්වන්නේ; මං, මා; තාසෙසි, තැතිගැන්වූසෙහිය;(උද්විග්න කෙළෙහිය)[ත්වං, නුඹ] අතියාචකො අසි, දෘෂ්ටවස්තුව නැවත නැවත ඉල්වන්නෙක් වෙහිය; (එහෙයින්) තං, ඒ මැණික; තෙ, නුඹට; නදස්සං, නො දෙන්නෙමි; තෙ, තාගේ; අස්සමං අපි, අසපුවට පවා; නච ආගමිස්සං, නැවත නොපැමිණෙන්නෙමි.

6. යස්ස, යමෙක් හට; පියං, ප්‍රියවූවක් ලෙස; ජිගිංසෙ, ගන්නාලද්දක් වේද, තං, එය; න යාචෙ, නොමඉල්වන්නේය; අතියාචනාය, බොහෝකොට ඉල්වීමෙන්; දෙස්සො හොති, වෛෂ කටයුත්තෙක් වෙයි. නාගො, නාගතෙමේ; බ්‍රාහ්මණෙන, බමුණා විසින්; මණිං, මිණ, යාචිතො, ඉල්වනලද්දේ; තං, ඔහු; අදස්සනං එව, නොදැකිමට, අජ්ඣගමාසි, පැමිණියේය

7. රට්ඨපාල,! එම්බාරට්ඨපාලය! අහංඅපි, මමද; තෙබහුජ්ජනා, ඒ බොහෝජනයන්; න ජානාමි; මොව්හු කවරහුදැයි නොදනිමි; තෙ, ඔව්හු; සඞ්ගම්ම, සමූහව; මං, මා; යාචන්ති, ඉල්වත්; කස්මා, කුමක්හෙයින්; ත්වං, නුඹ, මං, මා; නයාචසි; නොඉල්වන්නෙහිද?

8. යාචකො, ඉල්වනතැනැත්තේ;අප්පියො හොති, අප්‍රියවෙයි යාචං, යාචනය හෙවත්(ඉල්වනලද වස්තුව) අදදං, නොදෙන්නේ; අප්පියො, අප්‍රිය වෙයි නොහොත් යාචං, ඉල්වන්නාහුට; අදදං, නොදෙනතැනැත්තේ; අප්පියො, අප්‍රිය වෙයි. තස්මා, එහෙයින්; අහං, මම; තං, තා, න යාචාමි; නොඉල්වමි; මෙ, මාකෙරෙහි තාගේ හෝ තා කෙරෙහි මාගේ හෝ; විද්දෙස්සනා, අප්‍රිය භාවයක්; මා අහු, නොවේවා.

**පාරාජිකපාළිගාථාවී නිමි.**

—❖—

---

† විදෙස්සනා-පා-

# පාචිත්තියපාළි.

---

1. මනාපමෙව භාසෙය්‍ය-නාමනාපං කුදාචිපි
මනාපං භාසමානස්ස-ගරුංභාර මුදද්ධරි
ධනඤ්ච නමලබ්භෙසි-තෙනචත්ත මනො අහු

2. අධිචෙතසො අප්පමජ්ජතො-මුනිනො මොන
පථෙසු සික්ඛතො.
සොකා න භවන්ති තාදිනො-උපසන්තස්ස සදා සතීමතො

3. උභො අත්ථං න ජානන්ති උභො ධම්මං න පස්සරෙ
යො චායං මන්තං වාචෙති-යො චාධම්මෙන ධීයති

---

1. මනාපං එව, මෙරමාමන වඩන්නක්ම; භාසෙය්‍ය, කියන්නේය; කදාචිඅපි, කිසිකලෙකත්; අමනාපං, අමනාපදෙයක්; න, නොකියන්නේය. මනාපං භාසමානස්ස, මනාපබස්කියන්නහුගේ; ගරුංභාරං, මහත්වූ රියබරද; උදද්ධරී, උධරණය කෙළේය. නං, ඔහු; ධනංච, ධනයද; අලබ්භෙසි, ලාභය කරවී; තෙන ච, එහෙයින්ම; අත්තමනො අහු; ධනයෙන් බමුණු ද දිනීමෙන් ගොණු ද සතුටුසිත් ඇත්තෝවූහ.

2. අධිචෙතසො, සියලු සිත්වලට වඩා උත්තරිතර අර්හත්ඵල චිත්තයෙන් සමන්වාගතවූ; අප්පමජ්ජතො, කුශලධර්ම සකසා කිරීමෙන් අප්‍රමාදවූ; මොනපථෙසු සික්ඛතො, අර්හත්මාර්ගඥාන සංඛ්‍යාත මෞනපථයට මාර්ගයවූ සප්තත්‍රිංශත් බොධිපාක්ෂීය ධර්මයන්හි හෝ ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන්නාවූ; උපසන්තස්ස; රාගාදිය ව්‍යපසමනය කල හෙයින් සංසුන්වූ; සදා, හැමකල්හි; සතිමතො, ස්මෘතිවෛපුල්‍යයෙන් යුක්තවූ; තාදිනො, තාදී ලක්ෂණඇති, මුනිනො, උභයලොකය දන්නා ක්ෂීණාශ්‍රව මුනි හට; සොකා, ඉෂ්ටවියොගාදී ශොකයෝ; න භවන්ති, නොවෙත්.

3. යොච අයං, යම්මේකෙනෙක්; මන්තං වාචෙති, මන්ත්‍ර කියයිද; යො ච, යමෙක්; අධම්මෙන, අධර්මයෙන්; අධීයති, මන්ත්‍රාධ්‍යයනය කෙරේද; උභො, මේ රාජ බ්‍රාහ්මණ දෙදෙනම; අත්ථං, පාළි අර්ථය; න ජානන්ති, නොදනිත්; උභො, දෙදෙනම; ධම්මං, ධර්මය න පස්සරෙ, නොදක්නාහ.

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

4. සාලීනං ඔදනො භුත්තො–සුචිමංසූපසෙචනො
   නතස්මා ධම්මෙ න වත්තාමි–ධම්මො අරියෙහි වණ්ණිතො
5. ධීරත්ථු තං ධනලාභං–යසලාභං ච බ්‍රාහ්මණ!
   යා වුත්ති විනිපාතෙන–අධම්මචරණෙන වා
6. පරිබ්බජ මහාබ්‍රහ්මෙ–පචන්තඤ්ඤෙපි පාණිනො
   මා ත්වං අධම්මො ආචරිතො–අස්මා කුම්භ මිවා'භිදා
7. යං ලද්ධං තෙන තුට්ඨබ්බං අතිලොභො හි පාපකො
   හංසරාජං ගහෙත්වාන–සුවණ්ණා පරිහායථ

---

4. සුචිමංසූපසෙචනො, විකෘති ලෙස සඳගන්නාලද නොයෙක් පිරිසිදු මාංස මිශ්‍ර කරණලද; සාලීනං, රාජසන්තක හැල් සම්බන්ධිවූ; ඔදනෝ, බත; භුත්තො, අනුභව කරණ ලද්දේය; නතස්මා, එබැවින්, ධම්මෙ, ධර්මයෙහි; න වත්තාමි, නොපවතිමි; (ජීවිකාවෘත්තිය සඳහා ධර්මයෙහි නොපිහිටියෙමියි) ධම්මො, ධර්මයතෙමේ; අරියෙහි, ආර්‍ය්‍යයන් වහන්සේලා විසින්; වණ්ණිතො, වර්‍ණනා කරණලද්දේය; (එය මම දනිමි)

5. බ්‍රාහ්මණ, බමුණ; ධනලාභං ච, ධනලාභයද, යසලාභං ච, කීර්ත්තිලාභයද; (නෝ ලැබීහි) තං, ඒ යශවස්තුලාභයට; ධී අත්ථු, නින්දා වේවා; කුමක්හෙයින්ද යත්? විනිපාතෙන, සතර අපායෙහි විවසව පතිතවන්නාවූ; අධම්මචරණෙන වා, මෙලොව අධර්මචරියාව වන්නාවූ; යාවුත්ති, යම් ජීවිකාවෘත්තියක් වේද; (එයින් කිම?)

6 මහාබ්‍රහ්මෙ, මහාබ්‍රාහ්මණය!; පරිබ්බජ, මෙයින් බැහැරව අන්දිසාවකට වහා පලායව්; අඤ්ඤෙපි පාණිනො, සෙසු සත්ත්වයෝත්; පචන්ති, පිසත් (රජ සහ තොප පමණක් නොව අන්‍යයෝද පිස අනුභව කෙරෙති) ත්වං, ඉදින්) නුඹ, අධම්මො ආචරිතො, අධර්මචර්‍ය්‍යා කෙළෙහිය. (එහෙයින්) අස්මා කුම්භං ඉව, පාෂාණයෙක් තෙමේ දියකලයක් බිඳිද (එපරිද්දෙන්); මා අභිදා, නොබිඳෙව!

7. යං, යමක්; ලද්ධං, ලැබුයේද; තෙන, එයින්; තුට්ඨබ්බං, සතුටුවිය යුතුයි. හි, යම්හෙයකින්; අතිලොභො, නොලද වස්තුයෙහි ආසාකිරීමවූ අතිලොභය; පාපකො, ලාමකය; හංසරාජං ගහෙත්වාන, සවර්ණහංසරාජයා අල්වාගෙණ; සුවණ්ණා, සවර්ණයෙන්; පරිහායථ, පිරිහුනේය, (එමෙනි)

**පාචිත්තියපාළි ගාථාර්ථ නිමි.**

## සුජනප්‍රසාදනී

# මහාවග්ගපාළි.

1. යදා හවෙ පාතු භවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා
යතො පජානාති සහෙතුධම්මං

2. යදා හවෙ පාතු භවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
අථස්ස කඞ්ඛා ව පයන්ති සබ්බා
යතො ඛයං පච්චයානං අවෙදි

---

1. යදා, යම්කලෙක්හි හෙවත් යම් කෙලශ යුධයෙක්හි; හවෙ, එකාන්තයෙන්; ආතාපිනො, කෙලෙස්තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ; ඣායතො, ආරම්මණෝ‘පනිධ්‍යාන ලක්‍ෂණෝ‘පනිධ්‍යාන වශයෙන් ධ්‍යායීවූ; බ්‍රාහ්මණස්ස, බාහිතපාපී ක්‍ෂීණාශ්‍රව බ්‍රාහ්මණයාහට; ධම්මා, අනුලෝම ප්‍රත්‍යයාකාර ප්‍රතිවෙධ සාධක බෝධිපාක්‍ෂිය ධර්මයෝ; පාතුභවන්ති, අභිසමය වශයෙන් පහළවෙත්ද, අථ, එකල්හි; යතො, යම්හෙයකින් සහෙතුධම්මං, අවිද්‍යාදී හෙතු සහිත සියලු දුඃඛස්කන්ධ ධර්මය; පජානාති, දන්නේද, (එහෙයින්) අස්ස, ඔහුගේ; සබ්බා කඞ්ඛා, සියලු කාංක්‍ෂාවෝ; වපයන්ති, නිරුද්ධ වෙත්; [මෙය ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය ප්‍රත්‍යවෙක්‍ෂා කිරීම් වශයෙන් වදාරණලදි.]

2. යදා, යම්කලෙක්හි; හවෙ, එකාන්තයෙන්; ආතාපිනො, කෙලශසන්තාපක සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්තවූ; ඣායතො, ආරම්මණොපනිධ්‍යාන ලක්‍ෂණොපනිධ්‍යාන යන ධ්‍යානවශයෙන් ධ්‍යානකරන්නාවූ; බ්‍රාහ්මණස්ස, බාහිතපාපී ක්‍ෂීණාශ්‍රවයන්වහන්සේට; ධම්මා, නවලොකොත්තර ධර්මයෝ; පාතුභවන්ති, පහළවෙත්ද; යතො, යම්හෙයකින්; පච්චයානං ඛයං, ප්‍රත්‍යයක්‍ෂය සඞ්ඛ්‍යාත නිර්වාණය; අවෙදි, ප්‍රතිවෙධයෙන් දැනගත්තේද, අථ, එකල්හි; අස්ස, උන්වහන්සේගේ; සබ්බාකඞ්ඛා, "අහොසිං නු ඛො අතීතමද්ධානං" යනාදීන් පැවැති සියලු සොළොස්කාංක්‍ෂාවෝ; වපයන්ති, නැසෙත්.

[මෙය නිර්වාණ ධර්මය ප්‍රත්‍යවෙක්‍ෂා කිරීම් වශයෙන් වදාරණලදි]

## විනයගාථා ඡ ව්‍යාඛ්‍යාව.

3. යදා හවෙ පාතු භවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
විධූපයං තිට්ඨති මාරසෙනං
සූරියො'ව ඔභාසයමන්තලික්ඛං

4. යො බ්‍රාහ්මණො බාහිත පාප ධම්මො
නිහුහුඞ්කො නික්කසාවො යතත්තො
වෙදන්තගූ වුසිත බ්‍රහ්ම චරියො
ධම්මෙන සො බ්‍රහ්ම වාදං වදෙය්‍ය
යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ

5. සුඛො විවෙකො තුට්ඨස්ස-සුත ධම්මස්ස පස්සතො
අබ්‍යා'පජ්ඣං සුඛං ලොකෙ-පාණභූතෙසු සංයමො

---

3. යදා, යම්කලෙක්හි; හවෙ, ඒකාන්තයෙන් ආතාපිනො, වීර්‍ය්‍යයෙන් කෙලෙස් තවන්නාවූ; ඣායතො, ධ්‍යායීවූ; බ්‍රාහ්මණස්ස, ක්ෂීණාශ්‍රවයන් වහන්සේට; ධම්මා, චතුරාර්‍ය්‍ය සත්‍යධර්මයෝ පාතුභවන්ති, පහළවෙත්ද, (එකල්හි) මාරසෙනං, කාමාදීවූ එකොළොස් මරසෙනඟ, විධූපයං, කම්පනය කෙරෙමින්; අන්තලික්ඛං, අහස; ඔභාසයං, බබලවන්නාවූ; සූරියො ඉව, සූර්‍ය්‍යයා මෙන්; තිට්ඨති, සිටී; [මෙය මාර්ගීය ප්‍රත්‍යවෙක්ෂා කිරීම් වශයෙන් දෙශිතය]

4. යො, යම්කිසිවෙක්; බාහිත පාපධම්මො, බැහැර කරණලද පාප ධර්ම ඇත්තේද, නිහුහුඞ්කො, මානවශයෙන් කරණලද හුං හුං යන අනුකරණ නැත්තාවූ; නික්කසාවො, පහවූ රාගාදී කසටබැව් ඇති; යතත්තො, භාවනානුයොගී සිත් ඇත්තාවූ හෙවත් සීලසංවරයෙන් හෝ චිත්තසංවරයෙන් සංයතවූ; වෙදන්තගූ, චාතුර්මාර්ගඥාන සඞ්ඛ්‍යාත වෙදයෙහි අන්තයට පැමිණියාවූ; වුසිතබ්‍රහ්මචරියො,වැස නිමවනලද මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තාවූ; යස්ස, යමෙක්හට; ලොකෙ, සකලලොක සන්නිවාසයෙහි; කුහිඤ්චි, කිසියම් එකාරම්මණයෙක්හිදු; උස්සදා, රාගාදී පඤ්චවිධ උස්සදයෝ; න සොන්ති, නොවෙත්ද, 'සො, හෙතෙම; බ්‍රහ්මවාදං, "මම බ්‍රාහ්මණයෙමි'යි; ධම්මෙන, දැහැමින්; වදෙය්‍ය, කියන්නේය.

5. තුට්ඨස්ස, චතුමග්ගඤාණ සන්තොසයෙන් සතුටුවූවහුට; විවෙකො, උපධිවිවෙක සඞ්ඛ්‍යාත නිර්වාණය; සුඛො, සැපයි; සුතධම්මස්ස, ප්‍රකාශිත ධර්ම ඇත්තාවූ; පස්සතො, එය වීර්‍ය්‍ය බල යෙන් යුක්තව ඥානයෙන් බලන්නහුට; ලොකෙ, ලොකයෙහි;

6. සුඛා විරාගතාලොකෙ–කාමානං සමතික්කමො
අස්මිමානස්ස යො විනයො–එතං වෙ පරමං සුඛං

7. කිච්ඡෙන මෙ අධිගතං හලං–දානි පකාසිතුං
රාගදෙසපරෙතෙහි–නායං ධම්මො සුසම්බුධො

8. පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං
රාගරත්තා න දක්ඛින්ති–තමොක්ඛන්ධෙන ආවටා

9. පාතුරහොසි මගධෙසු පුබ්බෙ–ධම්මොඅසුද්ධො
සමලෙහි චින්තිතො
අවාපුරෙතං අමතස්ස ද්වාරං–සුණන්තු ධම්මං
විමලෙනානුබුද්ධං

---

අබ්‍යාපජ්ඣං, අව්‍යාපාද ස්වභාවය; හෙවත් නොකිපෙන සුලුබව; සුඛං, සැපයි. [මින් මෛත්‍රිය පෙරටුබව දක්වනලදි] පාණභූතෙසු, සත්ත්වයන් කෙරෙහි; සංයමො, අවිහිංසනභාවය සැපවෙයි [මින් කරුණා පූර්වභාග බව කීපිතයි.]

6. ලොකෙ, ලොකයෙහි; විරාගතා; විරාගීභාවය; සුඛා, සැපවන්නිය. කාමානං, කාමයන්ගේ; සමතික්කමො, ඉක්මවීමද; [මින් අනාගාමිමාර්ගය ප්‍රකාශිතයි] අස්මිමානස්ස, අස්මිමානයාගේ යො විනයො, යම් හික්මවීමක් වේද; [මින් අර්හත්ත්වය දෙශිතයි. එතං, මෙය, වෙ, එකාන්තයෙන්; පරමං සුඛං, උත්තමවූ සැපයයි; [මින් පිටත් සැපතක් නම් නැතැයි යුසේයි.]

7. මෙ, මා විසින්; කිච්ඡෙන, ආගමනීය ප්‍රතිපදා වශයෙන් දුක සේ; අධිගතං, අවබොධ කරණලද චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මය තෙම; ඉදානි, දැන්; පකාසිතුං, ප්‍රකාශකරන්ට, අලං, කම්නැත; අයං ධම්මො, මේ චතුරාර්‍ය්‍යසත්‍යධර්මය තෙමේ; රාගදෙසපරෙතෙහි, රාගද්වේෂයෙන් යුක්තවූවන් විසින්; න සුසම්බුධො, මනාව අවබොධ නොකාට හැකිවෙයි.

8. නිපුණං, සියුම්වූ; ගම්භීරං, ගැඹුරුවූ; දුද්දසං, පර්තයකින් වසා තැබූවක් මෙන් දුකසේ දැකියයුතුවූ; අණුං, සෑුදුවූ; පටිසොතගාමිං, නිත්‍යාදීන්ට ප්‍රතිවිරුද්ධව නිවන නමැති පිළිහොය කරා යන්නාවූ චතුස්සත්‍යධර්මය; රාගරත්තා, ත්‍රිවිධරාගයෙන් ඇලුනාවූ තමොක්ඛන්ධෙන, අවිද්‍යාන්ධකාරරාශියෙන්; ආවටා, වැසුනාවූ සත්ත්වයෝ; න දක්ඛින්ති, නොදක්නාහ.

9. පුබ්බෙ, පෙර, සමලෙහි රාගාදී මලසහිතවූ ෂට් ශාස්තෘන් විසින්; චින්තිතො, සිතනලද්දාවූ; අසුද්ධො, අපිරිසිදුවූ; ධම්මො, මිථ්‍යාදෘෂ්ටි ධර්මය; මගධෙසු, මගධ දනව්හි; පාතුඅහොසි,

## විනයගාථාණී ව්‍යාඛ්‍යාව.

10. සෙලෙ යථා පබ්බත මුද්ධනිට්ඨිතො-යථාපි පස්සෙ
ජනතං සමන්තතො
තථූපමං ධම්මමයං සුමේධ-පාසාදමාරුය්හ සමන්ත චක්ඛු
සොකාවතිණ්ණං ජනත මපෙත සොකො
අවෙක්ඛස්සු ජාතිජරාභිභූතං

11 උට්ඨෙහි! වීර! විජිතසඞ්ගාම!-සත්ථවාහ' අණණ විචර ලොකෙ
දෙසස්සු! භගවා ධම්මං-අඤ්ඤාතාරො භවිස්සන්ති

12 අපාරුතා තෙසං අමතස්ස ද්වාරා-යෙ සොතවන්තො
පමුඤ්චන්තු සද්ධං
විහිංස සඤ්ඤීපගුණං නභාසිං-ධම්මං පණීතං මනුජෙසු බ්‍රහ්මෙ!

---

පහල වූයේය. අමතස්සවාරං, නිර්වාණද්වාරයවූ; එතං, මේ ආයාචිතං ගීය; අවාපුර විවෘත කල මැනවි; විමලෙන, රාගාදී කෙලෙස්මල රහිත හෙයින් අතිශයින් පරිශුද්ධවූ; (ඔබවහන්සේ විසින්) අනුබුද්ධං, සර්වඥතඥානයෙන්; අවබොධකලාවූ; ධම්මං, ධර්මය; සුණන්තු, අසත්වා

10 සමන්තචක්ඛු, සමතැස් ඇති; සුමේධ, සුන්දර ප්‍රාඥයන් වහන්ස; සෙලෙ පබ්බතමුද්ධනි, ශෛලමය පර්වතයක් මුදුනෙහි; ඨිතො, සිටියෙක් තෙම; සමන්තතො, හාත්පස; ජනතං, ජනසමූහයා; යථාපි පස්සෙ, යම්සේ දකීද; (එසේ) අපෙතසොකො, පහවූ සොක ඇති ඔබවහන්සේ; තථූපමං, ඒ ශෛලපර්වතය; උපමා කොට ඇති; ධම්මමයං ධර්මයවූ; පාසාදං, පහය; ආරුය්හ, නැග; ජාතිජරාභිභූතං, ජාතිජරාවෙන්; මඩනාලද; සොකාවතිණ්ණං, ශොකයට බැසගත්; ජනතං, ජනසමූහයා, අවෙක්ඛස්සු, බලන සේක්වා.

11. විජිතසඞ්ගාම, දිනූ මරයුද ඇති; සත්ථවාහ, විනෙය ජනයා සසරින් එතරකරණ හෙයින් සාර්ථවාහකවූ; අණණ, කාම ච්ඡන්දාදී නය රහිතවූ; වීර, වීරයන් වහන්ස! උට්ඨෙහි, නැඟී සිටිනු මැනවි; ලොකෙ, ලොකයෙහි; විචර, චාරිකා වශයෙන් හැසිරෙණු මැනවි; භගවා, භාග්‍යවත් තෙමේ; ධම්මං, ධර්මය; දෙසස්සු, දෙසනු මැනවි; අඤ්ඤාතාරො, ධර්මය දැනගන්නෝ; භවිස්සන්ති, වන්නාහ.

12 බ්‍රහ්මෙ, එම්බා බ්‍රහ්මය; විහිංස සඤ්ඤී, කායවාක් කලම්ථ සංඥ ඇත්තෙම්; මනුජෙසු, සත්වයන් විෂයයෙහි; පගුණං, ප්‍රගුණ වූ; පණීතං ධම්මං, උතුම් ධර්මය; න භාසිං, නො කීයෙමි; තෙසං,

13 සබ්බා'භිභූ සබ්බවිදූහමස්මි–සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො–සයං අභිඤ්ඤාය
කමුද්දිසෙය්‍යං

14 න මෙ ආචරියො අත්ථි–සදිසො මෙ න විජ්ජති
සදෙවකස්මිං ලොකස්මිං–නත්ථි මෙ පටිපුග්ගලො

15 අහං හි අරහා ලොකෙ–අහං සත්ථා අනුත්තරො
එකොම්හි සම්මා සම්බුද්ධො–සීතිභූතො'ස්මි නිබ්බුතො

---

ඒ සත්වයන්ට; අමතස්ස ද්වාරා, අමෘත ද්වාරයෝ; අපාරුතා, විවෘත යහ; යෙ, යම්කෙනෙක්; සොතවන්තො, ඇසීමට කන් ඇත්තෝ වෙත් ද හෙවත් අසනු කැමති වෙත්ද; (ඉච්ඡු) සද්ධං, ශ්‍රද්ධාව; පමුඤ්චන්තු, එලවත්වා

13. සබ්බෙසු ධම්මෙසු, සියලු ත්‍රෛභූමික ධර්මයන්හි; අනූපලිත්තො, කෙලෙස් වශයෙන් නොතැවරුණාවූ; සබ්බඤ්ජහො, සියලු ත්‍රෛභූමික ධර්ම දුරුකළාවූ; තණ්හක්ඛයෙ, තෘෂ්ණාක්ෂය සංඛ්‍යාත නිර්වාණයෙහි; විමුත්තො, අරමුණු වශයෙන් මිදුනාවූ; සබ්බා'භිභූ, සියලු ත්‍රෛභූමික ධර්මයන් මැඩ පවත්වමින් සිටියාවූ; අහං, මම; සබ්බවිදූඅස්මි, සියලු චාතුර්භූමික ධර්මයන් දත්තෙක්වෙමි; සයං, තෙමේ; අභිඤ්ඤාය; විශිෂ්ට ඥානයෙන් දැන; කං, කවරෙක්; උද්දිසෙය්‍යං, ඇදුරු ලෙස උදෙසම් ද?

14. මේ, මට; ආචරියො, ලොකොත්තර ධර්මාචාර්යයෙක්; නඅත්ථි, නොමැත; මෙ, මට; සදිසො, තුල්‍යයෙක්; නවිජ්ජති, විද්‍යමාන නො වෙයි; සදෙවකස්මිං ලොකස්මිං, දෙවියන් සහිත ලොකයෙහි; මෙ, මට; පටිපුග්ගලො, ප්‍රතිභාග පුද්ගලයෙක්; නත්ථි, නැත.

15. ලොකෙ, ලොකයෙහි; අහංහි, මම ම; අරහා, රහත්වෙමි; අහං, මම; අනුත්තරො, නිරුත්තරවූ; සත්ථා, ශාස්තෘ වෙමි; සීතිභූතො අස්මි, කෙලෙස් ගිනි නිවීමෙන් සිසිල් වූයේ වෙමි; නිබ්බුතො, එහෙයින්ම නිවුනේ වෙමි, එකො, අසහායවූ; සම්මාසම්බුද්ධො අම්හි, චතුස්සත්‍ය ධර්මය; ස්වයම්භූ ඥානයෙන් අවබොධකළ හෙයින් සම්‍යක්සම්බුද්ධ වෙමි,

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව

16. ධම්මචක්කං පවත්තෙතුං-ගච්ඡාමි කාසිනං පුරං
අන්ධභූතස්මිං ලොකස්මිං-ආහඤ්ඤං අමත දුන්දුභිං

17. මාදිසා වෙ ජිනා හොන්ති-යෙ පත්තා ආසවක්ඛයං
ජිතා මෙ පාපකා ධම්මා-තස්මාහං උපකා! ජිනො

18. බද්ධො'සි සබ්බපාසෙහි-යෙ දිබ්බා යෙ ච මානුසා
මහාබන්ධන බද්ධොසි-න මෙ සමණ මොක්ඛසි

19. මුත්තොහං සබ්බපාසෙහි-යෙ දිබ්බා යෙ ච මානුසා
මහාබන්ධන මුත්තො'ම්හි-නිහතො ත්වම'සි අන්තක!

20. අන්තලික්ඛචරො පාසො-යවායං චරති මානසො
තෙන තං බාධයිස්සාමි-න මෙ සමණ මොක්ඛසි

---

16. අන්ධභූතස්මිං, අවිද්‍යාවෙන් අන්ධවූ; ලොකස්මිං, ලොක යෙහි; අමතදුන්දුභිං, අමාබෙරය; අහඤ්ඤං, ප්‍රහරණය කෙරෙමින්; ධම්මචක්කං, ධර්මචක්‍රය; පවත්තෙතුං, පැවැත්වීම පිණිස; කාසිනං පුරං, කසිරට (බරණැස් නුවර) බලා; ගච්ඡාමි, යෙමි

17. උපකා, උපකාජීවකයෙනි; යෙ, යම් කෙනෙක් තුමූ; ආසවක්ඛයං, නිවණට; පත්තා, පැමිණියාහු වෙත්ද; වෙ, ඒකාන්තයෙන්; මාදිසා, එබඳු මා වැන්නෝ; ජිනා හොන්ති, ජින නම් වෙත්; මෙ, මා විසින්; පාපකා ධම්මා, පාපධර්මයෝ; ජිතා, දිනන ලදහ; තස්මා, එහෙයින්; අහං, මම; ජිනො, "ජින" නම් වෙමි.

18. දිබ්බා, දිව්‍යමයවූ; යෙ, යම් රාගපාසයෝ වෙත් ද; මානුසා මනුෂ්‍යමයවූ, යෙච, යම් කාමපාසයෝ වෙත් ද; සබ්බපාසෙහි, ඒ සියලු මලපත්වලින්; බද්ධො අසි, බැඳුනේ වෙහිය; මහා බන්ධන බද්ධො අසි, මහත් රාගබන්ධනයෙන් බැඳුනේ වෙහිය; සමණ, ශ්‍රමණය; මෙ, මාගේ පාසයෙන්; නමොක්ඛසි, නුඹ නොමිදෙන් නෙහිය.

19. අහං, මම; යෙ දිබ්බා, යම් දිව්‍යමය රාගපාසයෝ වෙත් ද යෙ ච මානුසා, යම් මනුෂ්‍යමය රාගපාසයෝ වෙත් ද; සබ්බපාසෙහි ඒ සියලු පාසයන් කෙරෙන්; මුත්තො, මිදුනේ වෙමි; මහා බන්ධන මුත්තොඅම්හි, තෘෂ්ණා නැමැති මහත්වූ බැම්මෙන් මිදුනේ වෙමි; අන්තක, එම්බා පාපීවූ මාරය; ත්වං, තා; නිහතො අසි, නටුනේ වෙහිය

20. අන්තලික්ඛචරො, අහසෙහි හැසිරෙන්නන් පවා බඳනා සුලු හෙයින් 'අන්තලික්ඛචර' නම්වූ; යො අයං පාසො, යම් මේ රාග පාසයක් තෙමේ; මානසො, චිත්ත සම්ප්‍රයුක්තවූයේ; චරති,

21. රූපා සද්දා රසා ගන්ධා–ඵොට්ඨබ්බා ච මනොරමා
එත්ථ මෙ විගතො ඡන්දො නිහතො ත්වමසි අන්තක!

22. බන්ධොසි මාරපාසෙහි–යෙ දිබ්බා යෙච මානුසා
මාරබන්ධන බන්ධොසි–න මෙ සමණ මොක්ඛසි

23. මුත්තොහං මාරපාසෙහි–යෙ දිබ්බා යෙච මානුසා
මාරබන්ධන මුත්තොම්හි–නිහතො ත්වමසි අන්තකා'ති

24 නෙරඤ්ජරායං භගවා=උරුවෙලකස්සපං ජටිලමවොච
සචෙ තෙ කස්සප අගරු–විහරෙමු අජ්ජුණ්හො අග්ගිසරණම්හි

25 නඛො මෙ මහා සමණගරු–ඵාසුකාමොව තං නිවාරෙමි
චණ්ඩෙ'ත්ථ නාගරාජා–ඉද්ධිමා ආසිවිසො ඝොරවිසො
සො තං මා විහෙඨෙසී ති

---

හැකිවේද; තෙන, එයින්; න , නා; බාධයිස්සාමි, පෙළමි, සමණ, ශ්‍රමණය; මෙ, මාගේ විෂයයෙන්; න මොක්ඛසි, නුඹ නො මිදෙන්නෙහිය

21. රූපා, ඉෂ්ටවූරූපයෝය; සද්දා, ඉෂ්ටවූ ශබ්දයෝය; රසා, රසයෝය; මනොරමා, චිත්තාභිරාමවූ; ඵොට්ඨබ්බා, ස්පර්ශයෝය; (යන) එත්ථ, මෙහි; මෙ, මාගේ; ඡන්දො, නෙහසිය තෘෂ්ණාව, විගතො, පහවූයේය; අන්තක, මාරය; ත්වං, තෝ; නිහතො අසි, නැසුනෙහිය; හෙවත් මාගෙන් තෝ පැරදුනෙහිය.

22, මාරපාසෙහි; මාරමල පුඩුවලින්; මාරබන්ධන, මර බැම් මෙන්–සෙස්ස 18 හා සම යි

23. මාරපාසෙහි, මර මලපුඩුවලින්; මාරබන්ධන, මර බැම් මෙන්–සෙස්ස–19 මෙනි

24. නෙරඤ්ජරායං, පිරිසිදු ජලය ඇතිහෙයින් 'නෙරඤ්ජරා' නම් වූ නදිය සමීපයෙහිදී; භගවා, භාග්‍යවතුන් වහන්සේ; උරුවෙල කස්සපං ජටිල , උරුවෙල් කසුප් දූළිල්ලාට; අවොච, මෙසේ විදාළසේක; කස්සප, කාශ්‍යපය; සචෙ, ඉදින්; තෙ, නුඹට; අගරු, නො බර නම්; අජ්ජුණ්හා, අදදවස; අග්ගිසරණම්හි, ගිනිහල් ගෙයි; විහරෙමු, වාසය කරමු.

25 මහා සමණ, මහ ශ්‍රමණය; මෙ, මට; න ඛො ගරු, බර නොවෙයි; එත්ථ, මෙහි; චණ්ඩො, සැඩවූ; ඉද්ධිමා, සෘද්ධි ඇත්තාවූ; ආසීවිසො, වහා පැතිරෙණ විෂ ඇති; ඝොරවිසො, කෲර

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

26. අප්පෙව මං න විහෙඨෙය්‍ය-ඉච්ඡ ත්වං කස්සප අනුජානාහි
අග්‍යාගාරං
දින්නන්ති නං විදිත්වා-අසම්භීතො පාවිසි භය මතීතො
27. දිස්වා ඉසිං පවිට්ඨං-අහිනාගො දුම්මනො පධූපායි
සුමන ම නසො අධිමනො-මනුස්සනාගො'පි තත්ථ පධූපායි
28. මක්ඛඤ්ච අසහමානො-අහිනාගො පාවකො'ව පජ්ජලි
තෙජොධාතුසු කුසලො- මනුස්ස නාගො'පිතත්ථ පජ්ජලි
29. උභින්නං සජොතිභූතානං-අග්‍යා'ගාරං උදිච්චරෙ ජටිලා
අභිරූපො වත භො මහා සමණො-නාගෙන
විහෙඨීය'තීති භණන්ති

---

විෂ ඇති; නාගරාජා, නා රජෙක්; (වෙසෙයි) සො, හෙතෙම; තං, නුඹ; මා විහෙඨෙසී'ති, නො පෙළාවයි; ඵාසුකාමොව, නුඹට පහසු කැමැත්තේ ම; තං, නුඹ, නිවාරෙමි, වළක්වමි.

26 මං, මා; න විහෙඨෙය්‍ය, ඒ නාගරාජතෙම නොවෙහෙසන්නේ නම්; අප්පෙව නාම, ඉතා යෙහෙකි; ඉච්ඡ, එබැවින්; කස්සප, කාශ්‍යපය, ත්වං, නුඹ; අග්‍යාගාරං, ගිනිහල්ගෙය; අනුජානාහි, අනුදනුව; තං, එය, දින්නං ඉති, දෙනලදැයි; විදිත්වා, දැන; අසම්භීතො, නිර්භයවූයේ; භයං අතීතො, ඉක්ම වූ බිය ඇත්තේ; පාවිසි, (බුදුහු ගිනිහලට) වැඩි සේක.

27 අහිනාගො, සර්ප නාගතෙමේ; පවිට්ඨං, පිවිසියාවූ; ඉසිං බුද්ධර්ෂීන් වහන්සේ; දිස්වා, දැක; දුම්මනො, ක්‍රොධයෙන් දූෂිත සිත් ඇත්තේ; පධූපායි, විෂධූම හෙළීය; සුමන මනසො, සතුටු සිත් ඇති; අධිමනො, අධිචිත්තවත් වූ; මනුස්ස නාගො අපි, මනුෂ්‍ය නාගයන් වහන්සේද; තත්ථ, එහි; පධූපායි, ප්‍රධූපනය කළසේක.

29. අහිනාගො, සර්පනාග තෙමේ; මක්ඛඤ්ච, කොපයද; අසහමානො, නොඉවසන්නේ; පාවකොඉව, ගින්නක් මෙන්; පජ්ජලි, දිලිසුනේය, තත්ථ, එතැන්හිදී; තෙජොධාතුසුකුසලෙ, තෙජොධාතු සමාපත්තියෙහි දක්ෂවූ; මනුස්සනාගො අපි, මිනිස්නා ශ්‍රෙෂ්ඨතෙමේ ද; පජ්ජලි, දිලිසුනේය.

29 සජොතිභූතානං, හට්ගත් බැබලීම් ඇති; උභින්නං, දෙදෙනාගෙන්; (ආලොකවූ) අග්‍ය ගාරං, ගිනිහල්ගෙය; (දැක)

30. අථ රත්තියා අච්චයෙන-අග්ගි නාගස්ස අච්චියො න හොන්ති
ඉද්ධිමතො පන්නු ඨිතා-අනෙකවණ්ණා අච්චියො හොන්ති

31. නීලකා අථ ලොහිතිකා මඤ්ජෙට්ඨා පීතිකා ඵලිකවණ්ණායො
අඞ්ගීරසස්ස කායෙ-අනෙකවණ්ණා අච්චියො හොන්ති

32. පත්තම්හි ඔදහිත්වා-අග්ගි නාගං බ්‍රාහ්මණස්ස දස්සෙසි
අයං තෙ කස්සප නාගො- පරියාදින්නො අස්ස
තෙජසා තෙජො'ති

33. භගවතො අධිට්ඨානෙන-පඤ්ච කට්ඨසතානි න ඵාලියිංසු
ඵාලියිංසු අග්ගි න උජ්ජලිංසු- උජ්ජලිංසු නවිජ්ඣායිංසු

---

ජටිලා, ජටිලයෝ; උදිච්චමරෙ, මෙසේ කියන්නාහ. වත, ඒකාන්ත යෙන්ම; අභිරූපො, විශිෂ්ටරූප ඇත්තාවූ; භො සමණො, පින්වත් ශ්‍රමණතෙමේ; නාගෙන, නාගයා විසින්; විහෙඨිය තීඉති, වෙහෙසනු ලැබේ යයි; භණන්ති, කියත්

30. අථ, නැවත; රත්තියා අච්චයෙන, රෑ ඉකුත්වීමෙන්; අග්ගිනාගස්ස, සර්ප නාගයාගේ; අච්චියො, කාන්තීහු; නහොන්ති, නොවෙත්; ඉද්ධිමතො, සෘද්ධිමත්වූ බුදුරජාණන් වහන්සේගේ ශරීරයෙන්; උඨිතා, නැගී සිටියාවූ; අනෙකවණ්ණා, නොයෙක් වර්ණයෙන් යුත්; අච්චියො, රශ්මී; හොනති, වෙත්.

31. අඞ්ගීරසස්ස, සර්වඥයන් වහන්සේගේ; කායෙ, ශ්‍රී ශරීරයෙහි; නීලකා, නීලවර්ණවූද; අථ, යලි; ලොහිතිකා, රක්තවර්ණවූ ද; පීතිකා, පීතවර්ණවූ ද; මඤ්ජෙට්ඨා, මදටියවන්වූ ද; ඵලිකවණ්ණායො, ස්ඵටිකමණි වර්ණවූද; අනෙකවණ්ණා, මේ නොයෙක් වර්ණයෙන් යුත්; අච්චියො හොන්ති, රශ්මීහු වෙති.

32. කස්සප, කාශ්‍යපය; තෙ, තාගේ; අයං නාගො, මේ නාගයායි; පත්තම්හි ඔදහිත්වා, පාත්‍රයෙහි බහා; අග්ගිනාගං, සර්පයා; බ්‍රාහ්මණස්ස, බමුණාහට; දස්සෙසි, දැක්වූයේය; තෙජසා, මා තෙදින්; තෙජො, ඔහුතෙද; පරියාදින්නො අස්ස, අභිභවනය කරණ ලද්දේ වන්නේය; (භවත්) තෙජසා, මා තෙදින්; අස්ස, ඔහුගේ; තෙජො, තෙද; පරියාදින්නො, විනාශිතය.

33. භගවතො අධිට්ඨානෙන, භාග්‍යවතුන් වහන්සේගේ අධිෂ්ඨානයෙන්; පඤ්චකට්ඨසතානි, කාෂ්ට පන්සියයක්; නඵාලියිංසු නොපැළුනාහ; ඵාලියිංසු කාෂ්ට පන්සියයක් පැළුනාහ; අග්ගි,

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව

34. විජ්ඣායිංසු පඤ්ච-මන්දාමුඛිසතානි අභිනිම්මිනී
එතෙන නයෙන-අඩ්ඪුඩ්ඪපාටිහාරිය සහස්සානි හොන්ති

35. කිමෙව දිස්වා උරුවෙලවාසි-පහාසි අග්ගිං කිසකොවදානො
පුච්ඡාමි තං කස්සප එතමත්ථං-කථං පහීණං තව
අග්ගිහුත්තන්ති

36 රූපෙ ච සද්දෙ ච අථො රසෙ ච-කාමිත්ථියො චාභිවදන්ති යඤ්ඤා
එතම්මලං උපධීසු ඤත්වා-තස්මා න යිට්ඨෙ න හුතෙ අරඤ්ජින්ති

37 එත්ථ ච තෙ මනො න රමිත්ථ කස්සපාති (භගවා)
රූපෙසු සද්දෙසු අථො රසෙසු
අථ කො චරහි දෙවී මනුස්ස ලොකෙ
රතො මනො කස්සප බ්‍රූහි මෙ තන්ති

---

ගිනි; නඋජ්ජලිංසු, නොඇවුලුනාහ; උජ්ජලිංසු, ඇවිලුනාහු නවිජ්ඣායිංසු, නොනිවුනාහ.

34 විජ්ඣායිංසු, එය ම නිවුනාහ; පඤ්චමන්දාමුඛීසතානි, පන්සියයක් ගිනිබඳුන්; අභිනිම්මිනි, නිර්මිත වී; එතෙන නයෙන, මේ ක්‍රමයෙන්; අඩ්ඪුඩ්ඪපාටිහාරිය සහස්සානි, තුන්දහස් පන්සියයක් ප්‍රාතිහාර්‍ය්‍යයෝ; හොන්ති, වෙත්.

35 උරුවෙලවාසි, උරුවෙල්වැසි දුළුල්ල; කිසකොවදානො, තපොචර්‍ය්‍යා හෙතුවෙන් කෘශය යි ලබනලද නම්ඇති තවුසන්ට අවවාද කරණ සුලුවූ; තෙ හොත්; කිසකො, තෙමේ තපසින් කෘශවූයේ; වදානො, මෙරමා අවවාද කරන්නේ; කිං, කුමක්; දිස්වා, දැක; අග්ගි, ගිනිපිදීම; පහාසි, දුරුකෙළෙහිද; කස්සප, කාශ්‍යපය; තව, තාගේ; අග්ගිහුත්තං, අගනිහොමය; කථං, කුමක් හෙතු කොට ගෙණ; පහීණං, ප්‍රහීණදැයි; තං, තා; පුච්ඡාමි විචාරමි.

36. රූපෙච, රූපයන්ද; සද්දෙ ච, ශබ්දයන්ද; අථ, වැළි; රසෙ ච, රසයන්ද; ඉත්ථියො, ස්ත්‍රීන්ද; නෙවත් සපශියන්ද යන මොහු (කාමනම්) කාමා, මේ කාමයෝ; යඤ්ඤා, යාගයෝයයි; අභිවදන්ති, කියත්; නෙවත් රාගහෙතු සම්බන්ධ කෙරෙති; එතං, මේ කාම ප්‍රභෙදය; උපධීසු, බන්ධොපධීන්හි; මලංඉති, කිලුටයයි; ඤත්වා දැන; තස්මා, එහෙයින්; යිට්ඨෙ, යාගයෙහි; න අරඤ්ජිං, නො ඇලුනෙම්; හුතෙ, හෝමය; න අරඤ්ජිං, අභිරමණය නොකෙළෙම්.

37. භගවා, භාග්‍යවතුන් වහන්සේ: ඉති, මෙසේ වදාරණසේක; කස්සප, කාශ්‍යපය; රූපෙසු, රූපයන්හිද; අථ, නැවත;

31. දිස්වා පදං සන්තමනූපධිකං-අකිඤ්චනං කාමභවෙ අසත්තං
අනඤ්ඤථාභාවී මනඤ්ඤනෙය්‍යං-තස්මා න යිඨෙ
න හුතෙ අරඤ්ජි නාහි

39. දන්තො දන්තෙහි සහ-පුරාණ ජටිලෙහි විප්පමුත්තො
විප්පමුත්තෙහි
සිඞ්ගීනික්ඛසවණ්ණො-රාජගහං පාවිසි භගවා

40. සන්තො සන්තෙහි සහ-පුරාණ ජටිලෙහි විප්පමුත්තො
විප්පමුත්තෙහි
සිඞ්ගීනික්ඛසවණ්ණො-රාජගහං පාවිසි භගවා

---

සද්දෙසු, ශබ්දයන්හිද; රසෙසු, රසයන්හිද; යන; එව්, මෙහි; මෙ, මාගේ; මනො, සිත; න රමිඵ්, නොඇලුණේය; අථ, එකල්හි දෙවමනුස්සලොකෙ, දෙව්මිනිසුන් සහිත ලොකයෙහි; කො, කව රෙක් හෝ කොතැන්හි; වරති, දන්' මනො, සිත; රතො, ඇලු නේද; කස්සප, කාශ්‍යපය: එතං, මෙය; බ්‍රෑහි, කියව.

39. සන්තං සන්සුන් ස්වභාව ඇති හෙයින් ශාන්තවූ; අනූප ධිකං, කාමාදී උපධි රහිත හෙයින් අනුපධිකවූ; අකිඤ්චනං, රාගාදී පලිබොධ රහිතවූ, කාමභවෙ, කාම ලොකයෙහි; අසත්තං, නො ඇලුනාවූ; අනඤ්ඤථාභාවී, ජාති ජරා මරණාදියක් නැති හෙයින් අන්‍යථාභාවයක් නැත්තාවූ; අනඤ්ඤනෙය්‍යං, අනිකෙකු විසින් නො පැමිණ විය හැකි බැවින් තමා විසින් භාවිත මාර්ගයෙන්ම අධිගන්තව්‍යවූ; පදං, නිර්වාණ පදය; දිස්වා, දැක; තස්මා, එහෙයින්; යිඨෙ, යාගයෙහි ද; හුතෙ, හෝමයෙහිද; න අරඤ්ජිං, නොඇලු නෙමි·

39. දන්තො, දාන්තවූ හෙවත් චක්ෂුරාදී ඉන්ද්‍රියයන් දමනය කළාවූ; විප්පමුත්තො, කෙලෙසුන් කෙරෙන් මිදුනාවූ; සිඞ්ගී නික්ඛසවණ්ණො, සිඞ්ගී නම් ස්වර්ණයෙන් කළ නිෂ්කයකට බඳු ශරීර වර්ණ ඇති; භගවා භාග්‍යවතුන් වහන්සේ; දන්තෙහි, දා න්තවූ; විප්පමුත්තෙහි, කෙලෙසුන් කෙරෙන් මිදුනාවූ; පුරාණ ජටිලෙහි සහ, පරණදුළුල්ලන් සමග; රාජගහං, රජගහ නුවරට; පාවිසි, වැඩිසේක.

40. සන්තො, කෙලෙසුන් කෙරෙන් නිවී හෙයින් ශාන්තවූ;

## සුජනප්පමොදනී

41\. මුත්තො මුත්තෙහි සහ-පුරාණ ජටිලෙහි විප්පමුත්තො විප්පමුත්තෙහි
සිඞ්ගීනික්ඛසවණ්ණො-රාජගහං පාවිසි භගවා

42\. තිණ්ණො තිණ්ණෙහි සහ-පුරාණ ජටිලෙහි-විප්පමුත්තො විප්පමුත්තෙහි
සිඞ්ගීනික්ඛසවණ්ණො-රාජගහං පාවිසි භගවා

43\. යො ධීරො සබ්බධී දන්තො-සුද්ධො අප්පටිපුග්ගලො
අරහං සුගතො ලොකෙ-තස්සාහං පරිචාරකො

44\. දසවාසො දසබලො-දසධම්මවිදූ දසහි චුපෙතො
සො දසසත පරිවාරො-රාජගහං පාවිසි භගවා,

45\. අප්පං වා බහුං වා භාසස්සු-අත්ථඤ්ඤෙව මෙ බ්‍රෑහි
අත්ථෙනෙව මෙ අත්ථො-කිං කාහසි බ්‍යඤ්ජනං බහුන්ති

---

41 මුත්තො, සසරින් මිදුනාවූ;-පෙ-

42\. තිණ්ණො, චතුරොඝය තරණය කළාවූ; සෙසු අර්ථ 39 කී නියායෙන් යොදුගත යුතුයි.

**43**. යො ධීරො, යම් ධෘතිසම්පන්නයෙක් තෙමේ; සබ්බධී, සියලු **ස්කන්ධායතනයන්හි**; නොහොත් චක්ෂුරාදි සියලු ඉන්ද්‍රිය ගොචරවාරයෙහි; දන්තො, දමුනේ; සුද්ධො, එහෙයින්ම, පරිශුද්ධ ද; අප්පටිපුග්ගලො, තමා හා ප්‍රතිභාග පුද්ගලයෙකු අවිද්‍යමාන හෙයින් අප්‍රතිපුද්ගල ද; ලොකෙ, ලෙව්හි; අරහං, රහත්වූ සුගතො, සුගතයන් වහන්සේ කෙනෙක් වෙත් ද; තස්ස, ඒ බුදුරජාණන්වහන්සේගේ; අහං, මම; පරිචාරකො, කිඞ්කර මෙහෙකරුවෙක් වෙමි.

**44**. දසවාසො, දශවිධ ආයඝීවාස ඇති; දසබලො, දශවිධ කායබලයක් හා ඥානබලයක් ඇති; දසධම්මවිදූ, දශවිධ කර්මපථ දන්නාවූ; දසහි උපෙතො, දසවිධ අසෙඛ ධර්මයන්ගෙන් යුක්තවූ; දසසතපරිවාරො, දහසක් පිරිවර ඇති; සො භගවා, ඒ භාග්‍යවතුන්වහන්සේ; රාජගහං, රජගහ නුවරට; පාවිසි, පිවිසිසේක.

**45**. අප්පං වා, **සවල්පවූ** හෝ; බහුං වා, බොහෝවූ හෝ; අත්ථං එව, අර්ථයම; මෙ, මට; බ්‍රෑහි, කියව; මෙ, මට; අත්ථෙන එව, අර්ථයෙන්ම; අත්ථො, ප්‍රයොජන වෙයි; බ්‍යඤ්ජනං බහුං, ව්‍යඤ්ජන සමූහය තෙම; කිං කාහසි, කුමක් කෙරේද;

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

46. යෙ ධම්මා හෙතුප්පභවා–තෙසං හෙතුං තථාගතො ආහ
තෙසඤ්ච යො නිරොධො–එවං වාදී මහාසමණො'ති,

47. එසෙව ධම්මො යදි තාව දෙව–පච්චබ්‍යථා පදමසොකං
අදිට්ඨං අබ්භතීතං–බහුකෙහි කප්පනහුතෙහිති,

48. අප්පං වා බහුං වා භාසස්සු–අත්ථඤ්ඤෙව මෙ බ්‍රෑහි
අත්ථෙනෙව මෙ අත්ථො–කිං කාහසි බ්‍යඤ්ජනං බහුන්ති,

49. යෙ ධම්මා හෙතුප්පභවා–තෙසං හෙතුං තථාගතො ආහ
තෙසං ච යො නිරොධො–එවං වාදී මහාසමණොති,

50. ගම්භීරෙ ඤාණවිසයෙ–අනුත්තරෙ උපධි සඞ්ඛයෙ
විමුත්තෙන අප්පත්තෙන වෙඨවනං–අථ තෙ සත්ථා බ්‍යාකාසි,

---

46 යෙ ධම්මා, යම් ධර්මකෙනෙක්; හෙතුප්පභවා, හෙතුව ප්‍රභවකොට ඇත්තාහුද හෙවත් තෘෂ්ණාමූලක පඤ්චස්කන්ධදුඃඛයෝ වෙත්ද; තෙසං, ඔවුන්ගේ; හෙතුං, හෙතු නම්වූ අවෛරාසියක් ප්‍රභෙද තෘෂ්ණාසංඛ්‍යාත සමුදයද; තථාගතො, තථාගත තෙමේ; ආහ, වදාළසේක; තෙසං, ඔවුන්ගේ; යො නිරොධො, යම් අප්‍රවෘත්ත නිරුද්ධිය හා නිරොධොපායයද; (නය වශයෙන් අෂ්ටාර්ය මාර්ගයද) ප්‍රකාශකළසේක; මහාසමණො, මහාශ්‍රමණ තෙමේ; එවං වාදී, මෙබඳු වාද ඇතිසේක නොහොත් මෙබඳු චතුරාර්ය සත්‍ය ධර්මය ප්‍රකාශකරණසේක;

47. යදි, ඉදින්; තාවදෙව, එකෙණෙහිම අවබොධ කටයුතුවූ; එසො එව ධම්මො, මේ ශ්‍රොතආපත්තිඵල මාත්‍රයක් වෙයි; බහුකෙහි, බොහෝවූ; කප්පනහුතෙහි, කල්ප නහුතයකින්ත්; (කොටිප්‍රකොටි ශතසහස්‍ර ශතයක් නහුත නම්) අදිට්ඨං, අපවිසින් නොදක්නා ලද්දවූ: අබ්භතීතං, එහෙයින්ම ඉක්ම ගියාවූ; (මින් මහත් පිරිහිම දක්වනලදි) අසොකං පදං, නිර්වාණ පදය; පච්චබ්‍යථ, ප්‍රතිවෙධකළාහුය;

48–49–මෙහි අර්ථ 45–46 වෙනි ගාථාවන් බලාදතයුතුයි.

5). ගම්භීරෙ ඤාණවිසයෙ, ගැඹුරු නුවණට ගොදුරුවූ; අනුත්තරෙ, නිරුත්තරවූ; උපධිසඞ්ඛයෙ, පංචොපධික්ෂය සංඛ්‍යාත නිර්වාණයෙහි; විමුත්තෙන, මිදුනාවූ; නොහොත් නිවන් අරමුණු

51. එතෙ වෙ සහායා - ආගච්ඡන්ති කොලිතො උපතිස්සො ච
එතං මෙ සාවකයුගං භවිස්සති - අග්ගං භද්‍ද යුගන්ති,

52. ආගතො බො මහාසමණො - මගධානං ගිරිබ්බජං
සබ්බ සඤ්ජයකෙ නෙත්වා - කං සු දනි නයිස්සති,

53. නයන්ති වෙ මහාවීරා - සද්ධම්මෙන තථාගතා
ධම්මෙන නයමානානං - කා උසූයා විජානතන්ති

54 ආගතො බො මහාසමණො - මගධානං ගිරිබ්බජං
සබ්බ සඤ්ජයකෙ නෙත්වා - කං සු දනි නයිස්සති.

55. නයන්ති වෙ මහාවීරා - සද්ධම්මෙන තථාගතා
ධම්මෙන නයමානානං - කා උසූයා විජානතන්ති,

---

කොට කෙලෙසුන්ගෙන් මිදුනාවූ; නෙ, ඒ ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනයන්; වෙළුවනං, වෙළුවනයට; අප්පත්තෙ, නොපැමිණිකල්හි; සත්ථා, ශාස්තෲන් වහන්සේ; බ්‍යාකාසි, මෙසේ ප්‍රකාශ කළසේක;

51. කොලිතො, කොලිතය; උපතිස්සො, උපතිෂ්‍යය යන; එතෙ වෙ සහායා, මේ යහළුවෝ දෙදෙන ආගච්ඡන්ති, එත්; එතං, තෙල දෙදෙන; මෙ, මාගේ අග්ගං, ශ්‍රෙෂ්ඨවූ; භද්‍දයුගං, සුන්‍දර යුග්මයවූ; සාවකයුගං භවිස්සති, ශ්‍රාවක යුග්මය; වන්නේය.

52. මහාසමණො, මහා ශ්‍රමණතෙමේ; සබ්බ සඤ්ජයකෙ, සඤ්ජය පිරිසෙහිවූ සියල්ලන්ම; නෙත්වා, තමා වෙත පමුණුවා ගෙණ; මගධානං, මගධ ජනපදයෙහිවූ; ගිරිබ්බජං, පර්‍වතයෙන් හාත්පස ගාලක්මෙන් වටවතිබෙන හෙයින් ගිරිව්‍රජ නම්වූ; නුවරට; ආගතොබො, ආයේය; ඉදනි, දූන්; කංසු නාම, කවරෙක් නම්; නයිස්සති, පමුණුවාද?

53. මහාවීරා, මහාවීරයෝවූ; තථාගතා, තථාගතයන් වහන්සේලා; වෙ, එකාන්තයෙන්; සද්ධම්මෙන, සද්ධර්මයෙන්; නයන්ති විනෙය ජනයා නිවන් පමුණුවත්; විජානතං, ශික්ෂාවිධි දන්නාවූ; ධම්මෙන, ධර්මයවූ පරිද්දෙන්; නයමානානං, දනා නිවණට පමුණුවනකල්හි නොහොත් පමුණුවන්නන් කෙරෙහි; කා උසූයා නොපවැත්නවුන්ගේ කවර ඊෂ්‍යාවක්ද;

54–55–පූර්‍වොක්ත පරිදිම අභියොජනාව කටයුතුයි;

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

56. නෙක්ඛම්මං අධිමුත්තස්ස-පවිවෙකඤ්ච චෙතසො
අබ්‍යාපජ්ඣාධිමුත්තස්ස-උපාදානක්ඛයස්ස ච

57. තණ්හක්ඛයා'ධිමුත්තස්ස-අසම්මොහඤ්ච චෙතසො
දිස්වා ආයතනුප්පාදං-සම්මා චිත්තං විමුච්චති

58. තස්ස සම්මා විමුත්තස්ස-සන්තචිත්තස්ස භික්ඛුනො
කතස්ස පතිචයො නත්ථි-කරණීයං න විජ්ජති

59. සෙලො යථා එකඝනො-වාතෙන න සමීරති
එවං රූපා රසා සද්දා-ගන්ධා ඵස්සා ච කෙවලා

---

56. නෙක්ඛම්මං, කෙලෙසුන් කෙරෙන් නික්මීමවූ නෛෂ්ක්‍රම්‍යය; අධිමුත්තස්ස, අවබොධ කොට සිටියාවූ; චෙතසො, චිත්තයාගේ පවිවෙකඤ්ච, කෙලෙසුන්ගෙන් වෙන්වීමවූ ප්‍රකෂී විවෙකයද අවබොධකොට සිටියාවූ; අබ්‍යාපජ්ඣාධිමුත්තස්ස, අව්‍යාපාදභාවය අවබොධ කොට සිටියාවූ; උපාදානක්ඛයස්ස ච, උපාදානයන්ගේ ක්ෂයභාවය අවබොධ කොට සිටියාවූ;

57. තණ්හක්ඛයා'ධි මුත්තස්ස, තෘෂ්ණාක්ෂය දැන සිටියාවූ; චෙතසො, චිත්තයාගේ; අසම්මොහං, නුමුළාබව දැන සිටියාවූ; (උත්තම පුද්ගලයානට) ආයතනුප්පාදං, ආයතනයන්ගේ උත්පත්තිය; දිස්වා, දැක; සම්මා, මනාකොට; චිත්තං, සිත, විමුච්චති, කෙලෙසුන් කෙරෙන් මිදෙයි.

68. සම්මාවිමුත්තස්ස, අර්හත්මාර්ගයෙන් මොනවට මිදුනාවූ; සන්තචිත්තස්ස, කෙලෙසුන් සන්සුන් සිත් ඇත්තාවූ; තස්ස භික්ඛුනො, ඒභික්ෂුවවිසින්; (නොහොත්)ඒ භික්ෂුවට; කරණීයං, උපාදානයන්ගේ ව්‍යයීභාවය පිණිස නැවත කටයුත්තෙක්; නත්ථි, නැත; කතස්ස, කරණලද්දහුගේ; පතිචයො, නැවත නැවත කිරීමෙක්; නත්ථි, නැත්තේයි.

59. එකඝනො, රන්ධ්‍රපටලාපගමයෙන් එකඝනවූ; සෙලො, පංසුපර්වත මිශ්‍රපර්වතයෙන් තොර ශෛලමය පර්වතයක්තෙම; යථා, යම්සේ; වාතෙන, වාතය කාරණකොටගෙණ; න සමීරති, කම්පා නොවේද; එවං, එපරිද්දෙන්ම; කෙවලා, හුදකලාවූ; රූපා, රූපයෝය; රසා, රසයෝය; සද්දා, ශබ්දයෝය; ගන්ධා, සුගන්ධයෝය; ඵස්සා ච, ස්පර්ශයෝය යන මොව්හුද;

60. ඉට්ඨා ධම්මා අනිට්ඨා ච–නප්පවෙධෙන්ති තාදිනො
ඨිතං චිත්තං විප්පමුත්තං–වයඤ්ච'ස්සානු පස්සති

61. දිස්වා ආදිනවං ලොකෙ–ඤත්වා ධම්මං නිරූපධිං
අරියො න රමතී පාපෙ –පාපෙ න රමතීසුචී'ති.

62. යො සඤ්ඤතානං පරදත්තභොජිනං–කාලෙන
සක්කච්ච දදාති යාගුං
දසස්ස ඨානානි අනුප්පවෙච්ඡති ආයුඤ්ච වණ්ණඤ්ච
සුඛං බලඤ්ච

63. පටිභාණ'මස්ස උපජායතෙ තතො–ඛුද්දං පිපාසං
බ්‍යපනෙති වාතං
සොධෙති වත්ථිං'පරිණාමෙති භුත්තං–භෙසජ්ජ'මෙතං
සුගතෙන වණ්ණිතං

---

60. ඉට්ඨා ධම්මා, මෙබඳු ඉෂ්ටාරම්මණයෝ (නොහොත්) කමනීය කාරණයෝද; අනිට්ඨා ච; අනිෂ්ටාරම්මණයෝද; තාදිනො, තාදීගුණ ඇති ක්ෂීණාශ්‍රවයන්; නප්පවෙධන්ති, කම්පා නොකෙරෙත්; ඨිතං චිත්තං, ස්ථායීවූ චිත්තයද; විප්පමුත්තං, මිදුනේය; (එබැවින්) අස්ස, ඒ චිත්තයාගේ; වයඤ්ච, විනාශයද; අනුපස්සති, දකී.

61. ලොකෙ, 'ලොක' සඞ්ඛ්‍යාත කාමවස්තුවෙහි; ආදීනවං, දෝෂය, දිස්වා, දැක; නිරූපධිං, උපධි රහිතවූ; ධම්මං, නිර්වාණ ධර්මය; ඤත්වා, දැන; පාපෙ, පාපයෙහි; අරියො, ආර්‍ය්‍යතෙමේ; නරමති, අභිරමණය නොකෙරෙයි; සුචි, පවිත්‍ර ස්වභාව ඇති තැනැත්තේ; පාපෙ, පාපයෙහි; න රමති, නොඇලෙයි.

62 යො, යමෙක්තෙමේ; සඤ්ඤතානං, සංයත චක්ඛාදිඉන්ද්‍රියයන් ඇති; පරදත්තභොජිනං, මෙරමා දුන් බත් අනුභව කරන්නාවූ; (භික්ෂූන්ට) කාලෙන, සුදුසු කාලයෙහි; සක්කච්චං, සකසා; යාගුං, හුලුකැන් (කැඳ) දදාති, දේද; (හෙතෙම) දසස්සඨානානි, දශවිධ ආනිසංසයන්; අනුප්පවෙච්ඡති, රැස්කෙරෙයි; ආයුංච, දීර්ඝායුෂද; වණ්ණංච, ශොභමාන ශරීරවර්ණයද; සුඛං, සැපයද; බලංච, කායබලයද; (ලබයි)

63. අස්ස, ඔහට; පටිභාණං, ක්ෂණික ප්‍රතිභාණය; තතො, ඒ නිමිත්තෙන්; උපජායතෙ, හටගණී; ඛුද්දං, බඩසයද; පිපාසං, පවසද; වාතං, වාතයද; බ්‍යපනෙති, පහකෙරෙයි; වත්ථිං, මූත්‍ර

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

64. තස්මා හි යාගුං අල’මෙව දාතුං–නිච්චං මනුස්සෙන සුඛත්ථිකෙන
දිබ්බානි වා පත්ථයතා සුඛානි–මනුස්ස සොභග්‍යත’මිච්ඡතා වා’ති

65. යස්මිං පදෙසෙ කප්පෙති–වාසං පණ්ඩිතජාතියො
සීලවන්තෙ’ත්ථ භොජෙත්වා–සඤ්ඤතෙ බ්‍රහ්මචාරයො

66. යා තත්ථ දෙවතා ආසුං–තාසං දක්ඛිණ’මාදිසෙ
තා පූජිතා පූජයන්ති–මානිතා මානයන්ති නං

67. තතො නං අනුකම්පන්ති–මාතා පුත්තං ව ඔරසං
දෙවතානුකම්පිතො පොසො–සදා භද්‍රානි පස්සති

---

මාර්ගය; සොධෙති, ශෝධනය කෙරෙයි; භුත්තං, වළඳනලද්ද; පරිණාමෙති, දිරවයි; එතං, මෙය; සුගතෙන, තථාගතයන්වහන්සේ විසින්; වණ්ණිතං, වර්ණනාකරණලද; භෙසජ්ජං, බෙහෙදකි.

64. තස්මා හි, එබැවින්; දිබ්බානි සුඛානි, දිව සැප; පත්ථයතා, පතන්නාවූ; මනුස්සසොභග්‍යතං, මිනිස් සුබැගිබව; ඉච්ඡතා, කැමැත්තාවූ; සුඛත්ථිකෙන, සුවකැමැත්තාවූ; මනුස්සෙන, මනුෂ්‍යයා විසින්; නිච්චං, අනවරතයෙන්; යාගුං, හුලුකැන්; දාතුං, දෙන්ට; අලං, සුදුසු වේ.

65. පණ්ඩිතජාතියො, පණ්ඩිතස්වභාව ඇත්තෙක් තෙමේ; යස්මිං පදෙසෙ, යම් පෙදෙසෙක්හි; වාසං කප්පෙති, වාසයකෙරේද එත්ථ, මෙහි; සඤ්ඤතෙ, ඉන්ද්‍රිය සංයම ඇති; බ්‍රහ්මචාරයො, ශ්‍රෙෂ්ඨචර්‍ය්‍යා ඇත්තාවූ; සීලවන්තෙ, සීලවන්තයන්; භොජෙත්වා, වළඳවා;

66. තත්ථ, ඒස්ථානයෙහි; යා දෙවතා, යම්බඳුදෙවි කෙනෙක්; ආසුං, වෙත්ද; තාසං, ඔවුන්ට; දක්ඛිණං, දක්ෂිණාව; ආදිසෙ, දෙන්නේය; තා, ඔහු; පූජිතා, පුදනලද්දාහු; පූජයන්ති, නැවත ඔහු පුදත්; මානිතා, බුහුමන් කරණලද්දාහු; මානයන්ති, ඔහුට බුහුමන් කෙරෙත්.

67. තතො, ඒහෙතුවෙන්; මාතා, මවුතොමෝ; ඔරසංපුත්තං ඉව, ඖරස පුත්‍රයෙකුට මෙන්; නං, ඔහුට; අනුකම්පන්ති, අනුකම්පා කෙරෙත්; දෙවතානුකම්පිතො, දෙවියන් විසින් අනුග්‍රහය කරණලද; පොසො, ඒ පුරුෂතෙමේ; සදා, හැමකල්හි; භද්‍රානි, ලාභසත්කාරාදී භද්‍රඉෂ්ටවිපාකයන්; පස්සති, දකියි.

68. යෙ තරන්ති අණ්ණවං සරං–සෙතුං කත්වාන විසජ්ජ පල්ලලානි
කුල්ලං හි ජනො පබන්ධති–තිණ්ණා මෙධාවිනො ජනා'ති.

69. චතුන්නං අරියසච්චානං–යථාභූතං අදස්සනා
සංසිතං දීඝමද්ධානං–තාසු තාසෙව'ව ජාතිසු

70. තානි එතානි දිට්ඨානි–භවනෙත්ති සමූහතා
උච්ඡින්නමූලං දුක්ඛස්ස–නත්ථි'දානි පුනබ්භවො'ති

71. අග්ගිහුත්තමුඛා යඤ්ඤා–සාවිත්ති ඡන්දසො මුඛං
රාජාමුඛං මනුස්සානං–නදීනං සාගරො මුඛං.

---

68. යෙ, යම්කෙනෙක්තුමූ; අණ්ණවං, යොදුන් ගැඹුරදිගපළල ඇති ජලස්ථානයන්ද; සරං, ගඞ්ගාවද; පල්ලලානි, ජලබහුල භූමීන්; විසජ්ජ, හැර; සෙතුං කත්වාන, හෙයක්කොට; තරන්ති, තරණය කෙරෙත්ද; ජනො, ඒ ලෞකික ජනතෙම; කුල්ලං, පසුර; පබන්ධති, ස්වල්පජලතරණය කරන්ටද බඳියි; මෙධාවිනො ජනා, බුද්ධාදී ප්‍රඥාවත්හු; තිණ්ණා හි; මහත්වූ සංසාර සාගරයත් තරණය කළාහුමැයි.

69. චතුන්නං අරියසච්චානං, චතුරාර්‍ය්‍යසත්‍යයන්;, යථාභූතං තතුසේ, අදස්සනා, නොදැකීමෙන්; දීඝං අද්ධානං, දීර්ඝකාලයක් මුලුල්ලෙහි; තාසුතාසු ජාතිසු එව, ඒ ඒ ජාතීන්හිම; සංසිතං, හැසිරෙණලදි.

70. තානි එතානි, ඒ මේ චතුරාර්‍ය්‍යසත්‍යයෝ; දිට්ඨානි, දක්නාලද්දුහ; භවනෙත්ති, (භවයට උත්පත්ති වශයෙන් පමුණුවන හෙයින්) "භවනෙත්තිකා" නම්ලද තෘෂ්ණාව; සමූහතා, නසනලද්දීය; දුක්ඛස්ස, වත්දුඃඛයාගේ; මූලං, මුල; උච්ඡින්නං, සිඳිනලදි; ඉදානි, දැන්; පුනබ්භවො, සසර නැවත ඉපදීමක්; නත්ථි, නැත්තේය;

71. යඤ්ඤා, යාගයෝතුමූ; අග්ගිහුත්තමුඛා, අග්නිහොමය ප්‍රමුඛකොට ඇත්තාහ; ඡන්දසො, ඡන්දශ්ශාස්ත්‍රයට; සාවිත්ති, 'සාවිත්‍රී' නම් ඡන්දස; මුඛං, ප්‍රධානයි; මනුස්සානං, මිනිසුන්ට; රාජා, රජතෙම; මුඛං, ප්‍රධානයි; නදීනං, ගඞ්ගාවන්ට; සාගරො, සයුර; මුඛං, ප්‍රධානයි

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

72\. නක්ඛත්තානං මුඛං චන්දො–ආදිච්චො තපතං මුඛං
පුඤ්ඤමාකඞ්ඛමානානං–සඞ්ඝො වෙ යජතං මුඛං

73\. යා අන්නපානං දදති පමොදිතා–සීලූපපන්නා
සුගතස්ස සාවිකා
දදති දානං අභිභුය්‍ය මච්ඡරං–සොවග්ගිකං
සොකනුදං සුඛාවහං

74\. දිබ්බං බලං සා ලභතෙ ච ආයුං–ආගම්ම මග්ගං
විරජං අනඞ්ගණං
සා පුඤ්ඤකාමා සුඛිනී අනාමයා–සග්ගම්හි
කායම්හි චිරං පමොදති

---

72\. නක්ඛත්තානං, තාරකාවන්ට; චන්දො චන්ද්‍රතෙමේ; මුඛං, ප්‍රධානයි; තපතං, බබලන්නවුන් අතුරෙන්; ආදිච්චො, සූර්‍ය්‍යතෙමේ; මුඛං, ප්‍රධානයි; පුඤ්ඤං, පින්; ආකඞ්ඛමානානං, කැමතිවන්නාවූ; යජතං, දන් දෙන්නවුන්ට; සඞ්ඝො, සඞ්ඝතෙමේ; වෙ, එකාන්තයෙන්; මුඛං, ප්‍රධානයි

73 පමොදිතා, ප්‍රමොදයට පැමිණියාවූ; සීලූපපන්නා, සීලයෙන් යුක්ත වූවාහු; සුගතස්ස, සුගතයන් වහන්සේගේ; සාවිකා ශ්‍රාවිකාවූ; යා, (විසාඛා උපාසිකා නම්) යම් ස්ත්‍රියක් තොමෝ; අන්නපානං, ආහාරපානයන්; දදති, දේද; (ඕතොමෝ) සොවග්ගිකං, ස්වර්ගය පිණිස පවත්නාවූ; සොකනුදං, ජාත්‍යාදි ශොක පහකරන්නාවූ; සුඛාවහං, දිඪධම්මික සම්පරායික සැප එලවන්නාවූ; දානං, දානය; මච්ඡරං, මාත්සර්‍ය්‍යය, අභිභුය්‍ය, විශෙෂයෙන් මැඩ, දදති, දෙයි;

74\. සා, ඕතොමෝ; දිබ්බං බලං, දිව්‍යමයබලයද; ආයුං, දිව්‍යමය ආයුෂද; ලභතෙ, ලබාමය; විරජං, රාගාදී රජස් රහිතවූ; අනඞ්ගණං, ක්ලෙශධූලිනැත්තාවූ; මග්ගං ආගම්ම, සෝවාන්මාර්ගය නිමිතිකොට ගෙණ; පුඤ්ඤකාමා, පින් කැමැත්තාවූ; සුඛිනී, නිර්වාණසුඛාභිලාෂීවූ; අනාමයා, නිරාමය වූවා; චිරං, බොහෝ කලක්; සග්ගම්හි කායම්හි, ස්වර්ගලොකයෙහි; පමොදති, පරම සුඛානුභවයෙන් සතුටුවන්නීය.

## සුජනප්පමොදනී

75. පුථුසද්දො සමජනො–න බාලො කොචි මඤ්ඤථ
සඞ්ඝස්මිං භිජ්ජමානස්මිං–නාඤ්ඤං භියෙ‍්‍යා අමඤ්ඤරුං

76. පරිමුට්ඨා පණ්ඩිතාභාසා-වාචාගොචරභාණිනො
යාවිච්ඡන්ති මුඛායාමං–යෙන නීතා න තං විදූ

77. අක්කොච්ඡි මං අවධි මං–අජිනි මං අහාසි මෙ
යෙ තං උපනය්හන්ති–වෙරං තෙසං න සම්මති

78. අක්කොච්ඡි මං අවධි මං–අජිනි මං අහාසි මෙ
යෙ තං න උපනය්හන්ති–වෙරං තෙසූ'පසම්මති

---

**75.** පුථුසද්දො, ඝ්‍රකිරීම් වශයෙන් මහත් ශබ්ද ඇත්තාවූ; සමජනො, සමාන ජනයා ඇති; (යම් කලහකාරක පිරිසක් වේද) කොචි, ඔවු'නතුරෙන් කිසිවෙක්; බාලො, මම අඥාන වෙමියි; නමඤ්ඤථ, නොසිතීය; (සියල්ලෝම පණ්ඩිතමානීහු වෙති) භියෙ‍්‍යා, වැඩියක්; සඞ්ඝස්මිං භිජ්ජමානස්මිං, සඞ්ඝයා බිඳෙන කල්හි; අඤ්ඤං, අපනිසා සඞ්ඝයා බිඳේයයි අනික් කරුණක්; අමඤ්ඤරුං, නොසිතූහ.

**76.** පරිමුට්ඨා, මුළාසිහි ඇත්තාවූ; පණ්ඩිතාභාසා, පණ්ඩිත සින්ට බඳු වචන ඇත්තාවූ; වාචාගොචරභාණිනො, සතර සති පට්ඨානාදිය නොව වාග් ගොචරවූවක් කියන්නාවූ; යාව, යම්තාක්; මුඛායාමං, මුව විදහා ලීම; ඉච්ඡන්ති, කැමැත්තාහුද; [එතෙක් බණිති, සඞ්ඝගෞරවයෙන් මුව නොහකුළුවති] යෙන, යම්කලහයෙකින්; නීතා. නිල්ලජ්ජීභාවයට පමුණුවන ලද්දාහු; තං, ඒ කාරණය; න විදූ, මෙතෙක් දොෂ ඇතැයි නොදනිති.

**77.** මං, මට; අක්කොච්ඡි, ආක්‍රොශ කෙළේයයිද [හෙවත් ජාත්‍යාදියෙන් ගටා බැන්නේයයිද] මං, මට; අවධි, අතින් පයින් පහළේයයිද; මං, මා; අජිනි, බොරු සාක්ෂි කීමාදියෙන් දිනීයයිද; මෙ, මාගේ උපභොග පරිභොග වස්තුව; අහාසි, පැහැරගත්තේයයිද යෙ, යම් ගිහිපැවිදි කෙනෙක්; තං, ඒ වෛරය; උපනය්හන්ති, (තණපිදුරු ආදියෙන් කුණුමස් වෙළන්නවුන් මෙන්) නැවත නැවත සිත බඳිත්ද; තෙසං, ඔවුන්ගේ; වෙරං, වෛරය; න සම්මති, නො සන්සිඳෙන්නේය.

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

79. නහි වෙරෙන වෙරානි-සම්මන්තී'ධ කුදාචනං
අවෙරෙන ච සම්මන්ති-එසධම්මො සනන්තනො

80. පරෙ ච න විජානන්ති-මය'මෙත්ථ යමාමසෙ
යෙ ච තත්ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා

81. *අට්ඨි'ච්ඡින්නා පාණහරා-ගවා'ස්සධන හාරිනො
රට්ඨං විලුම්පමානානං-තෙසම්පි හොති සඞ්ගති
කස්මා තුම්හා කනො සියා?

---

78. -පෙ-න උපනය්හන්ති, සිත් හිබැඳ නොපවත්වයිද; තෙසං -වෙරං-උපසම්මති, සන්සිඳෙන්නේය.

79. ඉධ, මේ සත්ත්වලොකයෙහි; වෙරානි, නවාඝාතවස්තු ජනිත වෛරයෝ; වෙරෙන, වෛරයෙන්; කුදාචනං, කිසිකලෙකත්; නහි සම්මන්ති, (කෙළ මල මූ වැකුණුතැන් ඒ කෙළ මලමූ ආදියෙන්ම සෝදා පිරිසිදුකරන්ට නොහැකිවාක් මෙන්) නොසන්සිඳෙත්; අවෙරෙන ච, වෛර නොකිරීමෙන්ම; සම්මන්ති, (කෙළ මල මූ ඈ වැකුණුතැන් පිරිසිදු ජලයෙන් සෝදා පිරිසිදුකරන්ට හැක්කාසේ) මෛත්‍රිය හෙතුකොටගෙණ සන්සිඳෙත්; එසො ධම්මො, වෛරය අවෛරයෙන් සන්සිඳෙයි යන මේ ධර්මයතෙමේ; සනන්තනො, බුද්ධාදී උතුමන් විසින් පරිචිත පැරැණි ධර්මයෙකි-නොහොත් එසො සනන්තනො ධම්මො, අවෛරයෙන් වෛරය සන්සිඳවීම වූ මේ පෞරාණික ධර්මයතෙමේ බුද්ධාදිමහොත්තම යන් ගිය මාර්ගයයි.

80. එත්ථ, මේ කලහකාරක සඞ්ඝයා මැද; පරෙ, පණ්ඩිත ජනයාගෙන් අන්‍යවූ කලහකාරකයෝ; මයං අපි, යමාමසෙ, සතතයෙන් මරුවෙතට පැමිණෙන්නෙමුයි; නවිජානන්ති, නොදක්නාහ; තත්ථ, ඒ කලහකාරීන් අතුරෙහි; යෙච, යම් පණ්ඩිතජනකෙණෙක් වනාහි; විජානන්ති, 'අපි මරුවෙතට යම්හ'යි දනිත්ද; තතො, ඒ සම්‍යක් ප්‍රතිපදා හෙතුවෙන්; මෙධගා, කලහයෝ; සම්මන්ති, යොනිසොමනසිකාරය උපදවීම නිසා සන්සිඳෙන්නාහ.

81. අට්ඨිච්ඡින්නා, ඇට සුන්කරන්නාවූ; පාණහරා, ජීවිතච්ඡෙදය කරන්නාවූ; ගවාස්සධන හාරිනො, ගව අස් ධන පැහැර ගන්නාවූ;

---

* අට්ඨිච්ඡින්නා-ස

82. සචෙ ලභෙථ නිපකං සහායං–සඩිං චරං සාධුවිහාරි ධීරං
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි-චරෙය්‍යතෙන'ත්තමනොසතීමා

83. නො චෙ ලභෙථ නිපකං සහායං–සඩිං චරං සාධු විහාරි ධීරං
රාජාව රඨං විජිතං පහාය–එකො චරෙ
මාතඞ්ග'රඤ්ඤෙව නාගො

84. එකස්ස චරිතං සෙය්‍යො-නත්‍ථි බාලෙ සහායතා
එකො චරෙ න ච පාපානි කයිරා අප්පොස්සුක්කො
මාතඞ්ග'රඤ්ඤෙව නාගො

---

රඨං, රට; විලුම්පමානානං, පැහැරගන්නාවූ; තෙසං අපි, ඒරජුන්ගේද; සඞ්ගති හොති, එක්වීම වෙයි; කස්මා, කුමක් හෙයින්; තුම්හාකං, නොප සම්බන්ධව; නො සියා, සමගියක් නොවන්නේද?

82. නිපකං, සථානොචිත ප්‍රඥාවෙන් යුක්තවූ; සඩිංචරං, තමං හා සහචාරීන්ට යොග්‍යවූ; සාධුවිහාරිං, සද් සමාචාර ඇත්තාවූ; ධීරං, ධෘතිසම්පන්නවූ; සහායං, කල්‍යාණ මිත්‍රයෙකු, සචෙ, ඉදින් ලභෙථ, ලද්දේනම්; සබ්බානි පරිස්සයානි, සිංහ ව්‍යාඝ්‍රාදී ප්‍රකට උවදුරු හා රාගවෙෂාදී අප්‍රකට උවදුරුද යන සියලු උපද්‍රවයන්; අභිභුය්‍ය, මැඩ; තෙන, ඒ කල්‍යාණ මිත්‍රයා සමග; අත්තමනො, සිතුටුසිත් ඇතිව; සතිමා, සිහිනුවණින් යෙදී; චරෙය්‍ය, වසන්නේය.

83. -පෙ- නො චෙ ලභෙථ; ඉදින් නොලද්දේනම්; විජිතං, දිනනලද හෙවත් අත්පත් කර ගන්නාලද; රඨං පහාය, රට හැර පියා වනපත් **මහාජනක-අරිඤ්ජම** දී මහරජුන් මෙන්; අරඤ්ඤෙ, මේ 'රක්ෂිත'වනයෙහි හුදකලාව වසන්නාවූ; මාතඞ්ගනාගො ඉව, **පාරිලෙය්‍යක** හයනි ශ්‍රෙෂ්ඨයාමෙන්; එකො චරෙ, [ගණයා හැර පියා] හුදකලාව වසන්නේය.

84. එකස්ස, හුදකලාවූවහුගේ; චරිතං, වාසය; සෙය්‍යො, උතුම් වෙයි; බාලෙ, මෙලෝ පරලෝ වැඩ නොදන්නා බාලයාකෙරෙහි; සහායතා, සහලුබැව්; [හෙවත් ත්‍රිවිධශීල, දශකථාවස්තු, තෙළෙස් ධුතාඞ්ග විදර්ශනා, සතරමග, සතරඵල, නිර්වාණය යනමේ සහාය භාවය;] නත්‍ථි, නැති; (එහෙයින්) එකො චරෙ, [ගණපරිහරණයෙන් දුරුව] එකලාව හැසිරෙන්නේය: පාපානි, සවල්පමාත්‍රවූද

## විනයගාථා සහ ව්‍යාඛ්‍යාව.

85. එතං නාගස්ස නාගෙන–ඊසාදන්තස්ස හත්ථිනො
සමෙති චිත්තං චිත්තෙන–යදේ'කො රමතී වනෙ'ති

86. සඞ්ඝෙසු කිච්චෙසු ච මන්තනාසු ච–අත්ථෙසු ජාතෙසු විනිච්ඡයෙසු ච
කථං පකාරො'ධ නරො මහත්ථිකො–භික්ඛු කථං හොති'ධ පග්ගහාරහො

87, අනානුවජ්ජො පඨමෙන සීලතො අවෙක්ඛිතා'චාරො සුසංවුතින්ද්‍රියො
පච්චත්ථිකා නො පවදන්ති ධම්මතො–නහි'ස්සතං හොති වදෙය්‍යු යෙන නං

---

අකුශල කර්‍මයන්; නච කයිරා, නොකරන්නේය; අරඤ්ඤෙ, සමූහයා හැර රක්‍ෂිත වනයෙහි එකලාව වසන්නාවූ; මාතඞ්ග නාගො ඉව, 'මාතඞ්ග නමින් ප්‍රසිද්ධ **පාරිලෙය්‍යක** හස්ති ශ්‍රෙෂ්ඨයා මෙන්; අප්පොස්සුක්කො, [ගණ පරිහරණයෙන්] නිරුත්සුකව; චරෙ, වාසය කරන්නේය.

85. යං, යම්හෙයකින්; එකො හුදකලාවූයේ; වනෙ, වනයෙහි; රමති, සිත් අලවා වෙසේද; (එහෙයින්) ඊසාදන්තස්ස, රිය විය වැනි දත්ඇති; නාගස්ස, ශ්‍රෙෂ්ඨවූ; හත්ථිනො, හස්තිහුගේ; එතං, මේ චරිතය; නාගෙන, බුද්ධනාගයා සමගද; චිත්තං, ඔහුගේ සිත; චිත්තෙන, බුද්ධයන් වහන්සේගේ සිත හාද; සමෙති, සමවෙයි.

86. සඞ්ඝෙසු කිච්චෙසු, සඞ්ඝයා පිළිබඳ කුදුමහත් කටයුතු උපන්කල්හිද; මන්තනාසු ච, විනයමන්ත්‍රණ යන්හිද; අත්ථෙසු ජාතෙසු, අධිකරණයන් පැමිණිකල්හි; විනිච්ඡයෙසු ච; ඔවුන් විනිශ්චයකිරීම්හිද; මහත්ථිකො, මහත් උපකාර ඇත්තාවූ; නරො, පුද්ගලතෙම; ඉධ, මේ ශාසනයෙහි; කථංපකාරො හොති, කෙසේ වේද? පග්ගහාරහො, පිටිවහල්වීමට යොග්‍යවූයේ; ඉධ,මෙහි; භික්ඛු කථං හොති, කෙසේවේද?

87 පඨමෙන, පළමුවෙන්ම; සීලතො, ශීලවශයෙන්; අනනුවජ්ජො, උපවාද රහිතවූයේ; අවෙක්ඛිතාචාරො, "ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති" යනාදීන් උපපරීක්‍ෂිත ආචාර ඇත්තේ; සුසංවුතින්ද්‍රියො, මොනවට සංවරවූ ඉඳුරන්

88. සො තාදිසො සීල විසුඩ්ඪියා ඔිතො-විසාරදෙ හොති
විසය්හ භාසති
න ච්ජම්හති පරිසගතො න වෙධති-අත්ථං න හාපෙති
අනුය්‍යුතං භණං

89. තථේ'ව පඤ්හං පරිසාසු* පුච්ඡිතො-න චෙව පජ්ඣායති
න මඞ්කුහොති
සො කාලාගතං බ්‍යාකරණාරහං වචො-රඤ්ජෙති
විඤ්ඤුපරිසං විචක්ඛණො

90. සගරවොවුඩ්ඪතරෙසු භික්ඛුසු-ආචෙරකම්හිච සකෙවිසාරදෙ
අලං පමෙතුං පගුණො කථේතවෙ-පච්චත්ථිකානංච
විගය්හකොවිදෙ

---

ඇත්තේ වේද;(ඔහට)පච්චත්ථිකා, පසමිතුරෝ, ධම්මතො, කරුණු වශයෙන්; නොපවදන්ති, දෙස් නොකියත්; යෙන, යම්හෙය කින්; තං, ඔහුට; වදෙය්‍යුං, කියත්ද; අස්ස, ඔහට; තං, ඒ අප වාදය; නහි හොති, නොමඇත්තේ වෙයි.

88 තාදිසො, එබඳුවූ; සීලවිසුඩ්ඪියා ඔිතො, ශීල විශුඩ්ඪියෙහි පිහිටියාවූ;සො, හෙතෙම; විසාරදෙ හොති, විශාරද වෙයි; විසය්හ, මෙරමා අභිභවනය කොට; භාසති, කියයි; පරිසගතො, පිරිස අතරට ගියේ; නච්ඡම්හති, තැති නොගණියි; න වෙධති, නොවෙවුලයි; අනුය්‍යුතං, අනුදන්නාලද්දක්; භණං; කියන්නේ; අත්ථං, අර්ථය; න හාපෙති, ඊෂ්‍යාවක් හෝ අගති ගමනයක් නැතිහෙයින් නොනසයි.

89. තථා එව, එපරිද්දෙන්ම; පරිසාසු, පිරිස්හි; පඤ්හං, ප්‍රශන, පුච්ඡිතො, විචාරණලද්දේ; නච එව පජ්ඣායති, සිතිවිලි නොම සිතයි; න මඞ්කු හොති, මකුනොවෙයි; කාලාගතං, කියුයුතු සුදුසු කල්හි පැමිණි, බ්‍යාකරණාරහං, අර්ථානුලොම ව්‍යාකරණයට සුදු සුවූවචන; වචො, කියන්නාවූ; සො විචක්ඛණො, ඒ නුවණැත්තේ; විඤ්ඤුපරිසං, නුවණැති පිරිස; රඤ්ජෙති, සතුටුකරයි.

90 වුඩ්ඪතරෙසු භික්ඛුසු, අතිශයින් වෘධ භික්ෂූන් කෙරෙහි; සගාරවො, ගෞරව සහිතවූ; සකෙ ආචෙරකම්හි, තමන් ඇදුරු වාදයෙහි; විසාරදෙ, විශාරදවූ; පමෙතුං, විමශීනය කරන්ට; අලං, සමර්ථවූ; පගුණො, කෘතපරිචය ඇත්තාවූ; කථේතවෙ, කියයුතුවූ; පච්චත්ථිකානං, ප්‍රතිවාදීන්ගේ; විගය්හකොවිදෙ, විරොධස්ථාන දැකී මෙහි දක්ෂවූ;

---

* පරිසාය-ම

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

91. පච්චත්ථිකා යෙන වජන්ති නිග්ගහං–මහාජනො
සඤ්ඤාපනඤ්ච ගච්ඡති
සකඤ්ච ආදාය සමයං න රිඤ්චති–සො බ්‍යාකරං
පඤ්හමනූපඝාතිකං

92. දූතෙය්‍යකම්මෙසු අලං සමුග්ගහො–සඞ්ඝස්ස
කිච්චෙසු ච ආහුනං යථා
කරං වචො භික්ඛු ගණෙන පෙසිතො–අහඞ්කරොමී
ති න තෙන මඤ්ඤති

93. *ආපජ්ජති යාවතකෙසු වත්ථුසු
ආපත්ති යා හොති යථා ච වුට්ඨිතා†
එතෙ විභඞ්ගා උභයෙස්ස ස්වාගතා
ආපත්ති වුට්ඨාන පදස්ස කොවිදො

---

91. පච්චත්ථිකා, ප්‍රතිවාදීහු; යෙන, යම් කථාවකින්; නිග්ගහං, නිග්‍රහයට; වජන්ති, යෙත්ද; මහාජනො, මහාජන තෙමේ; සඤ්ඤාපනං, අවබොධයට; ගච්ඡති ච, යේද; සකං ආදාය සමයං, ස්වකීයාචාර්‍ය්‍ය වාදයත්; න රිඤ්චති, හිස් නොකෙරේද; සො, හෙතෙම; අනූපඝාතිකං, හිංසා රහිතවූ; පඤ්හං, ප්‍රශ්නයක්; බ්‍යාකරං, ප්‍රකාශ කරන්නේ වෙයි.

92. දූතෙය්‍ය කම්මෙසු, සඞ්ඝ දූතකර්මයෙහි; අලං, අෂ්ටවිධ දූතාඞ්ගයන්ගෙන් යුත් හෙයින් සමර්ථවූ; ආහුනං, ආහුති පිණ්ඩය; යථා, යම්සේ පිළිගණීද; (එපරිද්දෙන්) සඞ්ඝස්ස, සඞ්ඝයාගේ; කිච්චෙසු, කෘත්‍යයන්හි; සමුග්ගහො, ඉගෙණීම් හෝ පිළිගැණීම් ඇත්තාවූ; වචොකරං, වචනය ලෙස කරන්නාවූ; ගණෙන පෙසිතො, සමූහයා විසින් යවනලද්දාවූ; භික්ඛු, මහණ තෙම; තෙන, එහෙයින්; අහං, මම; කරොමීති, සඞ්ඝයා කිස කරමියි; න මඤ්ඤති, නොහගියි.

93. යාවතකෙසු, යම්තාක්; වත්ථුසු, වස්තූන්හි; ආපජ්ජති, ඇවැතට පැමිණේද; යථා, යම්ලෙසකින්; ආපත්තියා, ඇවැත්න්; වුට්ඨිතා හොති, නැගීසිටීම වේද; එතෙ, ආපත්ති ආපජ්ජන ආපත්ති වුට්ඨාන යන; උභයෙ විභඞ්ගා, අභිද්‍යෝතකයෝ දෙදෙන; අස්ස, ඔහු විසින්; සාගතා, මනාව අවබොධකරණලද්දාහු නුයි; ආපත්තිවුට්ඨානපදස්ස, ඇවැතින් නැගිසිටීම් කරුණෙහි; කොවිදො, දක්‍ෂවෙයි.

---

* ආපජ්ජතෙ-ස- † වුට්ඨාති-ස-

## සුජනපසෙමොදනී

94. නිස්සාරණං ගච්ඡති යානිච්චාවරං
නිස්සාරිතො හොති යථා ච වත්‍ථුනා
ඔසාරණං තං වුසිතස්ස ජන්තුනො
එතම්පි ජානාති විභඞ්ග කොවිදො

95. සගාරවො වුඩ්ඪතරෙසු භික්ඛුසු
නවෙසු·ථෙරෙසු ච මජ්ඣිමෙසු
මහාජනස්ස'ත්‍ථ චරො'ධ පණ්ඩිතො
සො තාදිසො භික්ඛු ඉධ පග්ගහාරහො'ති

---

94 යානිච්චාවරං, යම්බඳු භණ්ඩන කාරණාදීන්හි හැසිරෙන්නේ; නිස්සාරණං, තජ්ජනීයාදි නිස්සාරණ කර්‍මයට; ගච්ඡති, යෙයි; යථා, යම්සේ; වත්‍ථුනා, වස්තු වශයෙන්; නිස්සාරිතො හොති, බැහැර කරණ ලදද; තං, ඒ වත; වුසිතස්ස, වැසනිමවන ලද; ජන්තුනො, භික්ෂුවගේ; ඔසාරණං, ඇතුළත්කරගැණීමය යන එතං අපි, මෙයද; විභඞ්ගකොවිදො, විභඞ්ගයෙහි දක්ෂතැනැත්තේ ජානාති, දනියි.

95. ඉධ, මේ ශාසනයෙහි; වුඩ්ඪතරෙසු, අතිශයින් වෘද්ධවූ; භික්ඛුසු, භික්ෂූන්කෙරෙහිද; නවෙසු, නවකයන් කෙරෙහිද; මජ්ඣිමෙසු, මධ්‍යමයන් කෙරෙහිද; සගාරවො, ගෞරව සහිතවූ; පණ්ඩිතො, නුවණැත්තාවූ; මහාජනස්ස, මහජනයාට; අත්‍ථචරො, අර්‍ථචාරීවූ; තාදිසො, එබඳුවූ; සො භික්ඛු, ඒ මහණතෙම; පග්ගහාරහො, ප්‍රකර්‍ෂයෙන් අධිකරණ විනිශ්චය පිණිස ගතයුත්තා වෙයි.

[උපසපුවෙන් පස්වස් වන තුරු 'නවක' නම; එතැන් සිට දසවස් නොපිරෙණ තෙක් 'මජ්ඣිම' නම; පිරිපුන් දසවස් ඇතියේ 'ථෙර' හෙවත් 'වුඩ්ඪ' නම;මහලූ පැවිදිලැබ බොහෝකල් ඉක්ම සිටියේ 'වුඩ්ඪතර' නමැයි දතයුතු]

## මහාවග්ග පාළි ගාථා'ත්‍ථ නිමි.

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

# චූල්ලවග්ග පාළි.

1. විරූපක්ඛෙහි මෙ මෙත්තං—මෙත්තං එරාපථෙහි මෙ
ඡබ්‍යාපුත්තෙහි මෙ මෙත්තං—මෙත්තං කණ්හාගොතමකෙහි ච

2. අපාදකෙහි මෙ මෙත්තං—මෙත්තං දිපාදකෙහි මෙ
චතුප්පදෙහි මෙ මෙත්තං—මෙත්තං බහුප්පදෙහි මෙ

3. මා මං අපාදකො හිංසි—මා මං හිංසි දිපාදකො
මා මං චතුප්පදො හිංසි—මා මං හිංසි බහුප්පදො

4. සබ්බෙ සත්තා සබ්බෙ පාණා—සබ්බෙ භූතා ච කෙවලා
සබ්බෙ භද්‍රානි පස්සන්තු—මා කඤ්චි පාප'මාගමා

---

1. මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රිය; විරූපක්ඛෙහි, 'විරූපක්ඛ' නම් නාගයන් සමග වේ; මෙ, මාගේ, මෙත්තං, මෛත්‍රිය; එරාපථෙහි, 'එරාපථ' නම් නාගයන් සමග වේ; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රිය; ඡබ්‍යාපුත්තෙහි, 'ඡබ්‍යාපුත්ත' නම් නාගයන් සමග වේ; මෙත්තං, මාගේ මෛත්‍රිය; කණ්හාගොතමකෙහි ච, 'කණ්හාගොතම' නම් නාගයන් සමග වේ.

2. මෙ, මාගේ මෙත්තං, මෛත්‍රිය; අපාදකෙහි, පා රහිත සත්ත්වයන් සමග වේ; මෙ–මෙත්තං–දිපාදකෙහි, දෙපාසතුන් සමග වේ; මෙ–මෙත්තං–චතුප්පදෙහි; සිව්පා සතුන් සමග වේ; මෙ–මෙත්තං–බහුප්පදෙහි, බොහෝ පා ඇති සතුන් සමග වේ;

3. මං, මා; අපාදකො, නාගාදී අපාදක සත්ත්වතෙමේ; මා හිංසි, නොපෙළාවා; මං, මා, දිපාදකො, චොරාදි ද්විපාද සත්ත්වතෙමේ; මා හිංසි, නොපෙළාවා; චතුප්පදො, ව්‍යාඝ්‍රාදී චතුෂ්පාද සත්ත්වතෙමේ; මං–මාහිංසි–බහුප්පදො, බහුපා සත්ත්වතෙමේ; මං, මා; මාහිංසි–නොපෙළාවා.

4. සබ්බෙ සත්තා, සියලුසත්ත්වයෝද; සබ්බෙ පාණා, සියලු ප්‍රාණීහුද, සබ්බෙ භූතා ච, සියලු භූතයෝද යන; කෙවලා, මේ සියල්ලෝම; සබ්බෙ භද්‍රානි, සියලු සුන්දර ඉෂ්ටාරම්මණයන්; පස්සන්තු, දකිත්වා, කඤ්චි, කිසිවෙක්; පාපං, ලාමක දුක්කට; මා අගමා, නොපැමිණේවා;

## සුජනප්පමොදනී

5. සීතං උණ්හං පටිහන්ති-තතො වාළ මිගානි ච
සිරිංසපෙ ච මකසෙ-සිසිරෙ චාපි වුට්ඨියො

6. තතො වාතා'තපෙ ඝොරෙ-සඤ්ජාතෙ පටිහඤ්ඤති
ලෙණත්ථඤ්ච සුඛත්ථඤ්ච-ඣායිතුඤ්ච විපස්සිතුං

7. විහාරදානං සඞ්ඝස්ස-අග්ගං බුද්ධෙන වණ්ණිතං
තස්මා හි පණ්ඩිතො පොසො-සම්පස්සං අත්ථ'මත්තනො

8. විහාරෙ කාරයෙ රම්මෙ-වාසයෙ'ත්ථ බහුස්සුතෙ,
තෙසං අන්නඤ්ච පානඤ්ච-වත්ථසෙනාසනානි ච
දදෙය්‍ය උජුභූතෙසු-විප්පසන්නෙන චෙතසා

---

5. සීතං, සීතලද; උණ්හං, උෂ්ණයද; තතො, ඉන් මත්තෙහිවූ; වාළමිගානිච, චණ්ඩවනමෘගයන් ද; සිරිංසපෙ ච, සර්පයන් ද; මකසෙ, මදුරුවන්ද; සිසිරෙ ච, සංවූසිත වාතය ද; අපි, යළි; වුට්ඨියො, සෘජු මෙඝ සමුත්ථානයන් ද; පටිහන්ති, නසයි.

6. තතො, ඉක්බිති; ඝොරෙ, ඝොරවූ; සඤ්ජාතෙ, හටගත්තාවූ; වාතා'තපෙ, වාතය හා ඉරඅව්ව ද; පටිහඤ්ඤති, නසයි; ඣායිතුං, ධ්‍යානකරන්ට; ලෙණත්ථඤ්ච, නිලීනස්ථානය පිණිස ද; විපස්සිතුං, විදර්ශනාකරන්ට; සුඛත්ථඤ්ච, සීතාදී පරිශ්‍රයා භාවයෙන් සැප පිණිස ද වන්නේ ය.

7. 8. සඞ්ඝස්ස, සඞ්ඝයාහට; විහාරදානං, විහාර දානය කිරීම; බුද්ධෙන, සර්වඥයන් වහන්සේ විසින්; අග්ගං, අග්‍රයයි; වණ්ණිතං, වර්ණනා කරණ ලද්දේවේ; තස්මාහි, එබැවින්; පණ්ඩිතො පොසො, නුවණැති පුරුෂතෙමෙ; අත්තනො, තමාගේ; අත්ථං, පාරලෞකිකාර්ථය; සම්පස්සං, දක්නේ; රම්මෙ, රම්‍යවූ; විහාරෙ, විහාරයන්; කාරයෙ, කරවන්නේය; එත්ථ, මේ විහාරයෙහි; බහුස්සුතෙ, පර්‍ය්‍යාප්ති ප්‍රතිවෙධ ධර බහුශ්‍රැතයන්; වාසයෙ, වස්වන්නේය; උජුභූතෙසු, අකුටිල වූ; තෙසං, උන්වහන්සේලාට; අන්නං, සුදුසු අහාරද; පානංච, පැන්ද; වත්ථ සෙනාසනානි ච, චීවර සෙනාසනයන්ද; විප්පසන්නෙන චෙතසා, පහන් සිතින්; දදෙය්‍ය, දෙන්නේය.

9. තෙ තස්ස ධම්මං දෙසෙන්ති—සබ්බදුක්ඛාපනූදනං
යං සො ධම්ම'මිධ'ඤ්ඤාය—පරිනිබ්බාති අනාසවො

10. සතං හත්ථි සතං අස්සා—සතං අස්සතරී රථා
සතං කඤ්ඤා සහස්සානි—ආමුත්තමණිකුණ්ඩලා
එකස්ස පදවීතිහාරස්ස—කලං නාග්ඝන්ති සොළසිං

11. සබ්බදා වෙ සුඛං සෙති—බ්‍රාහ්මණො පරිනිබ්බුතො
යො න ලිම්පති කාමෙසු—සීතිභූතො නිරූපධි

12. සබ්බා ආසත්තියො ඡෙත්වා—විනෙය්‍ය හදයෙ දරං
උපසන්තො තද සෙති—සන්තිං පප්පුය්‍ය චෙතසො

---

9. තෙ, උන්වහන්සේලා, තස්ස, ඒ දයකයාහට; සබ්බදුක්ඛාපනූදනං, සියලු දුක් දුරුකරන්නාවූ; ධම්මං, ධර්මය; දෙසෙන්ති, දෙසනා කරත්; [කෙබඳු ධර්මයක්ද? යත්] සො, හෙතෙම; යං ධම්මං, යම්බඳු ධර්මයක්; (ඉධ යනු නිපාත මාත්‍රයි) අඤ්ඤාය, දැන, අනාසවො, කාමාදී ආශ්‍රව රහිතවූයේ; පරිනිබ්බාති, පිරිනිවේද? [එබඳු ධර්මය දෙශනාකරන්නාහ.]

10. හත්ථි සතං සහස්සානි, ඇතුන් සිය දහසෙක; අස්සා, අශ්වයෝ; සතං සහස්සානි, සියදහසෙක; අස්සතරී සතං සහස්සානි, වෙලඹුන් සිය දහසෙක; රථා, රථයෝ; සතං සහස්සානි, සිය දහසෙක; / ආමුත්ත මණිකුණ්ඩලා, මුතුයෙන් හා මිණි කොඩොලින් සරහණලද්දාවූ; කඤ්ඤා, කන්‍යාවෝ; සතං සහස්සානි, සියදහසෙක; [යන මෙකී වස්තු පරිත්‍යාගයෙන් ලැබෙන කුශල ඵලය] එකස්ස පදවීතිහාරස්ස, එක් **පදවීතිහාර** කුශලයක්හුගේ; සොළසිං කලං, සොළොස්වෙනි කලාවටත්; න අග්ඝන්ති, නො අගිත්.

11. යො, යමෙක් තෙම; කාමෙසු, වස්තුකාම ක්ලේශකාම යන්හි; න ලිම්පති, තෘෂ්ණාදෘෂ්ටීන් ආලිප්ත නො වේ ද; සීතිභූතො, ක්ලේශ රාහිත්‍යයෙන්; සිතිල්වූයේ ද; නිරූපධි, උපධි රහිත වේ ද; පරිනිබ්බුතො, ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවියේ ද; බ්‍රාහ්මණො, බාහිතපාපිවූ ඒ ක්ෂීණාශ්‍රව තෙම; වෙ, එකාන්තයෙන්; සබ්බදා, සියලු කල්හි; සුඛං සෙති, සැපසේ හොවී.

12. සබ්බා ආසත්තියො, ප්‍රකර්ෂයෙන් ඇලෙනහෙයින් ආසත්ති කා නම්වූ සියලු තෘෂ්ණාවන්; ඡෙත්වා, සිඳ; හදයෙ දරං, හෘදය නිඃශ්‍රිත දරථය; විනෙය්‍ය, සන්සිඳුවා; උපසන්තො, සන්සිඳුනු කෙලෙස් ඇත්තේ; චෙතසො, චිත්තයාගේ; සන්තිං, ශාන්තියට; පප්පුය්‍ය, පැමිණ; සුඛං සෙති, සැපසේ සයනය කෙරෙයි.

13. යෙ වඩ්ඪමපචායන්ති-නරා ධම්මස්ස කොවිදා
දිට්ඨෙව ධම්මෙ පාසංසා-සම්පරායෙ ච සුගතින්ති

14. සීතං උණ්හං පටිහන්ති-තතො වාළමිගානි ච
සිරිංසපෙ ච මකසෙ-සිසිරෙ චාපි වුට්ඨියො

15. තතො වාතාතපෙ ඝොරෙ-සඤ්ජාතෙ පටිහඤ්ඤති
ලෙණත්ථඤ්ච සුඛත්ථඤ්ච-ඣායිතුඤ්ච විපස්සිතුං

16. විහාරදානං සඞ්ඝස්ස-අග්ගං බුද්ධෙන වණ්ණිතං
තස්මා හි පණ්ඩිතො පොසො-සම්පස්සං අත්ථමත්තනො

17. විහාරෙ කාරයෙ රම්මෙ-වාසයෙත්ථ බහුස්සුතෙ
තෙසං අන්නඤ්ච පානඤ්ච-වත්ථසෙනාසනානි ච
දදෙය්‍ය උජුභූතෙසු-විප්පසන්නෙන චෙතසා

18. තෙ තස්ස ධම්මං දෙසෙන්ති-සබ්බදුක්ඛාපනූදනං
යං සො ධම්මමිධඤ්ඤාය-පරිනිබ්බාති අනාසවො

19. යස්සන්තරතො න සන්ති කොපා-ඉති භවා
භවතඤ්ච වීතිවත්තො
තං විගතභයං* සුඛිං අසොකං-දෙවා නානුභවන්ති
දස්සනායා'ති

---

13. ධම්මස්ස, ලොකධර්මයෙහි; කොවිදා, දක්ෂවූ; යෙ නරා, යම් මනුෂ්‍ය කෙනෙක්; වඩ්ඪං, ඥාන වයො වෘද්ධාදී මහල්ලන්; අපචායන්ති, පුදත් ද; (ඔව්හු) දිට්ඨෙවධම්මෙ, ඉහාත්මයෙහි; පාසංසා, ප්‍රශංසා කටයුතු බවට පැමිණෙති; සම්පරායෙ, පරලොව; සුගතිං, සුගතිය ලබිත්.

14 වැන්න පටන් 18 තෙක් පෙර සේ මැයි.

19. යස්ස, යමෙක්හුගේ; අන්තරතො, චිත්තයෙහි; කොපා, කෝපයෝ, න සන්ති, තෙවන මගින් සමූහත හෙයින් නොමැත්තාහු ද; ඉති, මේ හෙතුවෙන්; භවා'භවතං ච, සම්පත්ති විපත්ති වය ය; වීතිවත්තො, ඉක්ම වූවා වූ; විගත භයං, පහවූ බිය ඇති; සුඛිං, සුඛ ස්වභාව ඇති; අසොකං, නිශ්ශොකිවූ; තං, ඒ පුද්ගලයා දෙවා, දෙවියෝ ද; දස්සනාය, දැකීමට; න අනුභවන්ති, සමර්ථ, නොවෙත්. [මෙහි 'භවාභව' යන්නෙන් වෘද්ධි, හානි, ශාශ්වත උච්ඡෙද, පුණ්‍ය, පාප, යන මොව්හු දක්වන ලදහ.]

---

* වීතභයං-මු.

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

20\. ඵලං වෙ කදලිං හන්ති-ඵලං වෙළුං ඵලං නළං
සක්කාරො කාපුරිසං හන්ති-ගබ්භො අස්සතරී යථා'ති

21\. මා කුඤ්ජර!නාග මාසදො-දුක්ඛං හි කුඤ්ජර නාග මාසදො
නහි නාග හතස්ස කුඤ්ජර!-සුගති හොති ඉතො පරං යතො

22\. මාච මදො මාච පමාදො-නහි පමත්තා සුගතිං වජන්ති තෙන
ත්වඤ්ඤෙව තථා කරිස්සසි-යෙන ත්වං සුගතිං ගමිස්සසී'ති

23\. දණ්ඩෙනෙකෙ දමයන්ති-අංකුසෙහි කසාහි ච
අදණ්ඩෙන අසත්ථෙන-නාගො දන්තො මහෙසිනා'ති

---

20· වෙ, එකාන්තයෙන්; ඵලං, ඵලය තෙමේ; කදලිං, කෙසෙල් ගස; හන්ති, නසයි; වෙළුං, හුණ‍ගස; ඵලං, ඵලය තෙමේ (මල); හන්ති, නසයි; නළං, බටගස, ඵලං, ඵලය තෙමේ; හන්ති, නසයි; ගබ්භො, ගබ්හීය තෙමේ; අස්සතරී යථා, වෙළඹ යම් සේ නසා ද; එපරිද්දෙන් සක්කාරො, සත්කාරය තෙමේ; කාපුරිසං, තුච්ඡපුරුෂයා; හන්ති, නසයි; [කොටලුවාට දාව වෙළඹ කුස උපන්නිය 'අශ්වතරී' නම්]

21\. කුඤ්ජර, හස්තිරාජය? යතො, යම්හෙයකින්; නාග හතස්ස, බුද්ධනාගයන් හිංසාකරන්නාහට; ඉතොපරං, මින් මත්තෙහි; නහි සුගති හොති, සුගතියක් නොවේද; (එහෙයින්) කුඤ්ජර, හස්තිරාජය? නාගං බුද්ධනාගයන්; මා ආසදෙ, නොගටව; කුඤ්ජර, හස්තිරාජය? නාගං, බුද්ධ නාගයන් වෙත වධකරණ සිතින් එළඹීම; දුක්ඛං හි, දුක්මැයි; එහෙයින්-මා ආසදෙ, නොගටව.

22\. මාච මදෙ, මදයෙනුත් මත්නොවන්නේය; මාච පමාදෙ, ස්මෘති විප්‍රවාස වශයෙන්. ප්‍රමාදත් නොවන්නේය; හි, යම්හෙයකින්; පමත්තා, ප්‍රමාදවූවෝ; තෙන, ඒ හෙතුවෙන්; න සුගතිං වජන්ති, සුගතියට නොයත් ද; යෙන, යම් ක්‍රියාවකින්; ත්වං, නුඹ; සුගතිං ගමිස්සති, සුගතියට පැමිණේද; තථා, එපරිද්දෙන්; ත්වං එව, නුඹම; කරිස්සසි, සාධුක්‍රියා කරන්නෙහිය.

23\. එකෙ, ලොව ඇතැම්හු; දණ්ඩෙන, දඬුයෙන් ද; අංකුසෙන, අකුස්සෙන්ද; (හෙණ්ඩුවෙන්) කසාහි ච, කසවලින් ද; දමයන්ති, සතුන් දමනය කෙරෙත්; නාගො, 'ධනපාල' ඇත්තෙමේ මහෙසිනා, මහර්ෂිවූ බුදුන් විසින්; අදණ්ඩෙන, දඬුයෙන් තොරව; අසත්ථෙන, සැතින් තොරව; දන්තො, දමනය කරණ ලද්දේය.

## සුජනප්පමොදනී

24. සුකරං සාධුනා සාධු–සාධු පාපෙන දුක්කරං
පාපං පාපෙන සුකරං–පාපමරියෙහි දුක්කරන්ති

25. මහාවරාහස්ස මහිං විකුබ්බතො
භිසං ඝසමානස්ස නදීසු ජග්ගතො
භිංකොව පඞ්කං අභිභක්ඛයිත්වා
මමානුකුබ්බං කපණො මරිස්සති

26. යො වෙ න ව්‍යාධතී පත්වා–පරිසං උග්ගවාදිනිං
න ච හාපෙති වචනං–න ච ඡාදෙති සාසනං

27. අසන්දිද්ධො'ව අක්ඛාති*–පුච්ඡිතො ච න කුප්පති
ස වෙ තාදි සකො භික්ඛු–දූතෙය්‍යං ගන්තුමරහති

---

24. සාධුනා, සත්පුරුෂයා විසින්; සාධු, සුචරිත ක්‍රියාව; සුකරං, සුවසේ කටහැකිය; පාපෙන, පාපියා විසින්; සාධු, සුචරිත ක්‍රියාව; දුක්කරං, කිරීම දුෂ්කරයි; පාපෙන, පාපියා විසින්; පාපං, පාපය; සුකරං, සුකාර්‍ය්‍යයි; අරියෙහි, ආර්‍ය්‍යයන් වහන්සේලා විසින්; පාපං, පාපය; දුක්කරං, කිරීම දුෂ්කරයි.

25 මහිං, පොළොව; විකුබ්බතො, ප්‍රඥලනය කරන්නාවූ; භිසං ඝසමානස්ස, නෙලුම්'ල බුදින්නාවූ; නදීසු ගඞ්ගා පුෂ්කරණීන්හි; ජග්ගතො ජොෂ්‍යය වන්නාවූ; මහා වරාහස්ස, මහා හස්ති හුගේ;(ක්‍රියාව දක) පඞ්කං, මඩ; අභි භක්ඛයිත්වා, අනුභව කොට; (මරණයට පැමිණෙන) භිංකො ඉව, ඇත් පැටවෙකු මෙන්; මමානුකුබ්බං, මට අනුව ක්‍රියා කෙරෙමින්; කපණො, දිළිඳු දෙව්දත් තෙමේ; මරිස්සති, නැසෙයි.

26. යො, යම් භික්ෂුවක් තෙමේ; උග්ගවාදිනිං, තියුණු බස් බෙණෙන්නාවූ; පරිසං, පිරිසකට; පත්වා, පැමිණ; න ව්‍යාධති, කම්පා නොවේ ද; වචනං, තථාගත භාෂිතය; නචහාපෙති, නොනසා ද; සාසනං, බුද්ධානුශාසනය; න ච ඡාදෙති, නො වසා ද;

27. අසංදිද්ධොඑව, අනුසන්ධි වශයෙන් යොදු නිස්සන්දෙහව ම; අක්ඛාති, කියා ද; පුච්ඡිතො, විචාරණලද්දේ; න කුප්පති, නොකිපේද; තාදිසකො, එබඳුවූ; සො භික්ඛු, ඒ භික්ෂු තෙමේ; දූතෙය්‍යං, දූතකම්, පිණිස; ගන්තුං, යන්නට; අරහති, සුදුසුවෙයි.

---

*: අසංදිද්ධොච–ස–

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

28. මා ජාතු කොචි ලොකස්මිං–පාපිච්ඡො උදපජ්ජථ
තදමිනා විජානාථ–පාපිච්ඡානං යථා ගති

29. පණ්ඩිතො’ති සමඤ්ඤාතො–භාවිතත්තො’ති සම්මතො
ජලංව යසසා අට්ඨා–දෙවදත්තො’ති මෙ සුතං

30. සො පමාද’මනුචිණ්ණො–ආසජ්ජ නං තථාගතං
අවීචිනිරයං පත්තො–චතුද්වාරං භයානකං

31. අදුට්ඨස්ස හි යො දුබ්භෙ–පාපකම්මං අකුබ්බතො
ත’මෙව පාපං ඵුසති–දුට්ඨචිත්තං අනාදරං

32. සමුද්දං විසකුම්භෙන–යො මඤ්ඤෙය්‍ය පදූසිතුං
න සො තෙන පදූසෙය්‍ය–භෙස්මා හි* උදධී මහා

---

28. පාපිච්ඡො, පාපිච්ඡයෙක් තෙමේ; ලොකස්මිං, ලොකයෙහි; ජාතු, කිසි කලෙකත්; මා උදපජ්ජථ, නූපදීවා!; පාපිච්ඡානං, ලාමකා’කාඞ්ෂා ඇත්තවුන්ගේ; ගති, ගමන; යථා, යම් පරිද්දකින් වේ ද; තං, එය; ඉමිනා, මේ කාරණයෙන්; විජානාථ, දැනගණිව්!.

29. පණ්ඩිතො ඉති, පණ්ඩිත යයි; සමඤ්ඤාතො, ලෝවැස්සන් විසින් දැනගන්නා ලද්දාවූ; භාවිතත්තො ඉති; භාවිත සිත් ඇත්තේ යයි; සම්මතො සම්මත වූ; දෙවදත්තො, දෙව්දත් තෙමේ; යසසා, කීර්තියෙන්; ජලං ඉව, බබලමින් මෙන්; අට්ඨා, සිටියේ යයි; මෙ; මා විසින්; සුතං, (භාග්‍යවතුන් කෙරෙන්) අසන ලදි.

30. සො, හෙතෙම; පමාදං, ප්‍රමාදය; අනුචිණ්ණො, රැස් කෙළේ; හෙවත් ප්‍රමාදය ප්‍රහීණ නුවූයේ; නං තථාගතං, ඒ තථාගතයන් වහන්සේ; ආසජ්ජ, පවිටු සිතින් ගටා; භයානකං, බිහිසුණු වූ; චතුද්වාරං, සතර දොරක් ඇති; අවීචිනිරයං, අවීචි නරකයට; පත්තො, පැමිණියේය; (ආශිංසනාර්ථයෙහි අතීත වචනයි.)

31. යො, යමෙක් තෙම; පාපකම්මං, පව්කම්; අකුබ්බතො, නො කරන්නාවූ; අදුට්ඨස්ස, දුෂ්ට නු වූ වෙකුට; දුබ්භෙ, ද්‍රොහ කෙරේ ද; පාපං, පාපය තෙම; දුට්ඨචිත්තං, දුෂ්‍යසිත් ඇති; අනාදරං, දයා රහිත වූ; තං එව, ඒ පාපී පුද්ගලයා ම; ඵුසති, ස්පර්ශ කෙරේ.

32. යො, යමෙක් තෙමේ; විසකුම්භෙන, විෂ කළයකින්; සමුද්දං, මුහුද; පදූසිතුං, ප්‍රදූෂ්‍යකරන්ට; මඤ්ඤෙය්‍ය, හඟින්

---

* භස්මා–මූ.

## සුජනප්පමොදනී

33. එව’මෙව තථාගතං-යො,වාදෙනුප හිංසති
සම්මා’ගතං සන්තචිත්තං-වාදො තම්හි න රූහති

34. තාදිසං මිත්තං කුබ්බෙථ-තං ච සෙවෙථ පණ්ඩිතො
යස්සමග්ගා’නුගො භික්ඛු-ඛයං දුක්ඛස්ස පාපුණෙ’ති.

35. ආපායිකො නෙරයිකො-කප්පට්ඨො සඞ්ඝභෙදකො
වග්ගරතො අධම්මට්ඨො-යොගක්ඛෙමා පධංසති
සඞ්ඝං සමග්ගං භින්දිත්වා-කප්පං නිරයම්හි පච්චතී’ති

36. සුඛා සඞ්ඝස්ස සාමග්ගී-සමග්ගානඤ්ච’නුග්ගහො
සමග්ගරතො ධම්මට්ඨො-යොගක්ඛෙමා න ධංසති
සඞ්ඝං සමග්ගං කත්වාන-කප්පං සග්ගම්හි මොදතී’ති

---

තේද; සො, හෙතෙම; තෙන, ඒ විෂ කලයෙන්; හි, ඒකාන්ත යෙන්; භෙස්මා, භයඞ්කරවූ; මහාඋදධි, මහා සමුද්‍රය; න පදූසෙය්‍ය, ප්‍රදූෂණය නොකරන්නේය;

33. එවං එව, එ පරිද්දෙන් ම; යො, යමෙක්; තථාගතං, තථාගතයන් වහන්සේ; වාදෙන, වාදයෙන්; උපහිංසති, හිංසනය කෙරේ ද; සම්මාගතං, සුන්දරාගත වූ; සන්තචිත්තං, ශාන්ත සිත් ඇති; තම්හි, උන්වහන්සේ කෙරෙහි; වාදො, වාදය තෙමේ; න රූහති, අරොපනය නො වෙයි.

34. මග්ගානුගො, මාර්ගානුගාමී වූ; භික්ඛු, මහණ තෙම; යස්ස, යම් කිසිවක්හුගේ (වචනයෙන්) දුක්ඛස්ස, වෘත්ත දුක්ඛයාගේ; ඛයං, ක්‍ෂයභාවයට; පාපුණෙ, පැමිණෙන්නේ ද; තාදිසං, එබන්දෙකු (හා) මිත්තං, මිත්‍ර භාවය; කුබ්බෙථ, කරන්නේ ය. පණ්ඩිතො, නුවණැති තැනැත්තේ; තං ච, ඔහුම; සෙවෙථ, සෙවනය කරන්නේය.

35. වග්ගරතො, භෙද කිරීමෙහි ඇලුනා වූ; අධම්මට්ඨො, අධර්ම යෙහි පිහිටියා වූ; සඞ්ඝභෙදකො, සඞ්ඝභෙදක තෙමේ; අපායිකො, අපායට යා යුතු වෙයි. නෙරයිකො, නරකයෙහි උපදින්නේ; කප්පට්ඨො, කල්පස්ථායී වෙයි; යොගක්ඛෙමා, සතරයොගයෙන් එතර වූ ක්‍ෂෙමස්ථානයෙන්; (නිවනින්) පධංසති, නටුයේ වෙයි. සමග්ගං සඞ්ඝං, සමගිසඞ්ඝයා; භින්දිත්වා, බිඳ; කප්පං, කපක් මුලුල්ලෙහි; නිරයම්හි, නරකයෙහි; පච්චති, පැසෙයි.

36. සඞ්ඝස්ස, ශාසනාවචර සඞ්ඝයාගේ; සාමග්ගී, සමගිය; සුඛා, දෙව් මිනිසුන් සහිත ලොකයාට සැපයි; සමග්ගානං, සමගි වූවන්ට; අනුග්ගහො, අනුග්‍රහකිරීම ද (සැපයි); සමග්ග රතො,

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

37. වත්තං අපරිපූරෙන්තො–න සීලං පරිපූරති
අසුද්ධසීලො දුප්පඤ්ඤො–චිත්තෙකග්ගං න වින්දති

38. වික්ඛිත්තචිත්තො නෙකග්ගො–සම්මා ධම්මං න පස්සති
අපස්සමානො සද්ධම්මං–දුක්ඛා න පරිමුච්චති

39. යං වත්තං පරිපූරෙන්තො–සීලම්පි පරිපූරති
විසුද්ධසීලො සප්පඤ්ඤො–චිත්තෙ'කග්ගම්පි වින්දති

40. අවික්ඛිත්තචිත්තො එකග්ගො–සම්මා ධම්මං විපස්සති
සම්පස්සමානො සද්ධම්මං–දුක්ඛා සො පරිමුච්චති

---

සමගියෙහි ඇලුනා වූ; ධම්මට්ඨො, ධර්මයෙහි 'පිහිටි තැනැත්තේ; යොගක්ඛෙමා, නිවනින්; න ධංසති, නො නැසෙයි(පහ නො වෙයි) සඞ්ඝං, සඞ්ඝයා; සමග්ගං කත්වාන, සමගි කොට; කප්පං, ආයුෂ්කල්පයක්; සග්ගම්හි, ස්වර්ගයෙහි; මොදති, සතුටු වෙයි.

37. වත්තං, සම්මජ්ජනාදි වත්; අපරිපූරෙන්තො, නො පුරණ තැනැත්තේ: සීලං, සීලය; න පරිපූරති, සම්පූර්ණ නො කරයි; අසුද්ධසීලො, අපිරිසිදු සිල් ඇති; දුප්පඤ්ඤො, ප්‍රඥා රහිත තැනැත්තේ; චිත්තෙකග්ගං, සමාධිය; න වින්දති, නො ලබයි.

38. වික්ඛිත්ත චිත්තො, නානාරම්මණයන්හි විසිරී ගිය සිතැත්තා වූ; න එකග්ගො, චිත්තෛකාග්‍රතා රහිත තැනැත්තේ; සම්මා, මනාකොට; ධම්මං, ධර්මය; න පස්සති, නො බලයි; සද්ධම්මං, සද්ධර්මය; අපස්සමානො; නො දකින්නේ; දුක්ඛා, සංසාර දුක්ඛයෙන්; න පරිමුච්චති, නො මිදෙයි.

39. යං, යම් හෙයකින්;වත්තං, සම්මජ්ජනාදී කිසියම් වතක්; පරිපූරෙන්තො, පුරණ තැනැත්තේ; සීලම්පි, චතුපාරිශුද්ධි ශීලයත්, පරිපූරෙති, සම්පූර්ණ කෙරෙයි ද; විසුද්ධසීලො, එ හෙයින් ම; පිරිසිදු සිල් ඇත්තාවූ; සප්පඤ්ඤො, ඒ ප්‍රඥාවත් පුද්ගල තෙමේ; චිත්තෙකග්ගං අපි, සමාධිය ද; වින්දති, ලබයි.

40. අවික්ඛිත්ත චිත්තො, නානාරම්මණයන්හි විසිර නො ගිය සිත් ඇති; එකග්ගො, චිත්තෛකාග්‍රතා ඇති තැනැත්තේ; සම්මා, මනාකොට; ධම්මං, ධර්මය; විපස්සති, බලයි; සද්ධම්මං, සද්ධර්මය; සම්පස්සමානො, නුවණින් බලන්නාවූ; සො, හෙතෙම; දුක්ඛා, දුකින්; පරිමුච්චති, මිදෙයි.

## සුජනප්පමොදනී

41. තස්මා හි වත්තං පූරෙය්‍ය-ජිනපුත්තො විචක්ඛණො
ඔවාදං බුද්ධ සෙට්ඨස්ස-තතො නිබ්බාණ මෙහි ති

42. ඡන්නමති වස්සති-විවටං නාති වස්සති
තස්මා ඡන්නං විවරෙථ-එවං තං නාති වස්සතී ති

43. රාගදොසපරික්කිට්ඨා-එකෙ සමණබ්‍රාහ්මණා
අවිජ්ජා නිවුතා පොසා-පියරූපා'භි නන්දිනො

44. සුරං පිවන්ති මෙරයං-පටි සෙවන්ති මෙථුනං
රජතං ජාතරූපං ච-සාදියන්ති අවිද්දසු

45. මිච්ඡා'ජීවෙන ජීවන්ති-එකෙ සමණබ්‍රාහ්මණා
එතේ උපක්කිලෙසා වුත්තා-මුනිනා'දිච්ච බන්ධුනා

---

41. තස්මා, එබැවින්; විචක්ඛණො, නුවණැත්තාවූ; ජින පුත්තො සර්වඥ පුත්‍ර තෙමේ; වත්තං, වත්; පූරෙය්‍ය, පුරන්නේය; බුද්ධසෙට්ඨස්ස, ශ්‍රෙෂ්ඨවූ බුදුන්ගේ; ඔවාදං, මේ අවවාදයට අනුව හැසිරෙව; තතො, ඒ හෙතුවෙන්; නිබ්බාණං, නිවණට; එහිති, පැමිණෙන්නෙහිය;

42. ඡන්නං, ඇවැතට පැමිණ ප්‍රතිච්ඡාදනය කරන්නේ; අතිවස්සති, නැවත අනික්ඇවැතකට පැමිණීම් වශයෙන් බොහෝ කොට ඇවැත් අවදියි; තස්මා, එබැවින්; ඡන්නං, අප්‍රකට ඇවැත; විවරෙථ; විවෘත කරන්නේය; එවං, මෙසේ කල්හි; තං, එය; න තිවස්සති, නැවත බොහෝකොට නොපැමිණේයි;

43. රාගදොසපරික්කිට්ඨා, රාගද්වෙෂයන්ගෙන් විශෙෂයෙන් කිලුටුවූ; අවිජ්ජානිවුතා, අවිද්‍යාවෙන් වැසුනාවූ; පොසා, පුරුෂයෝවූ; එකෙ සමණබ්‍රාහ්මණා, ඇතැම් මහණ බමුණෝ; පියරූපාභිනන්දිනො, ප්‍රියස්වභාවය අභිනන්දනය කරන්නාහු වෙති;

44 සුරං, පිට්ඨසුරාදි පඤ්ච සුරාවර්ග ද; මෙරයං, පුෂ්පාසවාදී පංචමෙරය ද; පිවන්ති, බොත්; මෙථුනං, මෛථුනධර්මය; පතිසෙවන්ති, සෙවනය කරත්; අවිද්දසු, අඥනවූ ඔව්හු; රජතං, රිදීද; ජාතරූපං, රන්ද; සාදියන්ති, ඉවසත්; (පිළිගණිති)

45 එකෙ සමණබ්‍රාහ්මණා, ඇතැම් මහණ බමුණෝ; මිච්ඡාජීවෙන, මිථ්‍යා'ජීවයෙන්; ජීවන්ති, ජීවත් වෙත්; ආදිච්ච බන්ධුනා, සූර්‍ය්‍යබන්ධුවූ; මුනිනා, සර්වඥමුනීන්ද්‍රයානන් වහන්සේ විසින්;

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

46. යෙහි උපක්කිලිඨා-එකෙ සමණබ්‍රාහමණා,
න තපන්ති න භාසන්ති-අසුද්ධා සරජා මගා

47 අන්ධකාරෙන ඔනද්ධා-තණ්හා දාසා සනෙත්තිකා
වඩ්ඪෙන්ති කටසිං ඝොරං-ආදියන්ති පුනබ්භව'න්ති

---

එතෙ, මොව්හු; උපක්කිලෙසා, 'ශ්‍රමණොපක්ලෙශයෝ' යයි; වුත්තා, වදාරණ ලදහ.

කෙබඳු උපක්ලෙශයෝදයත්:-

46 යෙහි, යම් උපක්ලෙශධර්මකෙණෙකුන් කරණ කොට ගෙණ; උපක්කිලිඨා, කෙලෙසුනාවූ; එකෙ සමණබ්‍රාහමණා, ඇතැම් මහණ බමුණෝ; මගා, මෘගයන් වැනි වූවාහු; සරජා, රාගාදී රජස් සහිතවූවාහු; අසුද්ධා, අපිරිසිදුවූවාහු; නතපන්ති, නොදිලිසෙත්ද; නභාසන්ති, භාත්පසින් නොබබලත්ද;

47 අන්ධකාරෙන, අවිදුඅඳුරෙන්; ඔනද්ධා, වැසුනාහු; තණ්හාදාසා, තෘෂ්ණාවටදාසවූවාහු; සනෙත්තිකා, එහෙයින්ම භවයෙන් භවයට පැමිණීම් සහිතවූවාහු; කටසිං, නැවත නැවත ශරීරය නිඃක්ෂෙපකරමින්; වඩ්ඪෙන්ති, භූමිය වඩත්ද; ඝොරං, ඝොරවූ; පුනබ්භවං, පුනර්භවය, ආදියන්ති, ගණිත්ද; එබඳු උපක්ලෙශයෝයි.

## චූලවග්ගපාළි ගාථා'ර්ථ නිමි.

# පරිවාර පාළි.

1. උපාලි දාසකො චෙව සොණකො සිග්ගවො තථා
මොග්ගලිපුත්තෙන පඤ්චමා-එතෙ ජම්බු සිරිව්හයෙ

2. තතො මහින්දො ඉට්ඨියො-උත්තියො සම්බලො තථා
භද්දනාමො ච පණ්ඩිතො-එතෙ නාගා මහාපඤ්ඤා
ජම්බුදීපා ඉධා'ගතා

3. විනයං තෙ වාචයිංසු-පිටකං තම්බපණ්ණියා
නිකායෙ පඤ්ච වාචෙසුං-සත්තචෙ'ව පකරණෙ

---

1. උපාලි, විනයධාරීන් අතුරෙන් අග්‍රයයි බුද්ධදත්තාභිෂෙක ඇති 'උපාලි' ස්ථවිරය; දාසකො ච, උන්වහන්සේගේ ශිෂ්‍යදාසක ස්ථවිරය; සොණකො, සොණ ස්ථවිරය; තථා, එසේම; සිග්ගවො, සිග්ගවස්ථවිරය; මොග්ගලිපුත්තෙන පඤ්චමා, මොග්ගලිපුත්ත තිස්සස්ථවිරයන් පස්වැනිකොට ඇත්තාවූ; එතෙ, මුන්වහන්සේලා ජම්බුසිරිව්හයෙ, ශ්‍රීමජ්ජම්බුද්වීපයෙහි විනයාචාර්‍ය්‍ය පරම්පරාවෙහි වූවෝ වෙත්.

2 තතො, ඉක්බිති; මහින්දො, මහේන්ද්‍ර ස්ථවිරය; ඉට්ඨියො, ඉට්ඨියස්ථවිරය; උත්තියො, උත්තිය ස්ථවිරය;, තථා එසේම; සම්බලො, සම්බල ස්ථවිරය; පණ්ඩිතො, පණ්ඩිතවූ; භද්දනාමො ච භද්ද නම් ස්ථවිරය යන; මහාපඤ්ඤා, මහාප්‍රාඥවූ; එතෙ නාගා, 'අග' සඞ්ඛ්‍යාත අකුශලධර්මයන් නැසූහෙයින් 'නාග' නම්වූ මුන්වහන්සේලා; ජම්බුදීපා, දඹදිවින්; ඉධ ආගතා, මෙහි (ලක් දිවට) වැඩියා හුය.

3 තෙ, උන්වහන්සේලා; විනයං පිටකං, විනය පිටකය; තම්බපණ්ණියා, හෙළදිව; වාචයිංසු, හැදූරවූහ; පඤ්චනිකායෙ, පස්සඟි ද; සත්ත ච එව පකරණෙ, ප්‍රකරණ සත ද; වාචෙසුං, හැදූරවූහ; [මෙහි 'පඤ්චනිකායෙ' යන්නෙන් සූත්‍රපිටකය ද සත්තචෙව පකරණෙ, යන්නෙන් අභිධර්ම පිටකයද අභිප්‍රෙතය] තෙවළාබුදුවදන ලක්දිව පළකළහ යනුභාවයි.

4. තතො අරිට්ඨො මෙධාවී-තිස්සදත්තො ච පණ්ඩිතො
විසාරදො කාළසුමනො-ථෙරො ච දීඝනාමකො
දීඝසුමනො ච පණ්ඩිතො

5. පුනදෙව කාළ සුමනො-නාගත්ථෙරො ච බුද්ධරක්ඛිතො
තිස්සත්ථෙරො ච මෙධාවී-දෙවත්ථෙරො ච පණ්ඩිතො

6. පුනදෙව සුමනො මෙධාවී-විනයෙ ච විසාරදො
බහුස්සුතො චූළනාගො-ගජො'ව දුප්පධංසියො

7. ධම්මපාලිත නාමො ච-රොහණො සාධුපූජිතො
තස්ස සිස්සො මහාපඤ්ඤො-ඛෙමනාමො තිපෙටකී

8. දීපෙ තාරකරාජාව-පඤ්ඤාය අතිරොචථ
උපතිස්සො ච මෙධාවී-ඵුස්සදෙවො මහාකථී

---

4 තතො, ඉන්පසු; මෙධාවී, ප්‍රඥාවත්වූ; අරිට්ඨො, 'අරිට්ඨ' ස්ථවිරය; පණ්ඩිතො, පණ්ඩිතවූ; තිස්සදත්තො ච, තිස්සදත්ත ස්ථවිරය; විසාරදො, පතළ නැණැති; කාළසුමනො, කාළසුමන ස්ථවිරය; දීඝනාමකො, 'දීඝ' යන නම්ඇත්තාවූ; ථෙරො ච, ස්ථවිරයන් වහන්සේය; පණ්ඩිතො, පණ්ඩිතවූ; දීඝසුමනො ච, දීඝසුමන ස්ථවිරය;

5. පුනඑව, නැවතද; කාළසුමනො, කාළසුමනස්ථවිරය; නාගත්ථෙරො ච, නාගස්ථවිරය; බුද්ධරක්ඛිතො, 'බුද්ධරක්ඛිත' ස්ථවිරය; මෙධාවී, නුවණැත්තාවූ; තිස්සත්ථෙරො ච, 'තිස්ස' ස්ථවිරය; පණ්ඩිතො, පණ්ඩිතවූ, දෙවත්ථෙරො ච, දෙවස්ථවිරය;

6.පුනඑව, නැවතත්; මෙධාවී, ප්‍රඥාවත්වූ; විනයෙ ච, විනයයෙහි; විසාරදො, විශාරද දැනුම් ඇත්තාවූ; සුමනො, සුමනස්ථවිරය; බහුස්සුතො, බහුශ්‍රැතවූ හෙවත් බොහෝ ඇසූපිරූතැන් ඇත්තාවූ; දුප්පධංසියො, මැඩලියනොහැක්කාවූ; ගජො ඉව, හස්තිරාජයකුමෙන් සිටියාවූ; චූළනාගො, චූළනාගස්ථවිරය;

7. 8. ධම්මපාලිතනාමො ච, ධම්මපාලිත නම් ස්ථවිරය; සාධුපූජිතො, සත්පුරුෂයන් විසින් පුදනලද්දාවූ; රොහණො, රොහණ නම් ස්ථවිරය; තස්ස, උන්වහන්සේගේ; සිස්සො, ශිෂ්‍යවූ; මහාපඤ්ඤො, මහපැණැත්තාවූ; තිපෙටකී, ත්‍රිපිටකධරවූ; ඛෙම නාමො, චූලාභයනම්වූ ඛෙම ස්ථවිරතෙමේ; දීපෙ, හෙළදිව;

## සුජනසමොදනී

9. පුනදෙව සුමනො මෙධාවී–පුප්ඵනාමො බහුස්සුතො
මහාකපි මහාසීවො–පිටකෙ සබ්බත්ථ කොවිදො

10. පුනදෙව උපාලි මෙධාවී–විනයෙච විසාරදො
මහානාගො මහා පඤ්ඤො–සද්ධම්මවංසකොවිදො

11. පුනදෙව අභයො මෙධාවී–පිටකෙ සබ්බත්ථ කොවිදො
තිස්සත්ථෙරො ච මෙධාවී–විනයෙ ච විසාරදො

12. තස්ස සිස්සො මහාපඤ්ඤො–පුස්ස නාමො බහුස්සුතො
සාසනං අනුරක්ඛන්තො–ජම්බුදීපෙ පතිට්ඨිතො

---

තාරකරාජා ඉව, චන්ද්‍රයා මෙන්; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; අතිරොචථ ඉතා බැබලුණේය; මෙධාවී, නුවණැත්තාවූ; උපතිස්සො ච, උප තිස්ස් ස්ථවිරය; මහාකපි, කපිකශ්‍රෙෂ්ඨවූ; ඵුස්සදෙවො, ඵුස්සදෙව ස්ථවිරය;

9 පුනඑව, උන්වහන්සේට; අනතුරුව නැවතත්; මෙධාවී, ප්‍රඥාවත්වූ; සුමනො, සුමන නම් තෙරය; බහුස්සුතො, බහුශ්‍රැතවූ; පුප්ඵනාමො, පදුම නම් ස්ථවිරය; සබ්බත්ථපිටකෙ, විනය පිටකය සම්බන්ධී සැමතන්හි; කොවිදො, උද්ග්‍රහණධාරණාදීන් දක්ෂවූ; මහාකපි, කපිකශ්‍රෙෂ්ඨවූ; මහාසීවො, මහාසිව නම් ස්ථවිරය;

10. පුනදෙව, නැවතත්; මෙධාවී, ප්‍රඥාවත්වූ; විනයෙ ච, විනය යෙහි; විසාරදො, විශාරද ප්‍රඥා ඇති; උපාලී, දෙවෙනි උපාලි ස්ථවිරය;` සද්ධම්මවංසකොවිදො, ශාසනවංසය දැනීමෙහි දක්ෂවූ; මහාපඤ්ඤො, මහාප්‍රාඥවූ; මහානාගො, මහානාගස්ථවිරය;

11. පුනඑව, නැවතත්; මෙධාවී, නුවණැත්තාවූ; පිටකෙ, ත්‍රිපිටක ධර්මයෙහි; සබ්බත්ථ, හැමතැන්හිම; කොවිදො, දක්ෂවූ; අභයො, අභය ස්ථවිරය; මෙධාවී, ප්‍රඥාවත්වූ; විනයෙ ච විසාරදො, විනයයෙහි පතල නුවණැත්තාවූ; තිස්සත්ථෙරො ච, තිස්ස නම් තෙර තෙමේය;

12. තස්ස, උන්වහන්සේගේ; සිස්සො, ශිෂ්‍යවූ; මහාපඤ්ඤො, මහාප්‍රාඥවූ; බහුස්සුතො, බහුශ්‍රැතවූ; ඵුස්සනාමො, ඵුස්ස නම් තෙර තෙමේ; සාසනං, බුද්ධශාසනය; අනුරක්ඛන්තො, රක්නේ; ජම්බුදීපෙ, (හෙළදිව පැවිදිව) දඹදිව; (වැඩ ඉගෙණ) පතිට්ඨිතො, සසුන් රක්කේයි.

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

13 චූලාභයො ච මෙධාවී-විනයෙ ච විසාරදො
තිස්සත්ථෙරො ච මෙධාවී-සද්ධම්ම වංස කොවිදො

14. චූල දෙවො ච මෙධාවී-විනයෙ ච විසාරදො
සිවත්ථෙරො ච මෙධාවී-විනයෙ සබ්බත්ථ කොවිදො

15. එතෙ නාගා මහා පඤ්ඤා-විනයඤ්ඤූ මග්ග කොවිදා
විනයං දීපෙ පකාසෙසුං-පිටකං තම්බපණ්ණියා'ති-

16. අනිච්චා සබ්බෙ සඞ්ඛාරා-දුක්ඛා'නත්තා ච සඞ්ඛතා
නිබ්බාණඤ්චෙව පඤ්ඤත්ති-අනත්තා ඉති නිච්ඡයා

---

13. මෙධාවී; පැණැත්තාවූ; විනයෙ ච විනයයෙහි; විසාරදො, පතල නැණැත්තාවූ; චූලාභයො ච, චූලාභය නම් ස්ථවිරතෙමේය; මෙධාවී, ප්‍රඥාවන්වූ; සද්ධම්මවංස කොවිදො, බුද්ධසද්ධර්මවංශය දන්නා හෙයින් දක්ෂවූ; තිස්සත්ථෙරො ච, තිස්ස නම් ස්ථවිරතෙමේය;

14. මෙධාවී, ප්‍රඥාවන්වූ; විනයෙ ච, විනයයෙහි; විසාරදො; විශාරද ඥාන ඇත්තාවූ; චූලදෙවො ච, චූලදෙව නම් ස්ථවිර තෙමේය; මෙධාවී; නුවණැත්තාවූ; සබ්බත්ථ විනයෙ, විනය සම්බන්ධී සැමතැන්හි; කොවිදො, දක්ෂවූ; සිවත්ථෙරො ච, සිව නම් තෙර තෙමේය යන;

15. මහාපඤ්ඤා, මහාප්‍රාඥවූ; විනයඤ්ඤූ, විනය දන්නාවූ; මග්ගකොවිදා, මාර්ගඥානයෙහි; දක්ෂවූ; එතෙනාගා, මේ ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා; විනයං පිටකං, විනය පිටකය; තම්බපණ්ණි යාදීපෙ, 'තාම්‍රපර්ණී' නම්වූ හෙලදිව; පකාසෙසුං, ප්‍රකාශ කලාහුය.

16. සබ්බෙ සඞ්ඛාරා, සියලු ප්‍රත්‍යයසමුත්පන්නධර්මයෝ; අනිච්චා, ඇතිව නැතිවන සවභාව ඇති හෙයින් අනිත්‍ය යයිද; දුක්ඛා, දුඃඛවස්තුක හෙයින් දුක්යයිද; අනත්තා, තමා වශයෙහි නොපවත්නා හෙයින් අනාත්මයයිද; සඞ්ඛතා, ප්‍රත්‍යයසමුත්පන්න ධර්මයෝ යයිද; නියමකරණ ලදහ; නිබ්බාණඤ්ච, තෘෂ්ණා සංඛ්‍යාත 'වාණ' යෙන් මිදුනු නිර්වාණයද; පඤ්ඤත්ති, සත්ත්වපුද්ගලාදී ප්‍රඥප්තිය ද යන මේ ධර්මදෙදෙනා; අනත්තා ඉති, අනාත්මයයි නිච්ඡයා, නිශ්චය කරණලදහ;

17. බුධ වචනෙ අනුප්පන්නෙ–බුධාදිචෙව අනුගතෙ
තෙසං සභාගධම්මානං–නාම මත්තං න ඤායති*

18. දුක්කරං විවිධං කත්වා පූරයිත්වාන පාරමී
උප්පජ්ජන්ති මහාවීරා–චක්ඛුභූතා සබ්‍රහ්මකෙ

19. තෙ දෙසයන්ති සධම්මා-දුක්ඛ හානිං සුඛාවහං
අඞ්ගීරසො සක්‍යමුනි–සබ්බභූතානුකම්පකො

20. සබ්බසත්තුත්තමො සීහො–පිටකෙ තීනි දෙසයි
සුත්තන්තං අභිධම්මං ච–විනයං ච මහාගුණං

---

17. බුධවචනෙ, පරම කරුණාවෙන් සිතිල්වූ බුධවචනය; අනුප්පන්නෙ, නූපන්කල්හි; බුධාදිචෙව, කෙලෙස්මොහඳුරු නසන බුධසූර්‍ය්‍යා; අනුගතෙ, නොනැඟි කල්හි; (පහළ නොවූ කල්හි) තෙසං සභාග ධම්මානං, අනිත්‍යාදී සයකරුණෙන් සම්‍ානවූ ඒ ප්‍රතීත්‍ය සමුද්පාද ධර්මයන්ගේ; නාමමත්තං, ශික්ෂාපද ධර්මය යන නාම මාත්‍රයකුදු; න ඤායති, නොහැඟේ;

18. විවිධං, නානාප්‍රකාරවූ;; දුක්කරං කත්වා, දුෂ්කර ක්‍රියා කොට; පාරමීපූරයිත්වාන, සමත්‍රිංශත් පාරමිධර්මයන්;; පූරණය කොට; සබ්‍රහ්මකෙ, බඹුන් සහිත ලෝකයෙහි; චක්ඛුභූතා, නෙත් වැනිවූ; මහාවීරා, මහාවීරයෝ තුමූ; උප්පජ්ජන්ති, සත්ත්ව කරුණාවෙන්ම උපදනාහ;

19. තෙ, ඒ මහාවීරවූ තථාගයන් වහන්සේලා; දුක්ඛහානිං, දුක් නසන්නාවූ; සුඛාවහං, දිව්‍ය මනුෂ්‍ය සැප එළවන්නාවූ; සධම්මං, සධර්මය; දෙසයන්ති, දෙසත්ද; (එහෙයින්) අඞ්ගීරසො, රැස් නික්මෙන කායශ්‍රී ඇති; සක්‍යමුනි, ශාක්‍ය මුනීන්‍ද්‍රවූ; සබ්බභූතානුකම්පකො, සියලු සතුන්වෙත පතළ අනුකම්පා ඇති;

20 සබ්බ සත්තුත්තමො, ^ සමස්තසත්ත්වොත්තමමුනිශ්‍රෙෂ්ඨ තෙමේ; මහාගුණං, මහත් අනුසස් ඇත්තාවූ; සුත්තන්තං, සූත්‍ර පිටකය ද; අභිධම්මං, අභිධර්ම පිටකය ද; විනයං ච, විනය පිටක යද යන; තීනි පිටකෙ, ත්‍රිපිටක ධර්මයන්; දෙසෙසි, දෙසූසේක.

---

* න ඤායති.

## විනයගාථා ඊට ව්‍යාඛ්‍යාව.

21 එවං නීයති සද්ධම්මො-විනයො යදි තිට්ඨති
උභතො ච විභඞ්ගානි-ඛන්ධකා යා ච මාතිකා

22. මාලා සුත්තගුණෙනෙ'ව-පරිවාරෙන ගන්ථිතා
තස්සෙව පරිවාරස්ස-සමුට්ඨානං නියතො කතං

23. සම්භෙදං නිදානඤ්චඤ්ඤං=සුත්තෙ දිස්සන්ති උපරි
තස්මා සික්ඛෙ පරිවාරං-ධම්මකාමො සුපෙසලො'ති

---

21. විනයො, විනය පාළිය තෙමේ; යදි තිට්ඨති, ඉදින් අතුරු දහන් නො වී සිටින්නේ වී නම්; එවං, මෙසේ ඇති කල්හි; සද්ධම්මො, ප්‍රතිපත්ති ප්‍රතිවෙධ සද්ධර්මය; නීයති, පමුණුවනුලැබේ; උභතො විභඞ්ගානි, විභඞ්ගයෝ දෙදෙන; හෙවත් **පාරාජික පචිති** දෙ පොත ද; ඛන්ධකා, ඛන්ධකයෝ ද; හෙවත් **චුල්ලවග්ග මහාවග්ග** යන දෙ පොත ද; යා ච මාතිකා, යම් මේ මාතෘකා පාළියක් හෙවත් **උභය ප්‍රාතිමොක්ෂයක්** වේ නම් එය ද; යන මොව්හු;

22. සුත්තගුණෙන, නූලකින් ගෙතූ; මාලා ඉව, මල්දමක් මෙන්; පරිවාරෙන, පරිවාර නමැති හුයින්; ගන්ථිතා, ගොතන ලද්දහ; [එහෙයින් විනය ධර්මය නො නැසී පවතී යයි සේයි] තස්ස ච පරිවාරස්ස, එම පරිවාරයෙහිද; නියතො කතං, සෙස්ස වුන් හා සම්භෙදයක් නැති හෙයින් නියම වශයෙන් වෙන්කරණ ලද; සමුට්ඨානං, නියම සමුට්ඨාන යද;(හෙවත් **භූතාරොචන, චොරි වුට්ඨාපන, අනනුඤ්ඤාත** වශයෙන් සෙස්සවුන් හා අමිශ්‍ර කොට එකි එකි **ශික්ෂාපදයෙන්ම** වන්නේ යයි නියමිත **'නියම සමුට්ඨානය'** ද)

23. අඤ්ඤං, එයින් අන්‍යවූ; සම්භෙදං, ප්‍රභෙද ඇති; නිදානං, ඒ ඒ ශික්ෂාපදයන්ගේ ප්‍රඥප්ති දෙශසඞ්ඛ්‍යාත නිදානය ද යන මොව්හු; උපරි සුත්තෙ, මත්තෙහි සමුට්ඨානාදී **සූත්‍රයන්හි**; දිස්සන්ති, යම්හෙයකින්; පෙණෙත් ද; තස්මා, එබැවින්; ධම්ම කාමො, විනය ධර්මාභිලාෂී වූ; (ශික්ෂාකාමී වූ) සුපෙසලො, ප්‍රිය ශීලී මහණතෙමේ; පරිවාරං, පරිවාර පාළිය; සික්ඛෙය්‍ය, මොන වට ප්‍රගුණ කරන්නේය;

[මෙහි 'සමුට්ඨාන' නම් කාය වචාදී වශයෙන්; **ආපත්ති** නැගෙන පිළිවෙළයි, 'නිදාන' නම්:-

24 විහඞ්ග වීසු පඤ්ඤත්තං-උද්දිසන්ති උපොසථෙ
පවක්ඛාමි සමුට්ඨානං-යථාඤායං * සුණාථ මෙ

25. පාරාජිකං යං පඨමං-දුතියඤ්ච තතො පරං
සඤ්චරිත්තා'නු †භාසඤ්ච අතිරෙකඤ්ච චීවරං

26. ලොමානි පදසො ධම්මං-භූතං සංවිධානෙ න ච
ථෙය්‍ය දෙසන චොරී§ ච-අනනුඤ්ඤාතාය තෙරස

---

"වෙසාලියා රාජගහෙ-සාවත්ථියා ච ආළවී
කොසම්බියා ච සක්කෙසු-භග්ගෙසු ච පඤ්ඤත්තා"යි

දක්වන ලද ශික්‍ෂාපද පැණවූ නගර ජනපදාදී යයි. 'සමෙහද'යන මෙහි පූර්වෝක්ත්‍යාපත්තිත්‍රයය හැර අන්‍යා'පත්තීහු සමෙහද නම් වෙති යි දත යුතු]

තෙරස සමුට්ඨානයන් දක්වත්-:

24 වීසු විභඞ්ගෙසු, විභඞ්ගවයයෙහි; පඤ්ඤත්තං, පණවන ලද; (යම් ප්‍රඥප්ති සමූහයක්) උපොසථෙ, පොහෝ දින යෙහි; උද්දිසන්ති, භික්‍ෂු භික්‍ෂුණීහු උදෙසත් ද; (ඔවුන්ගේ) සමුට්ඨානං, ආපත්ති සමුට්ඨානය; යථා ඤායං, න්‍යාය වූ පරිද්දෙන්; පවක්ඛාමි කියමි; මෙ, ඒ මා වදන්; සුණාථ, අසව්.

25 යං, යම්බදු වූ; පඨමංපාරාජිකං, පඨමපාරාජික සමුට්ඨානයක් වේ නම් එය ද; තතො පරං, ඉන් ඔබ්බෙහි දුතියඤ්ච, දුතිය පාරාජික සමුට්ඨානය ද; සඤ්චරිත්තානුභාසඤ්ච, සඤ්චරිත්තසමුට්ඨානය සමනුභාසන සමුට්ඨානය යන දෙක ද; අතිරෙකං චීවරං ච, කඨින සමුට්ඨානය ද;

26 ලොමානි, එළකලොම සමුට්ඨානය ද; පදසොධම්මං, පදසොධම්ම සමුට්ඨානය ද; භූතං සංවිධානෙන ච, 'භූතා රොචන සමුට්ඨානය අද්ධාන පටිපජ්ජන සමුට්ඨානය යන දෙක ද; ථෙය්‍ය, ථෙය්‍යසත්ථ සමුට්ඨානය ද; දෙසන, ධම්ම දෙසනා සමුට්ඨානය ද; චොරී ච චොරිවුට්ඨාපන සමුට්ඨානය ද; යන මොව්හු; අනනුඤ්ඤාතාය, අනනුඤ්ඤාත සමුට්ඨානයන් සමග; තෙරස, තෙලෙසෙක් වෙති.

---

* යථාඤාණං-ප. † භාසකඤ්ච-ස. § චොරිං ච-ස-

27. තෙරසෙ'තෙ සමුට්ඨාන-නයා විඤ්ඤූහි චින්තිතා
එකෙක'ස්මිං සමුට්ඨානෙ-සදිසා ඉධ දිස්සරෙ

28. මෙථුනං සුක්කසංසග්ගා-අනියතා පඨමිකා
පුබ්බූප පරි පාචිතා-රහො භික්ඛුනියා සහ

---

27. එතෙ තෙරස සමුට්ඨාන නයා, මේ තෙළෙස් ආපත්ති සමුට්ඨාන ක්‍රමයෝ; විඤ්ඤූහි, විනයෙහි දක්ෂ නුවණැත්තන් විසින්; චින්තිතා, සිතනලද්දාහ; එකෙකස්මිං සමුට්ඨානෙ, එකි එකී සමුට්ඨානයෙක්හි; [ඇතුළත් වන] සදිසා, අන්‍යවූ සමාන ශික්ෂා පදයෝ ද; ඉධ, මේ උභය විභඞ්ගයෙහි, දිස්සරෙ, පෙණෙත්; [තෙරස සමුට්ඨානයන් අතුරෙන් **'පඨම පාරාජික සමුට්ඨාන'** යෙහි ඇතුළත් වන ශික්ෂාපදයන් දක්වනු සඳහා **'මෙථුනං සුක්කසංසග්ගා'** යනාදිය කියත්]

28. මෙථුනං, [යමක් පිරිසෙයින් ත්‍රිසන්ගිය මාගමක හා ද මෙවුන්දම් සෙවූ මහණහු පරිජි ඇවැත් අවන බැව් ප්‍රකාශිත] මෛථුන ශික්ෂාපදය ද; සුක්කසංසග්ගා, [සිහිනෙන් හැර ව්‍යතික්‍රම සාධක පූර්වභාග චෙතනා ඇති ශුක්‍ර මොචනයෙන් සඟ වෙසෙස් වන බැව් ප්‍රකාශිත වූ] සුක්කවිසඨි ශික්ෂාපදය හා [කාය සංසර්ග රාගයෙන් මිනිස් මාගමකගේ අත් පා ආදිය පරාමර්ශනය කිරීම් හෙතුවීන් සඟවෙසෙස් වන බැව් ප්‍රකාශිත] කායසංසර්ග ශික්ෂාපදය ද; පඨමිකා අනියතා,[යම් මහණෙක් එකලා වූ මිනිස් මාගමක් සමග තනිව මෛථුන සෙවනයට යොග්‍ය වූ අසුනෙක්හි හිඳී නම් ඒ දුටු ශ්‍රද්ධෙය වචන ඇති උවැසියකගේ ප්‍රතිඥා පරිදි **පරිජි, සඟවෙසෙස්, පචිති**, යන තුණින් යම් ඇවැතක් එකී මහණහුට ආරොපණය කට යුතු බැව් සන්දර්ශිත] පළමුවෙනි අනියත ශික්ෂාපදය ද; පුබ්බූපපරි පාචිතා, [සඟසතු සෙනස් නෙහි පළමුකොට වෙසෙමින් සිටි භික්ෂුව එයින් නොනැඟී යන්නේ යයි දැන දැන ම "යමෙකුට සම්බාධ වන්නේනම් හෙතෙම යන්නේය" යන සිතින් මඤ්චාදීන්ගේ උපචාරයටවැද සයන ක්‍රියා කරන්නාහුට පචිති ඇවැත් සිදුවන බැව් සූචිත] පුබ්බූපගත ශික්ෂාපදය හා [දැන දැන ම භික්ෂුණිය විසින් නිපදවන ලද පඤ්චවිධ භොජනයෙන් එක්තරා භොජනයක් වළඳන මහණහුට 'පචිති' ඇවැත් වන බැව් ප්‍රකාශිත] භික්ෂුණී පරිපාචිත ශික්ෂා පදය ද; රහො භික්ඛුනියා සහ [එකලා වූ මෙහෙණක් හා සමග රහසිගතව නිෂද්‍යාකරණ මහණහුට පචිති ඇවැත් සිදුවන බැව් ඥාපක] භික්ෂුණිය හා රහොගතව නිසජ්ජන ශික්ෂාපදය ද;

**29. සභොජනෙ රහො චෙව-අඞ්ගුලී උදකෙ හසං**
**පහාරෙ උග්ගිරෙ චෙව-තෙ පඤ්ඤාසා ච සෙඛියා**

**30. *අධක්ඛකං ගාමචස්සුතා-තලමට්ඨච සුඩිකා**
**වස්සංවුත්ථා ච ඔවාදං-නානුබන්ධ පවත්තිනිං**

---

29. සභොජනෙ, (මෛථුන රාගයෙන් සමන්විත ස්ත්‍රී පුරුෂයන් දෙදෙනෙකු ඇති භෝජනං ගෙහි ඇතුළට වැද හිඳින භික්ෂුවට පචිති ඇවැත් සිදුවන බැව් නියමිත) සභොජන ශික්ෂාපදය ද; රහො චෙව, (මිනිස් මාගමක සමග රහස් වූ මුවා වූ අසුනෙක්හි නිෂද්‍යා කරන්නහුට පචිති ඇවැත් සිදුවන බැව් සූචිත) රහො නිසජ්ජ ශික්ෂාපදය ද; අඞ්ගුලි, ඇඟිල්ලෙන් ගිරිති කවන භික්ෂුව පචිති ඇවැත් අවන බැව් සූචක) අඞ්ගුලි ශික්ෂාපදය ද; උදකෙ හසං, (දියෙහි ක්‍රීඩා කිරීම් හෙතුවින් පචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත) උදකහස්සධම්ම ශික්ෂාපදය ද; පහාරෙ; (කිපි භික්ෂුව හට ප්‍රහාරදානය කරණ මහණහුට පචිති ඇවැත් වනබැව් නියමිත) ප්‍රහාර ශික්ෂාපදය ද; උග්ගිරෙ චෙව; (කිපි භික්ෂුවක්හට වෙර පලු නැංවීමෙන් පචිති ඇවැත් අවන බැව් ප්‍රකාශිත) උග්ගිර ශික්ෂාපදය ද; තෙපඤ්ඤාසා ච සෙඛියා, [ඛුද්දක වර්ණනාවසානයෙහි වූ පරිමණ්ඩල පාරුපණාදී] තෙපණස් සෙඛියා ශික්ෂාපද ද;

30. අධක්ඛකං, [කාය සංසග්ගරාගයෙන් තෙත්වැ තමාගේ අකුඇපින් යට දනමඬල හා වැලමිටින් මත්තෙහි, එම රාගයෙන් ම මත් වූ මිනිස් පුරුෂයක්හුගේ ආමර්ශන පරාමර්ශනාදිය ඉවසන මෙහෙණහට පරිජි ඇවැත් වන බැව් සන්දර්ශිත] අධක්ඛක ශික්ෂාපදය ද; ගාමචස්සුතා, [එකලාව තමාහුත් ගමින් අනික් ගමකට යන්නාවූ ද එකලාව ගඟින් එතර යන්නාවූ ද, දෙවන භික්ෂුණියක් නැතිව රාත්‍රියෙහි එකලාව වසන්නාවූ ද භික්ෂුණිය සඟවෙසෙස් ඇවැතට පැමිණෙන බැව් ප්‍රකාශිත] ග්‍රාමාන්තර ගමන ශික්ෂාපදය ද; තලමට්ඨච සුඩිකා, (යටත් පිරිසෙයින් මහනෙල් පෙත්තකින්දු මූත්‍ර මාර්ග තලය පැහැරීමෙහි භික්ෂුණිය පචිතිඇවැත් අවන බැව් ප්‍රකාශිත) තලමට්ඨක ශික්ෂාපදය හා (ජලයෙන් මූත්‍ර මාර්ගය ශුධකිරීමෙහිදී දෑඟුල ඉක්මවන්නාවූ භික්ෂුණිය පචිති ඇවැතට පැමිණෙන බැව් සූචිත)

---

* අධක්ඛගාමචස්සුතා-ස-

## විනයගාථා ඣ ව්‍යාඛ්‍යාව.

31. ඡසත්තති ඉමෙ සික්ඛා–කායමානසිකා කතා
සබ්බෙ එක සමුට්ඨානා පඨමං පාරාජිකං යථා 'ති.

**පඨම පාරාජික සමුට්ඨානං නිට්ඨිතං**

32. අදින්නං විග්ගහුත්තරි-දුට්ඨුල්ල අත්තකාමිනං
අමූලා අඤ්ඤභාගියා–අනියතා දුතියිකා

---

උදකශුද්ධිකාදි යන ශික්ෂාපදය ද; වස්සං වුත්ථා ච, (යම් භික්ෂුණියක් විසූ වස් ඇත්තී ස පස් යොදුනක්හුදු ගමන් නො යන්නී නම් ඇ' පචිති ඇවැතට පැමිණෙන බැව් නියමිත) වස්සංවුත්ථ ශික්ෂාපදය ද; ඔවාදං, [ගරුධම්ම අසන පිණිස හෝ පොහෝ පවුරුණු විචාරණ පිණිස නොයන භික්ෂුණියට පචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත ඔවාදගමන ශික්ෂාපදය ද;] නානුබන්ධෙ පවත්තිනිං, (තමා උපසපන් කරවූ උපජ්ඣාය භික්ෂුණියට දෙවසියක් උපස්ථාන නො කරණ මෙහෙණ පචිති ඇවැතට පැමිණෙන බැව් සන්දීපක) නානුබන්ධ ශික්ෂාපද ය ද (යන);

31. ඉමෙ ඡසත්තති සික්ඛා, මේ සත් සැත්තෑවක් ශික්ෂාවෝ, (ලිඞ්ගවිපර්‍යාසයයි )කාය මානසිකා කතා, කාය–චිත්ත සමුට්ඨාන යෙන් කරණ ලද්දාහුයි. සබ්බෙ, මේ සියල්ලෝ; පඨමං පාරාජිකං යථා, ප්‍රථමපාරාජිකාව යම් සේ ද එසේ; එකසමුට්ඨානා, එකම සමුට්ඨානයක් ඇත්තෝ වෙත්

**පඨම පාරාජික සමුට්ඨානය නිමියේයි. (1)**

---

32. අදින්නං, [ගමින් හෝ ආරණ්‍යයෙන් පාදයක් හෝ පාදයක් වටිනා නුදුන් වස්තුව සොර සිතින් ගන්නා මහණ පරජි ඇවැතට පැමිණෙන බැව් ප්‍රකාශිත]අදත්තාදාන ශික්ෂාපදය ද; විග්ගහ, (මිනිස් සිරුරක් දිවියෙන් තොරකරණ මහණහුට පරිජි ඇවැත් සිදුවන බැව් සූචිත) මනුෂ්‍යවිග්‍රහ ශික්ෂාපදය ද; උත්තරි,[අභිමානයෙන් හැර තමා සතන්හි නැති උතුරුමිනිස්ධම් ප්‍රකාශ කරණ මහණ පරිජි ඇවැත් අවන බැව් සන්දර්ශිත] උත්තරිමනුස්ස ධම්ම සික්ඛාපදය ද; දුට්ඨුල්ල අත්තකාමිනං, (යම් භික්ෂුවක් දුට්ඨුල්ල වචනස්සාද රාගයට බටුයේ ඉන් පෙරළියාවූ සිතින් තරුණ පුරුෂයකු තරුණ ස්ත්‍රියකට යම්සේ ද? එසේ මිනිස් මාගමකට වසමග පසමග පිළිබඳ වූ මෛථුන සන්නිඃශ්‍රිත වචනයෙන් අසභ්‍ය

33. අවජීනෙ පරිණාමනෙ-මුසා ඔමස පෙසුනෙ
දුට්ඨුල්ල පඨවී ඛණෙ-භූතං අඤ්ඤංච උජ්ඣාපෙ*

---

බෙණේ නම් ඕහට සඟවෙසෙස් ඇවැත් වන බැව් සන්දීපක] දුට්ඨුල්ල ශික්ෂාපදය හා [සුභාෂිත දුර්භාෂිත දන්නා මිනිස් මාගමකට තමහට මෙවුන්දම්න් මෙහෙ කිරීමෙහි අනුසස් කියන මහණ තෙම සඟවෙසෙස් ඇවැතට පැමිණේ යයි දක්වන ලද] අත්තකාම පාරිචරියා ශික්ෂාව ද; අමූලාඅඤ්ඤභාගියා, [ද්වෙෂයෙන් දුෂ්ටවූ අමූලික පරිජි ඇවැතකින් භික්ෂුවකට චොදන කළ යම් මහණෙක් වේ නම් ඕහට සඟවෙසෙස් වනබැව් ප්‍රකාශිත ] අමූල ශික්ෂාපදය හා [එපරිද්දෙන් ම අන්‍යභාගිය අධිකරණයක්හුගේ ජාත්‍යාදී කිසිලෙශයක් ගෙණ පරිජි ඇවතකින් චෝදනාකරණ මහණහට සඟවෙසෙස් වන බැව් ඥාපක ] අඤ්ඤභාගිය ශික්ෂා පදය ද; දුතියකා අනියතා, [මාගමකට දුට්ඨුල්ලවාචායෙන් බණන්නට යොග්‍ය වූ අසුනක යම් භික්ෂුවක් එකලාවූ මාගමක් සමග එකලාව හිඳී නම් ඒ දුටු ශ්‍රද්ධෙය වචන ඇති උවැසියකගේ ප්‍රතිඥ පරිදි සඟවෙසෙස් හෝ පචිති යන ඇවැත් දෙකින් එකක් ඒ භික්ෂුවට ආරොපණය කට යුතු බැව් සන්දර්ශිත] දෙවන අනියත ශික්ෂාපදය ද;

33. අවජිනෙ, [භික්ෂුවක් හට තෙමේ ම සිවුරක් දී පසුව කිපී එය පැහැරගන්නා භික්ෂුවට නිසඟි පචිති ඇවැත් සිදු වන බැව් ප්‍රකාශිත] අච්ඡින්දන ශික්ෂාපදය ද; පරිණාමනෙ, [සඟහට පිරිනමන ලද බැව් දැන දැන ම සාඞ්ඝික වස්තුවක් තමහට නතු කරණ භික්ෂුවට නිසඟිපචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත] පරිණාම ශික්ෂාපදය ද; මුසා, [දැන දැන මුසවා කීමෙහි පචිති ඇවැත් සිදු වන බැව් ප්‍රකාශිත] මුසාවාද ශික්ෂාපදය ද; ඔමස [උපසපන් භික්ෂුවකට ජාත්‍යාදීන් ගටා බිණීමෙහි පචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත] ඔමසවාද ශික්ෂාපදය ද, පෙසුනෙ, [කේලාම් කීමෙහි පචිති ඇවැත් සිදුවන බැව් සූචිත] පෙසුඤ්ඤ ශික්ෂාපදය ද; දුට්ඨුල්ල පඨවීඛණෙ, [සඞ්ඝානුමතියක් නැතිව භික්ෂුවකගේ සඟවෙසෙස් ඇවැතක් අනුපසම්පන්නයක්හට සවස්තුක කොට කියන මහණ පචිති ඇවැතට පැමිණෙන බැව්

---

* අඤ්ඤාය උජ්ඣාපෙ-ස-

**34. නික්කඩ්ඪනං සික්ඛවිනං ච-ආමිසහෙතු භුත්තාවී**
**එහි අනාදරී භිංසා-අපනිධෙ ච ජීවිතං**

---

ප්‍රකාශිත] දුබ්බලාපත්ති ආරොචන ශික්‍ෂාපදය හා [අකැප පොළොව කණින කණවන මහණහට පචිති ඇවැත් නියමිත] පඨවිඛණන ශික්‍ෂාපදය ද; භූතං, [තෘණ වෘක්‍ෂාදීන්ගේ ඡේදනා දියෙහි පචිති ඇවැත් අවන බැව් ප්‍රකාශිත] භූතගාම ශික්‍ෂාපද ය ද; අඤ්ඤං ච, සඟමැද චොදනා කරණු ලබන කල්හි විචාල දෙය තබා අනිකක් කීමෙහි හා එසේම විචාළ දෙය නො කියා මවහෙස දීමෙහි ද පචිති ඇවැත් සිදුවන බැව් සංඤිපක] අඤ්ඤ වාදක ශික්‍ෂාපදය ද; උජ්ඣාපෙ, [සම්මති ලත් භික්‍ෂුව සෙසු භික්‍ෂූන් විසින් ලාමක කොට සිතෙහ සේ වඩන කීමෙහි හා ඔහුගේ නුගුණ භික්‍ෂූන් අතර පළවන සේ කථාකිරීමෙහි ද පචිති ඇවැත් නියමිත] උජ්ඣාපනක ශික්‍ෂාපදය ද;

34. නික්කඩ්ඪනං, [භික්‍ෂුවක් කෙරෙහි කුපිතවැ ඔහු සඟ සතු සෙනස්නෙන් නෙරපන්නාවූ හෝ නෙරපවන්නාවූ මහණ හට පචිති ඇවැත් සිදුවන බැව් පලවෙන] නික්කඩ්ඪන ශික්‍ෂා පදය ද; සික්ඛවිනක්ඛව, [දැන දැන පණුවන් ඇති දියෙන් තණ හෝ මැටි හෝ තෙමන්නාවූ ද තෙමවන්නාවූ ද භික්‍ෂුව පචිති ඇවැතට පැමිණෙන බැව් පලවෙන] සික්ඛවන ශික්‍ෂාපදය ද; ආමිසහෙතු, [යම් මහණෙක් "භික්‍ෂූහු චිවරාදී ආමිෂය තකා භික්‍ෂුණීන්ට අවවාද කෙරෙති" යි සම්මති ලත් භික්‍ෂූන්ට කියා නම් හෙතෙම පචිති ඇවැතට පැමිණේයයි ප්‍රකාශවන] ආමිස හෙතු ශික්‍ෂාපදය; භුත්තාවී, [යම් භික්‍ෂුවක් වැළඳූ පැවරූ භික්‍ෂු වක්හට ඒ බැව් දැන දැනත් වෙදනා උපදවන රිසියෙන් අයිරිත් නොකරණ ලද බාද්‍යභොජ්‍ය යකින් "මහණ! කව, වළඳව" යි එළවා පවරා නම් ඔහු වැළඳූ අවසන්හි ඒ පැවරූ භික්‍ෂුවට පචිති ඇවැත් වන බැව් සඳගීගිත] භුත්තාවී ශික්‍ෂාපදය ද; එහි, "ඇවත! මං හා කැටිව එව ගමකට හෝ නියම් ගමකට පිඩු පිණිස වදුම්හ" යි කියා භික්‍ෂුවක් කැඳවා ගෙණ ගොස් පසුව මානමක් හා සිනාකෙළි ඈ අනාචාරයක හැසිරෙණු සඳහා 'ඇවැත! යව තා සමග කථා කිරීම හෝ හිඳීම හෝ මට සුව නො වේ" යි කියා යම් කිසි ආමිෂයක් දී හෝ නො දී ඒ භික්‍ෂුව පිටත් කරණ මහණහුට පචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත]

35. ජානං සප්පාණකං කම්මං–ඌන සංවාස නාසනා
සහධම්මිකං විලෙඛා ච–මොහො අමූලකෙන ච

---

එහි ගාමං වා යනාදී ශික්ෂාපදය ද; අනාදරී, ශික්ෂාපදයෙන් අවවාද කරණු ලැබූ පුද්ගලයාහට හෝ ධර්මයට හෝ අනාදර කිරීමෙහි පචිති ඇවැත් නියමිත අනාදරිය ශික්ෂාපදය ද; භිංසා, භික්ෂුවක්හු භයගන්වන මහණහුට පචිති ඇවැත් නියමිත භිංසාපනක ශික්ෂාපදය ද; අපනිධෙ ච, [යටත් පිරිසෙයින් ක්‍රීඩා පිණිස පවා භික්ෂුවක්හුගේ පාත්‍රයක් හෝ සිවුරක් හෝ නිසීදනාදියක් හෝ තෙමේ සඟවන්නාවූ ද අනුන් ලවා සඟව වන්නාවූ ද භික්ෂුවට පචිති ඇවැත් නියමිත] අපනිධාන ශික්ෂාපදය ද; ජීවිතං, ["මොහු මරමි"යි දැන දැන තිරිසන් ගත සතක්හු දිවියෙන් තොර කරණ භික්ෂුව පචිති ඇවැතට පැමිණෙන බැව් කථිත] ජීවිතවොරොපණ ශික්ෂාපදය ද;

**35.** ජානං සප්පාණකං, දැන දැන පණුවන් ඇති දිය පරිභොග කරණ භික්ෂුවට පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත ශික්ෂාපදය ද; කම්මං, [යථා ධර්මයෙන් සන්සිඳුවනලද අධිකරණය දැන දැන ම නැවත කරණ පිණිස උගුළුවන භික්ෂුවට පචිති ඇවැත් ප්‍රකාශිත] උක්කොටන ශික්ෂාපදය ද; ඌන. [දැන දැන උනු විසිවස් ඇති පුද්ගලයා උපසම්පදා කරවා නම් ඒ පුද්ගලයා ද අනුපසම්පන්න වෙයි–ගණපූරක භික්ෂූහු ද දුකුලා ඇවතට පැමිණෙති. උපාධ්‍යායයාහට පචිති ඇවැත් වේ යයි නියමිත] ඌන වීසතිවස්ස ශික්ෂාපදය ද; සංවාස, [**"තථා'හං භගවතා ධම්මං දෙසිතං ආජානාමි"** යනාදී වාද ඇති බැවින් උත්ක්ෂෙපනීය කර්මය කරණු ලැබූ භික්ෂුව යම්තාක් ඔසාරණය නො කරණු ලැබේ නම් ඒ තාක් ඔහු හා ධර්මාමිෂ සම්භොග හා උපොෂිතාදී සංවාස කරණ මහණහුට පචිති ඇවැත් සිදුවන බැව් පළවෙන] සංවාස ශික්ෂාපදය ද; නාසනා, [**"තථා'හං භගවතා ධම්මං දෙසිතං ආජානාමි"** යනාදී වාද ඇති බැවින් නසනලද හෙරණෙකු හා සම්භොග කරණ භික්ෂුවට පචිති ඇවැත් නියමිත] නාසන ශික්ෂාපදය ද; සහධම්මිකං; [ප්‍රඥප්ත ශික්ෂාපදයෙන් අවවාද කරණු ලබන්නාවූ යම් භික්ෂුවක් "ඇවත ව්‍යක්ත බහුශ්‍රැත අන්‍ය විනයධර භික්ෂුවකගෙන් විචාරණ තුරු මම තෙල ශික්ෂාපදයෙහි නො හික්මෙමි"

36 *කුක්කුච්ච ධම්මිකං චීවරං–පරිණාමෙය්‍ය පුග්ගලෙ
ඛිංසන්ත අකාලං අච්ඡින්දෙ–දුග්ගහිත නිරයෙන ච

---

යයි කියා නම් ඔහුට පචිති ඇවැත් වනබැව් පළවෙන] සහධම්මික ශික්ෂාපදය ද; විලෙඛා ච, [ප්‍රාතිමොක් උදෙසනු ලබන කල්හි "මේ ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාවන් උදෙසීමෙන් කම් කිම්? හුදෙක් කුකුස් බව පිණිස වෙහෙස පිණිස විචිකිච්ඡා සඞ්ඛ්‍යාත මනො විලෙඛය පිණිස පවතින්නේය"යි කියන මහණහු පචිති ඇවැතට පැමිණෙන බැව් ප්‍රකාශිත] විලෙඛ ශික්ෂාපදය ද; මොහො, මොහාරොපණය කරණු ලැබූකල්හි නැවත මොහණක පුද්ගලයා කෙරෙහි පචිති ඇවැත් නියමිත මොහණක ශික්ෂාපදය ද; අමූලකෙන ච, [අමූලක සඞ්ඝාදිසෙසාපත්තියකින් භික්ෂුවක්හට චොදනා කරණ මහණහුට පචිති ඇවැත් වනබැව් පළවෙන] අමූලක ශික්ෂාපදය ද;

36. කුක්කුච්චං, ['මෙයින් මොහුට ඇසිල්ලකුදු අපහසුවක් ඇති කෙරෙමි 'යන සිතින් දැන දැන භික්ෂුවක්හට **"ඌනවීසති වස්සො මඤ්ඤෙ ත්වං උපසම්පන්නො"** යනාදීන් කුකුස් උපදවන මහණහට පචිති ඇවැත් වනබැව් ප්‍රකාශිත] කුක්කුච්ච උපදහන ශික්ෂාපදය ද; ධම්මිකං, [ධාර්මික වූ අපලොකනාදී චතුර්විධ විනය කර්මයන්ට ඡන්දය දී පසුව බුමුණන බවට පැමිණෙන භික්ෂුවට පචිති ඇවැත් වනබැව් සන්දර්ශිත] ධම්මික ශික්ෂාපදය ද; චීවරං, [සඞ්ඝයා හා සමගිව සෙනාසන පඤ්ඤාපකාදී සම්මුති ලත් භික්ෂුවකට සිවුරක් දී පසුව "භික්ෂූහු සාඞ්ඝික ලාභය විශ්වාස යන්ට පිරිනමති"යි බුමුණන බවට පැමිණෙන භික්ෂුවට පචිති ඇවැත් වනබැව් ප්‍රකාශිත] චීවර ශික්ෂාපදය ද; පුග්ගලෙ පරිණාමෙය්‍ය, [සඞ්ඝයාහට පිරිණමන ලද සාඞ්ඝසන්තක චීවරාදී වස්තුව දැන දැන පුද්ගලයෙකුට පිරිණමන භික්ෂුව පචිති ඇවැතට පැමිණෙන බැව් සූචිත] පුග්ගල පරිණාමන ශික්ෂාපදය ද; ඛිංසන්ත, ['අයස්මාවෙනි! ඔබ මෛථුනරාගයෙන් තෙත් නුවූයෙහි නම් මේ පුරුෂ පුද්ගල තෙමේ මෛථුනරාගයෙන් තෙත් වූයේ හෝ නුවූයේ ඔබට කුමක් කෙරේ ද? එබැවින් ඔබ මේ පුරුෂයා විසින් දෙනු ලබන ඛාද්‍යභොජ්‍යාදියක් සියතින් පිළිගෙණ කව වළඳව" යි

---

* කුක්කුච්චං චීවරං දත්වා-ෂ-

## සුජනප්පමොදනී

37. ගණං විභඞ්ගං දුබ්බලං–කඨිනා'ඵාසු'පස්සයං
අක්කොස චණ්ඩි මච්ඡරී–ගබ්භිනී ච පායන්තියා

---

කියන මෙහෙණිය සඟවෙසෙස් ඇවැතට පැමිණෙන බැව් පළවෙන] කිහෙන යනාදී ශික්ෂාපදය ද; අකාලං, [නො කල්හි සිවුරක් කල් සිවුරකැයි සිතින් ඉටා ගෙණ බෙදවන භික්ෂුණියට නිසැගි පචිති ඇවැත් වන බැව් නියමිත] අකාලචීවර භාජන ශික්ෂාපදය ද; අච්ඡින්ද, [භික්ෂුණියක් සමග සිවුරු මාරුකර ගෙණ පසුව "ආය්‍යාවෙනි! තිගේ සිවුර ගෙණ මගේ සිවුර දෙව! යමක් තිගේ නම් එය තීගේමය යමක් මගේ නම් එය මගේමය"යි කියා පැහැර ගන්නා වූ හෝ ගන්වන්නා වූ මෙහෙණියට නිසගි පචිති ඇවැත් නියමිත] චීවරාච්ඡින්දන ශික්ෂාපදය ද; දුග්ගහිත නිරයෙන ච, [වරදවා ගත් බැවින් නො විමසීම් හෙතුවින් අන් උපසපන් මෙහෙණක් හට දෙස් කියන භික්ෂුණිය පචිති ඇවැතට පැමිණෙන බැව් පළවෙන] දුග්ගහිතාදී ශික්ෂාපදය හා [තමාට හෝ අන් උපසපන් මෙහෙණක්හට නිරයෙන් හෝ බ්‍රහ්මචය්‍ය්‍යාවෙන් දිවුරණ භික්ෂුණිය පචිති ඇවැත් අවදින බැව් නියමිත] නිරයාදි ශික්ෂාපදය ද;

37. ගණං, ගණයාට සිවුරු ලැබීම අන්තරාය කරණ මෙහෙණියට පචිති ඇවැත් නියමිත ශික්ෂාපදය ද; විභඞ්ගං, ධාර්මික චීවර භාජනය වළකන භික්ෂුණිය පචිති ඇවැත් අවදින බැව් ප්‍රකාශිත චීවරවිභඞ්ග පටිබාහන ශික්ෂාපදය ද; දුබ්බලං, දුර්ල සිවුරෙහි ආශාවෙන් චීවරකාලසමය ඉක්මවන මෙහෙණියට පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත ශික්ෂාපදය ද; කඨින, [සමගි භික්ෂුණී සඞ්ඝයා විසින් කරණු ලබන කඨිනුද්ධාරය වළහන භික්ෂුණිය පචිති ඇවැතට පැමිණෙන බැව් පළවෙන] කඨිනුද්ධාර ශික්ෂාපදය ද; අඵාසු, දැන දැන භික්ෂුණියකට අපහසු කම් ඇති වන සේ ක්‍රියා කරණ මෙහෙණියට පචිති ඇවැත් නියමිත ශික්ෂාපදය ද; උපස්සයං, [භික්ෂුණියකට තමා සතු ගෙයක් දී පසුව කිපී ඈ එයින් බැහැර කරණ මෙහෙණිය පචිති ඇවැත් අවදින බැව් සන්දර්ශිත] උපස්සයාදි ශික්ෂාපදය ද; අක්කොස, භික්ෂුවක්හට ආක්‍රොශ පරිභව කරණ මෙහෙණියට පචිති ඇවැත් නියමිත ශික්ෂාපදය ද; චණ්ඩි, කොපව භික්ෂුණී සඞ්ඝයාට "බාලා අබ්‍යත්තා

38. වෙ වස්සා සික්ඛා සඞ්ඝන–තයො චේ'ව ගිහිගතා
කුමාරි භූතා තිස්සො ච–ඌන වාදස සම්මතා

---

**එතා''** යනාදීන් පරිභව බෙණෙන භික්ෂුණීය පචිති ඇවැත් අවදින බැව් පළවෙන ශික්ෂාපදය ද; මච්ඡරී, කුලමච්ඡරී භික්ෂුණීයට පචිති ඇවැත් නියමිත ශික්ෂාපදය ද; ගබ්භිනිං, බඩදරු වන් ඇති තැනැත්තිය උපසම්පදා කරවන භික්ෂුණීය පචිති ඇවැත් අවදින බැව් ප්‍රකාශිත ශික්ෂාපදය ද; පායන්තියා, කිරි පොවන තැනැත්තිය උපසම්පදා කරවන භික්ෂුණීයට පචිති ඇවැත් නියමිත ශික්ෂාපදය ද;

**38.** වෙ **වස්සා සික්ඛා**, [දෙ වසක් පාණාතිපාතා වේරමණාදී ෂට් ප්‍රකාර ධර්මයෙහි නො හික්මුණු ශික්ෂමානාවක් උපසම්පන්න කරවන භික්ෂුණීයට පචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත] වෙ වස්සාදි ශික්ෂාපදය ද; සඞ්ඝන, [දෙ වසක් ෂට්විධ ධර්මයෙහි හික්මුණු ශික්ෂමානාවක් භික්ෂුණී සඞ්ඝයා විසින් සම්මත නො කරණ ලදුව උපසම්පන්න කරවන මෙහෙණීය පචිති ඇවැත් අවදින බැව් පලවෙන] සඞ්ඝන අසම්මතා' යන ශික්ෂාපදය ද, තයො ගිහිගතා ච එව, [නො පිරිපුන් දොළොස් අවුරුදු ඇති පුරුෂ සමාගමයට පැමිණි තැනැත්තිය ද; දෙවසක් ෂට්විධ ධර්මයෙහි නො හික්මුණු පිරිපුන් දොළොස් අවුරුදු ඇති එබඳු ම තැනැත්තිය ද යළිදු, පිරිපුන් දොළොස් අවුරුදු ඇති ෂට්විධ ධර්මයෙහි දෙ වසක් හික්මුණු භික්ෂුණී සඞ්ඝයා විසින් සම්මත නො ලත් තැනැත්තිය ද යන මොවුන් උපසම්පන්න කරණ භික්ෂුණීන්ට පචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත] ගිහිගත ශික්ෂාපද ත්‍රයය ද; කුමාරිභූතා තිස්සො ච, [විසි වස් නො පිරුණු පුරුෂ සමාගමක් නැති හෙයින් කුමාරිකා නම් වූ තැනැත්තිය ද; දෙවසක් ෂට්විධ ධර්මයෙහි නො හික්මුණු පිරිපුන් විසි වයස් ඇති එබඳු ම තැනැත්තිය ද, යළිදු දෙ වසක් ෂට්විධ ධර්මයෙහි හික්මුණු සඞ්ඝයා විසින් අසම්මත වූ උක්ත ලක්ෂණ ඇති තැනැත්තිය ද, යන මොවුන් උපසම්පන්න කරවීමෙන් ඒ ඒ භික්ෂුණීන්ට පචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත] කුමාරිභූත ශික්ෂාපද ත්‍රයය ද, ඌන වාදස සම්මතා, ඌනු දොළොස් වස් ඇත්තිය ද, පිරිපුන් දොළොස් වස් ඇති භික්ෂුණීන් විසින් අසම්මත තැනැත්තිය ද යන දෙදෙන උපසම්පන්න කරණ භික්ෂුණීන්ට පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත ශික්ෂාපද දෙක ද;

39. අලන්තාව*සොකාවාසං-ඡන්‍ද අනුවස්සා ච වෙ
සික්ඛාපදා සත්තති ‘මෙ-සමුට්ඨානා තිකා කතා

40. කාය චිත්තෙන න වාචා-වාචා චිත්තං න කායිකා
තීහි ද්වාරෙහි ජායන්ති-පාරාජිකං දුතියං යථා’ති

**දුතිය පාරාජික සමුට්ඨානං නිට්ඨිතං.**

—//—

---

39. අලං තාව, [ආර්‍ය්‍යාව! තව ම ඔබගේ උපසම්පදාවෙන් කම් නැතැ යි කියනු ලබන්නී “යහපතැ” යි ගිවිස පසුව බුමුණන බවට පැමිණෙන්නියට පචිති ඇවැත් සිදුවන බැව් දැපන] අලං තාව” යනාදී ශික්‍ෂාපදය ද; සොකාවාසං, [පුරුෂයන් හා සංශෘෂ්ට වූ කුමාරයන් හා සංශෘෂ්ට වූ දැඩි වූ පුරුෂයන්ට ශොක දෙන්නා වූ තැනැත්තිය උපසම්පන්න කරවන භික්‍ෂුණියට පචිති ඇවැත් නියමිත] සොකාවාසාදී ශික්‍ෂාපදය ද; ඡන්‍ද, [ලැග්ගා වූ ඡන්දය ඇතිව ශික්‍ෂමානාවක් උපසම්පන්න කරණ භික්‍ෂුණියට පචිති ඇවැත් සිදුවන බැව් පළවෙන] පාරිවාසික ඡන්දදාන ශික්‍ෂාපදය ද; අනුවස්සා, [අවුරුද්දක් පාසා උපසම්පන්න කරවීමෙන් භික්‍ෂුණිය පචිති ඇවැත් අවදින බැව් පළවෙන] අනුවස්ස වුට්ඨාපන ශික්‍ෂාපදය ද;යන වෙ, මේ දෙකත් සමග; ඉමෙ සත්තති සික්ඛාපදා, මේ සැත්තෑවක් ශික්‍ෂාපදයෝ; තිකා සමුට්ඨානා කතා, තිකසමුට්ඨානයෝ යි නම් කරණ ලද්දාහ.

40. කාය චිත්තෙන, කයින් හා සිතින් ද; න වාචා, වචනයෙන් නොරව ද (ඇවත නාගි) වාචා චිත්තං, වචනයෙන් හා සිතිනුත්; න කායතො, කයින් නොරවත්(ඇවත නාගී) තීහි ද්වාරෙහි මෙසේ කාය වාචා චිත්ත යන තුන් දොරින් ජායන්ති,ඇවැත් නාගිත්. දුතියං පාරාජිකං යථා, දෙවන පාරාජිකාව යම්සේ ද එසේයි.

**විතිය පරජික සමුට්ඨානය නිමි.** (2)

—//—

---

* අලංතාව සොකාවස්සං-පා-

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

**41.** **සඤ්චරි** කුටිවිහාරෙ–ධොවනඤ්ච පටිග්ගහො
විඤ්ඤත්තුත්තරි අභිහට්ඨුං–උභින්නං දූතකෙන ච

---

**41.** **සඤ්චරි,** [නිබඳ අඹු සැමි බැව්හි හෝ මිථ්‍යාචාර බැව්හි හෝ පුරුෂයාගේ අභිප්‍රායය ස්ත්‍රියට හෝ ස්ත්‍රියගේ අභිප්‍රායය පුරුෂයාට කීමෙන් ස්ත්‍රී පුරුෂයන් කෙරෙහි හැසිරීම් බවට හෙවත් හසුන් ගැණුම්, විමසීම්, නැවත ගෙණඒම්, යන මීට පැමිණෙන භික්ෂුව සඟවෙසෙස් ඇවැත් අවදින බැව් සඳශිගිත] සඤ්චරිත්ත ශික්ෂාපදය ද; කුටි, [යම් භික්ෂුවක් කුනකිපිලලි කාසයාදී උපද්‍රව සහිත වූ බලිවද්ද යුතත් සකටයක් සිසාරවා යා නොහැකි බැවින් උපචාර නැත්තා වූ කුටි වස්තුවෙහි ස්වයං යාචිත පරිෂ්කාරයෙන් කුටියක් කෙළේ වී නම් කුටි වස්තු දෙසන පිණිස භික්ෂූන් හෝ නො එළවූයේ නම් ප්‍රමාණය හෝ ඉක්මවූයේ නම් ඔහුට සඟවෙසෙස් ඇවැත් වන බැව් සඳශිගිත] කුටිකාර ශික්ෂාපදය ද; විහාරෙ, [උපද්‍රව සහිත වූ උපචාර රහිත වූ භූමියෙහි මහල්ලක විහාරයක් කරවන්නේ නම් වස්තුදෙශනාව සඳහා භික්ෂූන් නො එලවන්නේ නම් එසේ කරණ මහණහු සඟවෙසෙස් ඇවැතට පැමිණෙන බැව් ප්‍රකාශවන] විහාර කාරාපන ශික්ෂාපදය ද; ධොවනං ච, [යම් භික්ෂුවක් නො නෑ මෙහෙණක ලවා පුරාණ චීවරයක් සෝදවා නම් හෝ රඳවා නම් හෝ ආකොටනය කරවා නම් හෝ වේ ද ඔහුට නිසගි පචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත] චීවර ධොවන ශික්ෂාපදය ද; පටිග්ගහො,[යටත්පිරිසෙයින් අරළු කඩකුඩුදී මුත් නො නෑ මෙහෙණක අතින් සිවුරක් පිළිගන්නා භික්ෂුවහට නිසගි පචිති ඇවැත් නියමිත] චීවර පටිග්ගහණ ශික්ෂාපදය ද; විඤ්ඤත්ති, [සොරුන් විසින් පැහැර නො ගන්නා ලද සිවුරු ඇති නො නට සිවුරු ඇති භික්ෂුවක් නො නෑ ගැහැවියෙකු හෝ ගිහිණියකු හෝ සිවුරක් ඉල්වා නම් ඕහට නිසගි පචිති ඇවැත් සිදුවන බැව් සඳශිගිත] විඥප්ති ශික්ෂාපදය ද; උත්තරි අභිහට්ඨුං, අච්ඡින්නාදි චීවර ඇති භික්ෂුවක් ගැහැවියෙකු හෝ ගිහිණියකු බොහෝ සිවුරුවලින් පවරණ කල්හි ඒ භික්ෂුව විසින් හඳනාව හා පොරෝණාව පමණක් ඉවසිය යුතුය. ඉන් මනත් ඉවසා නම් ඕහට නිසගි පචිති ඇවැත් සිදු වන බැව් ප්‍රකාශිත] උත්තරි සාදියන ශික්ෂාපදය ද; උභින්නං, නො නෑ ගෘහපතියෙකු විසින් හෝ ගෘහිණියක විසින් හෝ "මේ

42. *කොසිය සුද්ධ ෙව භාගා-ජ්ඣස්සානි නිසීදනං
රික්ඛවන්ති රූපිකා චේ'ව-උභො නානප්පකාරකා

සිවුරු මිලයෙන් සිවුරක් ගෙණ මෙ නම් භික්ෂුවට පුදන්නෙමි''යි සිවුරු මිලයක් රැස්කොට තබනලද කල්හි පෙර නො පවරණ ලද ඒ භික්ෂුව එනනට එළඹ "ඇවැත ! මේ සිවුරු මිලයෙන් මෙබඳු හෝ මෙබඳු හෝ සිවුරක් ගෙණ මට පුදව"යි කියමින් සිවුරෙහි අධික විධානයට පැමිණේ නම් ඔහුට නිසගි පචිති ඇවැත් සිදුවෙන බැව් ප්‍රකාශිත] පළමුවෙනි චීවර චෙතාපන්න ශික්ෂාපදය හා [එපරිද්දෙන් ම ගෘහපතියන් දෙදෙනකු විසින් හෝ ගෘහිණියන් දෙදෙනෙකු විසින් හෝ වෙන් වෙන් වශයෙන් සිවුරු මිල රැස්කොට තබන ලද කල්හි උක්ත ලක්ෂණඇති භික්ෂුව ඔවුන් වෙත පැමිණ 'ඇවැත්නි! තෙපි දෙදෙන ම එක්ව මෙබඳු මෙබඳු ආකාර ඇති එක සිවුරක් ම මට පුදව්"යයි බහුල විධානයට පැමිණේ නම් ඔහුට නිසගි පචිති ඇවත් සිදුවන බැව් ප්‍රකාශිත] දෙවන චීවර චෙතාපන්න ශික්ෂාපදය ද යන දෙක ද; දූතකෙන ච,[භික්ෂුවකට සිවුරක් ගෙණ පිදීමට රජකු විසින් හෝ රාජාමාත්‍යයකු විසින් හෝ බ්‍රාහමණයකු විසින් හෝ ගෘහපතියෙකු විසින් හෝ එවන ලද සිවුරු මිලක් දූතයා විසින් ඒ භික්ෂුවගේ කැපකරුවකු වෙත භාරකරණු ලැබූ කල්හි භික්ෂුව විසින් කැපකරු වෙත එළඹ දෙතුන්වර තෙක් සිවුරක් ඉල්විය යුතුයි. එසේ කොට සිවුරක් නො ලද්දේ නම් සවෙනිවර තෙක් තූෂ්ණීම්භූතව උදෙසා සිටිය යුතුයි. එසේ කොටත් නො ලැබ මත්තෙහි ව්‍යායාම කොට සිවුරක් නිපදවන්නේ නම් ඒ භික්ෂුවහට නිසගි පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත] දූත චීවර චෙතාපන්න ශික්ෂාපදය ද;

42. කොසිය, තිහිරි හූ මුසු කරණ ලද එළුලොම් මුවා සන්ථතයක් කරවන මහණහුට නිසගි පචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත කොසියමිස්සක ශික්ෂාපදය ද; සුද්ධ, හුදෙක් කළුවූ එළුලොමින් සන්ථතයක් කරවන භික්ෂුව නිසගිපචිති ඇවැත් අවදින බැව් ප්‍රකාශිත සුද්ධකාළක එළකලොම ශික්ෂාපදය ද; වෙ භාගා, [අලුත් සන්ථතයක් කරවන භික්ෂුව විසින් සුද්ධ කළු එළු ලොමින් කොටස් දෙකක් ද සුදු එළු ලොමින් තුන්වන

* කොසියා-ප-

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

**43** ඌනබන්ධන වස්සිකා-සුත්තං විකප්පනෙන ච
*වාරදූන සිබ්බිනී ච-පුව පච්චය ජොති ච

---

කොටස ද කිඹුල්වන් එළු ලොමින් සතරවන කොටස ද ගත යුතුයි. එසේ නො ගෙණ කරවන භික්ෂුවට නිසගිපචිති ඇවැත් ප්‍රකාශිත] වෙ භාගාදී ශික්ෂාපදය ද; ඡබ්බස්සානි, [අලුත් සන්ථතයක් කළ භික්ෂුව විසින් සාවුරුද්දක් එය පරිභොග කට යුතුයි. සාවුරුද්ද ඇතුළත අනික් සන්ථතයක් කරවා නම් ඔහුට නිසගි පචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත] ඡබ්බස්සානි යනාදී ශික්ෂාපදය ද; නිසීදනං, [පුරාණ සන්ථතයෙන්] සුගත් වියතක් පමණ තැන් කපා නො ගෙණ අලුත් නිසීදන සන්ථතයක් කරවන භික්ෂුවට නිසගි පචිති ඇවැත් සිදුවන බැව් නියමිත] නිසීදන ශික්ෂාපදය ද; රිඤ්චනති, [යම් භික්ෂුවක් නො නෑ මෙහෙණක ලවා එළුලොම් සෝදවා නම් හෝ රඳවා නම් හෝ අවුල් හරවා නම් හෝ වේ ද ඔහුට නිසගි පචිති සිදුවන බැව් පළවෙන] එළකලොම ධොවන ශික්ෂාපදය ද; රූපිකා චෙව, [රන් රිදී මසු කහවණු තෙමේ ගන්නා වූ ද අනුන් ලවා තමන් පිණිස ගන්වන්නාවූ ද එළවා තබන ලද්දක් සිතින් ඉවසන්නාවූද භික්ෂුවට නිසගි පචිති වන බැව් ප්‍රකාශිත]රූපිය පටිග්ගහණ ශික්ෂාපදය ද; උභො නානප්පකාරකා, [නා නා ප්‍රකාර වූ රන් රිදී මසු කහවණු පෙරළි කිරීමට පැමිණෙන භික්ෂුවට නිසගිපචිති වන බැව් සූචිත ශික්ෂාපදය හා නානා ප්‍රකාර වූ ගණු දෙනු කිරීමට පැමිණෙන භික්ෂුවට නිසගිපචිති වන බැව් සූචිත ශික්ෂාපදයදූ යි යන] නානප්පකාරක ශික්ෂාපද දෙක ද;

**43**. ඌනබන්ධන, [පඤ්ච බන්ධනයකින් අඩු පාත්‍රයක් ඇති භික්ෂුවක් විසින් අනෙක් අලුත් පාත්‍රයක් ඉල්වා නම් ඕහට නිසගි පචිති වන බැව් සූචිත ඌන පඤ්චබන්ධන ශික්ෂාපදය ද; වස්සික, [ගිමන් සාරමසින් පශ්චිම මාසයට පූර්වභාගයෙහි ම වැසිසළු සොයන්නා වූ ද පශ්චිම අර්ධමාසයට පූර්වභාගයෙහි ම ගෙන්නම් ආදිය කොට හඳින්නාවූ ද භික්ෂුවට නිසගිපචිති වන බැව් සන්දර්ශිත] වස්සිකසාටික ශික්ෂපදය ද; සුත්තං, [තෙමේ ම හූ විනවා නො නෑ නො පැවරූ පෙහෙරන් ලවා සිවුරක් වියවන

---

* වාරදූතා සිබ්බානි ච-ස-

භික්ෂුවට නිසගි පචිති වන බැව් ප්‍රකාශිත] සුත්ත විඤ්ඤාපන ශික්ෂාපදය ද; විකප්පනෙන ච, [භික්ෂුවක් උදෙසා නො නෑ ගිහි මිනිසකු විසින් හෝ ගිහි මාගමක විසින් සන්නාලීන් ලවා සිවු රක් වියවනු ලබන කල්හි ඒ භික්ෂුව පෙර නො පවරණ ලද්දේ සන්නාලින් කරා එළඹ එය තමා නිසා වියන බැව් කියා සිවුර දික් කරවීම් පුළුල් කරවීම් ආදියෙන් අධික විකප්පනයට පැමිණේ නම් ඒ භික්ෂුවට නිසගි පචිති වන බැව් ප්‍රකාශිත] විකප්පන ශික්ෂාපදය ද; වාරා, [මහල්ලක විහාරය කරවන භික්ෂුව විසින් දොරබාවට හාත්පස දෙරියන් වියත් පමණ ප්‍රදෙශය දොරබාව නිශ්චල වන පිණිස නැවත නැවත මත්තිකාලෙපය කට යුතුයි. අනුන් ලවා හෝ කරවිය යුතුයි. කවුළු සමීපය ඒ කවුළු තබා පිරියම් පිණිස ලෙපකට යුතුයි. අනුන් ලවා හෝ කරවිය යුතුයි. ධාන්‍යාදිය නො වපුළ තැන සිට ඡදනයාගේ දෙ තුන් පරික්ෂෙප යක් හෝ දෙ තුන් මඟක් මතු මත්තෙහි සොයන විසින් විධාන කට යුතුයි. එකී තුන් පරික්ෂෙපයට තුන් මඟට අධිකව විධාන කරණ භික්ෂුවට පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත] වාරකොසා යනාදී ශික්ෂාපදය ද; දන, [පාරිවට්ටකය හැර නො නෑ මෙහෙ ණින්නකට සිවුරක් දෙන භික්ෂුව පචිති ඇවැත් අවදින බැව් ප්‍රකාශිත] චීවර දන ශික්ෂාපදය ද; සිබ්බිනී ච, නොනෑ මෙහෙ ණකගේ සිවුරක් තෙමේ මහන්නා වූ ද අනුන් ලවා මස්වන්නා වූ ද භික්ෂුවට පචිති ඇවැත් වන බැව් නියමිත] චීවර සිබ්බන ශික්ෂා පදය ද; පූව, [කුලයට එළඹි භික්ෂුවක් තමහට පවරණ ලද අතිරස ලහළු ඈ කන දෙයින් හෝ බදහත් තිල තණ්ඩුලාදී මන්‍ථයෙන් හෝ පිරූ දෙ තුන් පා කෙණෙකුන්ට වඩා පිළිගත්තේ වී නම් ඕ හට පචිති ඇවැත් නියමිත] පූවපවාරණ ශික්ෂාපදය ද; පච්චය, [නො ගිලන් භික්ෂුව විසින් සාර මසක් ගිලන් පස යෙන් කරණ පවාරණය ඉවසිය යුතුයි. ඉන් මත්තෙහි විනවා නම් පචිති වන බැව් නියමිත] පච්චය පවාරණ ශික්ෂාපදය ද; ජොති ච, [නො ගිලන් භික්ෂුවක් තපිනා කැමැත්තේ ගිනි දල්වා නම් හෝ දල්වවා නම් හෝ වී නම් ඕහට පචිති ඇවැත් වන බැව් සූචිත] ජොති සමාදහන ශික්ෂාපදය ද;

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

44. රතනං සූචි මඤ්චො ච–තූලං නිසීදනං කණ්ඩු ච
වස්සිකා ච සුගතෙන–විඤ්ඤත්‍ය'ඤ්ඤ චෙතාපනා

---

**44** රතනං, [ඇතුළු අරමද ඇතුළු ගෙය ද හැර සෙසු තැන තුබූ මුතු මැණික් ඈ රුවනක් හෝ පිළි ඈ රතන සම්මතයක් හෝ නගා තබා දෙනු පිණිස තෙමේ ම ගන්නා වූ හෝ අනුන් ලවා ගන්වන්නා වූ හෝ භික්ෂුවට පචිති ඇවැත් වන බැව් පළ වෙන] රතන ශික්ෂාපද ය ද; සූචි, [ඇටමුවා හෝ දළමුවා හෝ අංමුවා හෝ ඉඳිකඳක් කරවන භික්ෂුවට භෙදනක පචිති ඇවැත් වන බැව් නියමිත] සූචිඝර ශික්ෂාපදය ද; මඤ්චො ච, [අලුත් ඇඳක් හෝ පුටුවක් කරවන භික්ෂුව විසින් වැල්යටය හැර සුගත් අඟුලෙන් අටඟුලක් පමණ පා ඇති කොට කරවිය යුතුයි. එය ඉක්මවන්නාහට ඡේදන පචිති වන්නේ ය යි ප්‍රඥප්ත] මඤ්චකාරාපන ශික්ෂාපදය ද; තූලං, [ඇඳක් හෝ පුටුවක් හෝ පුලුන් එව කරවන භික්ෂුවට උද්දාලනක පචිති ඇවැත් වන බැව් දීපිත] තූල ශික්ෂාපදය ද; නිසීදනං, [දිගින් සුගත් වියතින් දෙවියතක් ද සරස යෙළ වියතක් ද දශය වියතක් ද යන මෙ කී ප්‍රමාණය ඉක්මවා නිසීදනයක් කරවන භික්ෂුවට ඡේදනපචිති වන බැව් සූචිත] නිසීදන ශික්ෂාපදය ද; කණ්ඩු ච, [දිගින් සුගත් වියතින් සතරක් ද සරස්හි දෙ වියතක් ද යන ප්‍රමාණය ඉක්මවා කණ්ඩුපටිච්ඡාදක චීවරය කරවන භික්ෂුව ඡේදන පචිති ඇවැතට පැමිණෙන බැව් ප්‍රකාශිත] කණ්ඩුපටිච්ඡාදක ශික්ෂාපදය ද; වස්සිකා ච, [දිගින් සුගත් වියතින් ස වියතක් ද සරස්හි අඩු තුන් වියතක් ද යන ප්‍රමාණය ඉක්මවා වැසිසළු සිවුරු කරවන භික්ෂුව ඡේදන පචිති ඇවැත් අවදින බැව් පළවෙන] වස්සික සාටික ශික්ෂාපදය ද; සුගතෙන, සුගත් සිවුර පමණ හෝ ඉන් අධික කොට හෝ සිවුරක් කරවන භික්ෂුවට ඡේදනපචිති වන බැව් ප්‍රකාශිත ශික්ෂාපදය ද; විඤ්ඤත්ති, [යම් භික්ෂුණියක් එකක් ඉල්වා ඒ තබා අනිකක් ඉල්වා නම් ඇට නිසගි පචිති ඇවැත් වන්නේය යි ප්‍රඥප්ත]විඤ්ඤත්ති ශික්ෂාපදය ද; අඤ්ඤ චෙතාපනා [යම් භික්ෂුණියක් අනිකක් පරිවර්තනය කරවා නම් ඇට නිසගි පචිති වන්නේ ය යි ප්‍රඥප්ත] අඤ්ඤ චෙතාපන ශික්ෂාපදය ද;

## සුජනපසමොදනී

**45.** ෙච සඞ්ඝිකා ච මහාජනිකා ෙච-පුග්ගලා ගරුකා ලහු*
ෙච විසාසා සාටිකා ච-සමණ චීවෙරන ච

45. ෙච සඞ්ඝිකා, [යම් භික්ෂුණියක් තොමෝ අනිකක් පිණිස දුන්නා වූ අනිකක් උදෙසා දුන්නා වූ සඟසතු යොට දුන්නාවූ කැප පිරිකරින් අනිකක් පරිවර්තනය කරවා නම් ඈට නිසඟි පචිති වන්නේ යයි ප්‍රඥප්ත] පළමුවෙනි සඞ්ඝික ශික්ෂාපදය හා [තමා විසිනුදු ඉල්වන ලද උක්තලක්ෂණ ඇති පිරිකරින් (යමක් පිණිස දෙන ලද්දේ නම් ඒ තබා) අනිකක් පරිවර්තනය කරවන භික්ෂුණියට නිසඟි අචිති වන බැව් ප්‍රකාශිත] දෙවන සඞ්ඝික ශික්ෂාපදය ද; මහාජනිකා ෙච, [ගණයාහට දුන්නා වූ පූර්වෝක්ත ලක්ෂණ ඇති පිරිකරින් අනිකක් පෙරළි කරණ භික්ෂුණියට නිසඟි පචිති වන බැව් ප්‍රකාශවන] මහාජනික ශික්ෂාපදය හා [තමා විසිනුදු ඉල්වනලද උක්තප්‍රකාර පිරිකරකින් අනිකක් පෙරළි කරණ භික්ෂුණියට නිසඟි පචිති වන බැව් ප්‍රකාශිත මහාජනික ශික්ෂාපදය ද යන] මහාජනික ශික්ෂාපද වයය ද; පුග්ගලා, [එක මෙහෙණකට දුන්නා වූ යථෝක්ත පිරිකරින් අනිකක් පෙරළිකරණ භික්ෂුණියට නිසඟිපචිති වනබැව් සූචිත] පුග්ගල සික්ඛාපදය ද; ගරුකා, [ශිතකාලයෙහි පොරොණා කම්බලාදි ගරු පාපුරණයක් ඉල්වන්නා වූ භික්ෂුණිය විසින් සොලොස් කහවණුවකට වඩා වටිනා පාපුරණයක් ඉල්වා ගන්නා ලද නම් නිසඟිපචිති වන බැව් ප්‍රකාශිත] ගරුක ශික්ෂාපදය ද; ලහු, [උෂ්ණ කාලයෙහි පෙරවිය යුතු ලඝු පාපුරණයක් ඉල්වන්නා වූ භික්ෂුණිය විසින් දසකහවණුවකට වඩා වටිනා පාපුරණයක් ඉල්වා ගන්නා ලද නම් නිසඟි පචිති වනබැව් ඥාපක] ලහුක ශික්ෂාපදය ද; ෙච විසාසා, [මල මූ කසල ඉඳුල් යන මේ දෙය භිත්ති ප්‍රාකාරවලින් පිටත දමන භික්ෂුණියට පචිති ඇවැත් වන බැව් කියනලද පළමුවෙනි විසාස ශික්ෂාපදය හා එම දෙය ම නිල් තණ ඇති පෙදෙස්හි දමන භික්ෂුණියට පචිති ඇවැත් වන බැව් සූචිත දෙවෙනි විසාස ශික්ෂාපදයද යන] විසාස ශික්ෂාපද දෙක ද; සාටිකා ච, [දිගින් සුගත් වියතින් සතරක් ද; සරස දෙවියතක් ද යන ප්‍රමාණය ඉක්මවා දියසළු සිවුරු කරවන භික්ෂු

* පුග්ගල ලහුකා ගරු-ස-

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව

46. සම පඤ්ඤාසි,මෙ ධම්මා-ඡහි ඨානෙහි ජායරෙ
කායතො න වාචා චිත්තා-වාචතො න කාය මනා

47. කාය වාචා න චිත්තතො-කාය චිත්තා න වාචතො
වාචා චිත්තා න කායෙන-තීහි*ද්වාරෙහි ජායරෙ
ඡ සමුට්ඨානිකා වේ'තෙ-සඤ්චරිත්තෙන සාදිසා

### සඤ්චරිත්ත සමුට්ඨානං නිට්ඨිතං

48. භෙද'නුවත්තන දුබ්බච-දූස දුට්ඨුල්ල දිට්ඨි ච
ඡන්දං උජ්ජග්ඝිකා ද්වෙ ච-ද්වෙ ච සඤ්ඤා න බ්‍යාහරෙ

---

ණියට පචිති වන බැව් ප්‍රකාශිත] උදකසාටිකා ශික්ෂාපදය **ද;** සමණ චීවරෙන ච, [ගිහියෙකුට හෝ පිරිවැජියෙකුට හෝ පිරිවැජියකට කබ්බින්දු එබ්බූ සිවුරක් දෙන භික්ෂුණියට පචිති ඇවැත් වන බැව් සූචිත] සමණ චීවර ශික්ෂාපද ය ද යන;

46. ඉමෙ සමපඤ්ඤාස ධම්මා, මේ සමපණස් ධර්මයෝ; ඡහි ඨානෙහි, ස තැනෙකින්; ජායරෙ, උපදිත්; (ඒ එසේ මැයි) (1) කායතො න වාචා චිත්තා; කයිනුත් වචනයෙන් හා සිතින් තොරවත් උපදිත්; (2) වාචතො න කාය මනා, වචන යෙනුත් කයින් හා සිතින් තොරවත් උපදිත්.

**47.** (3) කායවාචා න චිත්තතො, කයින් හා වචනිනුත් සිතින් තොරවත් උපදිත්. (4) කාය චිත්තා න වාචතො, කයින් හා සිතිනුත් වචනයෙන් තොරවත් උපදිත්. (5) වාචාචිත්තා න කායෙන, වචනයෙන් හා සිතිනුත් කයින් තොරවත් උපදිත්. (6) තීහි ද්වාරෙහි ජායරෙ, කය වචන සිත යන ත්‍රිදොරින් උපදිත්. එතෙ, මොව්හු; සඤ්චරිත්තෙන සාදිසා, සඤ්චරිත්ත ශික්ෂාපදය හා **සදෘශවූවෝ;** ඡ සමුට්ඨානිකා, **ඡ සමුට්ඨානික** ශික්ෂාපදයෝ වෙති.

### සඤ්චරිත්ත සමුට්ඨානය නිමි. (3)

—//—

**48.** භෙද, [සඞ්ඝභෙදයට යත්න කරන්නාවූ භෙදකරවස්තු වක් හෝ ගෙණ සිටින්නාවූ **භික්ෂුව** තුන් යළක් **සමනුභාසන** කම් කරණ තෙක් ඒ නො හරී නම් ඔහුට සඟවෙසෙස් ඇවැත් වන බැව් ප්‍රකාශිත] භෙදපරක්කමන ශික්ෂාපදය ද; අනුවත්තන, [සඞ්ඝ

* ඨානෙහි-ප-

## සුජනප්පමොදනී

**49.** ඡමා නීචාසනෙ ඨානං–පච්ඡතො උප්පථෙන ච
වජ්ජානුවත්ති ගහණා–ඔසාරෙ පච්චා **චික්ඛණා**

---

භෙදයට යත්න කරණ භික්ෂුවට අනුවර්තක වන භික්ෂුකෙණෙක් තුන් යලක් **සමනුභාසන** කම් කරණ තෙක් එය අත් නො හරිත් නම් ඔවුන්ට සඟවෙසෙස් වන බැව් ප්‍රකාශිත] අනුවර්තන ශික්ෂා පදය ද; දුබ්බච, දුර්වච භික්ෂුව තුන් යලක් **සමනුභාසන** කම් කරණ තෙක් තම දුර්වච භාවය නො හරී නම් ඔහුට සඟ වෙසෙස් වන බැව් සන්දර්ශිත] දුර්වච ශික්ෂාපදය ද; දූස, කුල දූසක භික්ෂුකෙණෙක් තමන්ට භික්ෂූන් විසින් **පබ්බාජනීය කර්මය** කරණ කල්හි **"භික්ෂූහු ඡන්දාදී සතර අගතියෙන් පවත්නාහ"** යි කියත් නම් ඒ වචන හරණ පිණිස භික්ෂූන් විසින් ඔවුන්ට තුන් යලක් **සමනුභාසන කම්** කටයුතුයි. එතෙක් ඒ වචන අත් නො හලාහු නම් ඔවුන්ට සඟවෙසෙස් ඇවැත් වන බැව් සන්දර්ශිත] කුලදූසක ශික්ෂාපදය ද; දුට්ඨුල්ල, [දැන දැන භික්ෂුවකගේ සඞ්ඝාදිසෙස ආපත්තියක් සඟවන භික්ෂුවට පචිති ඇවැත් නියමිත දුට්ඨුල්ල පටිච්ඡාදන ශික්ෂාපදය ද; දිට්ඨි, **"නථාහං භගවතා දෙසිතං ධම්මං ආජානාමි"** යනාදීන් කුදෘෂ්ටි ගත් භික්ෂුව භික්ෂූන් විසින් තුන් යලක් **සමනුභාසන** කම් කරණ තෙක්] එය අත් නො හරී නම් ඔහුට පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත දිට්ඨිඅප්පටි **නිස්සජ්ජන** ශික්ෂාපදය ද; ඡන්දං, [සඟමැද විනිශ්චය කථාවක් පවත්නා කල්හි ඡන්දය නො දී නැගිට යන භික්ෂුවට පචිති ඇවැත් නියමිත]ඡන්දදාන ශික්ෂාපදය ද;උජ්ජග්ඝිකා වෙ ච,[මහත්වූ සිනා ඇතිව ඇතුළු ගම නො යා යුතුයි.එසේම නො හිඳිය යුතුයි. යන] උජ්ජග්ඝික ශික්ෂාපද දෙක ද; වෙ ච සද්දා, දොළොස් රියනින් මත්තේ නො ඇසෙන හඬ ඇතිව ඇතුළුගම යා යුතුයි, එසේ ම හිඳිය යුතුයි යන] අප්පසද්ද ශික්ෂාපද දෙක ද; න බ්‍යාහරෙ, කබල සහිත වූ මුඛයෙන් යුක්තව කථා නොකට යුතුයි යන] නබ්‍යාහරණ ශික්ෂාපදය ද;

49. ඡමා, බිම හුන්නහුට ධර්මදෙශනා නො කටයුතුයි යන ශික්ෂාපදය ද; නීචාසනෙ, මිටි අස්නෙහි හිඳ උස් අසුනෙහි සිටියහුට දහම් නො දෙසිය යුතුය යන ශික්ෂාපදය ද; ඨානං, සිටියහු විසින් හුන්නහුට දහම් නො දෙසිය යුතුය

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

**50.** **කිසම්ං** සංසට්ඨා වෙ වසී—විසිබ්බෙ **දුක්ඛිතාය** ච
  පුන **සංසට්ඨා** න වූපසමෙ-ආරාමඤ්ච **පවාරණා**

---

යන ශික්‍ෂාපද ය ද; **පච්ඡතො**, පසුව යන්නහු විසින් පෙර වූව යන්නහුට දහම් නො දෙසිය යුතුය යන ශික්‍ෂාපදය ද; **උප්පථෙන** ච; නො මගින් යන්නහු විසින් මගින් යන්නහුට දහම් නො දෙසිය යුතුය යන ශික්‍ෂා පද ය ද; **වජ්ජ**, [දූත දූත පරිජි අවන්නාවූ භික්‍ෂුණියකට තොමෝ චොදනා නො කරා නම් හෝ භික්‍ෂුණී ගණයාට නොකියා නම් හෝ එසේ කරණ භික්‍ෂුණිය පාරාජිකාපත්තියට පැමිණෙන බැව් සන්දර්ශිත] වජ්ජපටිච්ඡාදක ශික්‍ෂාපදය ද; **අනුවත්ති**, භික්‍ෂූන් විසින් **උක්ඛෙපනීය කර්‍ම්ම** කරණු ලැබූ භික්‍ෂුවකට අනුවර්තක වූ **භික්‍ෂුණියක් භික්‍ෂුණීන්** විසින් තුන් යලක් **සමනුභාසන කම්** කරණ තෙක් ඉන් නො වැලකුනී නම් ඈට පරිජි ඇවැත් වන බැව් නියමිත] උක්ඛිත්තානුවත්තික ශික්‍ෂාපදය ද; ගහණං,[කායසංසග්ග රාගයෙන් තෙත් වූ භික්‍ෂුණියක් කාය සංසග්ග සඞ්ඛ්‍යාත අසද්ධර්‍ම්මය සෙවුනා පිණිස එම රාගයෙන් තෙත් වූ පුරුෂයකු විසින් තමාගේ අත ගැන්ම ඉවසීමාදී කරුණු අටක් සම්පූර්ණ වී මෙන් පාරාජිකාවට පැමිණෙන බැව් ප්‍රකාශිත] හත්‍ථග්ගහණ නොහොත් අෂ්ටවත්‍ථුක ශික්‍ෂාපදය ද; ඔසාරෙ, [භික්‍ෂුණී සඞ්ඝයා විසින් **උක්ඛෙපනීය** කර්‍ම්මය කරණු ලැබූ භික්‍ෂුණියකට කාරකසංඝයා නො විචාරා කාරකසංඝයාගේ අදහස් නොදන **ඔසාරණ කම්** කරණ භික්‍ෂුණිය සඟවෙසෙස් ඇවැතට පැමිණෙන බැව් දර්ශිත] ඔසාරණ ශික්‍ෂාපදය ද; **පච්චාචික්ඛණං**, භික්‍ෂුණීන්ට කිපී'බුදුන් ප්‍රත්‍යාඛ්‍යාන කරමි යනාදිය කියූ භික්‍ෂුණියක් තුන් යලක් **සමනුභාසන කම්** කරණ තෙක් එසේ කිම අත් නො හරී නම් ඈට සඟ වෙසෙස් වන බැව් නියමිත] ප්‍රත්‍යාඛ්‍යාන ශික්‍ෂාපදය ද;

50. කිසම්ං, [චතුර්විධ අධිකරණයන් අතුරෙන් එක්තරා අධිකරණයකින් තමා පරදවන ලදින් කිපී "භික්‍ෂුණීහු ඡන්දාදී සතර අගතියට යෙති" යි කියන භික්‍ෂුණියක් තුන් යලක් **සමනුභාසන කම්** කරණ තෙක් එම වචන නො හ රී නම් ඈට සඟ වෙසෙස් වනබැව් ප්‍රකාශිත] කිසම්විදෙව යනාදී ශික්‍ෂාපදයද;

51. *අඩ්ඪමාසං සහජීවිනිං ච-චීවරං අනුබන්ධනා
සත්තතිංස ඉමෙ ධම්මා-කාය වාචාය චිත්තතො
සබ්බෙ එක සමුට්ඨානා-සමනුභාසනං යථා

**සමනුභාසන සමුට්ඨානං නිට්ඨිතං.**

---

සංසට්ඨා, නුසුදුසු වූ කාය වාග් ප්‍රයෝගයෙන් ගිහි මිනිසුන් හා එක් වීමාදියෙන් හැසිරෙණ **භික්ෂුණීහු භික්ෂුණීන්** විසින් තුන් යලක් **සමනුභාසන** කම් කරණ තුරුත් එය නො **හරින්** නම් ඔවුන්ට සඟවෙසෙස් වන බැව් සන්දර්ශිත] සංසට්ඨ විහරණ ශික්ෂාපද ය ද; වධවධී, යම් **භික්ෂුණියක්** තමා පැහැර පැහැර හඬා නම් ඇට පචිති ඇවැත් වන්නේය යි දැක්වූ ශික්ෂාපදය ද; විසිබ්බෙ, **භික්ෂුණියකගේ** සිවුරක් තොමෝ ලිහා හෝ අනුන් ලවා ලිහවා හෝ පසුව අන්තරායක් නැත්නී එය නො මසන්නී වූ හෝ මැස් වීමට උත්සාහ නො කරන්නී වූ භික්ෂුණියට පචිති ඇවැත් වන බැව් සූචිත] විසිබ්බන **සික්ඛාපදය** ද; දුක්ඛිතාය ච, ගිලන් වූ සද්ධිවිහාරිනියට උපස්ථාන නො කරණ කරවන්ට උත්සාහ නො කරණ භික්ෂුණියට පචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත] දුක්ඛිතං සහ ජීවිනිං යනාදී ශික්ෂාපදය ද; පුන සංසට්ඨා, ගෘහපතියකු සමග හෝ ගෘහපති පුත්‍රයෙකු සමග සංසෘෂ්ට ව වසන **භික්ෂුණියක්** තුන් යලක් **සමනුභාසන** කම් කරණ තෙක් එය නොහරී නම් ඇට පචිති ඇවැත් සිදුවන බැව් සන්දර්ශිත] දෙවෙනි සංසෘෂ්ට විහරණ ශික්ෂාපදය ද; වූපසමෙ, [ආය්‍යාවෙනි! එව, මේ අධිකරණ සන්සිඳුවයි කියනු ලබන්නී මැනවැයි පිළිගෙණ නැවැත එසේ නො කරණ **භික්ෂුණියට** පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත] වූපසම ශික්ෂාපදය ද; ආරාමං, දැන දැන සභික්ෂුක අරමකට නො පිළිවිස වදින **භික්ෂුණියට** පචිති ඇවැත් නියමිත ශික්ෂාපදය ද; පවාරණා, භික්ෂු **භික්ෂුණී** සඞ්ඝයා කෙරෙහි තුන් තැනකින් නො පවරණ **භික්ෂුණියට** පචිති ඇවැත් නියමිත ශික්ෂාපදය ද;

51. අඩ්ඪමාසං, [අඩ මසක් පාසා භික්ෂුසඞ්ඝයාගෙන් පැසැස්ස යුතු වූ උපොෂිත පුච්ඡාව ද අවවාද, පිණිස එළඹීම ද, ඉක්මවන භික්ෂුණියට පචිති ඇවැත් නියමිත] අඩ්ඪමාසං යනාදී ශික්ෂාපදය ද; සහජීවිනි ච, [සද්ධිවිහාරිනිය උපසම්

---

* අඩ්ඪමාසං සහජීවි ච-ප-අඩ්ඪ සහජීවිනිංච-ස-

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව

**52.** උබ්භතං කඨිනං තීනි–පඨමං පත්ත භෙසජ්ජං
අච්චෙකං චාපි සාසඞ්කං–*පක්කමන්තෙන වා දුවෙ

---

පන්න කොට දෙ වසක් ඇට උද්දෙස දානාදියෙන් අනුග්‍රහ නොකරණ භික්ෂුණියට ද; සද්ධිවිහාරිනිය උපසම්පන්න කොට ශටන් පිරිසෙයින් ස පස් යොදනක්දු කැඳවා ගෙණ නො යන භික්ෂුණියට ද පචිති ඇවැත් නියමිත] සහජීවිනී ශික්ෂාපද වය ය ද; චීවරා, [ශික්ෂමාණාවකට, "ආර්යාවෙනි, ඔබ මට සිවුරක් දෙන්නෙහි නම් මම ඔබ උපසම්පන්න කරවමි"යි කියා පසුව සිවුරක් ලබාගෙණත් එසේ නො කරණ භික්ෂුණියට පචිති ඇවැත් නියමිත] චීවරශික්ෂාපදය ද; අනුබන්ධනා, තමාට දෙ වසක් උපස්ථාන කළහොත් උපසම්පන්න කරවන බව ශික්ෂමාණාව කට කියා පසුව එසේ නො කරණ භික්ෂුණියට පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත] වෙ වස්සානුබන්ධන ශික්ෂාපදය ද යන; ඉමෙ සත්තතිංස ධම්මා, මේ සත්තිස් ධර්මයෝ; සබ්බෙ, සියල් ලෝ ම; කාය වාචා චිත්තතො, කාය වාචා චිත්තයෙන් උපදිත් නුයි එක සමුට්ඨානා, එක සමුට්ඨාන ශික්ෂාපදයෝ නම් වෙත්. සමනුභාසනං යථා, **සමනුභාසන ශික්ෂාපදය** මෙනි.

### සමනුභාසන සමුට්ඨානය නිමි. (4)

—//—

**52.** උබ්භතං කඨිනං තීනි, උබ්භතං කඨිනං යනාදී ශික්ෂාපද තුන ද; [ඒ ශික්ෂාපද තුන නම්: සිවුරු කොට නිම වූ කල්හි කඨිනානිසංස ඉවර වූ කල්හි අතිරෙක සිවුරක් දස දවසකට වඩා දරණ භික්ෂුවට නිසගිපචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත ශික්ෂාපදය ද, එසේ ම එක රැයකුදු සඞ්ඝ සම්මතියක් නැතිව ඉටු තුන් සිවුරින් වියොව වසන භික්ෂුවට නිසගිපචිති නියමිත ශික්ෂා පදය හා අකාල චීවරයක් මසකට වඩා බහා තබන භික්ෂුවට නිසගි පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත ශික්ෂාපදය ද යන මේ තුනයි] පඨමං පත්ත, දස දිනකට වඩා අයිරිත් පයක් දරණ භික්ෂුව නිසගිපචිති ඇවැත් අවදින බැව් ප්‍රකාශිත] පළමුවෙනි පා සික පදය ද; භෙසජ්ජං, [ගිතෙල් වෙඬරු ඈ බෙහෙත් සත් දවස් ඉක්මවන භික්ෂුවට නිසගිපචිති වන බැව් සූචිත] භෙසජ්ජ

---

* පක්කමන්තෙන ච මෙ-ස-

53. †උපස්සයං පරම්පරා-අනතිරිත්තං නිමන්තනා
§විකප්පං රඤ්ඤො විකාලෙ-වොසාසා'රඤ්ඤකෙන ච

ශික්ෂාපදය ද; අචෙචකං, [අත්‍යායික චීවරයක් චීවරකාල සමය ඉක්මවා තබන භික්ෂුවට පචිති ඇවැත් නියමිත] අචෙචකචීවර ශික්ෂාපදය ද; සාසඞ්කං, [ආසඞ්කා සහිත සෙනස්නෙහි වසන භික්ෂුවකු විසින් සොරබිය නිසා හාත්පස ගොදුරුගම තබන ලද සිවුරෙන් ඒ භික්ෂුව සරැකට වඩා වෙන්ව වෙසේ නම් ඔහුට නිසගිපචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත] සාසඞ්ක ශික්ෂාපදය ද; පක්කමන්තෙන වා දුවෙ, පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය යනාදී ශික්ෂා වයය ද; [ඒ ශික්ෂා වයය නම්: යම් මහණෙක් සඟසතු සෙනස්නෙහි ඇඳ පුටු ආදියක් වෘක්ෂමූලාදී අභ්‍යවකාශයෙහි අතුරා හෝ අතුරවා බැහැර යනවිට එය සුදුසු තැන නො තබා හෝ නො තබ්බවා යන්නේ නම් ඔහුටද, එසේම සඟසතු විහාරයෙහි භිසිචිම්ලිකාදී සඞ්ඝික ශය්‍යාවක් තෙමේ අතුට හෝ අතුරවා හෝ දිසාවකට යන කල නගා නො තබනා හෝ නො තබ්බවන භික්ෂුවට ද පචිති ඇවැත් සිදුවන බැව් පළවෙන සිකපද දෙකයි]

53. උපස්සයං, [භික්ෂුණිය ගිලන්ව සිටින කල මුත් අන් කාලෙක මෙහෙණවරට ගොස් භික්ෂුණීන්ට අවවාද කරණ භික්ෂුවට පචිති ඇවැත් නියමිත] උපස්සය ශික්ෂාපදය ද; පරම්පරා, [ගිලන් සමය, සිවුරු දෙන සමය හා සිවුරු කරණ සමය හැර අන් සමයෙක පැවරූ පිළිවෙළින් නො වළඳා උපිළිවෙළින් වැළඳීමෙහි පචිති ඇවැත් නියමිත] පරම්පර භොජන ශික්ෂාපදය ද; අනත්රිත්තං, [වැළඳූ පැවරූ යම් මහණෙක් අයිරිත් නො කළ ඛාද්‍ය භොද්‍යයක් කා නම් හෝ වළඳා නම් ඕහට පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත] අනතිරිත්ත ශික්ෂාපදය ද; නිමන්තනා, [සිවුරු දෙන සමය, සිවුරු කරණ සමය යන දෙ සමය හැර අන් සමයෙක භොජනයකින් පවරණ ලද යම් මහණෙක් දෙලොස් රියනකින් ඇතුළත සිට භික්ෂුවක් නොවිචාරා අන්‍ය කුලයෙහි හැසිරීමට පැමිණේ නම් ඔහුට පචිති ඇවැත් නියමිත] නිමන්ත්‍රණ ශික්ෂාපදය ද; විකප්පං, [යම් භික්ෂුවක් පඤ්සහදැමියන් අතුරෙන්

† උපස්සයං පරම්පරං-ස- § විකප්ප රඤ්ඤො විකාලෙ-ස-

## විනයගාථා ඡි ව්‍යාඛ්‍යාව.

54. උස්සයා සන්නිචයං ච–පුරෙ පච්ඡා විකාලෙ ච
පඤ්චාහිකා සඞ්කමනී–*ද්වෙ ආවසථෙන ච

එක් කෙනෙකුන්ට තෙමේම සිවුරක් විකපා පච්චුද්ධරණය නො කොට පරිභොග කෙරේ නම් ඔහුට පචිති ඇවැත් නියමිත] විකප්පන ශික්ෂාපදය ද; රඤ්ඤො, (අභිෂික්තවූ රජෙකුගේ පිටත නො නික්මුණු රජනු ඇති පිටත නො ගිය මෙහෙසුන් ඇති යහන් ගෙයි තමා අා බව පළමුකොට නො දැන්වා) එළිපත ඉක්ම ඇතුළට වදිනා භික්ෂුවට පචිති ඇවැත් වන බව ප්‍රකාශිත] රඤ්ඤො යනාදී ශික්ෂාපදය ද; විකාලෙ, [ඉක්මන් අවශ්‍ය කට යුත්තක් නැතිව දෙලොස් රියනෙකින් ඇතුළත සිටි භික්ෂුවකු ගෙන් නොවිචාරා විකාලයෙහි ගම වදිනා භික්ෂුවට පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත] විකාලෙ ගාමප්පවෙසන ශික්ෂාපදය ද; වොසාසං, [උපාසක කුලයෙහි නිමන්ත්‍රිතව වළඳමින් සිටි භික්ෂූන් ඉදිරියෙහි "මෙහි සූප දෙව, මෙහි බත් දෙව" යි විධාන කර මින් සිටි භික්ෂුණියක් ඒ භික්ෂූන් අතුරෙන් එක නමක් විසිනුදු පහ නො කරණ ලද්දී ඒ සියලු භික්ෂූන් පාටිදෙසනීය ඇවැත් අව දිනා බැව් ප්‍රකාශිත] වොසාසමානා යනාදී ශික්ෂාපදය ද; අරඤ්ඤ කෙන ච. [සාසඞ්ක සම්මත වූ ආරණ්‍ය සෙනාසනයෙහි වසන භික්ෂුව විසින් පළකොට නො කියා ගෙණෙනලද ඛාද්‍ය භොජ්‍ය යක් ඇතුළු අරමෙහි ලා සියතින් පිළිගෙණ තෙමේ නොගිලන්ව සිට පරිභොග කෙරේ නම් ඔහුට පාටිදෙසනීය ඇවැත් වන බැව් සූචිත] ආරඤ්ඤකාදී ශික්ෂාපදය ද;

**54.** උස්සයා, [ගෘහපත්‍යාදීන් සමග ක්‍රොධ මානොත්සන්න වශයෙන් විවාද කරණ භික්ෂුණිය සඟවෙසෙස් ඇවැත් අවදිනා බැව් ප්‍රකාශිත] උස්සය වාදිකාදි ශික්ෂාපදය ද; සන්නිචයං ච, [අධිෂ්ඨානුපග පාත්‍රයක් නො ඉටා නො විකපා එක් දිනකුදු තබන භික්ෂුණියට නිසගිපචිති ඇවැත් වන බැව් සන්දර්ශිත] සන්නිචය ශික්ෂාපදය ද; පුරෙ, පෙරවරු කුලයට එළඹ අස් නෙහි හිමියන් නො පිළිවිස හුනස්නෙන් නැගී යන භික්ෂුණිය පචිති ඇවැතට පැමිණෙන බැව් සූචිත] පුරෙභත්තං යනාදී ශික්ෂාපදය ද; පච්ඡා, [පස්වරු කුලයට එළඹ අස්නෙහි හිමියන්

* වෙ අවසථෙන ච–ස–

55. පස්සාබෙ ආසනෙ චෙව-තිංස එකූනකා ඉමෙ
කාය වාචා න චිත්තා තීහි ද්වාරෙහි ජායරෙ
ඡ සමුට්ඨානිකා සබ්බෙ-කඨිනෙන සහා සමා

## කඨින සමුට්ඨානං නිට්ඨිතං.

---

නොවිචාරා අසුනෙහි හිඳීම හෝ නිදීම කරණ භික්ෂුණියට පචිති ඇවැත් නියමිත] පච්ඡාභත්තං යනාදි ශික්ෂාපදය ද; විකාලෙ ච, [රාත්‍රියෙහි කුලයන් කරා එළඹ හිමියන් නොවිචාරා සෙය්‍යාවක් නොමෙරෝ අතුට හෝ අතුරවා හෝ හිඳීම හෝ නිදීම කරණ මෙහෙණියට, පචිති ඇවැත් නියමිත] විකාලෙ යනාදි ශික්ෂාපදය ද; පඤ්චාහිකා, ['යම් භික්ෂුණියක් පස් දවසක් සිවුරු පෙරළීම ඉක්මවා නම් ඇට පචිති ඇවැත් වන්නේය'යි ප්‍රඥප්ත පඤ්චාහිකං යන ශික්ෂාපදය ද; සඞ්කම්නි, [යම් මෙහෙණියක් නොමෙරෝ නො පිළිවිස ගණු ලැබූ අනුන් අයත් සිවුරක් හැඳිම් පෙරවීම් කරා නම් ඇට පචිති ඇවැත් වේ යයි ප්‍රඥප්ත] සඞ්කම නියං යනාදී ශික්ෂාපදය ද; ද්වෙ ආවසථෙන ච, [උතුනී සමයයෙහි වැළඳ ගන්නට දුන් සිවුරු සතරවන දවස සෝදා අනිකකට නො දී පරිභොග කරණ භික්ෂුණියට ද, දෙරුනි සෙනසුන රක්නා පිණිස පාවා නොදී චාරිකාවෙහි යන භික්ෂුණියට ද පචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත] ආවසථ ශික්ෂාපද ද්වය ද;

55. පස්සාබෙ, [ප්‍රශාඛයෙහි හටගත් ගඩක් හෝ වණයක් භික්ෂුණී සඞ්ඝාදීන් නො විචාරා පුරුෂයකු සමග හුදකලාව බිඳුවීම් ආදිය කරණ භික්ෂුණියට පචිති ඇවැත් නියමිත] පස්සාබෙ යනාදී ශික්ෂාපදය ද; ආසනෙ චෙව, භික්ෂුවක් ඉදිරියෙහි නො පිළිවිස අසුනෙහි හිඳින භික්ෂුණියට පචිති ඇවැත් වන බැව් සඞ්ගෘහිත සිකපදය ද යන; ඉමෙ එකූනතිංසකා, මේ එකුන්තිස් සිකපදයෝ; කාය වාචා න චිත්තා, කය වචන දෙකිනුත් සිතින් නොරවත් උපදිත් නු යි ද; තීහි ද්වාරෙහි ජායරෙ, කය වචන සිත යන ති දොරින් උපදිත් නු යි ද; කඨිනෙන සහා සමා, කඨින ශික්ෂාව මෙන්; සබ්බෙ, සියල්ලෝ; ඡ සමුට්ඨානිකා, ඡ සමුට්ඨානික නම් වෙත්.

**කඨින සමුට්ඨානය නිමි (5)**

—//—

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

56. එළකලොමං වෙ සෙය්‍යා- ආහච්ච පිණ්ඩභොජනං
ගණ විකාල සන්නිධි-දන්තපොණෙන 'චෙලකා

57. උය්‍යුත්තං සෙනං උය්‍යොධි-සුරා ඔරෙන න්හායනා
දුබ්බණ්ණකරණා චෙ දෙසනිකා-ලසුණු'ත්තීණෙ නච්චනං

---

56. එළකලොමං [අදන්මගට පිළිපන් භික්ෂුවක් සියතින් එළුලොම් පිළිගෙණ තුන් යොදුනක් ඉක්මවා නම් ඔහුට නිසඟි පචිති ඇවැත් වන බැව් ප්‍රකාශවන] එළකලොම ශික්ෂාපදය ද; වෙ සෙය්‍යා, [අනුපසම්පන්නයක්හු සමග දෙ තුන් රැයකින් මත්තෙහි සහසෙය්‍යාව කරණ භික්ෂුවට පචිති ඇවැත් නියමිත ශික්ෂාපදය හා මාගමක් සමග සහසෙය්‍යාව කරණ භික්ෂුවට පචිති ඇවැත් නියමිත ශික්ෂාපදය ද යන] සහසෙය්‍ය ශික්ෂාපදද්වයය ද; ආහච්ච, [සඟසතු සෙනස්නෙහි ආකාශ කුටිය මත්තෙහි වල්හිස විද සිළු ගන්වා කළ පා ඇති ඇඳක හෝ පුටුවක හිඳීම හෝ නිදීම කරන්නහුට පචිති ඇවැත් නියමිත] ආහච්චපාද ශික්ෂාපදය ද; පිණ්ඩ භොජනං, එක් දිනකට වඩා ආවසථ පිණ්ඩය වළඳන භික්ෂුවට පචිති ඇවැත් ප්‍රකාශිත] ආවසථ පිණ්ඩ භොජන ශික්ෂාපදය ද; ගණ, නිසිකල් හැර අන් සමයෙහි ගණභොජනයෙන් පචිති ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත ගණභොජන ශික්ෂාපදය ද; විකාල, විකාලයෙහි කෑම් පිම් කරණ භික්ෂුවට පචිති ඇවැත් නියමිත විකාල භොජන ශික්ෂාපදය ද; සන්නිධි, [පිළිගෙණ එකරැයකුදු ඉක්මවා තබන ලද ඛාද්‍ය භොජ්‍යයන් කන බොන භික්ෂුවට පචිති ඇවැත් නියමිත සන්නිධිකාරක ශික්ෂාපදය ද; දන්ත පොණෙන, [දිය හා දැහැටි හැර නොපිළිගන්වන ලද අහරක් මුවදොරට ගන්නහුට පචිති ඇවැත් නියමිත] දන්තපොණ ශික්ෂාපදයත් සමග; අචෙලකා, [නග්න පරිව්‍රාජකාදීන්ට සියතින් ඛාද්‍ය භොජ්‍යයන් දෙන මහණහුට පචිති ඇවැත් නියමිත] අචෙලක ශික්ෂාපදය ද;

57. උය්‍යුත්තං සෙනං, අවශ්‍ය සුදුසු කරුණක් නැතිව යුද පිණිස නික්මුණු සිවුරඟ සෙනඟ බැලීමට යන භික්ෂුවට පචිති ඇවැත් ප්‍රකාශිත] උය්‍යුත්ත ශික්ෂාපදය ද; උය්‍යොධි, [දෙ තුන් රැයක් සෙනායෙහි වසන භික්ෂුවක් යුධකරණ තැන් බල සෙනඟ ගණන තැන් ආදියට යා නම් ඔහුට පචිති ඇවැත්

58. නහානං අත්ථරණං සෙය්‍යා-අන්තො රට්ඨෙ තථා බහි
අන්තො වස්සං චිත්තාගාරං-ආසන්දිං සුත්ත කන්තනා

---

වන බැව් ප්‍රකාශවන] උය්‍යොධික ශික්ෂාපදය ද; සුරා, යම් භික්ෂු වක් රහමෙර පානය කෙරේ නම් ඔහුට පචිති ඇවැත් වන්නේ ය යි ප්‍රඥප්ත සුරාපාණ ශික්ෂාපදය ද; ඔරෙන නහායනං, [අඩ මසක් ඇතුලත එක්වරකට වඩා (සුදුසු සමයෙහි හැර) සනා නය කරණ මධ්‍ය දෙශවාසී භික්ෂුවට පචිති ඇවැත් නියමිත] නහාන ශික්ෂාපදය ද; දුබ්බණ්ණා, ත්‍රිවිධ දුර්වර්ණ කරණයන් අතුරෙන් එකක් නොගෙණ අලුත් සිවුරු පරිභොග කරණ භික්ෂුවට පචිති ඇවැත් නියමිත] දුබ්බණ්ණ සිකපදය ද; මෙ දෙසනිකා, [ඇතුළු ගමට වන් මෙහෙණකගෙන් ඛාද්‍ය භොජ්‍ය යක් සියතින් පිළිගෙණ පරිභොග කරණ භික්ෂුවට ද; පෙර නො පවරණ ලදුව සෙඛසම්මත උපාසක කුලයන්හි ඛාද්‍ය භොජ්‍යයන් සියතින් පිළිගෙණ වළඳන නො ගිලන් භික්ෂුවට ද පාටිදෙසනීය ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත] ශික්ෂාපද වයය ද; ලසුණ, යම් භික්ෂුණියක් මගධරට උපන් භණ්ඩික නම් ලූනු කා නම් ඇට පචිති ඇවැත් වන්නේය යි ප්‍රඥප්ත ලසුණ ශික්ෂා පදය ද; උත්තිඨෙ, [වළඳන්නා වූ භික්ෂුවකට පැණින් හෝ පවනින් යුක්තව සමීපයෙහි සිටින භික්ෂුණියට පචිති ඇවැත් නියමිත] උත්තිඨ ශික්ෂාපදය ද; නච්චනා, [නැටීම් ගී කීම් බෙර වැයීම් ආදිය දක්නට යන භික්ෂුණිය පචිති ඇවැත් අවදිත බැව් සන්දර්ශිත] නච්චන ශික්ෂාපදය ද;

58 නහානං, යම් භික්ෂුණියක් තොමෝ නාගනව නහා නම් ඇට පචිති ඇවැත් වන්නේය යි ප්‍රඥප්ත නහාන ශික්ෂාපදය ද; අත්ථරණං, දෙදෙනෙක් පාවාරාදීන්ගේ එක් කොළවරක් පොරවා කැටිව හොවින භික්ෂුණින් හට පචිති ඇවැත් නියමිත අත්ථරණ ශික්ෂාපදය ද; සෙය්‍යා, [දෙදෙනෙක් එක ඇඳක හොවින් නම් ඒ භික්ෂුණින් දෙදෙනාහට පචිති ඇවැත් වන බැව් නියමිත] තුවට්ටසයන ශික්ෂාපදය ද; අන්තො රට්ඨෙ, [සාසඞ්ක සම්මත වූ සප්‍රතිභය වූ තමා වසන රට කැපිව යන සාථියක් නැතිව චාරිකාවෙහි යන භික්ෂුණිය පචිති ඇවැත් අවදින බැව් ප්‍රකාශවන] අන්තොරට්ඨෙ යනාදී ශික්ෂාපදය ද; තථා, එසේ ම; බහි, එපරිද්දෙන් ම තමා වසන රටින් පිටත චාරිකා

59. වෙය්‍යා වච්චං සහත්ථා ච–අභික්ඛුකා වාසෙන ච
ඡත්තං යානං ච සඞ්ඝාණිං–අලඞ්කාරං ගන්ධ වාසිතං

වෙනි යන භික්ෂුණියට පචිති ඇවැත් නියමිත] තිරෙරථෙ යනාදී ශික්‍ෂාපදය ද; අනොතාවසසං, ඇතුළු වස චාරිකාවෙනි යන භික්ෂුණියට පචිති ඇවැත් නියමිත අනොතා වසෙස යනාදී ශික්‍ෂාපදය ද; චිත්තාගාරං, [ක්‍රීඩා කරණ පිණිස කළ රාජකීය ශාලාවක් හෝ චිත්‍රශාලාදියක් හෝ දක්නට යන භික්ෂුණි යට පචිති ඇවැත් නියමිත] චිත්තාගාරං, යනාදී ශික්‍ෂාපදය ද; ආසන්දිං, [පමණ ඉකුත් ආසන්දියක් හෝ අයඞ්ඛකයක් හෝ පරි භොග කරණ භික්ෂුණිය පචිති ඇවැත් අවදින බැව් ප්‍රකාශිත] ආසන්දි ශික්‍ෂාපදය ද; සුත්ත කන්තනං, [යම් භික්ෂුණියක් හූ කටී නම් ඇට පචිති ඇවැත් වන්නේය යි නියමිත] සුත්ත කන්තන සික පදය ද;

59 වෙය්‍යාවච්චං, [යම් භික්ෂුණියක් ගිහීන්ට මෙහෙකරා නම් ඇට පචිති ඇවැත් වේ යයි පණවනලද] වෙය්‍යාවච්ච ශික්‍ෂාපදය ද; සහත්ථා ච, [ගෘහස්ථාදීන්ට සියතින් ඛාද්‍ය භොජ්‍ය යක් දෙන භික්ෂුණියට පචිති ඇවැත් නියමිත] සහත්ථාදී ශික්‍ෂා පදය ද; අභික්ඛුකා වාසෙන ච, [යම් භික්ෂුණියක් අඩ යොදුන් ඇතුලත්හි අවවාද දයක භික්ෂුවක් නැති ආවාසයෙහි වස් වසා නම් ඇට පචිති ඇවැත් වන්නේය යි ප්‍රඥප්ත] අභික්ඛුකාවාස ශික්‍ෂාපදය ද; ඡත්තං, [යම් භික්ෂුණියක් නො ගිලන්ව කුඩ හා වහන් දරා නම් ඇට පචිති ඇවැත් වන්නේ යයි ප්‍රඥප්ත] ඡත්තූ පාහන ශික්‍ෂාපදය ද; යානං, [නො ගිලන්ව හිඳුලු ඇ යානයෙන් යන මෙහෙණියට පචිති ඇවැත් නියමිත] යාන ශික්‍ෂාපදය ද; සඞ්ඝාණිං, [මෙවුල්දම් ඇති පළඳනා දරණ භික්ෂුණියට පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත] සඞ්ඝාණි ශික්‍ෂාපදය ද; අලං කාරං, යම් භික්ෂුණියක් ගැහැණුන් පළඳින යම්කිසි ලකර බරණක් පළඳන්නී නම් ඇට පචිති ඇවැත් වන්නේ යයි ප්‍රඥප්ත ඉත්ථාලඞ්කාර ශික්‍ෂාපාදය ද; ගන්ධ, ගන්ධයෙන් වණ්ණයෙන් යුක්ත කළ සුණුයෙන් නහන භික්ෂුණියට පචිති ඇවැත් නියමිත ගන්ධ වණ්ණ ශික්‍ෂාපදය ද; වාසිතං, යම් භික්ෂුණියක් සුවඳ කළ තල සුන්නෙන් නහා නම් ඇට පචිති ඇවැත් වන බැව් පලවන වාසිත ශික්‍ෂාපදය ද;

60. භික්ඛුනීං සික්ඛමානඤ්ච-සාමණෙරී ගිහිනියා
අසංකච්චිකා ආපත්ති-චත්තාරීසා චතුත්තරී

61. කායෙන න වාචා චිත්තෙන-කාය චිත්තෙන න වාචතො
ඡ සමුට්ඨානිකා සබ්බා-සමා එළක ලොමිකා'ති*

**එළකලොම සමුට්ඨානං නිට්ඨිතං.**

—//—

62. පදඤ්ඤත්‍ර අසම්මතා-තථා අත්ථංගතෙන ච
තිරච්ඡාන විජ්ජා ද්වෙ වුත්තා-අනොකාසො ච පුච්ඡනා

---

60. භික්ඛුනීං, භික්ෂුණියක ලවා ඇග උළවා නම් ඇට පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත උම්මද්දන ශික්ෂාපදය ද; සික්ඛමානං ච, ශික්ෂමාණාවක ලවා ඇග උළවන භික්ෂුණියට පචිති වන බැව් සන්දර්ශිත සික්ඛමානං, යනාදී ශික්ෂාපදය ද; සාමණෙරී, සාමණෙරියක ලවා ඇග උළවන මෙහෙණිය පචිති ඇවැතට පැමිණෙන බැව් ප්‍රකාශිත සාමණෙරියා යනාදී ශික්ෂාපදය ද; ගිහිනියා, ගෘහිණියක ලවා ඇග උළවන මෙහෙණියට පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත ගිහිනියා යනාදී ශික්ෂාපදය ද; අසංකච්චිකා ආපත්ති, තන වසා බඳනා සිවුරු නැතිව ගම් වදින භික්ෂුණියට පචිති ඇවැත් නියමිත අසංකච්චික ශික්ෂාපදය ද යන; චතුත්තරී, සතරක් උතුරු කොට ඇති; චත්තාරීසා, සතළිසක් ශික්ෂාවෝ තුමූ;

61 කායෙන න වාචා චිත්තෙන, කයිනුත් වචනයෙන් හා සිතින් තොරවත් උපදිත් නු යි ද; කාය චිත්තෙන න වාචතො, කය හා සිතිනුත් වචනයෙන් තොරවත් උපදිත් නු යි ද; සබ්බෙ, සියල්ලෝ; ඡ සමුට්ඨානිකා, ඡ සමුට්ඨානික නම් වෙත්. එළක ලොමිකා සමා, එළකලොමික ශික්ෂාපදය මෙනි.

**එළකලොම සමුට්ඨානය නිමි (6)**

—//—

62. පදං, [සහොච්චාරණ කරණ විසින් අනුපසම්පන්නයෙකුට පාළිධර්මය හදාරවන භික්ෂුව පචිති ඇවැත් අවදින බැව් ප්‍රකාශිත] පදසොධම්ම ශික්ෂාපදය ද; අඤ්ඤත්‍ර, [ශ්‍රවණොපචාරයෙහි විඥ වූ පුරුෂයක්හු නැතිව මාගමකට ස පස් පෙදෙකින් වඩා

---

* එළක ලොමකා-ප-

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

63. සත්තසික්ඛාපදා එතෙ-වාචා න කාය චිත්තතො
වාචා චිත්තෙන ජායන්ති-නතු කායෙන ජායරෙ
ද්වෙ සමුට්ඨානිකා සබ්බ-පදසොධම්ම සාදිසා

**පදසොධම්ම සමුට්ඨානං නිට්ඨිතං.**

——//——

64. අද්ධානං නාවං පණීතං-මාතුගාමෙන සංහරෙ
ධඤ්ඤං නිමන්තිතා චෙව-අට්ඨ ච පාටිදෙසනී

---

දහම් දෙසන භික්ෂුව පචිති ඇවැතට පැමිණෙන බැව් ප්‍රකාශිත අඤ්ඤත්‍ර යනාදී ශික්ෂාපදය ද; අසම්මතො,[සම්මත නො කරණ ලදුව අෂ්ට ගරුධර්ම පාඨොච්චාරණ කරණ විසින් භික්ෂුණීන්ට අවවාද කරණ භික්ෂුවට පචිති ඇවැත් නියමිත] අසම්මතො යනාදී ශික්ෂාපදය ද; තථා, එසේම; අත්ථංගතෙන ච,[හිරු අවරට ගියකල්හි භික්ෂුණීන්ට අවවාද කරණ භික්ෂුවට පචිති ඇවැත් නියමිත භික්ඛුනොවාදක ශික්ෂාපදය ද; තිරච්ඡාන විජ්ජාමෙ, [හස්තිශිල්පාදී තිරශ්චීන විද්‍යාවක් පුහුණු කරණ හා අනුන්ට හදුරවන භික්ෂුණීන්ට පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත] තිරච්ඡාන විජ්ජා යනාදී ශික්ෂාපද ද්වය ද; අනොකාසො පුච්ඡනං ච, කෘතාවකාශ නො වූ භික්ෂුවකගෙන් ප්‍රශ්න විචාරණ භික්ෂුවට පචිති ඇවැත් වන බැව් ප්‍රකාශිත පඤ්හපුච්ඡන ශික්ෂාපදය ද; යන වුත්තා, වදාරණ ලද්දා වූ;

63. **එතෙ සත්ත සික්ඛාපදා**, මේ සත් සිකපදයෝ; වාචා න කාය චිත්තතො, වචනයෙනුත් කා සිත් දෙකින් තොරවත් උපදිති. වාචා **චිත්තෙන** ජායන්ති, වචන සිත් දෙකින් උපදිත්. කායෙන න තු ජායරෙ, කයින් නොම උපදිත්. පදසො ධම්ම සාදිසා, පදසොධම්ම ශික්ෂාපදය හා සමාන වූ; සබ්බ, මෙකී සියල්ලෝ; ද්වෙ සමුට්ඨානිකා, ද්විසමුට්ඨානික යහ.

**පදසොධම්ම සමුට්ඨානය නිමි. (7)**

——//——

64. අද්ධානං, [සුදුසු සමය හැර අන් සමයෙක්හි; භික්ෂුණී යක සමග බැණ ගෙණ එක අදත් මගට (සටත් පිරිසෙයින් හුන් ගමින් අනික් ගමකට පවා) යන භික්ෂුව පචිති ඇවැතට **පැමිණෙන බැව් ප්‍රකාශිත]** අද්ධාන **ශික්ෂාපදය ද**; නාවං, [සරසට

65\. සික්ඛා පණ්ණරසා එතෙ-කායා න වාචා න මනා
කාය වාචාහි ජායන්ති-න තෙ චිත්තෙන ජායරෙ

---

එතර වීමට මුත් උඩුගඟට හෝ යටි ගඟට යන නැවක භික්ෂුණී යක් හා එක්ව බැණ ගෙණ නැඟෙන භික්ෂුවට පචිති ඇවැත් නියමිත නාවා ශික්ෂාපදය ද; පණීතං,[නො ගිලන්ව සිට ගිතෙල් වෙඬරු ආදී ප්‍රණීත බොජුන් තමා පිණිස විනවා වළඳන භික්ෂුවට පචිති ඇවැත් නියමිත] ප්‍රණීත භොජන ශික්ෂාපදය ද; මාතුගාමෙන, [මාගමක් හා කථාකොට ගෙණ එක අදන් මගට (යටත් පිරිසෙයින් හුන් ගමින් අන් ගමකට ද) පිළිපදනා භික්ෂුව පචිති ඇවැත් අවදින බැව් නියමිත] මාතුගාමෙන සංවිධාය යනාදී ශික්ෂාපදය ද; සංහරෙ, [යම් භික්ෂුණියක් ප්‍රවෂ්ටනාවකාශ යෙහි ලොම් හරවා නම් ඇට පචිති ඇවැත් වන්නේ යයි ප්‍රඥපත] ලොමසංහරණ ශික්ෂාපදය ද; ධඤ්ඤං, [ශාලි ව්‍රීහ්‍යාදී ධාන්‍ය විනවීමාදියෙන් පිස හෝ පිසවා වළඳන භික්ෂුණියට පචිති ඇවැත් නියමිත] ධාන්‍ය ශික්ෂාපදය ද; නිමන්තිතා ච, [අකැප නිමන්ත්‍රණයෙන් නිමන්ත්‍රණය කරණ ලද්දා වූ හෝ පවරණ ලද්දා වූ භික්ෂුණිය බාද්‍ය භොජ්‍යයක් කා නම් හෝ වළඳා නම් ඇට පචිති ඇවැත් වන බැව් නියමිත] නිමන්තිතා, යනාදී ශික්ෂාපදය ද; අට්ඨපාටිදෙසනී ච, (1) [යම් භික්ෂුණියක් නො ගිලන්ව සිට ගිතෙල් විනවා වළඳා නම් ඇට ද, (2) එසේ ම දී විනවා වළඳන භික්ෂුණියටද, (3) තලතෙල් විනවා වළඳන භික්ෂුණියට ද; (4) මී විනවා වළඳන භික්ෂුණියට ද; (5) වෙඬරු විනවා වළඳන භික්ෂුණියට ද; (6) දියමස් විනවා වළඳන භික්ෂුණියට ද; (7) ගොඩමස් විනවා වළඳන භික්ෂුණියට ද; (8) කිරි විනවා වළඳන භික්ෂුණියට ද පිළිවෙළින් පාටිදෙසනීය ඇවැත් සිදුවන බැව් ප්‍රකාශිත] පාටිදෙසනීය ශික්ෂාපද අට ද යන;

65\. 66. එතෙ පණ්ණරසා සික්ඛා, මේ පසළොස් සිකපදයෝ තුමූ; (1) කායා, කයින් උපදිත්. න වාචා, වචනයෙන් නූපදිත්. න මනා, සිතිනුත් නූපදිත්. (2) කාය වාචාහි, කයිනුත් වචනයෙ නුත් උපදිත්. තෙ, ඒ කයිනුත් වචනයෙනුත් උපදනාහු; චිත්තෙන, සිතෙහි න ජායරෙ, නූපදිත්. (3) කාය චිත්තෙන ජායන්ති, කයි නුත් සිතිනුත් උපදිත් තෙ, ඒ කයිනුත් සිතිනුත් උපදනාහු,

66. කාය චිත්තෙන ජායන්ති–න තෙ ජායන්ති වාචතො
කාය වාචාහි චිත්තෙන-සමුට්ඨානා චතුබ්බිධා
පඤ්ඤත්තා බුද්ධඤාණෙන–අද්ධානෙන සහා සමා

**අද්ධාන සමුට්ඨානං නිට්ඨිතං**

—//—

67. ථෙය්‍යසත්ථ උපස්සුති-සූපං විඤ්ඤාපෙනෙන ච
රත්තිච්ඡන්නං ච ඔකාසං–එතෙ බ්‍යූහෙන සත්තමා

---

වාචතො න ජායන්ති, වචනයෙන් නූපදිත් (4) කාය වාචාහි චිත්තෙන, කය වචන හිත යන තුණින් උපදිත්. [මෙ පරිද්දෙන්] අද්ධානෙන සහ සමා, අද්ධාන ශික්ෂාපදය හා සමානවූ; චතුබ්බිධා සමුට්ඨානා, මෙකී චතු සමුට්ඨාන ශික්ෂාපදයෝ බුද්ධඤාණෙන, සර්වඥ තාඥනයෙන්; පඤ්ඤත්තා, පණවන ලද්දාහුය.

**අද්ධාන සමුට්ඨානය නිමි (8)**

—//—

**67** ථෙය්‍යසත්ථ, [දූන දූත සොර සත්වා මුලක් සමග කථා කොට ගෙණ එක අදත් මගට (යටත් පිරිසෙයින් හුත් ගමින් අන් ගමකට පවා) පිළිපදන භික්ෂුවට පචිති ඇවැත් සිදුවන බැව් නියමිත] ථෙය්‍යසත්ථ ශික්ෂාපදය ද; උපස්සුති, [“මොව්හු යමක් කියත් නම් එය අසමි” යි යන සිතින් දබර කලහයන් ගෙන් විවාදාධිකරණයට පැමිණි භික්ෂුන්ගේ බස් ඇසෙන තැන සිටින භික්ෂුව පචිති ඇවැතට පැමිණෙන බැව් ප්‍රකාශිත] උපස්සුති සික්ෂාපදය ද; සූපං විඤ්ඤාපෙනෙන ච, [නොගිලන් වූවහු විසින් කොමු හෝ බත් හෝ තමා පිණිස විනවා නොවැළඳිය යුතුයි යන සූපොදන විඤ්ඤාපන ශික්ෂාපදය ද; රත්තී, [රෑ ඇඳිරි වූ ආලොක නැති තන්හි හුදකලාව පුරුෂයකු සමග සිටින්නාවූ ද කාමනිශ්‍රිත කථා කියන්නාවූ ද භික්ෂුණියට පචිති ඇවැත් නියමිත] රත්තන්ධකාර ශික්ෂාපදය ද; ඡන්නං ච, [ඒ කුඩ්‍යාදීන් පිළිසත් අවකාශයෙහි පුරුෂයකු සමග හුදකලාව සිටින්නාවූ ද කාමනිශ්‍රිත කථා කියන්නාවූ ද භික්ෂුණියට පචිති ඇවැත් නියමිත] පටිච්ඡන්න ශික්ෂාපදය ද; ඔකාසං, අභ්‍යවකාශයෙහි පුරුෂයකු සමග හුදකලාව සිටින්නාවූ ද කාමනිශ්‍රිත

68. කාය චිත්තෙන ජායන්ති – න තෙ ජායන්ති වාචතෝ
තීහි වාරෙහි ජායන්ති – ච සමුට්ඨානිකා ඉමෙ
ථෙය්‍යසත්ථසමුට්ඨානා – දෙසිතා'දිච්චබන්ධුනා

**ථෙය්‍යසත්ථ සමුට්ඨානං නිට්ඨිතං.**

—//—

69. ඡත්තපාණිස්ස සද්ධම්මං – න දෙසෙන්ති තථාගතා
තථෙව දණ්ඩපාණිස්ස – සත්ථ ආවුධ පාණිනං

---

කථා කියන්නාවූ ද' මෙහෙණියට පචිති ඇවැත් නියමිත] අබෙහාකාස ශික්ෂාපදය ද; බ්‍රූහෙන, [වීථ්‍යාදියෙහි හුදකලාව පුරුෂයෙකු සමග සිටින්නාවූ හෝ කාමනිඃශ්‍රිත කථා කියන්නාවූ හෝ කණමුල කොඳුරන්නා වූ භික්ෂුණියට පචිති ඇවැත් වන බැව් සූචිත] බ්‍රූහ ශික්ෂාපදයත් සමග; සත්තමා, සත පිරුණාවූ; එතෙ, මේ ශික්ෂාපදයෝ;

68. කාය චිත්තෙන, කයින් හා සිතින්; ජායන්ති, උපදිත්. තෙ, ඒ කයින් හා සිතින් උපදනාහු; වාචතො, වචනයෙන්; න ජායන්ති, නූපදිත්; තීහි වාරෙහි, කය වචන සිත යන ති දොරින්; ජායන්ති, උපදිත්; ථෙය්‍යසත්ථ සමුට්ඨානා, ථෙය්‍යසත්ථ සමුට්ඨානය හා සමානවූ; ඉමෙ; මේ ශික්ෂාපදයෝතුමූ; ආදිච්ච බන්ධුනා, සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජානන්වහන්සේ විසින්; ච සමුට්ඨානිකා, ච් සමුට්ඨානිකයෝ යයි; දෙසිතා, දේශනා කොට වදාරණ ලදහ

**ථෙය්‍යසත්ථ සමුට්ඨානය නිමි. (9)**

—//—

69 තථාගතා, තථාගතයෝ තුමූ; ඡත්තපාණිස්ස, කුඩ ගත් අත් ඇත්තහුට; ධම්මං, ධර්මය; න දෙසෙන්ති, නො දෙසත්; [මෙයින් "**න ඡත්තපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**"" යන්න කථිතයි.] තථෙව, එපරිද්දෙන් ම; දණ්ඩ පාණිස්ස, දඬු ගත් අතැත්තහුට ද; සත්ථ, සැත් ගත් අත් ඇත්තහුට ද; ආවුධ පාණිනං, ආයුධ ගත් අත් ඇත්තහුට ද;

## විනය ගාථාදීපිකා ව්‍යාඛ්‍යාව.

70. පාදුකූ'පාහනං යානං–සෙය්‍ය පල්ලඞ්කාය ච
වෙඨිතො 'ගුණ්ඨිතො චෙව–එකාදස මනූනකා

71. වාචං චිත්තෙන ජායන්ති–න තෙ ජායන්ති කායතො
සබ්බෙ එකසමුට්ඨානා–සමකා* ධම්මදෙසනෙ

**ධම්මදෙසනා සමුට්ඨානං නිට්ඨිතං.**

——//——

72. භූතං කායෙන ජායති–න වාචාය න චිත්තතො
වාචතො ච සමුට්ඨාති–න කායා න ච චිත්තතො

---

70. පාදුකා, මිරිවැඩි දරන්නහුට ද; උ'පාහනා, වහන් දරන්නහුට ද; යානං, යානාරූඪවූවහුට ද; සෙය්‍ය, සයන ගත වූවහුට ද; පල්ලඞ්කාය ච, අකවටු ඇවුළුවහුට ද; වෙඨිත, හිස්වෙළුම් ඇත්තහුට ද; ඔගුණ්ඨිතො ච එව, හිස් වැසූවහුට ද යන මොවුන්ට ධර්මය දෙශනා නොකරත්;[**"න දණ්ඩ පාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමි ති සික්ඛා කරණීයා"** යනාදීන් ප්‍රඥප්ත සෙඛියා සිකපද දසය මෙයින් කථිතයි] අනූනකා, ඌන රහිත වූ; ඉමෙ එකාදස, මේ එකොළොස් ශික්ෂාපදයෝ;

71. වාචං චිත්තෙන, වචනයෙන් හා සිතින්; ජායන්ති, උපදිත්; තෙ, ඔව්හු; කායතො, කයින්; න ජායන්ති, නූපදිත්; ධම්මදෙසනෙ සමකා, ධම්මදෙසනා සමුට්ඨානය මෙන්; සබ්බෙ, සියල්ලෝ; එක සමුට්ඨානා, එක සමුට්ඨානිකයෝ වෙත්.

**ධර්මදෙශනා සමුට්ඨානය නිමි. (10)**

——//——

මෙසේ සමසීනක සමුට්ඨානයන් දක්වා ඉක්බිති නියත සමුට්ඨාන ත්‍රිකය දක්වන්නෝ **'භූතං කායෙන'** යනාදිය කියත්:–

72. භූතං, තෘණ වෘක්ෂාදීන්ගේ ඡේදනාදියෙහි පවිති ඇවැත් වන බැව් ප්‍රකාශිත භූතගාම ශික්ෂාපදය; කායෙන ජායති, කයින් උපදී; න වාචාය න චිත්තතො, වචනයෙනුත් සිතිනුත් නූපදී. වාචතො ච සමුට්ඨාති, වචනයෙන් ද නගී. න කායා න ච චිත්තතො, කයිනුත් සිතිනුත් නො නගී.

---

* සමමූකා–ස–

73 කාය වාචාය ජායති-න ච ජායති චිත්තතො
භූතාරොචනකා නාම-තීහි ඨානෙහි ජායති

**භූතාරොචන සමුට්ඨානං නිට්ඨිතං.**

—//—

74 චොරිං වාචාය චිත්තෙන-නතු ජායති කායතො
ජායති තීහි වාරෙහි-චොරි වුට්ඨාපනං ඉදං
අකතං වි සමුට්ඨානං-ධම්මරාජෙන භාසිතං

**චොරිවුට්ඨාපන සමුට්ඨානං නිට්ඨිතං.**

—//—

75 අනනුඤ්ඤාතං වාචාය-න කායා න ච චිත්තතො
ජායති කාය වාචාය-න තං ජායති චිත්තතො

---

**73**. කාය වාචාය ජායති, කයින් හා වචනයෙන් උපදී; න ච චිත්තතො ජායති, සිතින් නූපදිත්; භූතාරොචනකා නාම, භූතාරොචන ශික්‍ෂාව වනාහි; තීහි ඨානෙහි, තුන් තැනකින්; **ජායති**, උපදියි.

**භූතාරොචන සමුට්ඨානය නිමි, (11)**

—//—

**74.** චොරිං, [දූන දූන වධයට නිසි යයි **දන්නා ලද** තැනැත්තිය රජාදීන් නො විචාරා උපසම්පන්න කරණ **භික්‍ෂුණිය** සඟ වෙසෙස් අවදින බැව් ප්‍රකාශිත] චොරිවුට්ඨාපන ශික්‍ෂාපදය; වාචාය චිත්තෙන, වචනයෙන් හා සිතින් උපදී; කායතො, කයින්; න තු ජායති, නූපදී; තීහි වාරෙහි, කය වචන සිත යන තිදෙරින්; ජායති, උපදී; ඉදං චොරිවුට්ඨාපනං, මෙසේ මේ චොරිවුට්ඨාපන ශික්‍ෂාපදය; **වි සමුට්ඨානං** අකතං, **වි සමුට්ඨානික** සිකපදයක් කරණ ලදී;ධම්මරාජෙන භාසිතං, එය ධර්මරාජයන් විසින් දෙසනලදී.

**චොරිවුට්ඨාපන සමුට්ඨානය නිමි (12)**

---

75-76. අනනුඤ්ඤාතං, [මවුපියන් විසින් ද සවාමිහු විසින් ද නො අනුදන්නා ලද ශික්‍ෂමාණාව උපසම්පන්න කරවන භික්‍ෂුණී යට පචිති ඇවැත් නියමිත] අනනුඤ්ඤාත ශික්‍ෂාපදය; වාචාය, වචනයෙන් උපදී; න කායා න ච චිත්තතො, **කයිනුත් සිතිනුත්**

## විනය ගාථාඞ් ව්‍යාඛ්‍යාව.

76. ජායති වාචා චිත්තෙන-න තං ජායති කායතො
ජායති තීහි වාරෙහි-අකතං චතු ඨානිකං

**අනනුඤ්ඤාත සමුට්ඨානං නිට්ඨිතං.**

—//—

77. සමුට්ඨානං හි සංඛෙපං-දස තීනි සුදෙසිතං
අසම්මොහකරං ඨානං-නෙත්ති ධම්මානුලොමිකං
ධාරයන්තො ඉමං විඤ්ඤූ-සමුට්ඨානෙ න මුය්හතී'ති

**සමුට්ඨාන සීස සංඛෙපං නිට්ඨිතං.**

---

78. සමුට්ඨානා කායිකා අනන්තදස්සිනා-අක්ඛාතා
ලොකහිතෙන විවෙකදස්සිනා
ආපත්තියො තෙන සමුට්ඨිතා කති-පුච්ඡාමි තං බ්‍රෑහි
විභඞ්ගකොවිද !

---

නූපදී; කාය වාචාය ජායති, කයින් හා වචනයෙන් උපදී; තං, එය; චිත්තතො න ජායති; සිතින් නූපදී; වාචා චිත්තෙන ජායති, වචනයෙන් හා සිතින් උපදී; තං, එය; කායතො, කයින්; න ජායති, නූපදී; තීහි වාරෙහි ජායති, කය වචන සිත යන තිදෙරින් උපදී; [එහෙයින්] චතු ඨානිකං අකතං, මෙය චතු සමුට්ඨානික සිකපදයක් කරණ ලදී

**අනනුඤ්ඤාත සමුට්ඨානය නිමි. (13)**

---

**77.** සංඛෙපං, සංක්‍ෂෙප වූ; සමුට්ඨානං, සමුට්ඨානය නොහොත් සමුට්ඨානයෙහි සංක්‍ෂෙපය; දස තීනි, තෙළෙසක්‍ැ යි; සු දෙසිතං, මොනවට දෙසන ලදී; නෙත්ති ධම්මානුලොමිකං, විනය පාළියට අනුලොම් වූ; අසම්මොහ කරං, නුමුළා බැව් කරන්නා වූ; ඉමං ඨානං, මේ කාරණය (නොහොත්) මේ සථානය; ධාරයන්තො, දරන්නා වූ; විඤ්ඤූ, නුවණැත්තේ; සමුට්ඨානෙ, සමුට්ඨානයෙහි; න මුය්හති, මුළා නොවන්නේ ය

**සමුට්ඨාන සීස සංක්‍ෂෙප ගාථා'ර්ථ ව්‍යාඛ්‍යාව නිමි.**

---

78 විභඞ්ග කොවිද, විභඞ්ග ශාසනයෙහි දක්‍ෂ තැනැත්ත ! විවෙක දස්සිනා, තදඞ්ගාදී පඤ්චවිධ විවෙකයන් දක්නා සුලු වූ; ලොකහිතෙන, සත්ත්ව හිත විධායක වූ; අනන්තදස්සිනා, අනන්ත දර්ශී වූ බුදුරජාණන් වහන්සේ විසින්; කායිකා සමුට්ඨානා,

79. සමුට්ඨානා කායිකා අනන්තදස්සිනා-**අක්ඛාතා**
ලොකහිතෙන විවෙකදස්සිනා
ආපත්තියො තෙන සමුට්ඨිතා පඤ්ච-එතං තෙ අක්ඛාමි
විභඞ්ගකොවිද !

80. සමුට්ඨානා වාචසිකා අනන්තදස්සිනා-අක්ඛාතා
ලොකහිතෙන විවෙකදස්සිනා
ආපත්තියො තෙන සමුට්ඨිතා කති-පුච්ඡාමි තං බ්‍රෑහි
විභඞ්ග කොවිද !

81. සමුට්ඨානා වාචසිකා අනන්ත දස්සිනා-අක්ඛාතා
ලොකහිතෙන විවෙක දස්සිනා
ආපත්තියො තෙන සමුට්ඨිතා චතස්සො-එතං තෙ
අක්ඛාමි විභඞ්ග කොවිද !

82. සමුට්ඨානා කායිකා වාචසිකා අනන්තදස්සිනා-
අක්ඛාතා ලොකහිතෙන විවෙක දස්සිනා
ආපත්තියො තෙන සමුට්ඨිතා කති-පුච්ඡාමි තං බ්‍රෑහි
විභඞ්ග කොවිද !

---

යම් කායික සමුට්ඨානයෙක්; අක්ඛාතා, වදාරණලද්දාහු ද; තෙන, ඒ කායික සමුට්ඨානයෙන්; සමුට්ඨිතා, නැගී සිටියා වූ; ආපත්තියො ඇවැත්හු; කති, කෙතෙක්දැ යි; තං, තා; පුච්ඡාමි, විචාරමි; බ්‍රෑහි, එය කියව!

79. විභඞ්ග කොවිද, උභය විභඞ්ගයෙහි දක්‍ෂ තැනැත්ත! විවෙක දස්සිනා-පෙ-තෙන, ඒ සමුට්ඨානයෙන්; සමුට්ඨිතා, නැග සිටියා වූ; ආපත්තියො, ඇවැත්හු; **පඤ්ච, දුකුළා, තුලසි, සඟ වෙසෙස් පචිති, පාටිදෙසනීය** යයි පසක්; තෙ, විතාල නුඹට; එතං, මෙය; (මම) අක්ඛාමි, කියමි.

80 විභඞ්ග කොවිද, -පෙ-වාචසිකා සමුට්ඨානා, වාග්වාරික සමුට්ඨානයෝ-පෙ-

81. විභඞ්ග කොවිද-පෙ-තෙන, ඒ වාචසික සමුට්ඨානයෙන්; සමුට්ඨිතා, නැඟ සිටියා වූ; ආපත්තියො, ආපත්තිහු; චතස්සො, **දුකුළා තුලසි සඟවෙසෙස්, පචිති** යි සිවුදෙනෙකි.

82 -පෙ-කායිකා වාචසිකා, කාය වාග්වාරිකවූ; සමුට්ඨානා, සමුට්ඨානයෝ-පෙ-

## විනය ගාථාණී ව්‍යාඛ්‍යාව.

83\. සමුට්ඨානා කායිකා වාචසිකා අනන්ත දස්සිනා -
අක්ඛාතා ලෝක හිතෙන විවෙක දස්සිනා
ආපත්තියො තෙන සමුට්ඨිතා පඤ්ච-එතං තෙ අක්ඛාමි
විභඞ්ග කොවිද !

84 සමුට්ඨානා කායිකා මානසිකා අනන්ත දස්සිනා-
අක්ඛාතා ලෝක හිතෙන විවෙක දස්සිනා
ආපත්තියො තෙන සමුට්ඨිතා කති-පුච්ඡාමි තං බ්‍රෑහි
විභඞ්ග කොවිද !

85\. සමුට්ඨානා කායිකා මානසිකා අනන්ත දස්සිනා-
අක්ඛාතා ලෝක හිතෙන විවෙක දස්සිනා
ආපත්තියො තෙන සමුට්ඨිතා ඡ-එතං තෙ අක්ඛාමි
විභඞ්ග කොවිද !

86\. සමුට්ඨානා වාචසිකා මානසිකා අනන්ත දස්සිනා-
අක්ඛාතා ලෝකහිතෙන විවෙක දස්සිනා
ආපත්තියො තෙන සමුට්ඨිතා කති-පුච්ඡාමි තං
බ්‍රෑහි විභඞ්ග කොවිද !

87\. සමුට්ඨානා වාචසිකා මානසිකා අනන්ත දස්සිනා-
අක්ඛාතා ලෝක හිතෙන විවෙක දස්සිනා
ආපත්තියො තෙන සමුට්ඨිතා ඡ- එතං තෙ
අක්ඛාමි විභඞ්ග කොවිද!

---

83\. -පෙ-**පඤ්ච, දුකුළා**, **තුලසි, සඟවෙසෙස්**, **පචිති**, **පාටිදෙසනීය** යයි පස්දෙනෙකි,

84 කායිකා මානසිකා, කාය චිත්ත සමුට්ඨානයෝ-පෙ-

85\. තෙන, ඒ කාය චිත්ත සමුට්ඨානයෙන්; සමුට්ඨිතා ආපත්තියො, නැඟ සිටි ඇවැත්හු; ඡ, **පරිජි**, **දුකුලා**, **තුලසි**. **සඟවෙසෙස්**, **පචිති**, **පාටිදෙසනීය** යයි ස දෙනෙකි.

86 වාචසිකා මානසිකා, වාඞ්මනො වාරිකවූ; සමුට්ඨානා, සමුට්ඨානයෝ-පෙ-

87 ආපත්තියො, ඇවැත්හු; ඡ, **පරිජි**, **දුකුලා**, **තුලසි** **සඟවෙසෙස් පචිති දුබ්භාසිත** යයි සයක් වෙත්.

88. සමුට්ඨානා කායිකා වාචසිකා මානසිකා අනන්තදස්සිනා
අක්ඛාතා ලෝකහිතේන විවේකදස්සිනා
ආපත්තියෝ තේන සමුට්ඨිතා කති-පුච්ඡාමි තං
බෲහි විභඞ්ග කෝවිද!

89 සමුට්ඨානා කායිකා වාචසිකා මානසිකා-අනන්තදස්සිනා
අක්ඛාතා ලෝකහිතේන විවේකදස්සිනා
ආපත්තියෝ තේන සමුට්ඨිතා ඡ-එතං තේ අක්ඛාමි
විභඞ්ග කෝවිදා'ති.

**ආපත්ති සමුට්ඨාන ගාථා නිට්ඨිතා.**

90 එකංසං චීවරං කත්වා-පග්ගහෙත්වාන *අඤ්ජලිං
ආසිංසමාන රූපෝ ව-කිස්ස ත්වං ඉධ මාගතෝ?

91. ද්වීසු විනයේසු පඤ්ඤත්තා යේ-උද්දේසං
ආගච්ඡන්ති උපෝසථේසු
කතියෝ සික්ඛාපදානි හොන්ති-කතීසු නගරේසු පඤ්ඤත්තා

---

88. කායිකා වාචසිකා මානසිකා, කාය වාක් මනෝ වාරිකවූ;

89 තේන, එයින්; සමුට්ඨිතා, නැඟසිටියා වූ; ආපත්තියෝ, ඇවැත්හු; ඡ, **පරිජී, දුකුලා, තුලසි, සඟවෙසෙස් පචිති පාටිදෙසනීය** යයි කියා ස දෙනෙකි; තේ, නුඹට; එතං, මෙය; අක්ඛාමි, කියමි.

**ආපත්ති සමුට්ඨාන ගාථාවී නිමි.**

90 චීවරං, සිවුර; එකංසං කත්වා, එකස්කොට පෙරවා; අඤ්ජලිං පග්ගහෙත්වාන, දශනඛසමෝධානයෙන් උදුල ඇඳිලි බැඳ; ආසිංසමාන රූපෝඉව, ප්‍රත්‍යාශංසනය කරණ ස්වභාව ඇත්තේම, හෙවත් කිසිවක් පතනුවන්ව; ත්වං, නුඹ; කිස්ස, කුමන කරුණකින්; හෙවත් කුමකට; ඉධ ආගතෝ, මෙහි ආයෙහිද? (මෙය සම්බුදුයන් වහන්සේ විසින් උපාලි තෙරුන්ට වදුරණලදි.)

91. ද්වීසු විනයේසු, **භික්ෂු භික්ෂුණී** විනය ද්වයයෙහි; **පඤ්ඤත්තා**, පණවන ලද්දා වූ; යේ, යම් කෙණෙක් තුමූ; උපෝසථේසු, පෙහෙවස් දිනයන්හි; උද්දේසං, උදෙසීමට ආගච්ඡන්ති, එත් ද; සික්ඛාපදානි, ශික්ෂාපද වූ ඔව්හු; කතියෝ හොන්ති, කෙතෙක් වෙත් ද? කතිසු නගරේසු, කොතෙක් නගරයන්හි; පඤ්ඤත්තා, පණවනලද්දාහු ද?

---

* ඇ. පග්ගණ්හිත්වාන-ස-

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

92. භද්දකො තෙ උම්මඞ්ගො*–යොනිසො පරිපුච්ඡසි
තස්ස තෙ අහ මක්ඛිස්සං––යථා පි කුසලො තථා

93. වීසු විනයෙසු **පඤ්ඤත්තා** යෙ–උද්දෙසං
ආගච්ඡන්ති උපොසථෙසු,
අඩ්ඪුඩ්ඪසතානි තෙ හොන්ති–සත්තසු නගරෙසු පඤ්ඤත්තා

94. කතමෙසු සත්තසු නගරෙසු **පඤ්ඤත්තා**–
ඉඞ්ඝ මෙ ත්වං බ්‍යාකර
තං වචනපථං නිසාමයිත්වා–පටිපජ්ජෙම හිතාය නො සියා'ති

95. වෙසාලියං රාජගහෙ–සාවත්ථියං ච ආලවියං †
කොසම්බියං ච **සක්කෙසු**–භග්ගෙසු චෙව **පඤ්ඤත්තා**

---

**92**. තෙ, නුඹගේ ප්‍රශනය; උම්මඞ්ගො, අවිද්‍යාන්ධකාරයෙන් ඉල්පි සිටියේය. භද්දකො, එහෙයින් ම සුන්දර වන්නේය; නොහොත් උම්මඞ්ගො, නුවණ ඉස නැඟීම, (ප්‍රඥාශීර්ෂය) භද්දකො, උතුම; යොනිසො, නුවණින්; පුච්ඡසි, විචාරන්නෙහිය; තස්ස, එබැවින්; කුසලො, දක්ෂයෙක් තෙමේ; යථා, යම්සේ ද; තථා, එසේම; අහං, මම; තෙ, නුඹට; අක්ඛිස්සං, විචාළ දෙය කියන්නෙමි.

**93**. යෙ, යම් ශික්ෂාපද කෙණෙක්; වීසු විනයෙසු, විනය වසයෙහි; පඤ්ඤත්තා, පණවන ලද්දාහු; උපොසථෙසු, උපොසථයන්හි; උද්දෙසං ආගච්ඡන්ති, උදෙසීමට පැමිණෙත් ද; තෙ, ඔව්හු; අඩ්ඪුඩ්ඪසතානි හොන්ති, තුන්සියපණසක් වෙති; සත්තසු, නගරෙසු, නගර සතකදී; පඤ්ඤත්තා, පණවන ලද්දාහ.

**94**. කතමෙසු සත්තසු නගරෙසු, කවර නගර සතක දී; පඤ්ඤත්තා, පණවන ලද්දාහුද යි ඉඞ්ඝ, එබැවින්; ත්වං, නුඹ, මෙ, මට; බ්‍යාකර, විසඳ ප්‍රකාශ කරණු මැනවි. තං වචනපථං ඒ වාක්මාර්ගය; නිසාමයිත්වා, අසා; පටිපජ්ජෙම, පිළිපදින්නෙමු; නො, අපට; හිතාය සියා, එය හිත පිණිස වන්නේය;

**95**. වෙසාලියං, **විශාලා** නුවරද; රාජගහෙ, **රජගහනුවර ද**; සාවත්ථියං ච, **සැවැත් නුවර ද**; ආලවියං, **අලව්** නුවර ද; කොසම්බියං ච, **කොසඹෑ** නුවර ද; සක්කෙසු, **ශාක්‍යදනව්හිද**; භග්ගෙසු, **භග්ගදනව්හි ද**; පඤ්ඤත්තා, සිකපද පණවණ ලද්දාහ.

---

* උම්මඞ්ගො–උග්ගො, † වෙසාලියං රාජගහෙ–සාවත්ථියාච ආලවියා –ස– කොසම්බියා–ස–

96. කති වෙසාලියං* පඤ්ඤත්තා-කති රාජගහෙ කතා
සාවත්ථියං කති හොන්ති-කති ආළවියං කතා

97. කති කොසම්බියං පඤ්ඤත්තා-කති සක්කෙසු වුච්චන්ති
කති භග්ගෙසු පඤ්ඤත්තා-තං මෙ අක්ඛාහි පුච්ඡිතො

98. දස වෙසාලියං පඤ්ඤත්තා-එකවීස රාජගහෙ කතා
ඡ ඌන තීනි සතානි-සබ්බෙ සාවත්ථියං කතා

99. ඡ ආළවියං† පඤ්ඤත්තා-අට්ඨ කොසම්බියං කතා
අට්ඨ සක්කෙසු වුච්චන්ති-තයො භග්ගෙසු පඤ්ඤත්තා

---

96. වෙසාලියා, විශාලා නුවර දී; කති, කොතෙක් සික පදයෝ; පඤ්ඤත්තා, පණවන ලද්දාහු ද; රාජගහෙ, රජගහ නුවර දී; කති, කෙතෙක් කතා, පැණවීම කරණ ලද්දාහු ද; සාවත්ථියා සැවැත් නුවර දී කති, කෙතෙක්; හොන්ති, පණවන ලද්දාහු වෙත් ද; ආළවියා, අලව් නුවර දී කති කතා, කෙතෙක් ප්‍රඥප්තද?

97. කොසම්බියං, කොසඹෑ නුවර දී; කති පඤ්ඤත්තා, කෙතෙක් සිකපද පණවන ලද්දාහු ද; සක්කෙසු, ශාක්‍ය දනව්හි; කති වුච්චන්ති, කෙතෙක් කියනු ලැබෙත් ද; භග්ගෙසු, භගු දන්ව් හි; කති පඤ්ඤත්තා, කෙතෙක් පණවන ලද්දාහු ද; පුච්ඡිතො, විචාරණ ලද්දේ; තං, එය; මෙ, මට; අක්ඛාහි, කියනු මැනවි;

98. වෙසාලියං, විශාලා නුවර දී; පඤ්ඤත්තා, පණවන ලද සිකපදයෝ; දස, දස දෙනෙකි; රාජගහෙ කතා, රජගහ නුවර දී පණවන ලද්දාහු; එකවීස, එක් විස්සකි; සබ්බෙ, සියලු; ඡ ඌන තීනිසතානි, සයක් අඩු තුන්සියයක් (හෙවත්) දෙසිය සිවු අනූවක් ශික්ෂාවෝ; සාවත්ථියා කතා, සැවැත් නුවර දී පණවණ ලද්දාහ.

99. ආළවියං, අලව් නුවර දී; පඤ්ඤත්තා පණවන ලද්දාහු; ඡ, ශික්ෂාපද සයෙකි; කොසම්බියා කතා, කොසඹෑ නුවර දි පණවන ලද්දාහු; අට්ඨ, අටකි; අට්ඨ, අටක්; සක්කෙසු, ශාක්‍ය දනව්හි දි යයි; වුච්චන්ති, කියනු ලැබෙත්; භග්ගෙසු, භගු දනව්හි දී; තයො, ශික්ෂාපද තුනක්; පඤ්ඤත්තා, පණවන ලද්දාහ;

---

* වෙසාලියා-ස-    † ආළවියා-ස-

100 යෙ වෙසාලියං පඤ්ඤත්තා-තෙ සුණොහි යථා කථං
මෙථුන විග්ගහු'ත්තරි-අතිරෙකඤ්ච කාළකං

101. *භූතපරම්පරාභත්තං-දන්තපොණෙන අචෙලකං
භික්ඛුනීසු ච අක්කොසො-දසෙ'තෙ වෙසාලියං කතා

102. යෙ රාජගහෙ පඤ්ඤත්තා-තෙ සුණොහි යථා කථං
අදින්නාදානං රාජගහෙ චෙ අනුධංසනා පි ච

103 චෙ පි ච භෙද අන්තරවාසකං-රූපියං සුත්තං
උජ්ඣාපනෙන ච
පාචිතපිණ්ඩං ගණභොජනං-විකාලෙ ච චාරිත්තං
නහානං ඌන වීසති

---

100. වෙසාලියං, විශාලා නුවර දී; යෙ, යම් ශික්ෂාපද කෙණෙක්; පඤ්ඤත්තා, පණවන ලද්දාහු ද; තෙ, ඔව්හු; යථා කථං, යම්සේ කෙසේ දූ යි; සුණොහි, අසව; මෙථුන, මෛථුන ශික්ෂාපදය; විග්ගහ, මනුෂ්‍යවිග්‍රහ ශික්ෂාපදය; උත්තරි, උත්තරි මනුෂ්‍යධර්ම ශික්ෂාපදය; අතිරෙකං ච, අතිරිත්ත පත්තගාහ ශික්ෂාපදය; කාළකං, සුධකාළක සික්ඛාපදය;

101. භූත, භූතාරොචන ශික්ෂාපදය, පරම්පරාභත්තං, පරම්පරාභත්ත ශික්ෂාපදය; දන්තපොණෙන, දන්තපොණ ශික්ෂාපදය සහිත වූ; අචෙලකං, අචෙලක ශික්ෂාපදය; භික්ඛුනීසු ච, භික්ෂුනීන් කෙරෙහි ද; අක්කොසො, ආක්‍රොශ ශික්ෂාපදය; යන; එතෙ දස, මේ දසය; වෙසාලියං කතා, විශාලා නුවර දී පණවන ලදහ.

102. යෙ, යම් ශික්ෂාපද කෙණෙක්; රාජගහෙ, රජගහ නුවර දී; පඤ්ඤත්තා, පණවන ලද්දාහු ද; තෙ, ඔව්හු යථා කථං, යම් සේ කෙසේ දූ යි; සුණොහි, අසව; අදින්නාදානං, අදින්නාදාන ශික්ෂාපදය; අපි ච, වැලිදු; රාජගහෙ, රජගහනුවර දී චෙ අනුධංසනා, අමූලක අඤ්ඤභාගිය යන අනුධංසන ශික්ෂා වියය ද;

103. චෙ භෙද අපි, සඞ්ඝභෙදක භෙදානුවත්තක යන භෙද ශික්ෂාපද දෙක ද; අන්තරවාසකං, අන්තරවාසක ශික්ෂාපදය රූපියං, රූපිය සංවොහාර ශික්ෂාපදය; සුත්තං, "සාමංසුත්තං විඤ්ඤාපෙත්වා" යනාදී සුත්ත ශික්ෂාපදය; උජ්ඣාපනෙන ච,

---

* භූතපරම්පභත්තා-ස.

**104.** චීවරං දත්වා ඔසාසන්ති-එතෙ රාජගහෙ කතා
ගිරග්ගචරියා තත්ථෙව-ඡන්දදානෙන එක වීසති

**105.** යෙ සාවත්ථියං පඤ්ඤත්තා-තෙ සුණොහි යථා කථං
පරාජිකානි චත්තාරි-සඞ්ඝාදිසෙසා භවන්ති සොළස

**106.** අනියතා ච ද්වෙ හොන්ති-නිස්සග්ගියා චතු වීසති
ඡ පඤ්ඤාස සතඤ්චෙව-ඛුද්දකානි පවුච්චන්ති

**107.** දසයෙව ච ගාරය්හා-ද්වෙ සත්තති ච සෙඛියා
ඡ ඌන තීනි සතානි සබ්බෙ සාවත්ථියං කතා

---

උජ්ඣාපනක ශික්ෂාපදය සහිත; පාචිතපිණ්ඩං, භික්ඛුනීපරිපාචිත ශික්ෂාපදය; ගණභොජනං, ගණ භොජන ශික්ෂාපදය; විකාලෙ චාරිත්තං, විකාලෙ ගාමප්පවෙසන ශික්ෂාපදය; නහානං, නහාන ශික්ෂාපදය; ඌනවීසති, ඌන 'වීසතිවස්සං' යනාදී ශික්ෂාපදය;

**104.** චීවරං දත්වා, 'සමග්ගෙන සඞ්ඝෙන චීවරං දත්වා' යන ශික්ෂාපදය; ඔසාසන්ති, ඔසාසනක ශික්ෂාපදය; තත්ථ එව, එහි ම; ගිරග්ග, 'යාපන භික්ඛුනී නච්චං වා' යනාදී ශික්ෂාපදය; චරියා, චාරිකාපක්කමන ශික්ෂාපදය; ඡන්දදානෙන, ඡන්දදාන ශික්ෂාපදය සමග; එකවීසති, එක්විස්සක් වූවා වූ; එතෙ, මොව්හු; රාජගහෙ කතා, රජගහ නුවරදී පණවන ලද්දාහ.

**105.** සාවත්ථියං, සැවැත් නුවර දී; යෙ, යම් ශික්ෂාපද කෙණෙක් පඤ්ඤත්තා, පණවන ලද්දාහු ද; තෙ, ඔව්හු; යථා කථං, යම් සේ කෙසේ දැ යි; සුණොහි, අසව, චත්තාරි පාරාජිකානි, සතර පාරාජිකාවෝ ද; සඞ්ඝාදිසෙසා සොළස, සඟවෙසෙස් සොළස ද*; භවන්ති, වෙත්;

**106** අනියතා ච, අනියත ද; ද්වෙ හොන්ති, දෙකක් වෙත්; නිස්සග්ගියා, නිසගි; චතුවීසති; සූ විස්සකි; ඛුද්දකානි, ඛුද්දකාපත්තීහු; ඡපඤ්ඤාස සතං, එක්සිය සපණසක් ද; පවුච්චන්ති, කියනු ලැබෙත්.

**107.** ගාරය්හා, ගාරය්හාපත්තීහු; දසචෙව ච, දශයක් ද; සෙඛියා, සෙඛියාවෝ; ද්වෙ සත්තතිච, දෙ සැත්තෑවක් ද; යන; ඡ ඌන තීනිසතානි, සයක් අඩු තුන්සියයක් වූ; සබ්බෙ, සියලු ශික්ෂාවෝ සාවත්ථියං කතා සැවැත් නුවර දී පණවන ලද්දාහ.

---

* සුසාකාවිසන්, ද්වෙ දුට්ඨදොස, අත්තකාම, සඤ්චරිත්ත, කුලදූසක යන සය හා භික්ෂුණී සඞ්ඝාදිසෙස දසයක් ද යන සොළසයි.

## විනයගාථා ඊට ව්‍යාඛ්‍යාව.

108. යෙ ආළවියං පඤ්ඤත්තා - තෙ සුණොහි යථා කථං
කුටි කොසිය සෙය්‍යා ච - ඛණනෙ ගච්ඡ දෙවතෙ
සප්පාණකඤ්ච සිඤ්චන්ති - ඡ එතෙ ආළවියං කතා

109 යෙ කොසම්බියං පඤ්ඤත්තා - තෙ සුණොහි යථා කථං
මහාවිහාරො දොවචස්සං - අඤ්ඤං වාරං සුරාය ච
අනාදරියං සහධම්මො - පයොපානෙන අට්ඨිමං

110. යෙ සක්කෙසු පඤ්ඤත්තා - තෙ සුණොහි යථා කථං
එළකලොමානි පත්තො ච ඔවාදො චෙව භෙසජ්ජං

---

108 ආළවියං, අලව්නුවර; යෙ, යම් 'ශික්ෂාපද කෙනෙක් තුමූ; පඤ්ඤත්තා, පණවන ලද්දාහු ද; තෙ, ඔව්හු; යථා කථං, යම් සේ කෙසේ දැ යි; සුණොහි, අසව; කුටි, සඤ්ඤාචිත කුටි ශික්ෂාවය; කොසිය, කොසිය ශික්ෂාපදය; සෙය්‍යා ච, සහ සෙය්‍යා ශික්ෂාවය; ඛණනෙ, පඨවිඛණන ශික්ෂාවය; ගච්ඡ දෙවතෙ භූතගාම ශික්ෂාවය; සප්පාණකඤ්ච, සිඤ්චන්ති, සප්‍රාණක උදක සිඤ්චන ශික්ෂාවය යන; එතෙ ඡ, මේ සය; ආළවියං කතා, අලව් නුවර දී පණවන ලද්දාහ

109. කොසම්බියං, කොසඹෑ නුවර; පඤ්ඤත්තා, පණවන ලද්දා වූ; යෙ, යම් ශික්ෂා කෙනෙක් වෙත් ද; තෙ, ඔවුහු; යථා කථං, යම් සේ කෙසේ දැ යි; සුණොහි, අසව; මහාවිහාරො, මහල්ලක විහාර ශික්ෂාපදය; දොවචස්සං, දුර්වච ශික්ෂාපදය; අඤ්ඤං, 'අඤ්ඤවාදකෙ විහෙසකෙ' යන ශික්ෂාපදය; වාරං, 'යාව වාරකොසා' යනාදී ශික්ෂාපදය; සුරාය ච, සුරාපාන ශික්ෂාවය; අනාදරියං, අනාදරියෙ යනාදී ශික්ෂාපදය; සහධම්මො, සහධම්මික ශික්ෂාවය; පයොපානෙන, 'සුරා සුරා කාරකං' යන ශික්ෂාපදයත් සමග; අට්ඨිමං, අටක් වේ.

110. සක්කෙසු, ශාක්‍ය දනව්හි; පඤ්ඤත්තා, පණවන ලද්දා වූ; යෙ, යම් සිකපදයෝ වෙත් ද; තෙ, ඔවුහු; යථාකථං, යම් සේ කෙසේ දැ යි; සුණොහි, අසව; එළකලොමානි, එළක ලොම ධොවන ශික්ෂාවය; පත්තො ච, ඌන පඤ්චබන්ධන ශික්ෂාවය; ඔවාදො, 'යාපන භික්ඛුනී ඔවාදය' යනාදී ශික්ෂාවය; භෙසජ්ජං, භෙසජ්ජ විඤ්ඤාපන ශික්ෂාවය;

111. සූචි ආරඤ්ඤකො චෙව - ඡ එතෙ කාපිලවත්ථුවෙ
උදක සුද්ධියා ඔවාදෙ - භික්ඛුනීසු පවුච්චන්ති

112. සෙ භග්ගෙසු පඤ්ඤත්තා - තෙ සුෂණාගි යථා කථං
සමාදහිත්වා විසිවෙන්ති* - සාමිසෙන සසිත්ථකං

113 පාරාජිකානි චත්තාරි - සඞ්ඝාදිසෙසානි භවන්ති
සත්තනිස්සග්ගියා අට්ඨ චත්තිංසානි ච ඛුද්දකා

114. ද්වෙ ගාරය්හා තයො සික්ඛා - ඡ පඤ්ඤාස සික්ඛාපදා
ඡසු නගරෙසු පඤ්ඤත්තා - බුද්ධෙනා'දිච්චබන්ධුනා

115 ඡ ඌන තීනි සතානි - සබ්බෙ සාවත්ථියං කතා
කාරුණිකෙන බුද්ධෙන - ගොතමෙන යසස්සිනා

---

111. සූචි, 'අඞ්ගමයං වා' යනාදී සූචි ශික්ෂාපදය; ආරඤ්ඤකො ච එව, ආරණ්‍යක ශික්ෂාවය; යන; එතෙ ඡ, මේ සය; කාපිලවත්ථුවෙ, කිඹුල්වත් පුරයෙහි දී ප්‍රඥප්තයහ. භික්ඛුනීසු, භික්ෂුණීන් කෙරෙහි; උදකසුද්ධියා ච, උදක සුද්ධික ශික්ෂාව ද; ඔවාදෙ, ඔවාද ශික්ෂාව ද; පවුච්චන්ති, කියනු ලැබෙත්.

112. භග්ගෙසු, භග්ග දනව්හි දී; පඤ්ඤත්තා-පෙ-සුෂණාගි, අසව; සමාදහිත්වා විසිවෙන්ති, ජෝති සමාදහන ශික්ෂාපදය; සාමිසෙන, සාමිස ශික්ෂාවය; ස සිත්ථකං, සසිත්ථක ශික්ෂාපදය වත්තිංස, යන මොව්හු යි.

113. පාරාජිකානි චත්තාරි, පාරාජිකාවෝ සතර දෙනෙක; සඞ්ඝාදිසෙසානි සත්ත භවන්ති, සඞ්ඝාදිසෙසයෝ සත් දෙනෙක් වෙත්. නිස්සග්ගියා අට්ඨ, නිසගි අටකි; ඛුද්දකා, ඛුද්දකාපත්තීහු; දෙතිසකි.

114. ගාරය්හා, ගාරය්හාපත්තීහු; ද්වෙ, දෙදෙනෙක; තයො සික්ඛා, තව ශික්ෂාතුණක් ද; සික්ඛාපදා ඡ පඤ්ඤාස, යළි සිකපද සපණසක් ද යන මොව්හු; ආදිච්චබන්ධුනා, සූර්‍යබන්ධු වූ බුදුන් විසින්; ඡසු නගරෙසු, සය නගරයෙහි; පඤ්ඤත්තා, පණවන ලදහ.

115. කාරුණිකෙන, කරුණා පරවශ වූ; යසස්සිනා, යශස්වී වූ; ගොතමෙන, ගෞතම ගොත්‍රඇත්තා වූ; බුද්ධෙන, බුදුරජාණන් වහන්සේ විසින්; සබ්බෙ ඡ ඌන තීනි සතානි, සියලු සයක් අඩු තුන්සියයක් සිකපදයෝ; සාවත්ථියං කතා, සැවැත්නුවර දී පණවන ලදහ.

---

* විසිබ්බෙන්ති-ස-

## විනයගාථාඣි ව්‍යාඛ්‍යාව.

116. යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො - තං තං බ්‍යාකතං
අනඤ්ඤථා අඤ්ඤං තං පුච්ඡාමි තදිඞ්ඝ බ්‍රෑහි
ගරුකලහුකං චාපි සාවසෙසං නාවසෙසං -
දුට්ඨුල්ලං ච අදුට්ඨුල්ලං යෙ ච යාවතතියකා

117. සාධාරණා'සාධාරණං විපත්තියො - යෙහි සමථෙහි සම්මන්ති
සබ්බානිපෙතානි වියාකරොහි හන්ද වාක්‍යං සුණෝම තෙ

118. එකතිංසා යෙ ගරුකා - අට්ඨෙව අනවසෙසා
යෙ ගරුකා තෙ දුට්ඨුල්ලා - යෙ දුට්ඨුල්ලා තෙ* සීලවිපත්ති

---

116. යං තං, යම් ඒ ශික්ෂාපද භෙදයක්; අපුච්ඡිම්හ, විචාළෙමු ද; තං තං, ඒ ඒ භෙදය; නො, අපට; අකිත්තයී කියෙහිය; අනඤ්ඤථා, අන් පරිද්දකින් නොව; බ්‍යාකතං, විසඳු යෙහිය; තං, ඔබ; අඤ්ඤං, අනිකක්; පුච්ඡාමි, විචාරමි; ඉඞ්ඝ, එබැවින්; තං, එය; බ්‍රෑහි, කියව; ගරුකලහුකං, ගරු ලඝු ඇවැත් ද; අපි, නැවත; සාවසෙසං, සාවසෙසාපත්තීහු ද; අනවසෙසං, අනවසෙසාපත්තීහු ද; දුට්ඨුල්ලං, දුට්ඨුල්ලාපත්තීහු ද; අදුට්ඨුල්ලං ච; අදුට්ඨුල්ලාපත්තීහු ද; යෙ ච යාවතතියකා, යම් මේ තුන්යළදක්වා කීම් ඇති යාවතතියකා පත්තීහු වෙත්නම්ඔව්හුද,

117. සාධාරණාසාධාරණං, සමානා'සමාන ශික්ෂාවෝ ද; විපත්තියො, විපත්ති භෙදය ද; යෙහි සමථෙහි, යම්බඳු සමථ කෙණෙකුන්ගෙන්; සම්මන්ති, සන්සිඳෙත් නම් ඔව්හු ද; යන; එතානි සබ්බානි, මේ කී සියල්ලන් ම; වියාකරොහි, ප්‍රකාශකරණු මැනවි. හන්ද, දූන්; තෙ, ඔබගේ; වාක්‍යං, වචනය; සුණෝම; අසම්හ.

118. ගරුකා, ගරු වූ; යෙ එකතිංසා, මහණ මෙහෙණ සාධාරණාසාධාරණ යම් පාරාජික සඞ්ඝාදිසෙස සඞ්ඛ්‍යාත එක්තිසක් ඇවැත්හු ඇද් ද; එතෙ, මොවු, නතුරෙහි; අඪ, අට දෙනෙක්; අනවසෙසා, පාරාජිකාවෝයි. යෙ, යම් සිකපද කෙණෙක් තුමූ ගරුකා, ගරුකවූවාහු ද; තෙ, ඔව්හු; දුට්ඨුල්ලා, දුට්ඨුල්ල නම් වෙත්. යෙ, යම් ඇවැත් කෙණෙක්; දුට්ඨුල්ලා. දුට්ඨුල්ල නම් වූවාහුද; තෙ. ඔව්හු සීලවිපත්ති, සීලවිපත්තීහු යි

---

* ස්‍යා-ස-

119 පාරාජිකං සඞ්ඝාදිසෙසො–සීලවිපත්තීති වුච්චති
ථුල්ලච්චයං පාචිත්තියං–පාටිදෙසනියං තථා

120 දුක්කටං දුබ්භාසිතං–යො චායං අක්කොසති
හස්සාධිප්පායො අයං–සා ආචාර විපත්ති සම්මතා

121. විපරීත දිට්ඨිං ගණ්හන්ති–අසද්ධම්මෙහි පුරක්ඛතා
අබ්භාචික්ඛන්ති සම්බුද්ධං–දුප්පඤ්ඤා මොහ පාරුතා
අයං සා දිට්ඨිවිපත්ති සම්මතා

122. එකාදස යාවතතියකා–තෙ සුණොහි යථා කථං
උක්ඛිත්තානුවත්තකා–අට්ඨ යාව තතියකා
අරිට්ඨො චණ්ඩකාළී ච–ඉමෙ තෙ යාව තතියකා

---

(සතර විපත්තීන්හි දුට්ඨුල්ලාපත්තිය එක් විපත්තියෙක්හි සඞ්ගෘහිතය, අදුට්ඨුල්ලාපත්තිය විපත්තිත්‍රයයකින් සංගෘහිතය, එහෙයින් යෙ දුට්ඨුල්ලා සා සීලවිපත්ති, යනාදිය කියා එයම විතර කරණුවෝ **පාරාජිකංසඞ්ඝාදිසෙසො** යනාදිය කීහු)

119. පාරාජිකං, පාරාජිකව ද; සඞ්ඝාදිසෙසො, සඞ්ඝාදිසෙසය ද; සීලවිපත්ති ඉති, සීලවිපත්ති යයි; වුච්චති, කියනු ලැබේ; ථුල්ලච්චයං, තුලසි ද; පාචිත්තියං, පචිති ද; තථා, එසේ ම; පටිදෙසනියං, පාටිදෙසනියාපත්තිය ද;

120 දුක්කටං, දුකුලා ද; හස්සාධිප්පායො, සිනා අදහස් ඇතිව; යො ච අයං, යම් මේ පුද්ගලයෙක්; අක්කොසති, ආක්‍රොශ කෙරේ ද යන, අයං දුබ්භාසිතං, මේ දුර්භාෂිතය ද යන; සා අයං, මෝ තොමෝ; ආචාර විපත්ති, අචාර විපත්ති යයි; සම්මතා සම්මත කරණ ලද්දීය.

121. අසද්ධම්මෙහි පුරක්ඛතා, අසද්ධර්මයන් විසින් පෙරටු කරණ ලද්දා වූ; දුප්පඤ්ඤා, දුෂ්ප්‍රාඥ වූ හෙවත් නුවණ නැත්තාවූ; මොහපාරුතා, මොහයෙන් වළඳනා ලද්දා වූ; [සත්වයෝ] සම්බුද්ධං, සර්වඥයන් වහන්සේට; අබ්භාචික්ඛන්ති, අභ්‍යාඛ්‍යාන කෙරෙත් ද; විපරීතදිට්ඨිං, මිථ්‍යාදෘෂ්ටිය; ගණ්හන්ති, ගණිත් ද; සා අයං, මෝතොමෝ; දිට්ඨිවිපත්ති සම්මතා, දෘෂ්ටි විපත්ති යයි සලකනලද්දී වේ.

122. යාව තතියකා, යාව තතියක ශික්ෂාවෝ; එකාදස එකොළොසෙකි තෙ, ඔවුහු යථා කථං, වූ පරිද්දෙන්; සුණොහි, අසව; උක්ඛිත්තානුවත්තකා උක්ඛිත්තානුවත්තක ශික්ෂාව ද; යාවත්කි

**විනයගාථාණිවණ්ඣනාව.**

**123.** කති ඡේදනකානි? කති භෙදනකානි කති
උද්දාලනකානි ? කති අනඤ්ඤ පාචිත්තියානි ?
කති භික්ඛුසම්මුතියො? කති සාමීචියො ? කති පරමානි ?
කතිජානන්ති පඤ්ඤත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා

**124.** ඡ ඡේදනකානි එකං භෙදනකං එකං උද්දාලනකං
චත්තාරි අනඤ්ඤ පාචිත්තියානි
චතස්සො භික්ඛුසම්මුතියො–සත්ත සාමීචියො චුද්දස පරමානි
සොළස ජානන්ති පඤ්ඤත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා

---

යකා අඨ, යාව තතියක ශික්‍ෂා අට ද; අරිට්ඨො අරිට්ඨ ශික්‍ෂාව ද; චණ්ඩකාලී ච, චණ්ඩකාලී ශික්‍ෂාව ද යන; තෙ ඉමෙ, ඒ මොව්හු; යාව තතියකා, යාව තතියක ශික්‍ෂා නම්හ.

123. ඡේදනකානි, ඡේදනක ශික්‍ෂාවෝ; කති, කෙතෙක් ද? භෙදන කානි, භෙදනක ශික්‍ෂාවෝ; කති, කෙතෙක් ද ? කති උද්දාලනකානි, විදාරණ ශික්‍ෂාවෝ කෙතෙක් ද? අනඤ්ඤ පාචිත්ති යානි, අනඤ්ඤ පචිති; කති, කෙතෙක්ද? භික්ඛු සම්මුතියො කති භික්‍ෂුසම්මුති ශික්‍ෂාවෝ කෙතෙක්ද? කති සාමීචියො, "අයං තත්‍ථ සාමීචි" යනුවෙන් දක්වුණු ශික්‍ෂාවෝ කෙතෙක්ද ? කති පරමානි, **ඡක්කාතතුපරමං** යනාදීන් දක්වුණු ශික්‍ෂාවෝ කෙතෙක් ද ? ආදිච්චබන්ධුනා, සූය්‍ර්‍යබන්ධු වූ; බුද්ධෙන, බුදුන් විසින්; පඤ්ඤත්තා, පණවන ලද්දා වූ; ජානන්ති, **යො පන භික්ඛු ජානං** යනාදීන් දක්වුණු ශික්‍ෂාපදයෝ; කති, කෙතෙක් ද ?

**124.** ආදිච්චබන්ධුනා, සූය්‍ර්‍යබන්ධු වූ; බුද්ධෙන, බුදුරජුන්; විසින්; පඤ්ඤත්තා, පණවන ලද්දා වූ; ඡේදනකානි, ඡේද නකශික්‍ෂාවෝ; ඡ, සදෙනෙකි [උපග්‍රන්‍ථයබලනු] එකං භෙද නකං, එක භෙදන ශික්‍ෂාපදයකි. එකං උද්දාලනකං, එක උද්දාල නක සිකපදයෙකි. අනඤ්ඤ පාචිත්තියානි, අනඤ්ඤපාචි ත්තිය සික්ඛාපදයෝ; චත්තාරි, සතරෙකි. භික්ඛු සම්මුතියො, භික්‍ෂු සම්මුති ශික්‍ෂාවෝ; චතස්සො, සතරෙකි. සාමීචියො, සාමීචි ශික්‍ෂාවෝ; සත්ත, සතකි, පරමානි, පරමශික්‍ෂා පදයෝ; චුද්දස, තුදුසෙකි. ජානන්ති, ජානන්ති ශික්‍ෂාවෝ, සොළස, සොළසෙකි.

125. වීසං වෙ සතානි භික්ඛූනං-සික්ඛාපදානි උද්දෙසං
ආගච්ඡන්ති උපොසථෙසු
තීණි සතානි චත්තාරි-භික්ඛුනීනං සික්ඛාපදානි
උද්දෙසං ආගච්ඡන්ති උපොසථෙසු

126 ඡ චත්තාළීසා භික්ඛූනං-භික්ඛුනීහි අසාධාරණා
සතං තිංසා ච භික්ඛුනීනං-භික්ඛූහි අසාධාරණා

127 සතං සත්තති ඡ චෙව-උභින්නං අසාධාරණා
සතං සත්තති චත්තාරි-උභින්නං සමසික්ඛා *

128 වීසං වෙ සතානි භික්ඛූනං-සික්ඛාපදානි උද්දෙසං
ආගච්ඡන්ති උපොසථෙසු තෙ සුණොහි යථා කථං

---

125 භික්ඛූනං, භික්ෂූන් පිළිබඳ වූ; වීසං වෙ සතානි සික්ඛාපදානි, දෙසිය විස්සක් ශික්ෂාවෝ; උපොසථෙසු, උපොසථ දිනයන්හි, උද්දෙසං, උදෙසීමට, ආගච්ඡන්ති, පැමිණෙත්. භික්ඛුනීනං, භික්ෂුණීන් පිළිබඳ වූ; තීනි සතානි චත්තාරි සික්ඛා පදානි, තුන්සිය සතරක් සිකපදයෝ; උපොසථෙසු, පොහෝ දිනයන්හි; උද්දෙසං ආගච්ඡන්ති, උදෙසීමට පැමිණෙත්.

126 භික්ඛුනීහි, භික්ෂුණීන් හා. අසාධාරණා, අසමාන වූ; භික්ඛූනං, භික්ෂූන්ගේ සිකපද; ඡ චත්තාළීසා, සය සතළිසෙකි. භික්ඛූහි, භික්ෂූන් හා; අසාධාරණා, අසමාන වූ; භික්ඛුනීනං, භික්ෂුණීන්ගේ සිකපද; සතංතිංසා ච, එක්සිය තිසක් ද වෙත්.

127. උභින්නං, භික්ෂු භික්ෂුණී උභයපක්ෂයට; අසාධාරණා අසමාන වූ ශික්ෂාවෝ; සතං සත්තති ඡ එව, එක්සිය සැත්තෑ සයක් ම ය. උභින්නං, දෙපසට, සමසික්ඛා, සමාන ශික්ෂාවෝ; සතං සත්තති චත්තාරි, එක්සිය සූ සැත්තෑවෙකි.

128. භික්ඛූනං, භික්ෂූන්ගේ; වීසං වෙ සතානි, දෙසිය විස්සක්; සික්ඛාපදානි, සිකපද; උපොසථෙසු, උපොසථ දින යන්හි; උද්දෙසං ආගච්ඡන්ති, උදෙසීමට පැමිණෙත්. තෙ, ඔවුන්, යථා කථං, තත්වූ පරිදි; සුණොහි, අසව.

---

* සමසික්ඛතා-අ:-

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව

129. පාරාජිකානි චත්තාරි–සඞ්ඝාදිසෙසානි භවන්ති තෙරස
අනියතා ද්වෙ හොන්ති–නිස්සග්ගියානි තිංසෙ

130. ද්වෙ නවුතිච ඛුද්දකා චත්තාරො පාටිදෙසනියා–
පඤ්චසත්තති සෙඛියා
වීසං ද්වෙ සතානිපි'මෙ හොන්ති–භික්ඛූනං සික්ඛාපදානි
උද්දෙසං ආගච්ඡන්ති උපොසථෙසු

131. තීනි සතානි චත්තාරි භික්ඛුනීනං–සික්ඛාපදානි උද්දෙසං
ආගච්ඡන්ති උපොසථෙසු තෙ සුණොහි යථා කථං

132. පාරාජිකානි අට්ඨ සඞ්ඝාදිසෙසානි–භවන්ති සත්තරස
නිස්සග්ගියානි
තිංසෙ ච සතං ඡසට්ඨි ච චෙව–ඛුද්දකානි පවුච්චන්ති

---

129. පාරාජිකානි, පාරාජිකාවෝ; චත්තාරි, සතරදෙනෙකි; සඞ්ඝාදිසෙසානි, සඞ්ඝාදිසෙස්; තෙරස භවන්ති, තෙළෙසක් වෙත්; අනියතා, අනියතයෝ; ද්වෙ හොන්ති, දෙදෙනෙක් වෙත් නිස්සග්ගියානි, නිසඟි; තිංසෙ ච, තිසක් ද වෙත්.

130. ඛුද්දකා, ඛුද්දකයෝ; ද්වෙ නවුති, දෙයානූවකි; පාටිදෙසනීයා, පාටිදෙසනීහු; චත්තාරො, සතරදෙනෙකි. සෙඛියා, සෙඛියාවෝ; පඤ්චසත්තති, පන්සැත්තෑවකි; (යන;) ඉමෙ වීසං ද්වෙ සතානි අපි; මේ දෙසිය විස්සක් වූ; භික්ඛූනං, භික්ෂූන්ගේ; සික්ඛාපදානි, සිකපදයෝ; උපොසථෙසු, පෙහෙවස් දිනයන්හි; උද්දෙසං ආගච්ඡන්ති, උදෙසීමට පැමිණෙත්.

131. භික්ඛුනීනං, භික්ෂුණීන්ගේ; තීනිසතානි චත්තාරි සික්ඛාපදානි, තුන්සිය සතරක් ශික්ෂාවෝ; උපොසථෙසු, පෙහෙවස් දිනයන්හි; උද්දෙසං ආගච්ඡන්ති, උදෙසීමට එත් ද; තෙ, ඔවුන් යථාකථං, තතු සේ; සුණොහි, අසව.

132. පාරාජිකානි, පාරාජිකාවෝ; අට්ඨ, අටදෙනෙකි; [භික්ෂූන්ට සාධාරණ පරිජි සතර ඇතුළු **උබ්භජානුමණ්ඩලිකා, වජ්ජපටිච්ඡාදිකා, උක්ඛිත්තානුවත්තිකා, අට්ඨවත්ථුකා** යන සතර ද; අෂ්ටපාරාජිකාවෝ යි: උපග්‍රන්ථය බලනු ] සඞ්ඝාදිසෙසානි, සඞ්ඝාදිසෙසයෝ; සත්තරස භවන්ති, සතළොසක් වෙත්. නිස්සග්ගියානි, නිසඟි; තිංසෙ ච, තිසක් වෙත්; ඛුද්දකානි, ඛුද්දකයෝ; සතං ඡසට්ඨි ච එව, එක්සිය සැට සයකැයි; පවුච්චන්ති, කියනු ලැබෙත්

133. අ ... දෙසනීයා-පඤ්චසත්තති සෙඛියා
... තානි චත්තාරිමෙ හොන්ති භික්ඛුනීනං-
සික්ඛාපදානි උද්දෙසං ආගච්ඡන්ති උපොසථෙසු

134. ඡ චත්තාලීසා භික්ඛූනං- භික්ඛුනීහි අසාධාරණා
තෙ සුණොහි යථා කථං

135. ඡ සඞ්ඝාදිසෙසා ද්වීහි අනියතෙහි අට්ඨ නිස්සග්ගියානි ද්වාදස
තෙ තෙහි හොන්ති වීසති *ද්වා වීසති බුද්දකා
චත්තාරො පාටිදෙසනියා-ඡ චත්තාලීසාපිමෙ හොන්ති

136. භික්ඛූනං භික්ඛුනීහි-අසාධාරණා සතං.
තිංසා ච භික්ඛුනීනං -භික්ඛූහි අසාධාරණා
තෙ සුණොහි යථා කථං

---

133 පාටිදෙසනීයා, පාටිදෙසනීහු; අට්ඨ, අටකි; සෙඛියා, සෙඛියාවෝ; පඤ්චසත්තති, පන්සැත්තෑවකි. තීනිසතානි චත්තාරි, තුන්සිය සතරක් වූ; ඉමෙ සික්ඛාපදානි, මේ සිකපදයෝ, භික්ඛුනීනං, භික්ෂුණීන් පිළිඳ ව; උපොසථෙසුං උද්දෙස ආගච්ඡන්ති එත්.

134 භික්ඛුනීහි, භික්ෂුණීන් හා; අසාධාරණා, අසමාන වූ, භික්ඛූනං, භික්ෂූන්ගේ; [ශික්ෂාපදයෝ] ඡ චත්තාලීසා, සතළිස් සයකි. තෙ, ඔවුන්, යථා කථං, තත් වූ පරිද්දෙන්; සුණොහි අසව.

135 ඡ සඞ්ඝාදිසෙසා, විසට්ඨි, කායසංසග්ග දුට්ඨුල්ල, අත්ත කාම, කුටි, විහාර යයි සඟවෙසෙස් සදෙන ය; ද්වීහි අනියතෙහි භික්ෂුණීන්ට අසාධාරණ වූ අනියත දෙකය යන මොවුන් හා; අට්ඨ, ශික්ෂාපද අටෙක නිස්සග්ගියානි ද්වාදස, ධොවන පටිග්ගහාදී නිසගි දොළසය. (උ. ග්‍ර බලනු) යන; තෙ, ඔව්හු; තෙහි, පළමු කී වුන් හා කැටිව; වීසති, විස්සකි. බුද්දකා, සුඩපාචිත්තියා පත්තීහු; ද්වා වීසති. පරම්පරභොජනාදී වශයෙන් දෙවිස්සකි. [උප-ග්‍ර-බලනු] චත්තාරො පාටිදෙසනීයා පාටිදෙසනීය සතරෙකි. ඉමෙ, සියලු මොහු, චත්තාලීසා හොන්ති, සතළිසක් වෙත්.

136 භික්ඛූනං, භික්ෂූන්ට පමණක් පණවන ලද; භික්ඛුනීනං, භික්ඛුණීන්ට; අසාධාරණා, සාධාරණ නො වූ ශික්ෂාපද; සතං, සියයෙකි; භික්ඛුනීනං, භික්ෂුණීන්ට පමණක් පණවන

---

සමෙ වීසති--

## විනය ගාථා ඡීඩ ව්‍යාඛ්‍යාව.

137 පාරාජිකානි චත්තාරි-සඞ්ඝමහාදස නිස්සරෙ
නිස්සග්ගියා වාදස-ජ්ඣානවුති ච ඛුද්දකා
අට්ඨ පාටිදෙසනියා-සතං තිංසා පි මෙ හොන්ති

138 භික්ඛුනීනං භික්ඛූහි-අසාධාරණා සතං සත්ත ති ඡ චෙව්ව
උභින්නං අසාධාරණා-තෙ සුණොහි යථා කථං

139 පාරාජිකානි චත්තාරි-සඞ්ඝාදිසෙසානි භවන්ති සොළස
අනියතානි වෙ හොන්ති-නිස්සග්ගියානි චතුවීසති

---

ලද; භික්ඛූහි, භික්ෂූන් හා; අසාධාරණා, සාධාරණ නො වූ; තිංසා ච, තිසක් ද වෙති. තෙ, ඔවුන්; යථා කථං, තතු සේ; සුණොහි, අසව.

**137.** චත්තාරි පාරාජිකානි, සතර පාරාජිකාපත්තිහු ද; සඞ්ඝමහා දස නිස්සරෙ, භික්ෂූන්ට අසාධාරණ ඔවුන්ටම ආවෙණික සඟවෙසෙස් දශය නොහොත් සඞ්ඝයාකෙරෙන් බැහැර කට යුතු නිස්සාරණීය සඟවෙසෙස් දසය ද; වාදස නිස්සග්ගියා, භික්ෂුණී විභඞ්ගයෙහි කී දෙළොස් නිසගිහු ද; ඡ්ඣානවුති ච ඛුද්දකා, සයානූ ශුඩපචිතිහු ද; අට්ඨ පාටිදෙසනීයා, පාටිදෙස නීය අට ද; (යන) ඉමෙ, මොහු, සතං තිංසාපි හොන්ති, එක්සිය තිසක් වෙති.

**138.** භික්ඛූහි, භික්ෂූන් හා; අසාධාරණා, සාධාරණා නො වූ; භික්ෂුණීනං, භික්ෂුණීන්ට පමණක් පණවන ලද්දාහු; සතං සත්ත තිඡචෙව්ව, එක්සිය ස සැත්තෑවකි උභින්නං, දෙපක්ෂයට; අසා ධාරණා, අසමාන වූ; ශික්ෂාවෝ වෙත්. තෙ= යථාකථං- සුණොහි-

**139.** පාරාජිකානි චත්තාරි, සතර පරිජිහු ද; සංඝාදි සෙසානි, සඟවෙසෙස්; සොළස, සොළසක් ද; භවන්ති, වෙත්. වෙ අනියතා හොන්ති, අනියතාපත්තීහු දෙකක් වෙත් නිසග්ගි යානි, නිසගි; චතු වීසති, (මහණුන්ට අසාධාරණ මෙහෙණීන්ගේ දෙළෙස් නිසගිය, මෙහෙණුන්ට අසාධාරණ මහණුන්ගේ දෙළොස් නිසගි යයි)සූ විස්සකි

140. ස'     ඨාරස චෙව*-බුද්දකානි පවුච්චන්ති ද්වාදස
ප.   ෘසනියා සතං-සත්තති ඡචෙවපි මෙ හොන්ති

141. උභින්නං අසාධාරණා-සතං සත්තති චත්තාරි
උභින්නං සමසික්ඛතා-තෙ සුණොහි යථාකථං

14?. පාරාජිකානි චත්තාරි-සඞ්ඝාදිසෙසානි භවන්තිසත්ත
නිස්සග්ගියානි අට්ඨාරස-සමසත්තති ඛුද්දකා

143 පඤ්චසත්තති සෙඛියා සතං සත්තති
චත්තාරිපිමෙ හොන්ති උභින්නං සම සික්ඛතා

144 අපෙව පාරාජිකායෙ දුරාසදා තාලාවත්‍ථුසමූපමා †
පණ්ඩුපලාසො පුථුසිලා-සීසච්ඡින්නොව යො නරො
තාලොව මත්‍ථක ඡින්නො-අවිරූළ්හී භවන්ති තෙ

140 ඛුද්දකානි, ශුද්‍ධ පාචිත්තියාපත්තීහු; සතං අට්ඨාරස ච එව, එක්සිය අටළොසෙක් ම වෙති [උ ග්‍ර. බ ] පාටිදෙසනීයා-පාටිදෙසනීයාපත්තීහු; ද්වාදස, දොළොසෙකි. ඉමෙ, මොහු; සතං සත්තති ඡ ච එව අපි හොන්ති, එක්සිය ස සැත්තෑවක්ම වෙති.

141 උභින්නං, මහණ මෙහෙණි දෙපසට, අසාධාරණා, අසමාන වූ ශික්ෂාවෝ; සතං සත්තති චත්තාරි, එක්සිය සැත්තෑ සතරකි. උභින්නං සමසික්ඛතා, දෙපසට සමාන ශික්ෂා පද වෙත් ද; තෙ-යථාකථං-සුණොහි.

142. පාරාජිකානි පාරාජිකාපත්තිහු; චත්තාරි, මෛථුනාදී වශයෙන් සතරකි. සඞ්ඝාදිසෙසානි, සඟවෙසෙස්; සත්ත භවන්ති, සතක් වෙත්, නිස්සග්ගියානි, නිසඟි පචිති; අට්ඨාරස, අටළොසෙකි. ඛුද්දකා, ශුද්‍ධපචිති, සම සත්තති, සැත්තෑවකි (උප, ග්‍රන්ථයබලනු )

143. සෙඛියා, සෙඛියාවෙති ආචා වූ; සතං සත්තති චත්තාරි, එක්සිය සිවු සැත්තෑවකි; ඉමෙ, මොව්හු; උභින්නං, මහණ මෙහෙණි දෙපසට; සමසික්ඛතා, සමාන ශික්ෂාවෝ, හොන්ති, වෙත්.

144. දුරාසදා, ළං විය නො හැක්කා වූ; නො පැමිණිය හැක්කා වූ; නොහොත් සෙවුනන්ගේ මුල් සිඳින හෙයින් නො සෙවිය හැක්කා වූ; (මෙයින් මොවුන්ගේ සප්‍රතිභය භාවය ප්‍රකාශිතය)

* සතංඅට්ඨාරසංචෙව-ශු. † තාලවත්‍ථු සමූපමා-ස-

145. තෙවීසති සඞ්ඝාදිසෙසො–වෙ අනියතා වෙ චත්තාළීස
නිස්සග්ගියා අඩාසීතිසතං–පාචිත්තියා චාදස පාටිදෙසනියා

146. පඤ්චසත්තති සෙඛියා තීහි සමථෙහි සම්මන්ති
සම්මුඛා ච පටිඤ්ඤාය-තිණවත්ථාරකෙන ච

තලාවත්‍ථු සමූපමා, තල් ගස් ඉඟුළු බිමකට බඳු උපමා ඇති. (මෙයින් මොවුන්ගේ අවිරූළ්හි භාවය ප්‍රකාශිතයි) පාරාජිකා, පාරාජිකාපත්තීහු; අඩ එව, අට දෙනෙක්ම වෙත්. යෙ, යම් කෙනෙක් (ඒ ට අවන්නහු නම්) තෙ, ඔව්හු; පණ්ඩුපලාසො, විලික්සත් පතක් මෙන් ද; පුථුසිලා, පැලුනු ගලක්මෙන් ද, සීසච්ඡින්නො; හිස සුන් [යො, යම්බඳු] නරො ඉව, මිනිසෙකු මෙන් ද, මත්ථකච්ඡින්නො, මුදුන සුන් කල; තාලොඉව, තල් ගසක් මෙන් ද; අවිරූළ්හි භවන්ති, නැවත නො හට ගන්නෝ වෙති. [උපමා නිර්දේශයෙන් පරිජි අවන් මහණ නැවත ප්‍රකෘති ශ්‍රමණ භාවයෙහි පිහිටා සිටින්නට නොහැකිව සස්නෙහි අවිරූඪ වූ බව සුප්‍රකට කරණ ලදී-] [මේ අෂ්ටපාරාජිකාවෝ කිසියම් සමථයෙකින් නොසං සිඳෙත්, සං සිඳෙන ආපත්ති දක්වන්නෝ "තෙවීසති සඞ්ඝාදිසෙසා" යනාදිය ප්‍රකාශකළෝ.]

145 තෙ වීසති සඞ්ඝාදිසෙසා, තෙවිසි සඟවෙසෙස් ද; ද්වෙ අනියතා, අනියත දෙක ද, චත්තාළීස නිස්සග්ගියා, සතළිස් නිසඟිහු ද; අඩාසීති සතා පාචිත්තියා, මහණුන්ගේ දෙයානුවය, මෙහෙණුන්ගේ සයානුවදූයි යන එක්සිය අසූ අටක් පචිති හුද; චාදස පාටිදෙසනියා, පාටිදෙසනියාපත්ති දොළස ද;

146 පඤ්චසත්තති සෙඛියා, සෙඛියාගත ශික්ෂාවෝ පන් සැත්තෑව ද; [යන මොහු ,]සම්මුඛා ච, සම්මුඛාවිනය ද; පටිඤ්ඤාය, පටිඤ්ඤාත කරණය ද; තිණවත්ථාරකෙන ච, තිණවත්ථාරකය යන; තීහි සමථෙහි, සමථ තුනින්; සම්මන්ති, සං සිඳෙත්. [සඟවෙසෙස් තිණවත්ථාරය හැර සම්මුඛා පටිඤ්ඤාතකරණ දෙකින් සං සිඳෙත් ]

147. වෙ [illegible] ාසථා වෙ පවාරණා - චත්තාරි කම්මානි
ජිනෙන දෙසිතා
පඤ්චෙව උද්දෙසා චත්තාරො භවන්ති - අනඤ්ඤථා
ආපත්තික්ඛන්ධානි භවන්ති සත්ත

148 අධිකරණානි චත්තාරි - සත්තහි සමථෙහි සම්මන්ති
වීහි චතූහි තීහි - කිච්චං එකෙන සම්මති

149. පාරාජිකන්ති යං වුත්තං - තං සුණොහි යථාකථං
චුතොපරද්ධො භට්ඨො ච - සද්ධම්මා හි නිරාකතො *
සංවාසො පි තහිං නත්ථි - තෙනෙතං ඉති වුච්චති

---

147. ජිනෙන, සර්වඥයන් වහන්සේ විසින්; දෙසිතා, දෙසන ලද්දා වූ; වෙ උපොසථා, භික්ෂු භික්ෂුණී උපොසථ දෙකය; වේ පවාරණා එසේම පවුරුණු දෙකය; චත්තාරි කම්මානි, අධර්මවර්ගාදි කර්ම සතරය; පඤ්ච උද්දෙසා, භික්ෂූන්ගේ වශයෙන් ප්‍රාතිමොක්ෂ උද්දෙශ පසය; චත්තාරි, භික්ෂුණීන් ගේ වශයෙන් සතරය; සත්ත ආපත්තික්ඛන්ධා; ආපත්තිස්කන්ධ සතය යන මොව්හු ද; අනඤ්ඤථා භවන්ති, අන් පරිද්දකින් නො වෙත්.

148 චත්තාරි අධිකරණානි, සතර අධිකරණයෝ; සත්තහි සමථෙහි, සමථ සතින් ද; වීහි, දෙකකින් ද; චතූහි, සතරකින් ද; තීහි, තුනකින් ද; සම්මන්ති, සංසිඳෙත්; කිච්චං, කිච්චාධිකරණය; එකෙන, එක් සමථයකින්; සම්මති, සංසිඳෙයි.

149. පාරාජිකං ඉති, **පාරාජික** යයි; යං, යමක්; වුත්තං, කියන ලද ද; තං, ඒ අර්ථය; යථාකථං, යම්සේ කෙසේද යි; සුණොහි, අසව; සද්ධම්මා, ශාසනයෙන්; චුතො, සැවවීද; පරද්ධො, පැරදුනේ ද; භට්ඨො, ඒස්ථානයෙන් ගිලිහුණේ ද; නිරාකතො, ඔහු විසින් දුරුකරණ ලද ද; තහිං, ඔහු කෙරෙහි; සංවාසො පි, උපොසථ පවාරණාදී භේද සමග විසීමෙක් ද; නත්ථි, නැත; තෙන, එහෙයින්; එතං, මේ ආපත්තිය; ඉති වුච්චති, **පාරාජිකා** යයි මෙසේ කියනු ලැබේ.

(විස්තර මුද්‍රිත සමන්තපාසාදිකාවෙහි 150 පිට බැලියයුතු)

---

* නිරඞ්ගතො-ස-

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

150. සඞ්ඝාදිසෙසො ති යං වුත්තං - තං සුණොහි යථාකථං
සඞ්ඝාව දෙති පරිවාසං - මූලාය පටිකස්සති
මානත්තං දෙති අබ්භෙති - තෙනෙතං ඉති වුච්චති

151 අනියතො ති යං වුත්තං - තං සුණොහි යථාකථං
අනියතො න නියතො - අනෙකංසිකතං පදං
තිණ්ණමඤ්ඤතරං ඨානං - අනියතො ති පවුච්චති

---

150 සඞ්ඝාදිසෙසො ඉති, **සඞ්ඝාදිසෙස** යයි; යං, යමක්; වුත්තං, කියනලද ද; යථාකථං, යම්සේ කෙසේදැයි; තං, එය; සුණොහි, අසව; සඞ්ඝා එව, සංඝයාම; පරිවාසං, **පිරිවෙස්**; දෙති, දෙයි; මූලායපටිකස්සති, **මූලායපටිකස්සන** කර්මය කෙරෙයි; මානත්තං, **මානත්**; දෙති, දෙයි; අබ්භෙති, **අබ්භාන කර්මය** කෙරෙයි; තෙන, සඞ්ඝයා මුල මැද අග යන තුන් තැන ම කැමති විය යුතුය යන අර්ථයෙන්; එතං, මේ ආපත්තිය, ඉති පවුච්චති, **සඞ්ඝාදිසෙස** යයි කියනු ලැබේ [මේ ඇවතට පැමිණ ඉන් නැගී සිටිනු කැමති මහණහු විසින් ආදියෙහි පිරිවෙස්දීම පිණිස ද මධ්‍යයෙහි මූලායපටිකස්සන මානත් ආදිය ලැබීම පිණිස ද, අවසානයෙහි අබ්භානය පිණිස ද සඞ්ඝයා කැමතිවිය යුතුයි එහෙයින් **සඞ්ඝාදිසෙස** යයි කියනුලැබේ

[විස්තර-සමන්ත පාසාදිකා 301-පිට බලනු]

151. අනියතො ඉති, **අනියත** යයි; යං, යමක්; වුත්තං, කියන ලද ද; තං, එය, යථාකථං, තතු සේ; සුණොහි, අසව; අනියතො, අනියත යයි සේයි; න නියතො, නියත නැත්තේ ද; පදං ආපත්ති පදය; අනෙකංසිකතං, සනිටුහන් නො කරණ ලද ද; තිණ්ණං අඤ්ඤතරං ඨානං, **පරිජි, සඟ වෙසෙස්, පචිති** යන තුන් කාරණයෙන් එක්කින් ඇවත සිදු වේ ද; (එහෙයින්) අනියතො, **අනියත** යයි; පවුච්චති, කියනු ලැබේ. [ඒකාන්තයෙන්, සනිටුහන් නො කොට හැකි **පරිජි සඟවෙසෙස් පචිති** යන ඇවැත් තුනින් නඟින ඇවත **අනියතැයි** යූ සේයි ]

152 චු[illegible]ග්ගන්ති යං වුත්තං - තං සුණොහි යථාකථං
ඒ[illegible] මූලයො දෙසෙති - යොච තං පතිගණ්හති
අච්චයො තෙන සමො නත්ථි - තෙනෙතං ඉති වුච්චති

153. නිස්සග්ගියන්ති යං වුත්තං - තං සුණොහි යථාකථං
සඞ්ඝමජ්ඣෙ ගණමජ්ඣෙ - එකකස්සෙ'ව එකතො
නිස්සජ්ජිත්වාන දෙසෙති - තෙනෙතං ඉති වුච්චති

154. පාචිත්තියන්ති යං වුත්තං - තං සුණොහි යථාකථං
පාතෙති කුසලං ධම්මං - අරියමග්ගම්පරජ්ඣති
චිත්තසම්මොහනට්ඨානං - තෙනෙතං ඉති වුච්චති

---

152. චුල්ලවග්ගං ඉති, **චුල්ලවග්ග** යි කියා; යං වුත්තං-තං-යථාකථං- සුණොහි- එකස්ස, එකක්හට; මූලයො දෙසෙති, (**මූලායපටිකස්සන** යන්) දෙසයි; යො, යමෙක්; තං, එය; පතිගණ්හති, පිළිගණී ද, අච්චයො, වරද තෙමේ; තෙන, ඔහු හා; සමො, සමවූ **දෙශනාගාමිනී** ඇවතෙක්; නත්ථි, නැත්තේ ද; තෙන, එබැවින්; එතං, මෙය; ඉති වුච්චති, **චුල්ලවග්ග** යයි මෙසේ කියනු ලැබේ; [**දෙශනාගාමිනී** ඇවත් අතුරෙහි බැරෑරුම් ඇවතය යනාර්ථයෙන් **චුල්ලවග්ග** යයි කියා ]වි.ස 182 පිට බලනු.

153 නිස්සග්ගියං ඉති, **නිස්සග්ගි** යයි; යං වුත්තං -පෙ- සුණොහි- සඞ්ඝමජ්ඣෙ, **සඞ්ඝයා** මැද හෝ; ගණමජ්ඣෙ, සමූහයා මැද හෝ; එකකස්සෙව, එකෙක්හට ම; එකතො, එකෙක්; නිස්සජ්ජිත්වාන, යම් වස්තුවක් නිසඳු; දෙසෙති, ආපත්තිය දෙසා ද; තෙන, එබැවින්; එතං, මේ ආපත්තිය; ඉති වුච්චති, **නිස්සග්ගි** යයි මෙසේ කියනු ලැබේ;

154. පාචිත්තියං ඉති, **පාචිත්තිය** යයි; යං, යමක්; වුත්තං, කියන ලද ද ; තං, එය; යථාකථං, තතුසේ ; සුණොහි, අසව; **කුසලං ධම්මං**, කුශල චිත්තය; පාතෙති, හෙළා ද; අරියමග්ගං, ආර්ය මාර්ගය; අපරජ්ඣති, වරදා ද; චිත්ත සම්මොහනට්ඨානං, චිත්තයා මුළා කරණ තැන වේ ද = නොහොත් මුළා කිරීමට කරුණු වේ ද; තෙන, එබැවින්; එතං, මේ ආපත්තිය; ඉති වුච්චති, **පාචිත්තිය** යයි මෙසේ කියනු ලැබේ.

[**පාතෙති චිත්තං ති පාචිත්තියං** යි යූ හෙයින් ආර්යමාර්ගය වළහන සිත මුළා කරණ්‍ කුශලචිත්තය හෙළන ඇවත **පාචිත්ති** යයි ප්‍රකාශිතය.]

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

155. පාටිදෙසනියන්ති යං වුත්තං-තං සුණොහි යථා
භික්ඛු අඤ්ඤාතකො සන්තො-කිච්ඡා ලද්ධාය ... ං
සාමං ගහෙත්වා භුඤ්ජෙය්‍ය-ගාරය්හන්ති පවුච්චති

156. නිමන්තනාසු භුඤ්ජන්තං-ඡන්දය වොසාසති තත්‍ර භික්ඛුනී
අනිවාරෙත්වා තහිං භුඤ්ජෙ-ගාරය්හන්ති පවුච්චති

157. සද්ධාචිත්තං කුලං ගන්ත්වා-අප්පභොගං අනාළ්හියං
අගිලානො තහිං භුඤ්ජෙ-ගාරය්හන්ති පවුච්චති

158 යො වෙ අරඤ්ඤෙ විහරන්තො-සාසඞ්කෙ ස භයානකෙ
අවිදිතං තහිං භුඤ්ජෙ-ගාරය්හන්ති පවුච්චති

---

155. පාටිදෙසනියං ඉති, **පාටිදෙසනී** යයි; යං වුත්තං—පෙ—සුණොහි- **භික්ඛු**, භික්ෂු තෙම; අඤ්ඤාතකො සන්තො, නො නෑ වූයේ; කිච්ඡා ලද්ධාය, දුක සේ ලද නැනැත්තියගේ; භොජනං, බොජුන; **සාමං**, තෙමේම; ගහෙත්වා, ගෙණ; භුඤ්ජෙය්‍ය, **වළඳන්නේ ද**; ගාරය්හං ඉති, එය ගර්හා කටයුතු යයි පවුච්චති, **කියනු ලැබේ**. [**ගාරය්හාපත්ති** යයි උදෙසූ මෙය ප්‍රතිදෙශනය කට යුතු හෙයින් **පාටිදෙසනී** නම් ]

156. නිමන්තනාසු, නිමන්ත්‍රණයන් හි, භුඤ්ජන්තං, වළඳන්නහු; **තත්‍ර**, එහි දී; **භික්ඛුනී**, **භික්ෂුණියක්** තොමෝ; **ඡන්දය**, රුචියෙන්; වොසාසති, **"ඉධ ඔදනං දෙථ"** යනාදීන් අනුශාසනා කෙරේනම්; තහිං, එ තැන්හි දී, අනිවාරෙත්වා, **"අපසක්ක තාව භගිනි"** යනාදීන් නිවාරණය නො කොට; භුඤ්ජෙ, වළඳන්නේ වේ **ද?** ; ගාරය්හං ඉති, එය ගර්හා කටයුතු යයි; පවුච්චති, කියනු ලැබේ.

157. අප්පභොගං, ස්වල්ප වූ සම්පත් ඇති; අනාළ්හියං, නැළියක් කට පමණ වී නැති හෙයින් දිළිඳු වූ; සද්ධාචිත්තං, **සැදැහැසිත්** ඇති; **කුලං**, සෙබ කුලයකට; ගන්ත්වා, ගොස්; අගිලානො, නො ගිලන් වූයේ; තහිං, එහි; භුඤ්ජෙ, අනුභව කෙරේ නම්; ගාරය්හන්ති පවුච්චති-ගාරය්හාපත්තියයි, කියනු ලැබේ.

158. යො, යම් මහණෙක්; සාසඞ්කෙ, ආශංකා සහිත වූ; **ස** භයානකෙ, බිය සහිතවූ; අරඤ්ඤෙ, අරණ්‍යයෙහි; විහරන්තො, වසන්නේ; තහිං, එහි, අවිදිතං, පෙර නො දන්වන ලද භොජනය; භුඤ්ජෙ, අනුභවකෙරේ නම්; ගාරය්හන්ති පවුච්චති; -ෂ-

159. අ  අඤ්ඤාතිකා සන්තා-ඤං පරෙසං මමායිතං
(  තලං මධු ඵාණිතං-මච්ඡ මංසං අථො'පි ඛීරං
දධිංඤ්ච විඤ්ඤාපෙය්‍ය භික්ඛුනී-ගාරය්හප්පත්තා
සුගතස්ස සාසනෙ

160. *දුක්කට න්ති යං වුත්ත-තං සුණොහි යථාකථං
අපරද්ධං විරද්ධං ච-ඛලිතං යඤ්ච දුක්කටං

161. යං මනුස්සො කරෙ පාපං-ආවි වා යදි වා රහො
දුක්කට න්ති පවෙදෙන්ති-තෙනෙ'තං ඉති වුච්චති

162. දුබ්භාසිත න්ති යං වුත්තං-තං සුණොහි යථාකථං
දුබ්භාසිතං දුරාභට්ඨං-සඞ්කිලිට්ඨං ච යං පදං
යඤ්ච විඤ්ඤූ ගරහන්ති-තෙනෙ'තං ඉති වුච්චති

---

159 භික්ඛුනී, භික්ෂුණී තොමෝ; අඤ්ඤාතිකා සන්තා, නො නෑ වූ වා; පරෙසං, අනුන් විසින්, මමායිතං, මමත්‍වය කරණ ලද; සප්පි, ගිතෙල්ය, තෙලං, තෙල්ය; මධු, මීය; ඵාණිතං, පැණිය; මච්ඡ මංසං, දිය මස්-ගොඩ මස් ය; අපි, නැවත, ඛීරං, කිරී ය; දධි, දී ය;(යනමොවිනු) විඤ්ඤාපෙය්‍ය, විනවා පරිභොග කරා නම්; සුගතස්ස සාසනෙ, බුද්ධ ශාසනයෙහි; ගාරය්හප්පත්තා, ගර්‍හා බවට පැමිණියා වෙයි.

160. දුක්කටං ඉති, දුක්කට යයි;- යං වුත්තං- පෙ-සුණොහි අපරද්ධං, ශාස්තෘන් වහන්සේ විසින් වදාළ පරිදි නොකරණ හෙයින් නපුරු කොට කරණ ලද; විරද්ධං, කුශලයට ප්‍රතිපක්ෂව වරදවා කරණ ලද; ඛලිතං, ආර්‍ය්‍යප්‍රතිපදාවට අනාරූළ්හ හෙයින් පැකිළීම වීද, (එබඳුවූ) යඤ්චදුක්කටං, යම් දුෂ්කෘතයක් වේ ද;

161 මනුස්සො, මිනිස් තෙම්, ආවිවා, ප්‍රකටව හෝ; යදිවා, නොහොත්; රහො, රහසින් හෝ; පාපං, පව් වූ; යං, යමක්; කරෙ,කරන්නේ ද;(එය) දුක්කටං ඉති, දුක්කට යයි;පවෙදෙන්ති, ප්‍රකාශ කෙරෙත්; තෙන-එතං- ඉති වුච්චති-විස්තර-සමන්තපාසාදිකා, 182 පිට බලනු

162. දුබ්භාසිතං ඉති, දුබ්භාසිත යයි; යං වුත්තං-පෙ-සුණොහි- දුබ්භාසිතං, දුබ්භාසිතං යී සේ යි, දුරාභට්ඨං, නපුරු කොට කියන ලද; සඞ්කිලිට්ඨං, කිළුටු වූ; යං පදං, යම් වචන යක් වේ ද; යං ච, යම් බඳු වචනයකට; විඤ්ඤූ, නුවණැත්තෝ; ගරහන්ති ගරහත්ද, එබඳු වචනයයි-පෙ-

---

* දුක්කට න්ති හි යං වුත්තං-ස-

## විනය ගාථාණි ව්‍යාඛ්‍යාව.

163. සෙඛියනති යං වුත්තං-තං සුණොහි යථාකථං
සෙඛසස සිකඛමානසස-උජුමගගානුසාරිනො

164. ආදිපෙතං චරණඤච-මුඛං සංයම සංවරො
සිකඛා එතාදිසි නත්ථි-තෙනෙ'තං ඉති වුච්චති

165. ඡන්නමතිවසසති-විවටං නා'ති වසෑති
තසමා ඡන්නං විවරෙථ-එවං තං නාති'වසසති

166. ගතී මිගානං පවනං-ආකාසො පකඛිනං ගති
විභවො ගති ධමමානං-නිබ්බාණං අරහතො ගති

**ගාථා සඞගණිකං නිඨිතං.**

---

163. සෙඛියං ඉති, **සෙඛියා** යයි; යං වුත්තං -පෙ-සුණොහි උජුමගගානුසාරිනො, ඍජුමාර්ගය අනුව හැසිරෙන සුලුවූ. සිකඛමානසස, උපරි ගුණාධිගමය සඳහා නික්මෙන්නා වූ, සෙඛසස, ශෛක්‍ෂ පුද්ගලයා හට;

164. එතං, **මේ සෙඛියාව** ආදි, මුල් වෙයි; අපි, යළි; චරණඤච, පාදය ද වෙයි, මුඛං, ප්‍රමුඛ මාර්ග වෙයි; සංයමො, සංසිඳිම වෙයි; සංවරො, සංවරය වෙයි; එහෙයින් ම; එතාදිසී, මේ හා සමාන වූ, සිකඛා, ශික්‍ෂාවක්; නත්ථි නැත; තෙන-එතං ඉති වුච්චති-

165. ඡන්නං, වසන ලද ඇවත; අතිවසසති, අතිශයින් ඇවැත් වැසි වසී; විවටං, ඇවැත විදුන ලද්දේ; න අතිවසසති, අලුත් ඇවැත් වැසි නො වසී; තසමා, එබැවින්; ඡන්නං, ප්‍රතිච්ඡන්න ආපත්තිය; විවරෙථ, විවෘත කරන්නේය. එසේ ඇති කල්හි,) තං ඒ ඇවත; න අති වසසති, ඇවැත් වැසි නොවස් වයි [පියවි ගෙය නොවසන ලද්දේ තෙමෙයි. තෘණ පණාදියෙන් මනාව වසන ලද කල්හි නො තෙමෙයි: ආපත්තිසඞ්ඛ්‍යාත ගෘහය එසේ නොව වසන ලද කල්හි තෙමෙයි. විවෘත කොටැ තැබූ කල්හි නො තෙමෙයි මුල් ඇවැත පටිච්ඡන්න කිරීම් හෙතු වෙන් නැවත නැවැත අලුත් ඇවැත් සිදු වෙති එබැවින් **දෙසනාගාමිනී** ඇවැත දෙසා **වුට්ඨානගාමිනී** ඇවති න් නැඟිට ආයති සංවරයෙහි පිහිටිය යුතු යයි කී නියායි.]

166. මිගානං අබ්භ්‍යවකාශයෙහි ව්‍යාඝ්‍රාදීන් විසින් පෙළනු ලබන මුවන්ට; පවනං, වන ලැහැබ; ගති, පිළිසරණ යි; පකඛිනං, පක්‍ෂීන්ට; ආකාසො, අහස; ගති, පැමිණ අස්වැසුම් ලබන

## සුජනප්පමෝදනී.

167. ෙ ා කිමත්ථාය-සාරණා කිස්ස කාරණා
ස ෙ කිමත්ථාය-මතිකම්මං පන කිස්ස කාරණා

168. චොදනා සාරණත්ථාය-නිග්ගහත්ථාය සාරණා
සඞ්ඝො පරිග්ගහත්ථාය-මතිකම්මං පන පාටියෙක්කං

169. මා ඛො තුරිතො අභණි-මා ඛො චණ්ඩිකතො අභණි
මා ඛො පටිඝං ජනයි-සචෙ අනුවිජ්ජකො තුවං

---

හෙයින් ආවශ්‍යක ප්‍රතිෂ්ඨාව යි; ධම්මානං, සියලු සංඛතධර්මයන්ගේ; විභවො, විනාශයතෙමේ; ගති, උපගමනාවියෙන් අස්වැසීමයි; [ඉතා බොහෝ කලක් වැසත් සඞ්ඛත විනාශයක් නැතිවැ යහපත් ප්‍රතිෂ්ඨාවක් ඇති නො වෙයි.] අරහතො, රහත් වූවහුට, නිබ්බානං, **නිරුපධිශෙෂ නිර්වාණ ධාතුව**; ගති, එකාන්ත ප්‍රතිෂ්ඨාවයි;

**ගාථා සඞ්ගණිකාව නිමි.**

—//—

167 චොදනා, **වත්‍ථු ආපත්ති** නිදේශයෙන් **චොදනා** කිරීම; කිමත්ථාය, කුමක් පිණිස ද? සාරණා, වරද සිහිකරවීම, **කිස්ස කාරණා, කුමකට කරුණු ද**? සඞ්ඝො, සඞ්ඝ සන්නිපාතය; කිමත්ථාය, කුමක් පිණිස **ද**? මති කම්මං පන, විනයධරයන්ගේ විනය නය සංසන්දනය, කිස්ස කාරණා, කුමට කරුණු ද?

168 චොදනා, උක්ත ප්‍රකාර චොදනාව; සාරණත්ථාය; චූදිතකයා කළ වරද සිහිකරවනු පිණිසයි; සාරණා, වරද සිහිකරවී ම; නිග්ගහත්ථාය, ඔහුට නිග්‍රහ කරණු පිණිස යි; සඞ්ඝො; සඞ්ඝ සන්නිපාතය; පරිග්ගහත්ථාය, විනිශ්චයයෙහි ධාර්මිකාධාර්මික බවදැන ගන්නා පිණිස යි; මතිකම්මං පන, විනය නය සංසන්දනය වනාහි, පාටියෙක්කා, සුත්තන්තිකාදීන් වෙන වෙන වෙන ම විනිශ්චය කිරීම පිණිස යි.

169. සචෙ, ඉදින්; තුවං, නුඹ; අනුවිජ්ජකො, උපන් අධිකරණය විනිශ්චය කරණු පිණිස හුන් විනයධරයෙක් වෙහි නම්. තුරිතො, ඉක්මන් වූ යේ; මා ඛො අභණි, බස් නො කියනුව චණ්ඩිකතො, සැඩව; මා ඛො අභණි, බස් නො කියව;! පටිඝං, කෝපය; මා ඛො ජනයි' [චූදිතක, චොදකයන් කෙරෙහි] නූපදව.

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

170. මා ඛො සහසං අභණි-කථං විග්ගාහිකං අන[illegible]තං
සුත්තෙ විනයෙ අනුලොමෙ-පඤ්ඤත්තෙ අනු[illegible]කෙ

171. අනුයොගවත්තං නිසාමය-කුසලෙන බුද්ධිමතා කතං
සුවුත්තං සික්ඛාපදානුලොමිකං* ගතිං න නාසෙන්තො
සම්පරායිකං

172. හිතෙසී අනුයුඤ්ජස්සු-කාලෙනත්ථූපසංහිතං
චුදිතස්ස ච චොදකස්ස ච -සහසා වොහරං මාපධාරෙහි

---

170. අනත්ථසංහිතං, පිරිස් කැළඹීම් ආදී අවැඩින් යුක්ත වූ, විග්ගාහිකං, කලහ උපදවන කථාවක්; සහසං, වහා; මං ඛො අභණි, නො කියනුව; සුත්තෙ, උභතො විභඞ්ගයෙහි හෙවත් **පරිජි පචිති** දෙ පොතෙහි ද; විනයෙ, ඛන්ධකයෙහි හෙවත් **සුලු වග මහවග** දෙ ක්හි ද; අනුලොමෙ, **පරිවාර**යෙහි ද; පඤ්ඤත්තෙ, සියලු **විනයපිටක** යෙහි ද; අනුලොමිකෙ, **සූත්‍රය සූත්‍රානුලොමය, ආචාර්‍ය්‍යවාදය, අත්තනොමතිය** යන මේ සතර මහා අපදෙසයෙහි ද; යන මෙහි:-

171. අනුයොග වත්තං, යම්කිසි අනුයොග වතක් හෙවත් විනිශ්චය කරන්නවුන් විසින් සෙදිය යුතු වතක්; කුසලෙන, දක්ෂ වූ; බුද්ධිමතා, ඥානපාරඞ්ගත වූ සර්වඥයන් වහන්සේ විසින්; කතං, කරණලදද හෙවත් ගෙණ හැර දක්වන ලද්දේ ද; සුවුත්තං, මොනවට ප්‍රකාශිත වූ; සික්ඛාපදානු ලොමිකං, සියලු සික පදයන්ට අනුලොම් වූ එම අනුයොගවත; සම්පරායිකං ගතිං, පර ලොව ප්‍රතිෂ්ඨාව; න නාසෙන්තො, නො නසමින්; නිසාමය, අසනු මැනව. දූන් එම (අනුයොගවත ප්‍රකාශකරන්නාහු 'හිතෙසී' යනාදිය කියත්:—)

172. චුදිතස්ස ච, චුදිතකයා ද; චොදකස්ස, චොදකයාහට ද; හිතෙසී, හිතේසීවූයේ හෙවත් අභිවෘද්ධි අන්වේෂණය කරන්නේ; කාලෙන, යුක්තප්‍රයුක්ත කාලයෙහි; අත්ථූපසංහිතං, වැඩ සහිත කොට; අනුයුඤ්ජස්සු; විනිශ්චය කරණු මැනවි; සහසා වොහාරං, ඔවුන් විසින් හදිසියෙන් කියන ලද වචනය, මාපධාරෙහි, නො ගණුව

---

* සුගතිං-ශ්‍යා.

173. චෝ... ආහ ආපන්නොති-චුදිතකො ආහ අනාපන්නො'ති
උ... අනුක්ඛිපන්තා -පටිඤ්ඤානුසන්ධි තෙන කාරයෙ

174 පටිඤ්ඤා ලජ්ජීසු කතා -අලජ්ජී සෙව'තං න විජ්ජති
බහුම්පි අලජ්ජී භාසෙය්‍ය -වත්තානුසන්ධි තෙන කාරයෙ

175. අලජ්ජී කීදිසො හොති -පටිඤ්ඤා යස්ස න රූහති ?
එවඤ්ච තාහං පුච්ඡාමි -කීදිසො වුච්චති අලජ්ජී පුග්ගලො?

176. සඤ්චිච්ච ආපත්තිං ආපජ්ජති -ආපත්තිං පරිගූහති
අගතිගමනං ච ගච්ඡති-එදිසො වුච්චති අලජ්ජීපුග්ගලො

---

173. චොදකො, චොදක තෙමේ; ආපන්නොති, ඇවතට පැමිණියේ යයි; ආහ, කීයේ ද; චුදිතකො, චුදිතක තෙමේ; අනාපන්නො ඉති, නො පැමිණියෙමි යි; ආහ, කීයේ ද; එකල්හි; උභො අනුක්ඛිපන්තා, දෙදෙන ම උක්ෂෙපණය නොකරන්නේ හෙවත් දෙපස තෙපුල් නො නගමින්; පටිඤ්ඤානුසන්ධිතෙන, කථානුසන්ධිය හා ප්‍රතිඥාවසලකා; කාරයෙ, විනිශ්චය කරනතේය.

174. පටිඤ්ඤා, එකී ප්‍රතිඥාව; ලජ්ජීසු, ලජ්ජී භික්ෂූන් කෙරෙහි; කතා, කරණ ලද්දී ය; [චුදිතක යාගේ ප්‍රතිඥාව අනුව විනිශ්චය කට යුතුය යන නියමය පවත්නේ චුදිකයා ලජ්ජී කෙණෙක් නම් පමණෙකි] අලජ්ජීසු, අලජ්ජීන් කෙරෙහි; එතං, මේ පිළිත; න විජ්ජති, විද්‍යමාන නො වේ; අලජ්ජී, අලජ්ජී තෙම; බහුම්පි, බොහෝ කොට ත්; භාසෙය්‍ය, කියන්නේ ය; වත්තානුසන්ධිතෙන, වත්තානුසන්ධියෙන්, හෙවත් ඔහුගේ වත් හා සමග යම් පිළිතක් ගැලපේ ද ඒ පිළිතෙන් කාරයෙ, විනිශ්චය කරන් නේය. [ප සිදිනේ යයි ජේයි]

175. අලජ්ජී, අලජ්ජී තෙමේ; කීදිසො හොති, කෙබඳු වේ ද? යස්ස, යමෙකුගේ; පටිඤ්ඤා, පිළිත; න රූහති, නො නගී ද, (එබඳු වූ;) අලජ්ජී පුග්ගලො, **අලජ්ජී පුගුල් තෙම**; කීදිසො වුච්චති කෙබඳු යයි කියනු ලැබේද යි යන, එවං ච, මෙසේ ද ; අහං, මම; තං, ඔබ, පුච්ඡාමි, විචාරමි

176. සඤ්චිච්ච, දැන දැන; ආපත්තිං, ඇවතට; ආපජ්ජති, පැමිණෙයි; ආපත්තිං, ඇවත, පරිගූහති, සඟවයි; [නො දෙසයි ] අගතිගමනං ච ගච්ඡති, ඡන්දාදී අගති ගමනය ද කෙරෙයි; එදිසො පුග්ගලො, මෙබඳු පුද්ගල තෙම; අලජ්ජී වුච්චති, අලජ්ජී යයි කියනු ලැබේ;

177. සච්චං අහමපි ජානාමි -එදිසො වුච්චති අලජ්ජී ලො
අඤ්ඤං ච තාහං පුච්ඡාමි -කීදිසො වුච්චති ලජ ගලො

178 සඤ්චිච්ච ආපත්තිං නාපජ්ජති -ආපත්තිං න පරිගූහති
අගතිගමනං න ගච්ඡති -එදිසො වුච්චති ලජ්ජී පුග්ගලො

179. සච්චං අහමපි ජානාමි -එදිසො වුච්චති ලජ්ජී පුග්ගලො
අඤ්ඤං ච තාහං පුච්ඡාමි -කීදිසො හොති අධම්මචොදකො ?

180. අකාලෙන චොදෙති-අභූතෙන ඵරුසෙන
අනත්ථසංහිතෙන
දොසන්තරො චොදෙති-න මෙත්තචිත්තො -එදිසො
වුච්චති අධම්මචොදකො

---

177. සච්චං, සැබව; එදිසො පුග්ගලො, මෙබඳු පුද්ගල තෙම අලජ්ජී වුච්චති, අලජ්ජී යයි කියනු ලැබේ යන්න; අහං අපි, මම ද; ජානාමි, දනිමි; අහං, මම; තං, ඔබ; අඤ්ඤං ච, අනිකක් ද; පුච්ඡාමි, විචාරමි; [එනම් ]කීදිසො පුග්ගලො, කෙබඳු පුද්ගල යෙක් ; ලජ්ජී වුච්චති, ලජ්ජී යයි කියනු ලැබේ ද ?

178. සඤ්චිච්ච, දැන දැන; ආපත්තිං, ඇවතට, න ආපජ්ජති, නොපැමිණෙයි; ආපත්තිං, ඇවත: නපරිගූහති, නොසඟවයි, (දෙසයි) අගති ගමනං න ගච්ඡති, අගතියට නො යයි; එදිසො පුග්ගලො, මෙබඳු පුද්ගල තෙම; ලජ්ජී වුච්චති, ලජ්ජී යයි කියනු ලැබේ.

179. සච්චං, සැබව; එදිසො පුග්ගලො, මෙබඳු පුද්ගල තෙම ලජ්ජී වුච්චති, ලජ්ජී යයි කියනු ලැබේ යන්න; අහං අපි, මම ද; ජානාමි, දනිමි; අහං, මම; තං, ඔබ; අඤ්ඤං ච අනිකක් ද; පුච්ඡාමි, විචාරමි; අධම්ම චොදකො, අධර්මචොදක තෙමේ; කීදිසො හොති, කෙබඳු වේ ද;

180. අකාලෙන, නො අනුදන්නා ලද කල්හි; අභූතෙන, සිදු නො වූ; ඵරුසෙන; රළු වචනයෙන් යුක්ත වූ; අනත්ථ සංහිතෙන, අවැඩින් යුත් දෙයින්; චොදෙති, චොදනා කෙරයි; දොසන්තරො, අභ්‍යන්තර ගත ද්වේෂය ඇත්තේ; න මෙත්ත චිත්තො, මෙත් සිත් නැත්තේ; චොදෙති, චොදනා කෙරයි, එදිසො, මෙබඳු පුද්ගල තෙම; අධම්මචොදකො, අධර්මචොදකයා යයි, වුච්චති, කියනු ලැබේ.

## සුජනප්පසොදනී

181. ස ... හමපි ජානාමි-එදිසො වුච්චති අධම්මචොදකො
... ච තං'හං පුච්ඡාමි-කීදිසො වුච්චති ධම්මචොදකො?

182. කාලෙන චොදෙති-භූතෙන සණ්හෙන අත්ථසංහිතෙන
මෙත්තචිත්තො චොදෙති න දොසන්තරො
එදිසො වුච්චති ධම්ම චොදකො

183. සච්චං අහමපි ජානාමි-එදිසො වුච්චති ධම්ම චොදකො
අඤ්ඤඤ්ච තාහං පුච්ඡාමි-කීදිසො වුච්චති බාලචොදකො?

184. පුබ්බාපරං න ජානාති-පුබ්බාපරස්ස අකොවිදො
අනුසන්ධි වචන පථං න ජානාති-අනුසන්ධි
වචන පථස්ස අකොවිදො
එදිසො වුච්චති බාල චොදකො

---

181 සච්චං, සැබෑ; අහං අපි, මම ත්; ජානාමි, දනිමි; එදිසො, මෙබඳු පුද්ගල තෙම; අධම්ම චොදකො, **අධර්මචොදකයා** යයි; වුච්චති, කියනු ලැබේ; අහං, මම; අඤ්ඤං ච, අනිකක් ද; තං, ඔබ; පුච්ඡාමි, විචාරමි; කීදිසො, කෙබඳු පුද්ගලයෙක් තෙමේ; ධම්ම චොදකො, **ධර්මචොදකයා** යයි; වුච්චති, කියනු ලැබේ ද?

182. කාලෙන, සුදුසු කල්හි හෙවත් අනුඥාත කල්හි; භූතෙන, සත්‍ය වූ; සණ්හෙන, සිලුටු වූ; අත්ථසංහිතෙන, අර්ථ සන්නිඃශ්‍රිත වූවකින්; චොදෙති, චොදනා කරයි; මෙත්තචිත්තො, මෛත්‍රී සිතැත්තේ; න දොසන්තරගතො, ද්වේෂයට නො පැමිණියේ; චොදෙති, චොදනා කරයි; එදිසො, මෙබඳු පුද්ගල තෙම; ධම්මචොදකො, **ධර්මචොදකයා** යයි; වුච්චති, කියනු ලැබේ.

183. සච්චං-පෙ-කීදිසො, කෙබන්දෙක්; බාලචොදකො, **බාලචොදකයා** යයි; වුච්චති, කියනු ලැබේද?

184 පුබ්බාපරස්ස, පූර්වයෙන් කිව යුතු කථාවෙහි හා පසුව කිවයුතු කථාවෙහි; අකොවිදො, අදක්ෂ වූ යේ; පුබ්බාපරං, පෙර පසු කථාව; න ජානාති, නො දනියි; අනුසන්ධිවචන පථස්ස

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

185\. සච්චං අහමපි ජානාමි-එදිසො වුච්චති බාලචොදකො
අඤ්ඤාය තං'හං පුච්ඡාමි-කීදිසො වුච්චති
පණ්ඩිතචොදකො?

186\. පුබ්බාපරං විජානාති-පුබ්බාපරස්ස කොවිදො
අනුසන්ධිවචනපථං ජානාති-අනුසන්ධි වචනපථස්ස
කොවිදො

එදිසො වුච්චති පණ්ඩිත චොදකො.

187\. සච්චං අහමපි ජානාමි-එදිසො වුච්චති පණ්ඩිත චොදකො
අඤ්ඤාය තං'හං පුච්ඡාමි-චොදනා කින්ති වුච්චති?

188\. සීලවිපත්තියා චොදෙති-අථො ආචාර දිට්ඨියා
ආජීවෙන පි චොදෙති-චොදනා තෙන වුච්චති

**අපර ගාථාසඞ්ගණිකං නිට්ඨිතං.**

---

කථානුසන්ධිවිධිය හා විනිශ්චයානුසන්ධිවිධිය දන්නෙහි; අකොවිදෙ, අදක්ෂ වූයේ; අනුසන්ධිවචනපථං, කථානුසන්ධිය හා විනිශ්චයානුසන්ධිය; න ජානාති, නො දනියි; එදිසො, මෙබඳු පුද්ගල තෙමේ; බාලචොදකො, **බාලචොදකයා** යයි; වුච්චති, කියනු ලැබේ.

**185** 186. 187 සුනමයි-**කිං**, කුමක්; චොදනා ඉති, චොදනා වය යි; වුච්චති, කියනු ලැබේ ද?

188\. සීලවිපත්තියා, **පරිජි, සඞ්ඝාදිසෙස්** යන උභයාපත්ති **ස්කන්ධ** සංඛ්‍යාත සීලවිපත්තියෙන්; චොදෙති, චොදනා කරයි; අථො, නැවත; ආචාර දිට්ඨියා, ආචාර විපත්තියෙන් හා **අන්ත**ගාහික මිථ්‍යාදෘෂ්ටියෙන් චොදනා කරයි; ආජීවෙන අපි, ආජීව විපත්තියෙනුත්; චොදෙති, චොදනා කෙරෙයි; තෙන, එබැවින්; චොදනා, චොදනා යයි; වුච්චති, කියනු ලැබේ.

**අපර ගාථාසඞ්ගණිකාර්ථව්‍යාඛ්‍යාව නිමි.**

—//—

189\. දි  ෆෙන සමෙති-දිඨෙන සංසන්‍දතෙ දිඨං
පටිච්ච න උපෙති-අසුඩ පරිසඞකිතො
සො පුගගලො පටි ඤ්ඤය-කාරෙතබ්බො තෙනු'පොසථො

190\. සුතං සුතෙන සමෙති-සුතෙන සංසන්‍දතෙ සුතං
සුතං පටිච්ච න උපෙති-අසුඩ පරිසඞකිතො
සො පුගගලො පටිඤ්ඤය-කාරෙතබ්බො තෙනු'පොසථො

191 මුතං මුතෙන සමෙති-මුතෙන සංසන්‍දතෙ මුතං
මුතං පටිච්ච න උපෙති-අසුඩ පරිසඞකිතො
සො පුගගලො පටිඤ්ඤය-කාරෙතබ්බො තෙනු'පොසථොති

---

189\. දිඨං, දුටුඅයගේ දැකීම; දිඨෙන, දක්නා ලද්දහුගේ දැකීම හා; සමෙති, සම වේ; දිඨෙන, දක්නාලද්දහුගේ දැකීම හා; දිඨං, දුටු අයගේ දැකීම; සංසන්‍දතෙ, සසැඳේ; දිඨං පටිච්ච, ඒ දැකීම ම නිසා; න උපෙති, පාරාජිකාවට නො පැමිණේයි; (එබැවින්) සො පුගගලො, ඒ පුද්ගල තෙම; අසුඩපරිසඞකිතො, අමූලිකව අසුඩ යයි සැකකරණ ලද්දේ වේ. පටිඤ්ඤය, "මම පරිජි ඇවැතට නො පැමිණියෙමි" යන ඔහුගේ පිළිනෙන්; තෙන, ඔහු හා; උපොසථො, පොහොය; කාරෙතබ්බො, කට යුතුයි; [එක්කෙණෙකු විසින් අනිකෙක් මාගමක් සමග එක් සථානයකින් නික්මෙන්නහු හෝ එක් සථානයකට ඇතුල් වන්නහු හෝ දක්නා ලද්දේ ය. හෙතෙම ඔහුට පාරාජිකාවෙන් චොදනා කරයි, තමා එසේ නික්මෙද් දී හෝ ඇතුල් වෙද් දී ඔහු විසින් දක්නා ලද බව චොදනාකරණු ලැබූවහු ද අනුදනී හෙවත් ඔහු බලා සිටිනවා තෙමේ ද දුටුවේය. මෙසේ දෙදෙනාගේ ම දැකීම සමාන වෙයි. සසැඳෙයි එපමණක් විනා චුදිතකයා ඇවැතට නො පැමුණුනේය එහෙයින් චුදිතකයාගේ පිළිත පිළිගත යුතුයි. සුත, මුත වයය පිළිබඳව ද මෙසේයි. මෙයින් දිඨපරිසඞකිත, සුතපරිසඞකිත, මුතපරිසඞකිත යන තුන සඳර්ශිතයි. [විසතර විනයත්‍ථමඤ්ජුසාවෙන් දතයුතු.]

190\. සුතං, ශ්‍රැතිය;-පෙ-

191 මුතං, ගඣරස ස්පර්‍ශය; පෙ-

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

192. උපොසථො කිමත්ථාය-පවාරණා කිස්ස කාරණා
පරිවාසො කිමත්ථාය-මූලායපටිකස්සනා කිස්ස [illegible]ණා
මානත්තං කිමත්ථාය-අබ්භානං කිස්ස කාරණා

193. උපොසථො සමග්ගත්ථාය-විසුද්ධත්ථාය පවාරණා
පරිවාසො මානත්තත්ථාය-මූලාය පටිකස්සනා නිග්ගහත්ථාය
මානත්තං අබ්භානත්ථාය-විසුද්ධත්ථාය අබ්භානං

194 ඡන්දා දොසා භයා මොහා-ථෙරෙ ච පරිභාසති
කායස්ස භෙදා දුප්පඤ්ඤො ඛතො උපහතින්ද්‍රියො
නිරයං ගච්ඡති දුම්මෙධො-න ච සික්ඛාය ගාරවො

---

192. උපොසථො, උපොසථය; කිමත්ථාය, කුමක් පිණිස ද; පවාරණා, පවාරණා තොමෝ; කිස්ස කාරණා, කුමකට කරුණු වන්නී ද; පරිවාසො, පිරිවෙස; කිමත්ථාය, කුමක් පිණිස ද; මූලාය පටිකස්සනා, මූලාය පටිකස්සන කර්මය; කිස්ස කාරණා, කුමකට කරුණු වේ ද; මානත්තං, මානත; කිමත්ථාය, කුමක් පිණිසද; අබ්භානං, අබ්භාන කර්මය; කිස්ස කාරණා, කුමකට කරුණු වන්නේ ද

193. උපොසථො, උපොසථය තෙමේ; සමග්ගත්ථාය, සමගිය පිණිසයි; පවාරණා, පවරණ තොමෝ; විසුද්ධත්ථාය, පිරිසිදු බව පිණිස යි; මූලායපටිකස්සනා, මූලායපටිකස්සනා තොමෝ, නිග්ගහත්ථාය, නිග්‍රහය පිණිස යි; මානත්තං, මානත; අබ්භානත්ථාය, අබ්භානය පිණිස යි; අබ්භානං, අබ්භාන කර්මය; විසුද්ධත්ථාය, පාරිශුද්ධිය සඳහා යි.

194. ඡන්දා, ඡන්ද හෙතුවෙන් ද; දොසා, ද්වෙෂ හෙතුවෙන් ද; භයා, භිය හෙතුවෙන් ද; මොහා, මොහ හෙතුවෙන් ද; ථෙරෙ ච, තෙරුන්; පරිභාසති, පරිභව බෙණේ ද; [අවඥ කෙරේ ද;] දුප්පඤ්ඤො, දුෂ්ප්‍රාඥ වූ; ඛතො, කණින ලද කුසල් මුල් ඇති; උපහතින්ද්‍රියො, නසන ලද ශ්‍රද්ධාදී ඉඳුරන් ඇති; න ච සික්ඛාය ගාරවො, ශික්ෂාවෙහි ගෞරව නැත්තා වූ; දුම්මෙධො, නුවණ නැති තැනැත්තේ; කායස්ස භෙදා, කාය භෙදයෙන්; නිරයං, නරකයට; ගච්ඡති, යෙයි.

195. න [illegible]ං සි නිස්සාය - න ච නිස්සාය පුග්ගලං [illegible]
[illegible] එතෙ විවජ්ජෙත්වා - යථා ධම්මො තථා කරෙ

196 කොධනො උපනාහී ච - චණ්ඩො ච පරිභාසකො
අනාපත්තියා ආපත්තීති රොපෙති - තාදිසො චොදකො
ඣාපෙති අත්තානං

197. උපකණ්ණකං* ජප්පති - ජිම්හං පෙක්ඛති වීතිහරති
කුම්මග්ගං පටිසෙවති
අනාපත්තියා ආපත්තීති රොපෙති - තාදිසො චොදකො
ඣාපෙති අත්තානං

198 අකාලෙන චොදෙති අභූතෙන - ඵරුසෙන අනත්ථසංහිතෙන
දොසන්තරො චොදෙති - නො මෙත්තචිත්තො
අනාපත්තියා ආපත්තීති චොදෙති - තාදිසො චොදකො
ඣාපෙති අත්තානං

---

195 නච ආමිසං නිස්සාය, චීවරාදී ආමිෂය නිසා ද නොව; නච පුග්ගලං නිස්සාය, ආචාර්ය්‍ය උපාධ්‍යායාදී පුද්ගලයා නිසා ද නොව; එතෙ උභො, මේ ආමිෂ පුද්ගල දෙදෙන; විවජ්ජෙත්වා, දුරු කොට; [නිරපෙක්ෂකව] ධම්මො, විනිශ්චය ධර්මය; යථා, යම්සේ ද; තථා, එපරිද්දෙන්; කරෙ, විනිශ්චය කරන්නේය.

196 කොධනො, ක්‍රොධ ඇත්තේ ද; උපනාහිච, බද්ධ වෛර ඇත්තේ ද; චණ්ඩො ච, සැඩ තැනැත්තේ ද; පරිභාසකො, පරිභව බෙණන තැනැත්තේ ද, අනාපත්තියා, නො ඇවතෙහි; ආපත්ති ඉති, ඇවැත යයි; රොපෙති, නගා ද; තාදිසො චොදකො, එබඳු චොදක තෙමේ; අත්තානං, තමා; ඣාපෙති, දවයි

197. උපකණ්ණකං ජප්පති, මෙසේ කියව මෙසේ නොකියව යි කණ මුලට කොඳුරා ද; ජිම්හං පෙක්ඛති, දෙෂ ම සොයා ද; වීතිහරති විනිශ්චය පිරිහෙළා ද; කුම්මග්ගං, නො මග හෙවත් ඇවත, පටිසෙවති, සෙවී ද; -පෙ-

198. මෙය 181 පූර්වාර්ධය හා 196 අපරාර්ධය මෙනි.

---

* ජප්පෙති-ගැ.

199. ධම්මා'ධම්මං න ජානාති-ධම්මාධම්මස්ස අකෝවිදො
අනාපත්තියා ආපත්තීති රෝපෙති-තාදිසෝ චෝදකෝ
ඛාපෙති අත්තානං

200 විනයා'විනයං න ජානාති-විනයා'විනයස්ස අකෝවිදො
අනාපත්තියා ආපත්තී ති රෝපෙති-තාදිසෝ චෝදකෝ
ඛාපෙති අත්තානං

201 භාසිතා'භාසිතං න ජානාති-භාසිතා'භාසිතස්ස අකෝවිදො
අනාපත්තියා ආපත්තී ති රෝපෙති-තාදිසෝ චෝදකෝ
ඛාපෙති අත්තානං

202 ආචිණ්ණා'නාචිණ්ණං න ජානාති-ආචිණ්ණා
'නාචිණ්ණස්ස අකෝවිදො
අනාපත්තියා ආපත්තී ති රෝපෙති-තාදිසෝ චෝදකෝ
ඛාපෙති අත්තානං

203. පඤ්ඤත්තා'පඤ්ඤත්තං න ජානාති-පඤ්ඤත්තා
'පඤ්ඤත්තස්ස අකෝවිදො
අනාපත්තියා ආපත්තී ති රෝපෙති තාදිසෝ චෝදකෝ
ඛාපෙති අත්තානං

204. ආපන්නා'නාපත්තිං න ජානාති- ආපන්නා'නාපත්තිස්ස
අකෝවිදො
අනාපත්තියා ආපත්තී ති රෝපෙති-තාදිසෝ
චෝදකෝ ඛාපෙති අත්තානං

---

199. ධම්මාධම්මස්ස, ධර්මා ධර්ම දෙක්හි; අකෝවිදෙ, අදක්ෂ වූ යේ; ධම්මා'ධම්මං, ධර්මා'ධර්මය; න ජානාති, නො දනී ද; පෙ-

200. විනයාවිනයස්ස, විනය අවිනය දෙක්හි; අකෝවිදෙ, අදක්ෂ වූ යේ; විනයා'විනයං, විනය අවිනය දෙක; න ජානාති, නො දනී ද;

201. භාසිතා, භාසිතස්ස, වදාරණ ලද්දෙහි හා නො වදාරණ ලද්දෙහි-පෙ-

202 ආචිණ්ණා'නාචිණ්ණස්ස, බුඩාදීන් විසින් පුරුදු කරණ ලද්දෙහි හා පුරුදු නො කරණ ලද්දෙහි –

203. පඤ්ඤත්තා'පඤ්ඤත්තස්ස, පණවන ලද්දෙහි හා නො පණවන ලද්දෙහි –පෙ-

204. ආපන්නා 'නාපත්තිස්ස, ඇවැත්හි හා නො ඇවැත්හි- පෙ-

205. ලහු ගරුකං න ජානාති-ලහුක ගරුකස්ස අකොවිදො
අනාපත්තියා ආපත්තීති රොපෙති-තාදිසො චොදකො
ඛාපෙති අත්තානං

206 සාවසෙසං'නවසෙසං න ජානාති-සාව'සෙසානවසෙ
සස්ස අකොවිදො
අනාපත්තියා ආපත්තී ති රොපෙති-තාදිසො චොදකො
ඛාපෙති අත්තානං

207. දුට්ඨුල්ලං'දුට්ඨුල්ලං න ජානාති-දුට්ඨුල්ලං'දුට්ඨුල්ලස්ස අකොවිදො
අනාපත්තියා ආපත්තී ති රොපෙති-තාදිසො චොදකො
ඛාපෙති අත්තානං

208 පුබ්බාපරං න ජානාති-පුබ්බාපරස්ස අකොවිදො
අනාපත්තියා ආපත්තී ති රොපෙති-තාදිසො චොදකො
ඛාපෙති අත්තානං

209. අනුසන්ධි වචන පථං න ජානාති-අනුසන්ධි වචනපථස්ස
අකොවිදො
අනාපත්තියා ආපත්තී ති රොපෙති- තාදිසො චොදකො
ඛාපෙති අත්තානන්ති.

**චොදනාකණ්ඩං නිට්ඨිතං**

——//——

---

205 ලහුක ගරුකස්ස, ලුහු ඇවැත්හි හා ගරු ඇවැත්හි-පෙ-

206. සාවසෙසා'නවසෙසස්ස, සාවසෙසාපත්ති අනවසෙසා
පත්ති දෙකෙහි; -පෙ-

207 දුට්ඨුල්ලා'දුට්ඨුල්ලස්ස, දුට්ඨුල්ල අදුට්ඨුල්ල දෙක්හි -පෙ-
208. පුබ්බා'පරස්ස, පෙර පසු කථාවෙහි -පෙ-

209. අනුසන්ධිවචනපථස්ස, කථානුසන්ධිය හා විනිශ්චයානු
සන්ධියෙහි ; අකොවිදො, අදක්ෂවූ යේ; අනුසන්ධි වචනපථය,
කථානුසන්ධිය හා විනිශ්චයානු සන්ධිය; න ජානාති- පෙ-

**චොදනාකණ්ඩා නිමි.**

——//——

## විනයගාථාඤ්ච ව්‍යාඛ්‍යාව.

210. අනුයොග වත්තං නිසාමය-කුසලෙන බුද්ධිමතා ෆං
සුවුත්තං සික්ඛාපදානුලොමිකං-ගතිං න නාසෙය සම්පරායිකං

211. වත්ථුං විපත්තිං ආපත්ති-නිදානා'කාර අකොවිදෙ
පුබ්බා'පරං න ජානාති-කතාකතං සමෙන ච

212. *කම්මෙ ච අධිකරණෙ ච-සමථෙසු'පි අකොවිදෙ
රත්තො දුට්ඨො ච මූළ්හෝ ච-භයා මොහා ච ගච්ඡති

---

210. කුසලෙන, සියල්ලෙහි දක්ෂ වූ; බුද්ධිමතා, ඥනයාගේ පරතෙරට පැමිණි සර්‍වඥයන් වහන්සේ විසින්; කතං, ගෙණ හැර දක්වන ලද්දා වූ; සික්ඛාපදානුලොමිකං, ශික්ෂාපදයන්ට අනුලොම් වූ; සුවුත්තං, මනාකොට දෙසන ලද්දා වූ; අනුයොග වත්තං, අනුයොග වත; [විනිශ්වය කරන්නවුන් විසින් පිළිපිය යුතු වත] සම්පරායිකං ගතිං, පරලොව සුගති ගමන; න නාසෙන්තා, නො නසන්නේ; නිසාමය, අසනු මැනවි.

211. වත්ථුං, පාරාජිකාදී වස්තුවය; විපත්තිං, චතුර්විධ විපත්තිය; ආපත්ති, සප්තාපත්ති සක්‍ධය; නිදානං, මෙනම් ශික්ෂා පදය අසවල්තැනදී පණවන ලදැයි ශික්ෂාපදයන්ගේ නිදානය; පුබ්බාපරං, පෙර පසු වචනය;(යන මොවුන්;)න ජානාති,යම්කිසි භික්ෂුවක් තෙමේ නො දනී ද; සමෙන ච, ඒ පූර්‍වාපර වචනයන් නොදැනීම් මය වූ නුනුවණින් ම;කතා කතං, කළ නො කළ දෙය නො දනී ද; (මේබඳු වූ:) ආකාර අකොවිදෙ, කාරණා කරණ නො දත් තැනැත්තේ ද;

212. කම්මෙ ච; කර්‍මයෙහි ද; අධිකරණෙ ච, නුකති විනිශ්වයෙහි ද; සමථෙ ච, සප්තඅධිකරණ සමථයෙහි ද; අකොවිදො, අදක්ෂ වූ තැනැත්තේ; රත්තො, රාගයෙන් රත් වූයේ; දුට්ඨො, ද්වෙෂයෙන් දූෂිත වූයේ; මූළ්හො, මොහයෙන් මුළා වූයේ, භයා, භයින් ද; මොහා, මොහයෙන් ද; ගච්ඡති, අගතියට යෙයි; [රත්තො, දුට්ඨො, භයා, මොහා, යන මේ පදවලින් සතර අගතිය කීහ්නයි.]

---

* කම්මඤ්චඅධිකරණඤ්ච.

## සුජනප්පමෝදනී

213 සඤ්ඤතනි කුසලො-නිජ්ඣත්ති යාව අකොවිදො
ලද්ධපක්ඛො අහිරිකො-කණ්හකම්මො අනාදරො
* ස වෙ තාදිසකො භික්ඛු-අප්පටිකෙඛා ති වුච්චති

214. වත්ථුං විපත්තිං ආපත්ති නිදානාකාර කොවිදො
පුබ්බා පරං පජානාති-කතා කතං සමෙනච

215 කම්මෙච අධිකරණෙච-සමථෙ චාපිකොවිදෙ
අරත්තො අදුට්ඨො අමූළ්හො-භයා මොහා න ගච්ඡති

216 සඤ්ඤතායිචාච කුසලො-නිජ්ඣත්තියාච කොවිදෙ
ලද්ධපක්ඛො හිරිමනො-සුක්කකම්මො සගාරවො
ස වෙ තාදිසකො භික්ඛු-සප්පටිකෙඛා ති වුච්චතී 'ති

චූලසඞ්ගාමං නිඨිතං

213. නව සඤ්ඤතනි කුසලො, අනුන් දැන්වීමෙහි දක්ෂයෙක් නො වේ ද; නිජ්ඣත්තියා ච, තෙමේ කාරණාකාරණ දැන්මෙහි අසමර්ථ බැවින් නිජ්ඣත්තියෙහිද; අකොවිදො, දක්ෂ නො වේ ද; ලද්ධපක්ඛො,තමාගේ පිරිස්බඳු පිරිස් ලදුයේ හෝ තමාබඳු පිරිස් ලදුයේ; අහිරිකො,ලජ්ජා පරිබාහිර වූයේ; කණ්හකම්මො, නපුරු ලාමක පව්කම් ඇත්තේ ද; අනාදරො, ධර්මාදර පුද්ගලාදර රහිත වූයේ ද යන; තාදිසකො,එබඳු වූ; සො භික්ඛු, ඒ මහණ තෙමේ; වෙ, එකාන්තයෙන්; අප්පටිකෙඛා ඉති, නොබලා පිළිකෙව් කටයුතුය යි හෙවත් ජ්‍යෙෂ්ඨස්ථානයෙහි නො තැබිය යුත්තේ යයි; වුච්චති, කියනු ලැබේ.

214-215. වත්ථුං, පාරාජිකාදි වස්තුවය;විපත්තිං,චතුර්විධ විපත්තිය; ආපත්ති, ඇවතය; නිදාන,අසුවල් තැන දී පණවන ලද යි ශික්ෂා පදය සම්බන්ධ නිදානය; ආකාර, කාරණාකාරණ දැනීම ය; (යන මෙහි)කොවිදො, දක්ෂ වූයේ; පුබ්බාපරං, පෙරපසුවචන; පජානාති, විශිෂ්ටඥානයෙන් දනීද;සමෙත,නුවණින්; කතාකතං, මේ කළ දෙයය මේ නො කළ දෙයයයි (පජානාති, දනීද) අරත්තො, රාගයෙන් රත් නො වූයේ;අදුට්ඨො,ද්වේෂයෙන් දූෂිත නො වූයේ;අමූළ්හො,මොහයෙන් මුළා නොවූයේ;භයා,භය හෙතුවෙන් ද;මොහා, මොහහෙතුවෙන් ද; නගච්ඡති, අගතියට නො යේද.

216 සඤ්ඤත්තියාච, අනුන් දැන්වීමෙහි; කුසලො, දක්ෂ වේ ද; නිජ්ඣත්තියා ච, තෙමේ කාරණාකාරණයන් දැනීමෙහි; කොවිදො, දක්ෂවේ ද; ලද්ධපක්ඛො, ලබන ලද පක්ෂබල ඇත්තේ; හිරිමනො,පාපයෙහි ලජ්ජා සිතැත්තේ; සුක්කකම්මො, කල්‍යාණ කර්ම කරන්නේ වේ ද; සගාරවො,ධර්මගෞරව පුද්ගල

* සවෙතාදිසකො-ස-

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

217. ඡන්දා දොසා භයා මොහා–යො ධම්මං අතිවත්තති
නිහීයති තස්ස යසො–කාළපක්ඛෙව චන්දිමා

218. ඡන්දා දොසා භයා මොහා–යො ධම්මං නාතිවත්තති
ආපූරති තස්ස යසො–සුක්කපක්ඛෙව චන්දිමා'ති

219 දිට්ඨං දිට්ඨෙන සමෙති–දිට්ඨෙන සංසන්දතෙ දිට්ඨං
දිට්ඨං පටිච්ච න උපෙති–අසුද්ධ පරිසඞ්කිතො
සො පුග්ගලො පටිඤ්ඤාය–කාතබ්බා තෙන පවාරණා

220. සුතං සුතෙන සමෙති–සුතෙන සංසන්දතෙ සුතං
සුතං පටිච්ච න උපෙති–අසුද්ධ පරිසඞ්කිතො
සො පුග්ගලො පටිඤ්ඤාය කාතබ්බා තෙන පවාරණා,

221. මුතං මුතෙන සමෙති–මුතෙන සංසන්දතෙ මුතං
මුතං පටිච්ච න උපෙති–අසුද්ධ පරිසඞ්කිතො
සො පුග්ගලො පටිඤ්ඤාය–කාතබ්බා තෙන පවාරණා

**මහා සඞ්ගාමං නිට්ඨිතං**

---

ගෞරව සහිත වේ ද; තාදිසකො, එබඳු වූ; සො භික්ඛු, ඒ භික්ෂු තෙමේ; වෙ, ඒකාන්තයෙන්; සප්පතිස්සො ඉති, ප්‍රතීක්ෂණ සහිත වූයේ යයි හෙවත් දෙටු තන්හි තැබිය යුත්තේය යි; වුච්චති, කියනු ලැබේ.

**චූලසඞ්ගාම ගාථාර්ථ නිමි.**

—//—

217. යො, යමෙක් තෙමේ; ඡන්දා, මෙරමා කෙරෙහි ප්‍රිය වශයෙන් යෙදීමෙන් ඡන්දයෙන් හෝ; දොසා, ද්වේෂයෙන් හෝ; භයා, බිය හෙතුවෙන් හෝ; මොහා, මුළාවෙන් හෝ; ධම්මං, යුක්ති ධර්මය; අතිවත්තති, ඉක්මවා ද; තස්ස, ඔහුගේ; යසො, කීර්තිය තෙම; කාළපක්ඛෙ, කළුවර පක්ෂයෙහි වූ; චන්දිමා ඉව, පිරිහෙන චන්ද්‍රයා මෙන්; නිහීයති, නිඃශේෂයෙන් පිරිහෙන්නේය.

218. යො, යමෙක් තෙමේ; ඡන්දා, ඡන්ද හෙතුවෙන් හෝ; දොසා, ද්වේෂ හෙතුවෙන් හෝ; භයා, බිය හෙතුවෙන් හෝ, මොහා, මුළාවෙන් හෝ, ධම්මං, යුක්තිය; න අතිවත්තති, නො ඉක්මවා ද; තස්ස, ඔහුගේ; යසො, කීර්තිය තෙමේ; සුක්ඛ පක්ඛෙ, ශුක්ල පක්ෂයෙහි වූ; චන්දිමා ඉව, වැඩෙන චන්ද්‍රයා මෙන්; ආපූරති, ක්‍රමයෙන් පිරෙන්නේය.

219. 220. 221. චොදනාකාණ්ඩයෙහි 189, 190, 191, හා සම යි; තෙන, ඔහු සමග; පවාරණා, පවාරණා තොමෙ; කාතබ්බා, කටයුත්තේය.

**මහාසඞ්ගාම ගාථාර්ථ නිමි.**

—//—

222. පක්කමනනාතිකො කඨිනුඩාරො-වුතෙතා ආදිච්චබන්‍ධුනා
එතංච තාහං පුච්ඡාමි-කතමො පළිබොධො පඨමං ඡිජ්ජති

223. පක්කමනනාතිකො කඨිනුඩාරො-වුතෙතා ආදිච්චබන්‍ධුනා
එතඤ්චතාහං විස්සජ්ජිස්සං-චීවරපළිබොධො පඨමං ඡිජ්ජති
තස්ස සහ බහිසීම ගමනා-ආවාස පළිබොධො ඡිද්‍යති

224 නිඪානනාතිකො කඨිනුඩාරො-වුතෙතා ආදිච්චබන්‍ධුනා
එතං ච තාහං පුච්ඡාමි-කතමො පළිබොධො පඨමං ඡිජ්ජති

225. නිඪානනාතිකො කඨිනුඩාරො-වුතෙතා ආදිච්චබන්‍ධුනා
එතඤ්ච තාහං විස්සජ්ජිස්සං-ආවාස පළිබොධො පඨමං
ඡිජ්ජති

චීවරෙ නිඨිතෙ චීවර පළිබොධො ඡිජ්ජති

---

222. ආදිච්චබන්‍ධුනා, සූර්‍යබන්‍ධු වූ සර්‍වඥයන් වහන්සේ විසින්; පක්කමනනාතිකො, පක්කමනනාතිකා නම්වූ හෙවත් අවසින් නිරපෙක්‍ෂකව නික්ම යාම කෙළවර කොට ඇත්තා වූ; කඨිනුඩාරො, කෙළින් ඉදිරීම; වුතෙතා, වදාරණ ලද්දේය; [එහි] කතමො පළිබොධො, කවර පළිබොධයෙක්; පඨමං, පළමු කොට; ඡිද්‍යති, සිඳේද; (යන) එතං ච, මෙය ද; අහං, මම; තං, ඔබ; පුච්ඡාමි, විචාරමි.

223. ආදිච්චබන්‍ධුනා, සූර්‍යබන්‍ධු වූ සර්‍වඥයන් වහන්සේ විසින්; පක්කමනනාතිකො, පක්කමනනාතිකා නම්වූ හෙවත් නිරපෙක්‍ෂකව අවසින් නික්ම යාම කෙළවර කොට ඇත්තා වූ; කඨිනුඩාරො, කෙළින් ඉදිරීම; වුතෙතා, වදාරණ ලද්දේය; [එහි] චීවර පළිබොධො, චීවර පළිබොධය; පඨමං, පළමු කොට; ඡිද්‍යති, සිඳෙයි; තස්ස, ඔහුගේ; බහිසීම ගමනා සහ, සීමාවෙන් පිටතට යාම හා සමඟ; ආවාස පළිබොධො, ආවාස පළිබොධය තෙමේ; ඡිද්‍යති, සිඳෙයි; එතං ච, මේ කරුණ; (මෙසේ) තං, ඔබට; අහං, මම; විස්සජ්ජිස්සං, විසඳන්නෙමි

224 නිඪානනාතිකො, සිවුර කොට නිෂ්ඨීම කෙළවර කොට ඇත්තාවූ -පෙ-

225. ආවාස පළිබොධො, ආවාස පළිබොධය; පඨමං, පළමු කොට; ඡිද්‍යති, සිඳෙයි; චීවරෙ නිඨිතෙ, සිවුර කොට නිම වූ කල්හි; චීවර පළිබොධො, චීවර පළිබොධය; ඡිද්‍යති, සිඳෙයි;-

226. සනතිඨානනතිකො කඨිනුධාරෙ-වුතෙනා ආදිච්චබන්ධුනා
එතඤ්ච තාහං පුච්ඡාමි-කතමො පලිබොධො පඨ ජිජ්ජති

227. සනතිඨානනතිකො කඨිනුධාරො-වුතෙනා ආදිච්චබන්ධුනා
එතඤ්ච තාහං විසජ්ජිස්සං-වෙ පලිබොධා අපුබ්බං
අචරිමං ජිජ්ජනති

228. නාසනනතිකො කඨිනුධාරො-වුතෙනා ආදිච්චබන්ධුනා
එතඤ්ච තාහං පුච්ඡාමි-කතමො පලිබොධො පඨමං ජිජ්ජති

229. නාසනනතිකො කඨිනුධාරො වුතෙනා ආදිච්චබන්ධුනා
එතඤ්ච තාහං විසජ්ජිස්සං-ආවාස පලිබොධො
පඨමං ජිජ්ජති
චීවරෙ නඨෙ, චීවරපලිබොධො ජිජ්ජති

230. සවණනතිකො කඨිනුධාරො-වුතෙනා ආදිච්ච බන්ධුනා
එතඤ්ච තාහං පුච්ඡාමි-කතමො පලිබොධො පඨමං ජිජ්ජති

231. සවණනතිකො කඨිනුධාරො වුතෙනා ආදිච්ච බන්ධුනා
එතඤ්ච තාහං විසජ්ජිස්සං-චීවර පලිබොධො පඨමං
ජිජ්ජති

තස්ස සහ සවණෙන-ආවාස පලිබොධො ජිජ්ජති

---

226 සනතිඨානනතිකො, 'සිවුර ත් නොකරමි, ආවාසයට ද නො යමි 'යි සනිටුහන් කිරීම කෙළවර කොට ඇති; කඨිනුධාරෙ, කෙළින් ඉදිරීම;-පෙ-

227. වෙ පලිබොධා, චීවරාවාස යන උභය පලිබොධයෝ; අපුබ්බං අචරිමං, පෙර පසු නොව එකවර ම; ජිජ්ජනති, සිඳෙත්.

228. නාසනනතිකො, සිවුර නැසීම කෙළවර කොට ඇති; කඨිනුධාරෙ -පෙ-

229. චීවරෙ නඨෙ, සිවුර නැසුණු කල්හි; චීවර පලිබොධො-ජිජ්ජති-පෙ-

230. සවණනතිකො, විහාරයෙහි කඨිනොඩරණය කරණ ලද යි ඇසීම කෙළවර කොට ඇති;-

231 තස්ස, ඔහුගේ නොහොත් ඒ ප්‍රව්‍රාජිතයා; සහ සවණෙන, ඇසීම සමග ම; ආවාස පලිබොධො, ආවාස පලිබොධය; ජිජ්ජති, සිඳෙ යි.

232. ආංසාවච්ඡෙදිකො කඨිනුඞාරො-වුතෙතා ආදිච්චබන්ධුනා
එත ..ා තාහං පුච්ඡාමි-කතමො පලිබොධො පඨමං ඡිජ්ජති

233 ආංසාවචෙඡදිකො කඨිනුඞාරො-වුතෙතා ආදිච්චබන්ධුනා
එතඤ්ච තාහං විසසජ්ජිස්සං-ආවාස පලිබොධො පඨමං
ඡිජ්ජති

234. සීමාතිකකනතිකො කඨිනුඞාරො-වුතෙතා ආදිච්චබන්ධුනා
එතඤ්ච තාහං පුච්ඡාමි-කතමො පලිබොධො පඨමං ඡිජ්ජති
චීවරාසාය උපච්ඡිනනාය චීවර පලිබොධො ඡිජ්ජති

235. සීමාතිකකනතිකො කඨිනුඞාරො-වුතෙතා ආදිච්චබන්ධුනා
එතඤ්ච තාහං විසසජ්ජිස්සං-චීවර පලිබොධො පඨමං
ඡිජ්ජති
තසස බහිසීම ගතසස-ආවාස පලිබොධො ඡිජ්ජති

236. සඋබ්භාරො කඨිනුඞාරො-වුතෙතා ආදිච්චබන්ධුනා
එතඤ්ච තාහං පුච්ඡාමි-කතමො පලිබොධො පඨමං
ඡිජ්ජති

---

232 ආංසාවචෙඡදිකො, සිවුරු ලැබෙයි යන ආංසාව සිඳීමෙන් අනුසස් සිඳීම කෙළවර කොට ඇති-පෙ-

233. චීවරාසාය, සිවුර පිළිබඳ ආංසාව; උපච්ඡිනනාය, සිඳුනු කල්හි; චීවර පලිබොධො, චීවර පලිබොධය; ඡිජ්ජති, සිඳෙයි; [යන] එතං, මේ කරුණ මෙසේ; අහං, මම; තං, ඔබට; විසසජ්ජිස්සං, විසඳන්නෙමි.

234. සීමාතිකකනතිකො, සීමාතික්‍රමණය කෙළවර කොට ඇති; -පෙ-

235. බහිසීම ගතසස, සීමාවෙන් පිටත ගියාවූ; තසස, ඔහුට; ආවාස පලිබොධො-පෙ-

236. සඋබ්භාරො, [අනුසස් මූලසිවුරු ගෙණ සීමාවෙන් පිට නට ගොස් සිවුර නිමවූ කල්හි ඒ වෙහෙරින් ගිය මහණුන් කිබස් ගෙත්තම් නිමි කල්හි ඇසූ හෙයින්] උබ්භාර සහිතවූ; කඨිනුඞාරො, කඨිනුඞරණය -පෙ-

## විනය ගාථාඅර්ථ ව්‍යාඛ්‍යාව.

237. සහුබභාරො කඨිනුඬාරෙ–වුතෙතා ආදිචචබන්ධිනා
එතඤච තාහං විසසජ්ජිසසං–වෙ පළිබොධා අ‍ද. ‍ ං
අවරිමං ජිජ්ජ නාතී 'ති

### කඨිනභෙදෙ නිඨිතො

——//——

238 කතා පතනියො කායිකා-කති වාචසිකා කතා
ඡාදෙනතසස කති ආපතතියො-කති සංසගගපචචයා

239. ඡ ආපතතියො කායිකා ඡ වාචසිකා කතා
ඡාදෙනතසස තිසෙසා ආපතතියො-පඤච සංසගග පචචයා

240. අරුණුගෙග කති ආපතතියො-කති යාව තතියකා
කතෙතථ අඨවතථුකා–කතීහි සබබසඞගහො

---

**237** වෙ පළිබොධා,චීවරා 'වාසඝඛ්‍යාත පළිබොධ වයයම, අපුබබං අවරිමං, පෙර පසු නොව එකවර ම; ජිජ්ජ නාති, සිඳෙත්.

### කඨිනභෙද ගාථාර්ථ ව්‍යාඛ්‍යාව නිමි.

——//——

**238.** කායිකා, කයින් හටගන්නා වූ;ආපතතියො, ඇවැත්; කති, කෙතෙක් ද; වාචසිකා, වචනයෙන් හටගන්නා වූ ඇවැත්; කති, කෙතෙක්; කතා, ප්‍රකාශ කරණ ලද්දාහු ද? ඡාදෙනතසස, ඇවැත් වසන්නාහුට; කති ආපතතියො, ඇවැත් කෙතෙක් ද? සංසගගපචචයා, සංසර්ගප්‍රත්‍යයයෙන් ජන්‍ය ආපත්තීහු නොහොත් කය ගැටීමෙන් වන ඇවැත්; කති, කෙතෙක් ද?

**239** කායිකා, කායික වූ; ආපතතියො, ආපතතිහු;ඡ, සදෙනෙකි;වාචසිකා,වාචසිකාපතතීහු, ඡ,සදෙනෙකැයි;කතා,ප්‍රකාශ කරණ ලද්දාහ; ඡාදෙනතසස, ඇවැත් වසන කරන්නහුට; තිසෙසා ආපතතියො, ඇවැත් තුනකි; සංසගග පචචයා, සංසර්ගප්‍රත්‍යයෙයෙන් නිපදින ඇවැත්; පඤච, පස් දෙනෙකි; –උපග්‍රන්ථය බලනු–

**240.** අරුණුගෙග, අරුණු නැගෙන කල්හි; ආපතතියො, සිඩවන්නාවූ ආපතතිහු; කති, කෙතෙක් ද? යාවතතියකා, තුන් යලක් සමනුභාසන කම් කිරීමෙන් පසු සිදුවන ඇවැත්; කති, කෙතෙක් ද? යාවතතියකා, තුන් යලක් සමනුභාසනකම් කිරීමෙන් පසු සිදුවන ඇවැත්; කති,කෙතෙක් ද; එතථ, මෙහි; අඨවතථුකා, අෂ්ටවස්තුක ශික්ෂාවෝ; කති, කෙතෙක් ද? කතීහි, කොපමණකින් හෙවත් කුමකින් වනාහි; සබබසංගහො, ශික්ෂාපදයන්ගේ සර්ව සඞ්ග්‍රහය වේ ද?

ශ්‍රී

## සුජනප්පමොදනී.

241\. අරු… ග්ගෙ තිස්සො ආපත්තියො–ද්වෙ යාවතතියකා
එකෙත්ථ අට්ඨවත්ථුකා-එකෙන සබ්බසඞ්ගහො

242\. විනයස්ස කති මූලානි යානි බුද්ධෙන පඤ්ඤත්තා
විනයගරුකා කති වුත්තා–දුට්ඨුල්ලා ඡාදනා කති

243\. විනයස්ස ද්වෙ මූලානි–යානි බුද්ධෙන පඤ්ඤත්තා
විනය ගරුකා ද්වෙ වුත්තා–ද්වෙ දුට්ඨුල්ල ඡාදනා

---

241 අරුණුග්ගෙ, අරුණු නැගෙන සඳ; තිස්සො ආපත්තියො; [එකරත්ත, ඡාරත්ත,සත්තාහ, දසාහ, මාසාතික්‍රමණ වශයෙන් වන නිසඟි පචිතිය භික්ෂුණියක් සමග එක් රාත්‍රියක් තනිව විසීමෙන් සඞ්ඝාදිසෙසය යමෙක් පළමුවන. දෙවන, තුන්වන යාමයන් ඇවැත සඟවයි ද ඔහුට අරුණොද්ගමනයෙන් පසු සිදුවන දුෂ්කෘතාපත්තිය ද යන] ඇවැත් තුනක් වෙත්; යාවතතියකා, යාවතතියකාපත්තීහු; ද්වෙ, ප්‍රඥප්ති වශයෙන් භික්ෂු භික්ෂුණී භෙදයෙන් දෙකෙක් වෙත්; අට්ඨවත්ථුකා, අෂ්ටවස්තුකාපත්තීහු; එත්ථ, මේ ශාසනයෙහි; එකා, භික්ෂුණීන්ට පමණක් සාධාරණ වූ එකෙකි; එකෙන, "යස්ස සියා ආපත්ති සො ආවිකරෙය්‍ය" යන මේ එකම නිදානොද්දෙශයෙන්; සබ්බසඞ්ගහො, සියලු ශික්ෂාපද යන්ගේද සියලු ප්‍රාතිමොක්ෂොද්දෙශයන්ගේද සඞ්ග්‍රහය වෙයි.

242 බුද්ධෙන, බුදුරජානන් වහන්සේ විසින්; පඤ්ඤත්තා, පණවන ලද්දා වූ; යානි, යම් බඳු මූල යෝ වෙත් ද; මූලානි, ඒ මූලයෝ; විනයස්ස, විනයට; කති, කෙතෙක් වෙත් ද? විනයගරුකා, විනයගරුකාපත්තීහු; කති, කෙතෙක්; වුත්තා, වදාරණ ලද්දාහු ද? ඡාදනා දුට්ඨුල්ලා, ඡාදනක දුට්ඨුල්ලාපත්තීහු; කති, කෙතෙක් ද?

243\. බුද්ධෙන, බුදුරජානන් වහන්සේ විසින්; පඤ්ඤත්තා, පනවන ලද්දාවූ; විනයස්ස, විනයට හෝ විනයාගේ; යානි මූලානි, යම් මූලයෝ වෙත් ද; (ඔව්හු) ද්වෙ, කාය වාක් වශයෙන් දෙකෙකි; විනය ගරුකා, විනයගරුකාපත්තීහු; ද්වෙ, පරිජීසඟවෙසෙස් වශයෙන් දෙකෙකැ යි; වුත්තා, වදාරණ ලදහ; ඡාදනා දුට්ඨුල්ලා, ඡාදන දුට්ඨුල්ලාපත්තීහු; ද්වෙ, වජ්ජපටිච්ඡාදනයෙන් පරිජිද සඟවෙසෙස් සැඟවීමෙන් පචිද යන දෙකක් වෙත්.

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

244. ගාමන්තරෙ කති අපත්තියො-කති නදීපාරපච්චයා
කති මංසෙසු ථුල්ලච්චයං-කති මංසෙසු දුක්කටං

245. ගාමන්තරෙ චතස්සො ආපත්තියො චතස්සො නදීපාර පච්චයා
එකමිංසෙසු ථුල්ලච්චයං-නවමංසෙසු දුක්කටං

246. කති වාචසිකා රත්තිං කති වාචසිකා දිවා
දදමානස්ස කති ආපත්තියො-පටිගණ්හන්තස්ස කිත්තකා

---

244. ගාමින්තරෙ, ගමතුරෙහි; ආපත්තියො, සිඩවන ඇවැත්; කති, කීදෙනෙක් ද? නදීපාර පච්චයා, නදියෙහි පරතෙරට යාමෙන් සිදු වන ඇවැත්; කති, කොතෙක් ද? කති මංසෙසු, කොතෙක් මස්වල; ථුල්ලච්චයං, තුලසිද; කති මංසෙසු, කොතෙක් මස් වල; දුක්කටං, දුකුළාද?

245. ගාමන්තරෙ, ග්‍රාමාන්තරයෙහි දී සිදු වන්නාවූ; ආපත්තියො, ඇවැත්; චතස්සො, සතරෙකි; [භික්ෂුවක් මෙහෙනක් හා සමග යනු පිණිස සංවිධාන කෙරේ නම් දුක්කට ද, අන් ග්‍රාමයක් හුගේ උපචාරය ඉක්මවා නම් පචිති ද මෙහෙණක් පරික්ෂිපත ග්‍රාමයෙක්හි දී ප්‍රථම පාදය ඉගිළීමෙන් තුලසි ද දෙවෙනි පියෙහි සඟවෙසෙස් ද යි මෙසේ දුකුළා, පචිති, තුලසි, සඟවෙසෙස් යන සතරයි] නදීපාරපච්චයා, ගඟින් පරතෙර යාම් ප්‍රත්‍යය යෙන්; චතස්සො, ඇවැත් සතරෙකි; [භික්ෂුවක් භික්ෂුණියක් හා සංවිධාන කිරීමෙහි දුකුළා ද; එක්ව නැවු නැඟීමෙහි පචිති ද; ගඟෙහි පරතෙර යන්නාවූ භික්ෂුණිය එතරව ප්‍රථම පාදය ඉක්මවීමෙන් තුලසි ද, දෙවන පිය ඉක්මවීමෙන් සඟවෙසෙස් ද සිදු වේ] එක මංසෙසු, එකම මිනිස් මස්හි; ථුල්ලච්චයං, තුලසි වේ; නවමංසෙසු, [ඇත්, අස්, බලු, දිවි සිංහ, ව්‍යාඝ්‍ර, කරබානා, වලස්, ඌණී යන] නව මසෙහි; දුක්කටං, දුකුළා ඇවැත්වේ.

246 රත්තිං, රාත්‍රියෙහි දී; වාචසිකා, වාග්ද්වාරයෙන වන ඇවැත්; කති, කොතෙක් ද; දිවා, දහවල්; වාචසිකා, වචනයෙන් සිදුවන ඇවැත්; කති, කොතෙක් ද? දදමානස්ස, දෙන්නහුට; කතිආපත්තියො, ඇවැත් කොතෙක් සිදුවෙත් ද? පටිගණ්හන්තස්ස, පිළිගන්නහුට; කති, ඇවැත් කීයක් සිදු වේ ද?

247. වෙ ච සිකා රත්තිං-වෙ වාචසිකා දිවා,
දදමානස්ස තිස්සො ආපත්තියො-චත්තාරො ච පටිග්ගහෙ

248. කති දෙසනාගාමිනියො-කති සප්පටිකම්මා කතා
කතෙත්ථ අප්පටිකම්මාවුත්තා-බුද්ධෙනා'දිච්චබන්ධුනා

---

247. රත්තිං, රාත්‍රියෙහි; වාචසිකා, වචනයෙන් සිදුවන ඇවැත්; වෙ, [භික්ෂුණියක් රාත්‍රියේ අඳුරෙහි පහන් නැතිව පුරුෂයකුගේ අත්පස සිටීමෙන් සල්ලාප කෙරේ නම් පචිති ද, අත්පස දුරු කොට සිට නම් දුකුලා ද යන] ඇවැත් දෙක වෙත්; දිවා, දවල්හි වූ; වාචසිකා, වාචසිකාපත්තිහු; වෙ [භික්ෂුණියක් දවල් ප්‍රතිච්ඡන්නස්ථානයෙක්හි පුරුෂයකුගේ අත්පස සිට සල්ලාප කිරීමෙන් පචිතිද, අත්පසින් දුරුව සල්ලාප කෙරේ නම් දුකුලා ද යන ඇවැත්] දෙකෙකි; දදමානස්ස, දෙන්නහුට; තිස්සො, [මරණාභිප්‍රායයෙන් මිනිසෙකුට වස දුන් සඳ ඔහු මළ කල්හි වන පරිජි ඇවැතද, යක් බූ පිසසුන්ට දී ඔවුන් මළ කල වන තුලසි ද, තිරිසනෙකුට දෙන ලදුව මළ කල්හි සිදුවන පචිති හා නො නෑ මෙහෙණකට සිවුරු දීමෙහි පචිතිද යන] ඇවැත් තුනක් වෙත්; පටිග්ගහෙ, පිළිගැන්මෙහි; චත්තාරො, [ගන්ධගාහ වෙණිගාහාදියෙන් වන සඟවෙසෙස් ද, මුවින් පුරුෂ නිමිත්ත ගැණීමෙන් සිදුවන පරිජි ද, නො නෑ මෙහෙණක අතින් සිවුරු ගැණීමෙන් වන නිසඟිපචිති ද, අවස්සුත පුරුෂයකු දුන් කෑසුතු දෑය තොමෝත් අවස්සුතව පිළිගැන්මෙන් වන තුලසි ද යන] ඇවැත් සතරකි.

248. දෙසනාගාමිනියො, දෙසනාගාමිනී ඇවැත්; කති, කෙතෙක් ද? සප්පටිකම්ම කතා, ප්‍රතික්‍රියා සහිත යයි ප්‍රකාශ කරණ ලද්දා වූ ඇවැත්; කති, කෙතෙක් ද? එත්ථ, මේ ශාසනයෙහි; කති, කෙතෙක් ඇවැත්; අප්පටිකම්මා, ප්‍රතිකර්ම රහිතයෝ යයි; ආදිච්චබන්ධුනා, සූර්‍ය්‍යබන්ධු වූ; බුද්ධෙන, බුදුරජානන් වහන්සේ විසින්; වුත්තා, වදාරණ ලද්දාහු ද?

249. පඤ්ච දෙසනාගාමිනියො-ඡ සප්පටිකම්මා කථ
එකො අප්පටිකම්මො වුත්තො-බුද්ධෙනාදිච්චබන්ධුනා

250. විනයගරුකා කති වුත්තා-කාය වාචසිකානි ච
කති විකාලෙ ධඤ්ඤරසො-කති ඤත්තිචතුත්ථෙන සම්මුති

251. විනයගරුකා වෙ වුත්තා-කාය වාචසිකානි ච
එකො විකාලෙ ධඤ්ඤරසො එකා ඤත්ති චතුත්ථෙන සම්මුති

---

249. දෙසනා ගාමිනියො, දෙසීමෙන් පිරිසිදු විය හැකි ඇවැත්; පඤ්ච, පසකි; [ලඝු ඇවැත් පසයි] ඡ, සයක්; පාරාජිකාව හැර ඉතිරි ඇවැත් සය යි] සප්පටිකම්මා කතා, ප්‍රතිකර්ම සහිත යයි ප්‍රකාශකරණලදහ; ආදිච්චබන්ධුනා, ආදිත්‍යබන්ධු වූ; බුද්ධෙන, බුදුන් විසින්; එකො, මේ සස්හෙහි, එකා, එකම පාරාජිකාපත්තිය; අප්පටිකම්මො, [මස්තකච්ඡින්න තාලවෘක්ෂයක් මෙන් පරිජි ඇවැත් අවන්නහු මේ සස්සෙහි නො වැඩෙන බැවින් ] ප්‍රතික්‍රියා රහිත යයි; වුත්තා, වදාරණ ලද්දීය.

250. විනය ගරුකා, විනය ගරුකාපත්තීහු; කති, කීදෙනෙක්; වුත්තා, වදාරණ ලද්දාහු ද? කාය වාචසිකානි, කයින් හා වචනින් සිදුවෙන්නා වූ ඇවැත් කෙතෙක් ද? විකාලෙ, විකාලයෙහි, ධඤ්ඤ රසො ධාන්‍ය රසානුභවයෝ; කති, කෙතෙක් ද? ඤත්ති චතුත්ථෙන, ඤත්ති චතුර්ථක කර්මයෙන් කරණු ලබන්නාවූ, සම්මුති, සම්මුතීහු; කති, කෙතෙක් ද?

251. විනයගරුකා, විනයයෙහි පණවන ලද ගරුකාපත්තීහු; වෙ, පරිජි සඟවෙසෙස් යයි දෙකකැ යි; වුත්තා, වදාරණලදහ; කාය වාචසිකා නි, සියලු ශික්ෂාවෝ කායවාචසික වෙති; (මානසිකවූ ඇවතෙක් නැතැයි යුසේයි) විකාලෙ, විකාලයෙහි එකො ධඤ්ඤරසො, එකම ලොණ සොවීරක නම් ධාන්‍ය රසය යි; [මෙයකාලයෙහි ද වටී යි ] ඤත්තිචතුත්ථෙන සම්මුති, ඤත්ති චතුර්ථක කර්ම වාක්‍යයෙන් කරණුලබන සම්මුතීහු; එකා, එකම භික්ඛුනොවාදක සම්මුති යයි.

252. පරාජිකා කායිකා කති-කති සංවාස භූමියො
කතීනං රත්තිච්ඡෙදො-පඤ්ඤත්තා ද්වඞ්ගුලා කති

253. පාරාජිකා කායිකා ද්වෙ-ද්වෙ සංවාස භූමියො
ද්වින්නං ච රත්තිච්ඡෙදො-පඤ්ඤත්තා ද්වඞ්ගුලා දුවෙ

254 කත'ත්තානං වධිත්වාන-කතීහි සඞ්ඝො භිජ්ජති
කතෙ'ත්ථ පඨමාපත්තිකා-ඤත්තියා කරණා කති

---

252. කායිකා, කයින් සිදුවන්නාවූ; පාරාජිකා, පාරාජිකාවෝ; කති, කීදෙනෙක් ද? සංවාස භූමියො, සංවාස භූමීහු; **කති** කෙතෙක් **ද?** කතීනං, කෙතෙක් දෙනෙකුන්ට; රත්තිච්ඡෙදො, රාත්‍රිච්ඡේදය වේ **ද?** ද්වඞ්ගුලා පඤ්ඤත්තා, ද්වඞ්ගුල ප්‍රඥප්තීහු; කති, කෙතෙක් වෙත් ද?

253. කායිකා, කායික වූ; පාරාජිකා, පාරාජිකාවෝ; ද්වෙ, දෙදෙනෙකි; [භික්ෂූන් විෂයයෙහි මෛථුන පාරාජිකාව ද, භික්ෂුණීන් විෂයයෙහි කායසංසග්ග පාරාජිකාව ද යන දෙක යි.] සංවාස භූමියො, සංවාසභූමීහු; ද්වෙ, දෙදෙනෙක; [තෙමේ ම තෙමේ සමාන සංවාසක යකු කෙරේ ද-සමග්ග සඞ්ඝයා උක්ඛිත්තක කම්මයෙන් පලවා හැරියහු ඇතුළත් කිරීමද යන මේ යි ඇතැම්හු මේ විවිධ භෙදය සමාන සංවාස භූමිය, නානා සංවාස භූමි යයි දක්වූහ.] ද්වින්නං, පාරිවාසිකයාහට ද මානත්ත චාරීහට **ද** යන දෙදෙනාට රත්තිච්ඡෙදො, රාත්‍රිච්ඡේදය වේ; ද්වඞ්ගුලා පඤ්ඤත්තා, ද්වඞ්ගුල ප්‍රඥප්තීහු; දුවෙ, දෙදෙනෙකි; [ද්වඞ්ගුල **පබ්බ පරමං ආදාතබ්බං**, යන ශික්ෂාපදය හා '**ද්වඞ්ගුලං වා ද්වෙමාසං වා**] යනාදී ප්‍රඥප්තිය ද යන දෙක යි. ]

254. අත්තානං වධිත්වාන, තමා මරා පැහැර; කති, කෙතෙක් ඇවැත් අවදී ද**?** සඞ්ඝො, සඞ්ඝතෙමේ; කතීහි, කරුණු කියකින් භිජ්ජති, බිඳේ **ද?** එත්ථ, මෙහි; පඨමාපත්තිකා, ප්‍රථමාපත්තීහු; **කති**, කෙතෙක් **ද?** ඤත්තියා කරණා, ඤත්ති කාර්‍ය්‍යයෝ; කති, කෙතෙක් ද?

255. වෙ අත්තානං වධිත්වාන-චීහි සඞ්ඝො භිජ්ජති
වෙ'ත්ථ පඨමං පඤ්ඤත්තා-ඡත්තියා කාරණා දුවෙ

256. පාණාතිපාතෙ කති ආපත්තියො-වාචා පාරාජිකා කති
ඔභාසනා කති වුත්තා-සඤ්චරිත්තෙන වා කති

257. පාණාතිපාතෙ තිස්සො ආපත්තියො-වාචා පාරාජිකා තයො
ඔභාසනා තයො වුත්තා-සඤ්චරිත්තෙන වා තයො

---

255. අත්තානං වධිත්වාන, තමා මරා පැහැර; වෙ, අවදින ඇවැත්දෙකකි; [භික්ෂුණිය තමා පැහැර හඬානම් පචිතිවේ තමා පැහැර නොහඬා නම් දුකුලා වේ.] චීහි; කර්මයෙන් ද සලාක ග්‍රාහයෙන් ද යන දෙ කරුණෙන්; සඞ්ඝො, සඞ්ඝ තෙමේ; භිජ්ජති, බිඳේ; එත්ථ, මෙහි; පඨමාපඤ්ඤත්තා, ප්‍රථම පනතීහු; වෙ, සියලු විනයපිටකයෙහි දෙපසට පැනවීම් වශයෙන් දෙකකි; [භික්ෂූන්ට නවයක් ද භික්ෂුණීන්ට නවයක්දැ යි අටළොසක් වෙති] ඡත්තියා-කාරණා ඡත්ති කෘත්‍යයෝ; වෙ, කර්මය කර්ම පාදක යයි දෙකෙකි. (ඔවුනතුරෙහි කර්මය නවස්ථානයෙක්හි ද, කර්මපාදය දෙතැනෙක ද පවතින්නේ වේ.)

256. පාණාතිපාතෙ, ප්‍රාණඝාතයෙහි; කති ආපත්තියො, ආපත්තීහු කෙතෙක් ද? වාචාපාරාජිකා, වචසින් අව දින පරිජි ඇවැත්; කති, කෙතෙක් ද? ඔභාසනා, අසභ්‍ය භාසනයෝ; කති, කෙතෙක්; වුත්තා, වදාරණ ලද්දාහු ද; සඤ්චරිත්තෙන, සඤ්චරිත්තය කරණකොට ගෙණ; කති, ඇවැත් කීයක් සිදු වේ ද? [මෙහි 'වා' යනු පද පූරණයෙහි නිපාත යි]

257. පාණාතිපාතෙ, ප්‍රාණඝාතයෙහි; තිස්සො, [අනොදිස්සකව හෙවත් යමෙකු නිමිති නොකොට කැනූ වළක මිනිසෙක් වැටී මළේ නම් පරිජි ද, යක්ෂ ප්‍රෙතයන් වැටී මළෝ නම් ථුලසි ද තිරිසනෙකු වැටී මළේ නම් පචිතිද්‍ද යි] [ආපත්තීහු] තිදෙනෙකි; වාචාපාරාජිකා, වචසින් වන පාරාජිකාවෝ; තයො, වජ්ජපටිච්ඡාදක, උක්ඛිත්තානුවත්තක, අට්ඨවත්ථුක යයි තුනෙකි; [ඇතැම් ආචාර්‍ය්‍යී කෙනෙක් අණත්තික අදින්නාදානය, ආණත්තික මනුස්ස ඝාතනය, උත්තරිමනුස්සධම්මුල්ලපන යයි තුනක් ලෙවත් කරති. ] ඔභාසනා, අසභ්‍ය භාෂණයෝ; තයො, [වුච්ඡ

258. කති පුග්ගලා න උපසම්පාදෙතබ්බා-කති කම්මානං සඞ්ගහා
නාසිතකා කතී වුත්තා-කතීනං එකවාචිකා

259. තයො පුග්ගලා න උපසම්පාදෙතබ්බා-තයො කම්මානං සඞ්ගහා
නාසිතකා තයො වුත්තා-තිණ්ණන්නං එකවාචිකා

---

මාර්ගී, ද්‍රාවමාර්ගී නිමිති කොට ගුණ කථනයෙහි සඟවෙසෙස් ද, යථොක්ත මාර්ගීවයස හැර අකුවෙන් යට දත මඩලින් උඩ ගුණ කීමෙහි තුලසි ද, අකුවෙන් උඩ දත මඩලින් යට ගුණ කීමෙහි, දුකුලාදූ යි ] ඇවැත් තුනක්; වුත්තා, වදාරණ ලදහ; සඤ්චරිත්තෙන, සඤ්චරිත්තය කරණ කොට ගෙණ; තයො, [පිළිගැණීමය විමර්ශනය, ප්‍රත්‍යාහරණය යන මෙහි සඟවෙසෙස් ද, පිළිගැණීමය, විමර්ශනය යන මෙහි තුලසි ද, පිළිගැණීමෙහි දුකුලාදූ යි ] ඇවැත් තී දෙනෙකි.

258 කතිපුග්ගලා, කෙතෙක් පුද්ගලයෝ, න උපසම්පාදෙතබ්බා, උපසම්පන්න නො කටයුත්තෝ ද; කම්මානං, කර්මයන්ගේ, සඞ්ගහා, සඞ්ග්‍රහයෝ; කති, කෙතෙක් ද? නාසිතකා, නාසී කරණයෝ; කතී, කී දෙනෙක් යයි; වුත්තා, වදාරණ ලද්දාහු ද? කතීනං, කී දෙනෙකුන්ට; එකවාචිකා, එක් අනුසාවනය ක් වේ ද?

259. න උපසම්පාදෙතබ්බා, උපසම්පදා නොකට යුතු වූ; පුග්ගලා, පුද්ගලයෝ; තයො, අඨානගත, අඞ්ගහීන, වත්ථු විපන්න යයි තී දෙනෙකි; [මෙහි අඨානගත නම්:- උපසම්පදාව පිණිස වයස අඩුවීම යි අඞ්ගහීන නම්:- යමෙකුට පා සිවුරු අසම්පූර්ණ හෝ වේ ද සම්පූර්ණ වුවත් යාඥා නො කෙරේ නම් හෝ වේ ද ඔහු යි. වත්ථුවිපන්න නම්:- මාතුඝාතකාදීන් හා පණ්ඩක උභතොබ්‍යඤ්ජනක තිරච්ඡානාදීහු යි]කම්මානං, ඤත්ති අනුසාවන කර්මයන් පිළිබඳ; සඞ්ගහා, සඞ්ග්‍රහයෝ; තයො, ඤත්තිකප්පන, විප්පකතපච්චය, අතීතකරණ යයි තී දෙනෙකි; [ඤත්තිකප්පනය නම්, කඨිනදුස්සං ඉත්ථං නාමස්ස දදෙය්‍ය, සඞ්ඝො උපොසථං කරෙය්‍ය,' යනාදී වශයෙන් ඤත්තිය තැබීමයි. 'ඉත්ථං නාමස්ස දෙති,' 'කඨිනං අත්ථරිතුං අසම්භොගං කරොති,' යනාදී වශයෙන් දෙති, කරොති යනාදිය විප්පකතපච්චය යි. අතීතකරණය නාම්:- 'දින්නංසඞ්ඝෙන, 'කතං

260. අදින්නාදානෙ කති ආපත්තියො-කති මෙථුන පච්චයා
ඡින්දන්තස්ස කති ආපත්තියො-කති ඡඩ්ඩිත ප. වයා

261. අදින්නාදානෙ තිස්සො ආපත්තියො-චතස්සො මෙථුන පච්චයා
ඡින්දන්තස්ස තිස්සො ආපත්තියො පඤ්ච ඡඩ්ඩිත පච්චයා

---

**සඞ්ඝෙන,** යනාදි යයි] [තව ද මෙහි **වස්තුවය,** ඤත්තිය, **අනුසාවන** යයි ත්‍රි භෙදයක් ද වේ. වස්තු, ඤත්ති, **අනුසාවන** යන තුණ සම්පූර්ණ වූ විට **කර්මය** නම් වේ. එබැවින් මේ තුන ද කර්මයෙහි සඞ්ග්‍රහ මැයි] නාසිතකා, නාසනා වෙති; තයො, **ලිඞ්ගනාසනා, සංවාසනාසනා, දණ්ඩකම්මනාසනා** යයි තුනක්, වුත්තා, වදාරණ ලදහ; [මෙහි **ලිඞ්ගනාසනා** නම් ශ්‍රමණභාවයෙන් තොර කිරීම යි, **සංවාසනාසනා** නම් සඞ්ඝකර්මාදී සංවාස ඔහු හා නො කිරීමයි, **දණ්ඩකම්මනාසනා** නම් දසඟකින් **කණ්ටකසාමණෙරාදීන්** මෙන් දඬුවමින් නැසීම යි] එකවාචිකා, එක් අනුසාවනාව; තිණ්ණණ්ණං, ති දෙනෙකුන්ට වේ; [**'අනුජානාමි භික්ඛවෙ තයො එකානුසාවනෙන කාතුං'** යි වදාළ හෙයින් නානාචාර්‍ය්‍යක එකොපාධ්‍යායකයන්ට එක ම අනුසාවනය ප්‍රමාණ යි.]

260. අදින්නාදානෙ, **අදත්තාදානයෙහි;** කති ආපත්තියො, කොතෙක් ඇවැත් සිදු වෙත්ද? මෙථුන පච්චයා, මෛථුන හෙතුවින්; කති, ඇවැත් කොතෙක් වෙත් ද? ඡින්දන්තස්ස, වෘක්ෂ ආදිය සිඳින්නහුට; කති ආපත්තියො, ඇවැත් කීයක් සිදු වෙත්ද? ඡඩ්ඩිත පච්චයා, දූමීම් හෙතුවෙන්; කති, ඇවැත් කීයක් සිදු වේ ද?

261. අදින්නාදානෙ, අයිනාදන්හි; තිස්සො ආපත්තියො, [පාදයක් හෝ අතිරේක පාදයක් ගන්නහුට පරිජි ද, අයිරිත් මස්සක තුලසි ද, මස්සක් හෝ මස්සකට අඩුව ගැන්මෙහි දුකුලාදූ යි] ඇවැත් තුනකි; මෙථුනපච්චයා, මෙවුන් දම් හෙතුවින්; ආපත්තියො, ඇවැත්; චතස්සො, [මත අක්ඛයිතයෙහි පරිජි ද, බොහෝසෙයින් කුණු වූවෙහි තුලසි ද, විවෘත වූ මුඛයෙහි දුකුලා ද, කිසිලි ආදියෙහි පචිතිදූ යි] සතරකි; ඡින්දන්තස්ස, සිඳින්නහුට; තිස්සො ආපත්තියො, [වනසපතිවෘක්ෂ

262. භික්‍ඛුනොවාදක වග්ගසමිං-පාචිත්තියෙන දුක්කටා
කතෙත්ථ නවකා වුත්තා-කතීනං චීවරෙන ච

263. භික්ඛුනො'වාදකවග්ගස්මිං-පාචිත්තියෙන දුක්කටා
කතා චතුරෙ'ත්ථ නවකා-වුත්තා චිත්තං චීවරෙන ච

---

ඡෙදනය කරන්නහුට පරිජි ද, භූතගාම පාතව්‍යතායෙහි පචිති ද, අඩගජාතඡෙදනයෙහි තුලසිදූ යි] ඇවැත් තුනකි; ජඩ්ඩිත පච්චයා, දැමීම් හෙතුවින්; පඤ්ච, [අතොංදිස්සකව වස දැමූ කල්හි ඒ හෙතුවෙන් මිනිසකු මළ කල්හි පරිජි ද යක්ෂ ප්‍රෙතාදීන් අතුරෙන් යමෙක් මළේ නම් තුලසි ද, තිරිසෙනෙකු මළේ නම් පචිති ද, සුකුරු මිදීමෙහි සඟවෙසෙස් ද, සෙඛියා හි කී පරිදි තෘණසථානයෙහි මල මූත්‍ර ක්‍රියාවෙන් දුකුලාදූ යි මෙසේ] ඇවැත් පසක් වෙති.

262. භික්ඛුනොවාදක වග්ගස්මිං, භික්ෂුණ්‍ය'වවාද වර්ගයෙහි දශ ශික්ෂාපදයන් අතුරෙහි; පාචිත්තියෙන, පචිති ඇවැත සමග; දුක්කටා, දුකුලා ඇවැත්; කතා ප්‍රකාශිත ද? එත්ථ, මෙහි; කති, කෙතෙක් දෙන; නවකා, නවකාපත්ති යයි; වුත්තා වදාරණ ලද්දාහු ද? කතීනං, කී දෙනෙකුන්ට; චීවරෙන ච, චීවරය කාරණකොට ගෙණ ඇවැත් වේ ද?

263. භික්ඛුනොවාදක වග්ගස්මිං, භික්ෂුණ්‍යවවාද වර්ගයෙහි දශ ශික්ෂාවන් අතුරෙහි; පාචිත්තියෙන දුක්කටා, පචිතිය සහිත දුකුලා ඇවැත්හු; කතා ප්‍රකාශ කරණ ලද්දාහුමය; එත්ථ, මෙහි; නවකා, නවකාපත්තිහු; චතුරො, [ප්‍රථම ශික්ෂාපදයෙහි අධම්ම කම්මයෙහි දෙකෙක, ධම්මකම්මයෙහි දෙකෙකැ යි] සතරෙකි; චිත්තං, [භික්ෂූන් හමුවෙහි උපසපන් මෙහෙණින්නක්හට සිවුරු දෙන්නහුට හා භික්ෂූකීන් හමුවෙහි උපසපන් මෙහෙණින්නක්හට සිවුරු දෙන්නහුට ද යන දෙදෙනාට; චීවරෙන, චීවර දානය කාරණකොට ගෙණ; වුත්තා, පචිති දුකුලා ඇවැත් වේ යයි වදාරණ ලදී.

## විනය ගාථා ශබ්ද ව්‍යාඛ්‍යාව.

264. භික්ඛුනීනඤ්ච අක්ඛාතා පාටිදෙසනියා කති
භුඤ්ජන්තා'මකධඤ්ඤෙන-පාචිත්තියෙන **දුක්කටා** කතා

265 භික්ඛුනීනඤ්ච අක්ඛාතා-අට්ඨ පාටිදෙසනියා කතා
භුඤ්ජන්තා'මකධඤ්ඤෙන-පාචිත්තියෙන දුක්කටා කතා

266. ගච්ඡන්තස්ස කති ආපත්තියො-ඨිතස්සචා පි කිත්තකා
නිසින්නස්ස කති ආපත්තියො-නිපන්නස්සා'පි කිත්තකා

---

264. භික්ඛුනීනං, භික්ෂුණීන්ට; අක්ඛාතා, වදාරණ ලද්දා වූ; පාටිදෙසනියා, පාටිදෙසනියාපත්තිහු; කති, කොතෙක් ද? ආමක ධඤ්ඤෙන, අමු ධාන්‍ය විනවා; භුඤ්ජන්ති, අනුභව කරන්නී වූ භික්ෂුණීය; පාචිත්තියෙන, පචිති ඇවැත සමග; දුක්කටා කතා, දුකුළා ඇවත් ඇවදීම කළා ද?

265. භික්ඛුනීනං, භික්ෂුනින්ට; අක්ඛාතා, වදාරණලද්දා වූ; පාටිදෙසනියා, පාටිදෙසනිය සික පදයෝ; අට්ඨ, [" **යාපන භික්ඛුනී අගිලානා සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පටිදෙසෙතබ්බං තාය භික්ඛුනියා ගාරය්හං අය්‍යෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී ති" යා පන භික්ඛුනී අගිලානා දධිං - තෙලං-මධුං-නවනීතං - මච්ඡං - මංසං-ඛීරං-තං පටිදෙසෙමි ති** යනුවෙන්] අටකි; ආමක ධඤ්ඤෙන, ශාලි ව්‍රීහ්‍යාදී ධන්‍යයන්; භුඤ්ජන්ති, විනවා අනුභවකරන්නිය; පාචිත්තියෙන, පචිති ඇවත සමග; දුක්කටා, දුකුළා ඇවැතක්; කතා, රැස්කළා මැයි.

266. ගච්ඡන්තස්ස, යන්නහුට; කති ආපත්තියො, ඇවැත් කීයක් වෙත් ද; අපි, නැවත; ඨිතස්ස, සිටියහුට; කිත්තකා, කොතෙක් වෙත් ද? නිසින්නස්ස, හුන්නහුට; ආපත්තියො, ඇවැත්; කති, කොතෙක් සිදුවෙත් ද? අපි, නැවැත; නිපන්නස්ස අපි, හොත්තහුට; කිත්තකා, කොතෙක් සිදුවෙත් ද.

## • සුජනප්පමොදනී.

268. ගච්ඡන්තස්ස චතස්සො ආපත්තියො -ඨිතස්සවා'පි තත්තිකා
නිසින්නස්ස ච චතස්සො ආපත්තියො–නිපන්නස්සා'පි
තත්තිකා

269. කති පාචිත්තියානි-සබ්බානි නානා වත්ථුකානි
අපුබ්බං අචරිමං-ආපජ්ජෙය්‍ය එකතො

270. පඤ්ච පාචිත්තියානි-සබ්බානි නානා වත්ථුකානි
අපුබ්බං අචරිමං-ආපජ්ජන්ති *එකතො

---

268. ගච්ඡන්තස්ස, මාර්ගාදියෙහි යන්නහුට; චතස්සො ආපත්තියො,[භික්ෂුණියක් හෝ මාගමක් සමග කැපිව යනු සඳහා සංවිධාන කිරීමෙන් යන්නහුට දුකුළා ද, ග්‍රාමොපචාරාතික්‍රමණයෙන් පචිති ද,එකලාව ග්‍රාමාන්තරයකට යන මෙහෙණියට ග්‍රාමොපචාරය ඉක්මවා තැබූ පළමු පියවරින් වන තුලසි ද, දෙවෙනි පියවරෙහි සඟවෙසෙස්දැ යි] ඇවැත් සතරෙකි; අපි, නැවත; ඨිතස්ස ච, සිටියහුට ද; තත්තිකා, එපමණකි, හෙවත් ඇවැත් සතරකි;[එනම්:–භික්ෂුණියකට අභිකාරයෙහි මෛථුනයට අවකාශ ඇති ප්‍රච්ඡන්නස්ථානයෙක්හි මිත්‍රසන්ථව වශයෙන් පුරුෂයකුගේ අත්පස සිටීමෙන් සිදුවන පචිතියද, අත්පසින් දුරුව සිටීමෙන් වන දුකුළා ද,අරුණ නැඟෙනකල දුතියිකාවක් අත්පස හරිමින් සිටීමෙහි තුලසි ද, අත්පස හැර සිටිකල්හි සඟවෙසෙස් ද, වේ] නිසින්නස්සච,හුන්නහුට ද;චතස්සො,උක්ත ප්‍රකාරයෙන් ම **පචිති දුකුළා, සඟවෙසෙස් තුලසි යයි** සතරකි; අපි,නැවත;නිපන්නස්ස, හොත්තහුට ද; තත්තිකා, එපමණ ම ඇවැත් වේ,[වැද හෙවී මෙහි ද යථොක්ත සතර ඇවැත්ම සිදුවෙයි යනු භාවයි.]

269. නානා වත්ථුකානි, නානා වස්තුක වූ; හෙවත් වෙන් වෙන් වූ වස්තු ඇති; පාචිත්තියානි, පචිති; සබ්බානි, සියල්ලෝම; කති, කොතෙක් වූ වාහු; අපුබ්බං අචරිමං, පෙර පසු නොව; එකතො, එකවර; ආපජ්ජෙය්‍ය, අවදන්නේ ද?

270. නානා වත්ථුකානි, නානා වස්තුක වූ; පාචිත්තියානි, පචිති ඇවැත්; සබ්බානි, සියල්ලෝම; පඤ්ච, [**තලතෙල්, මී, උක්සකුරු, ගිතෙල්, වෙඬරු** යන පස් බෙහෙත් එක්බඳුනක

---

* ආපජ්ජෙය්‍ය

271. කති පාචිත්තියානි-සබ්බානි නානා වත්‍ථුකානි
අපුබ්බං අචරිමං-ආපජ්ජෙය්‍ය එකතො

272. නව පාචිත්තියානි-සබ්බානි නානා වත්‍ථුකානි
අපුබ්බං අචරිමං-ආපජ්ජන්ති එකතො

273. කති පාචිත්තියානි-සබ්බානි නානා වත්‍ථුකානි
කති වාචාය දෙසෙය්‍ය-වුත්තා ආදිච්චබන්‍ධුනා

274. පඤ්ච පාචිත්තියානි-සබ්බානි නානා වත්‍ථුකානි
එක වාචාය දෙසෙය්‍ය-වුත්තා ආදිච්චබන්‍ධුනා

---

ගෝ නානා භාජනයන්හි තැබූ භික්‍ෂුව සත්දවස ඇවෑමෙන් පචිති ඇවැත් පසකට පැමිණෙන හෙයින්] පස්දෙනෙක් වූවාහු; අපුබ්බං අචරිමං, පෙර පසු නොව; එකතො, එකවරම; ආප ජ්ජන්ති, අවදිත්.

271-272 මෙහි: 272-පාචිත්තියානි:-සබ්බානි, සියල්ලෝම; නව, නව දෙනෙක් වූ වාහු; අපුබ්බං අචරිමං ආපජ්ජන්ති-[ගිතෙල්, වෙඬරු, තලතෙල්, මී, උක්සකුරු, දියමස්, කැප ගොඩමස්, කිරි, දී යන මේ නව ප්‍රණීත භොජනයන් විනවා ඔවුන් එකට අනා ගත් පිඩක් මුවතුලට ගෙණ උගුරෙන් ඔබ ඉක්මවන භික්‍ෂුවට එකවිට ම පචිති නවයක් සිදු වෙති]

273. සබ්බානි, සියල්ල; නානාවත්‍ථුකානි, නානාවස්තුක වූ කති පාචිත්තියානි, පචිති කෙතෙක්; කති වාචාය, වචන කීය. කින්; දෙසෙය්‍ය, දෙසන්නේ යසි; ආදිච්චබන්‍ධුනා, බුදුන් විසින්; වුත්තා, වදාරණ ලද ද?

274. පඤ්චපාචිත්තියානි, පචිති පසක්; [පස් බෙහෙත් පිළි බඳ පස යි.] ආදිච්ච බන්‍ධුනා, බුදුන් විසින්; එකවාචාය, [අහං භන්තෙ පඤ්ච භෙසජ්ජානි පටිග්ගහෙත්වා, සත්තාහං අතික්කා මිත්වා පඤ්චආපත්තියො ආපන්නො, තාතුම්හ මූලෙපටිදෙ සෙමි යන] එකම වචනයෙන්; දෙසෙය්‍ය, දෙසන්නේ යසි; වුත්තා, වදාරණ ලදී. [එක් වචනින් දෙසුයේ සු දෙසුයේ ම වෙයි. දෙතුන් වචනින් කම් නැති.]

275. කති පාචිත්තියානි-සබ්බානි නානා වත්ථුකානි
කති වාචාය දෙසෙය්‍ය-වුත්තා ආදිච්චබන්ධුනා

276. නව පාචිත්තියානි-සබ්බානි නානා වත්ථුකානි
එක වාචාය දෙසෙය්‍ය-වුත්තා ආදිච්චබන්ධුනා

277. කති පාචිත්තියානි-සබ්බානි නානා වත්ථුකානි
කිඤ්චි කිත්තෙත්වා දෙසෙය්‍ය-වුත්තා ආදිච්චබන්ධුනා

278. පඤ්ච පාචිත්තියානි-සබ්බානි නානා වත්ථුකානි
වත්ථුං කිත්තෙත්වා දෙසෙය්‍ය-වුත්තා ආදිච්චබන්ධුනා

279. කති පාචිත්තියානි-සබ්බානි නානා වත්ථුකානි
කිඤ්චි කිත්තෙත්වා දෙසෙය්‍ය-වුත්තා ආදිච්චබන්ධුනා

280. නව පාචිත්තියානි-සබ්බානි නානාවත්ථුකානි
වත්ථුං කිත්තෙත්වා දෙසෙය්‍ය-වුත්තා ආදිච්චබන්ධුනා

---

275–276 මෙනි. 276–නව පාචිත්තියානි, පචිති නවයක්; [නව ප්‍රණීත භොජනයන් සම්බන්ධ නව යයි] එකවාචාය, [**අහං භන්තෙ නව පණීත භොජනානි විඤ්ඤාපෙත්වා භුඤ්ජිත්වා නව ආපත්තියො ආපන්නො; තා තුම්හමූලෙ පටිදෙසෙමි**' යන] එකම වචනයෙන්; දෙසෙය්‍ය, දෙසන්නේ යයි -පෙ- [එවිට සියල්ල දෙසූ යේ වෙයි.]

277. කිඤ්චි කිත්තෙත්වා, කුමක් කීර්තනය කොට; දෙසෙය්‍ය, දෙසන්නේ යයි -පෙ-

278-වත්ථුං කිත්තෙත්වා, [‘අහං භන්තෙ **පඤ්ච භෙසජ්ජානි පටිග්ගහෙත්වා සත්තාහං අතික්කාමෙසිං යථාවත්ථුකා තා තුම්හ මූලෙ පටිදෙසෙමි**' යනුවෙන්] වස්තුව කීර්තනය කොට; දෙසෙය්‍ය-[එකල දෙසූ යේ ම වෙයි. ඇවතෙහි නාමග්‍රහණයෙන් කම් නැති.]

279. පෙර සේ මැයි-280-**නව පාචිත්තියානි විඤ්ඤාපෙත්වා භුඤ්ජිත්වා යථා වත්ථුකං, තා තුම්හමූලෙ පටිදෙසෙමි** යනුවෙන්] වස්තුකීර්තනය කොට; දෙසය්‍ය, ආදිච්චබන්ධුනා වුත්තා, -දෙ-

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

**281.** යාව තතියකෙ කති ආපත්තියො-කති වොහාර පච්චයා
ඛාදන්තස්ස කති ආපත්තියො-කති භොජන පච්චයා

**282.** යාව තතියකෙ තිස්සො ආපත්තියො-ඡ වොහාර පච්චයා
ඛාදන්තස්ස තිස්සො ආපත්තියො-පඤ්ච භොජන පච්චයා

---

**281.** යාව තතියකෙ, යාව තතියකාපත්තීහු; කති, කෙතෙක් ද? වොහාර පච්චයා, වාගව්‍යවහාර හෙතුවෙන්; කති, ඇවැත් කීයක් සිදු වේ ද ? ඛාදන්තස්ස, කන්නහුට; කති ආපත්තියො ඇවැත් කීයක් ද? භොජන පච්චයා, භොජන හෙතුවින්; කති, ඇවැත් කීයක් සිදු වේ ද?

**282** යාව තතියකෙ, තුන්වෙනි වර කීම් අවසානයෙහි; තිස්සො ආපත්තියො, [උක්ඛිත්තානුවත්තක භික්ෂුණියට පරිජි ද, භෙදකානුවර්තකයන්ට සඟවෙසෙස් ද, ලාමක දෘෂ්ටිය නො දුරලන්නහුට පචිතිද්‍ද යි ] ඇවැත් තුනකි; වොහාර පච්චයා, වාගව්‍යවහාර හෙතුවෙන්; ඡ, [ආජීවය හෙවත් දිවිරැක ගැණීම පිණිස ලාමක අදහස් ඇත්තේ තමා කෙරෙහි නැති උතුරුමිනිස් දම් ප්‍රකාශ කරන්නහුට පරිජි ද, ආජීව හෙතුවෙන් සඤ්චරිත්තයෙහි හැසිරෙන්නහුට සඟවෙසෙස් ද; ආජීව හෙතුවෙන් ‘‘යමෙක් නුඹගේ විහාරයෙහි වසයි නම් හෙතෙම ප්‍රථම ධ්‍යානයට පැමිණියේය යි යනාදීන් පර්‍යාය කථා කියන්නහුට තුලසි ද ආජීවය හේතු කොට ගෙණ තමා පිණිස ප්‍රණීත බොජුන් විනවා වළඳන්නහුට පචිති ද, එවැනි වූම භික්ෂුණියට පාටිදෙසනීය ද, තමා පිණිස සූප ව්‍යඤ්ජනාදිය විනවා වළඳන්නහුට දුකුළා ද යි ] ඇවැත් සයකි; ඛාදන්තස්ස, කන්නහුට; තිස්සො ආපත්තියො, [මනුෂ්‍ය මාංසානුභවයෙහි තුලසි ද, සෙසු නවවිධ වූ අකැප මස් බුදීමෙහි දුකුළා ද, භික්ෂුණියක් සුදු ලුහුණු වැළඳීමෙහි පචිති ද යි ] ඇවැත් තුනකි; භොජන පච්චයා, බොජුන් හෙතුවින්; පඤ්ච, [තොමෙ‍ර් කෙලෙසුන් ගෙන් තෙත්ව සිට කෙලෙසුන්ගෙන් තෙත් වූ පුරුෂයකු අතින් භොජනය පිළිගැන්මෙහි සඟවෙසෙස් ද, මනුෂ්‍ය මාංසානුභවයෙහි තුලසි ද , සුදු ලුහුණු වැළඳීමෙහි පචිති ද, තමා පිණිස විනවා ගත් ප්‍රණීත භොජනයක් වැළඳීමෙහි පාටිදෙසනිය ද, සෙසු අකැප මස් එක් කොට අනා වැළඳීමෙහි දුකුළාද්‍ද යි] ඇවැත් පසක් වේ.

283. සබ්බා යාවතතියකා-කති ඨානානි ගච්ඡන්ති
කත්තනඤ්චෙව ආපත්තියො-කතීනං අධිකරණෙන ච

284. සබ්බා යාවතතියකා-පඤ්චඨානානි ගච්ඡන්ති
පඤ්චන්නං චෙව ආපත්ති-පඤ්චන්නං අධිකරණෙන ච

285. කතීනං විනිච්ඡයො හොති-කත්තනං වූපසමෙන ච
කතීනඤ්චෙව අනාපත්ති-කතීහි ඨානෙහි සොභති

---

283, සබ්බා යාවතතියකා, සියලු යාවතතියකාපත්තීහු; කති ඨානානි, කී තැනකට; ගච්ඡන්ති, යෙත් ද? කතීනං, කී දෙනෙකුන්ට; ආපත්තියො, ඇවැත් වෙත් ද? අධිකරණෙන ච, අධිකරණය ද; කතීනං, කී දෙනෙකුන්ට ද?

284. සබ්බා යාවතතියකා, සියලු යාවතතියකාපත්තීහු; පඤ්ච ඨානානි, [උක්ඛිත්තානුවත්තක භික්ෂුණියට තුන් යළක් සමනුභාසනය කිරීමෙහි දී ඤත්තියෙහි දුකුළා ද, කර්‍මවාක්‍ය දෙකකින් තුලසි ද, කර්‍මවාක්‍යාවසානයෙහි පරිජි ද සඞ්ඝ භෙදය පිණිස තැත් කිරීමේ දී සඟවෙසෙස් ද, ලාමික දෘෂ්ටි නුදුරලීමෙහි පචිතිද යි මෙසේ] පස් තැනකට; ගච්ඡන්ති, යෙත්; ආපත්ති, ඇවැත් නම්; පඤ්චන්නං, පස්සහදම්යන්ට වේ; [භික්ෂු, භික්ෂුණී, සාමණෙර, සාමණෙරී, සික්ඛමානා යන මොව්හු පස් සහදම්යෝ නම් වෙත්. ඔවුනතුරෙන් නිෂ්පයණීය වශයෙන් භික්ෂු, භික්ෂුණී යන දෙදෙනාට ම ඇවැත් වේ. සාමණෙර, සාමණෙරී, සික්ඛමානා යන තිදෙනාට ඇවැත් නැති. අකැප හෙයිනි. එබැවින් භික්ෂූන් කරණ ලෙස ඔවුන් ලවා ඇවැත් නො දෙස විය යුතු වේ. දඬුවම් පමණක් ම ඔවුන්ට කට යුතුයි] අධිකරණෙන ච, යුක්ති විචාරණ සඞ්ඛ්‍යාත අධිකරණය; පඤ්චන්නං, යථොක්ත පස් සහදම්යන්ට ම වේ. [පස් සහදම්යන් ගේ'අධිකරණ' නම් පා සිවුරු ආදිය පිළිබඳ වූ විනිශ්චය ව්‍යවහාරය යි. ගිහින්ගේ වනාහි නොයෙක් කොලාහලාදිය සම්බන්ධ නඩු අධිකරණ යයි කියනු ලැබේ]

285. කතීනං, කී දෙනෙකුන්ගේ නොහොත් කී දෙනෙකුන්ට; විනිච්ඡයො හොති, යුක්ති විචාරණය වේ ද? කතීනං, කී දෙනෙකුන්ට; වූපසමෙන ච, අධිකරණයන් සංසිඳුනේ වේ ද? කතීනං ච, කී දෙනෙකුන්ට; අනාපත්ති, ඇවැත් නො වේ ද?; කතීහි ඨානෙහි, කරුණු කීයකින්; සොභති, හොබී ද?.

286. පඤ්චන්නං විනිච්ඡයො හොති-පඤ්චන්නං වූ 'පසමෙන ච
පඤ්චන්නංඤ්ච අනාපත්ති-තීනි ඨානෙහි සොභති

287. කති කායිකා රත්තිං-කති කායිකා දිවා
නිජ්ඣායන්තස්ස කති ආපත්තියො-කති පිණ්ඩපාත පච්චයා

288. ද්වෙ කායිකා රත්තිං ද්වෙ කායිකා දිවා
නිජ්ඣායන්තස්ස එකා'පත්ති-එකා පිණ්ඩපාත පච්චයා

---

286. විනිච්ඡයො, අධිකරණ විනිශ්චය; පඤ්චන්නංහොති, පඤ්සහදූම්යන්ට වේ; පඤ්චන්නං, පස් සහදූම්යන්ට; වූපසමෙන ච, අධිකරණය සංසිඳුනේ වෙයි; අනාපත්ති, ඇවැත් නොවීම ද; පඤ්චන්නං ච එව, පස් සහදූම්යන්ට ම ය; තීනි ඨානෙහි, සඞ්ඝ, ගණ, පුද්ගල යන තුන් කරුණින්; සොභති, හොබී. [කරණ ලද ශික්‍ෂා ව්‍යතික්‍රමණය ඇති පුද්ගල තෙමේ පිළියම් සහිත ඇවැත සඞ්ඝ ගණ පුද්ගලයන් විෂයයෙහි ප්‍රකාශ කොට යළි පිරිසිදුවන්නේ වේ. එහෙයින් මෙසේ කීහ]

287. රත්තිං, රාත්‍රියෙහි සිදුවන්නා වූ; කායිකා; කාය වාරිකාපත්තීහු; කති, කෙතෙක්ද? දිවා, දහවල් සිදුවන්නා වූ; කායිකා, කාය වාරිකා පත්තීහු; කති, කෙතෙක් ද; නිජ්ඣායන්තස්ස, බලන්නහුට; කති ආපත්තියො, ඇවැත් කීයක් ද? පිණ්ඩපාත පච්චයා, පිඬු පිළිගැණීම් හෙතුවින්; කති, කෙතෙක් ඇවැත් සිදුවෙත් ද?

288. රත්තිං, රාත්‍රියෙහි සිඩ වන්නා වූ; කායිකා, කායිකා පත්තීහු; ද්වෙ, [භික්ෂුණියක් රැ අඳුරෙහි පුරුෂයෙකුගේ අත් පස සිටීමය, හිඳීමය, හොවීමය, යනාදියෙහි පචිති ද, අත් පසින් දුරුව සිටීමාදියෙහි දුකුළාදු යි] දෙදෙනෙකි; දිවා, දව හල් සිදුවන්නා වූ; කායිකා, කායිකාපත්තීහු; ද්වෙ, [භික්ෂුණියක් දහවල් ප්‍රතිච්ඡන්න වූ රහස්‍යාවරණයට යොග්‍ය ස්ථානයෙක්හි පුරුෂයකුගේ අත්පස සිටීමෙන් පචිති ද, අත්පසින් දුරුව සිටීමෙන් දුකුළාදු යි ]දෙදෙනෙකි; නිජ්ඣායන්තස්ස, අසවල් තැන ඇතැ යි බලන්නහුට; එකාආපත්ති, [''න භික්ඛවෙ රත්තෙන මාතුගාමස්ස අඞ්ගජාතං උපනිජ්ඣා යි තබ්බං යො උපනිජ්ඣායෙය්‍ය ආපත්ති දුක්කටස්ස' යි ප්‍රඥප්ත හෙයින් ]එක දුකුළා ඇවැතකි; පිණ්ඩපාත පච්චයා, පිඬු පිළිගැණීම් හෙතුවින්; එකා,

289\. කත්‍ය'ාිසංසෙ සමපස්සං-පරෙසං සඩාය දෙසයෙ
උක්ඛිත්තකා කති වුත්තා-කති සම්මා පවත්තනා

290\. අඨා'නිසංසෙ සමපස්සං-පරෙසං සඩාය දෙසයෙ
උක්ඛිත්තකා තයො වුත්තා-තෙචත්තාරීස සම්මා වත්තනා

291\. කති ඨානෙ මුසාවාදො-කති පරමන්ති වුච්චති
කති පාටිදෙසනියා කතිනං දෙසනාය ච

---

[''න භික්ඛුවෙභික්ඛද්‍යයි කාය මුඛං ඔලොකෙත බ්බං'' යන මෙහි] එක දුකුළා ඇවැතකි; [ යටත් පිරිසෙයින් කැඳ හෝ ව්‍යඤ්ජන දෙන්නා වූ සාමණේරයක්හුගේ ද මුහුණ නො බැලිය යුතුයි. බලා නම් දුකුළා වේ] *

289\. කති ආනිසංසෙ, කොතෙක් අනුසස්; සමපස්සං, දක්නේ; පරෙසං,මෙරමාහට;සඩාය,ශ්‍රද්ධායෙන්; දෙසෙයෙ, ඇවැත දෙසන්නේ ද; උක්ඛිත්තකා, උක්ඛිත්තක පුඟුලෝ;කති,කි දෙනෙක් යයි; වුත්තා, වදාරණ ලද්දෝ ද? සම්මා පවත්තනා, උක්ඛිත්තකයන් විසින් වත්වල මනාව පැවතීම්; කති, කෙතෙක් ද?

290\. අඨානිසංසෙ, කොසමබක්ඛන්ධකයෙහි කියන ලද අෂ්ටවිධ ආනිසංසයන් ; සමපස්සං, දක්නේ; පරෙසං, මෙරමා හට; සඩාය, ශ්‍රද්ධායෙන්; දෙසයෙ, ඇවත දෙසන්නේය; (උ. ෆ බලනු) උක්ඛිත්තකා, උක්ෂෙපණීය කර්මය කරණු ලැබූ පුඟුලෝ; තයො වුත්තා, [ **ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකො, ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්ත කො පාපිකාය දිඨියා අප්පටිනිස්සග්ගෙඋක්ඛිත්තකො** යනුවෙන්] තිදෙනෙකැයි කියන ලදහ; සම්මාපවත්තනා, මනාව පැවතීම්; තෙ චත්තරීසා, තෙ සාළිසෙකි.

291\. මුසාවාදො, මුසාවාදය තෙමේ, කති ඨානෙ, සථාන කීයකට යන්නේ වේ ද? පරමං, පරම ශබ්දයෙන් කාල නියමය කරණ ලද්දහු; කති, කෙතෙක් යයි; වුච්චති, කියනු ලැබේ ද? පාටිදෙසනියා, පාටිදෙසනියයෝ; කති, කෙතෙක් ද? කතීනං, කී දෙනෙකුන්ට; දෙසනාය ච, වරද දෙසීම් වෙත් ද?

---

* ඇතැම් ආචාර්‍යවරු භික්ෂූණී පරිපාචිත පිණ්ඩපාත සෙහි පචිති ඇවැත ගණිත්

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

292. පඤ්චඨානෙ මුසාවාදෙ-චුද්දස පරමං'ති වුච්චති
චා දස පාටිදෙසනියා-චතුන්නං දෙසනාය ච

293 කතඞ්ගිකො මුසාවාදෙ කති උපොසථඞ්ගානි
කති දූතෙය්‍යඞ්ගානි-කති තිත්ථිය වත්තනා

294. අට්ඨඞ්ගිකො මුසාවාදෙ-අට්ඨ උපොසථඞ්ගානි
අට්ඨ දූතෙය්‍යඞ්ගානි-අට්ඨ තිත්ථිය වත්තනා

---

292. මුසාවාදෙ, මුසාවාදය තෙම; පඤ්චඨානෙ, **පරිජ් ජගවෙසෙස්, තුලසි, පචිත්, දුකුලා** යන පස් තැනකට යන්නේ වේ; පරමං, පරමං යනුවෙන් කාල නියමය කරණ ලද්දහු; චුද්දස ඉති, "**දසාහ පරමං අතික්කාමෙය්‍ය** යනාදීන් තුදුසකි; (උ. ග්‍ර. බ. )පාටිදෙසනියා, පාටිදෙසනියයෝ; වාදස, භික්ෂූන් පිළිබඳ සතරෙක, භික්ෂුණීන් පිළිබඳ අටකැයි දොළසෙකි; චතුන්නං, සතරදෙනෙකුන්ගේ; අච්චයදෙසනාය ච, වරද දෙසීම් වෙත්. [එනම්: [1] (බුදුන් මරණු පිණිස) **දෙව්දත්තු** විසින් යොදන ලද දුනුවායන්ගේ වරද දෙසීමය,:-[2] **අනු රුධ** තෙරුන්ගේ **උපාසිකාවගේ** වරද දෙසීමය:-[3] **වඩ්ඪලිච්ඡවි** හුගේ වරද දෙසීමය :-[4] **වඞ්ග ගාමිය** නම් තෙරුන්ට **උක්ඛෙපණීයකම්මය** කොට ආ භික්ෂූන්ගේ වරද දෙසීමය යන මේ යි]

293 මුසාවාදෙ, මුසාවාදය තෙමේ; කති අඞ්ගිකො, **කතෙක්** අඞ්ග ඇත්තේ ද? උපොසථඞ්ගානි, උපොසථාඞ්ගයෝ, **කති,** කොතෙක් ද? දූතෙය්‍යඞ්ගානි, දූතාඞ්ගයෝ; කති, කොතෙක් ද? තිත්ථියවත්තනා, **සමීඥ** ශාසනොපසම්පදාව කැමැති අන්‍ය තීර්ථකයන් විසින් පිරිය යුතු වත්; කති, කොතෙක්ද?

294. මුසාවාදෙ, මෘෂාවාදය තෙමේ; අට්ඨඞ්ගිකො, ["**පුබ්බෙ, ච'ස්ස හොති මුසා භණිස්සං'ති, භණන්තස්ස හොති මුසා භණාමී'ති, භණිතස්ස හොති මුසා මයා** භණිත'න්ති, විනිධාය දිට්ඨිං විනිධාය ඛන්තිං, **විනිධාය රුචිං, විනිධාය භාවං, විනිධාය ඡන්දං"** යනුවෙන් ] අටඟක් ඇත්තේ වේ; උපොසථඞ්ගානි, උපොසථාඞ්ගයෝ; අට්ඨ, අට දෙනෙකි.

295. කති වාචිකා උපසම්පදා කතීනං පච්චුට්ඨාතබ්බං
කතීනං ආසනං දාතබ්බං-භික්ඛුනොවාදකො කතීහි

---

[ඔහුනම් :–

“පාණං න හානෙ නචදින්න මාදියෙ
මුසා න භාසෙ න ච මජ්ජපො සියා
අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා
රත්තිං න භුඤ්ජෙය්‍ය විකාල භොජනං
මාලං න ධාරෙ න ච ගන්ධමාචරෙ
මඤ්චෙ ඡමායංව සයෙථ සන්ථතෙ
එතඤ්හි අට්ඨඞ්ගික මාහු'පොසථං
බුද්ධෙන දුක්ඛන්ත ගුණා පකාසිතං”

යන මොවිහු යි ]

දූතෙය්‍යඞ්ගානි, දූත භික්ෂුව කෙරෙහි පිහිටිය යුතු අඞ්ගයෝ; අට, [“ඉධ භික්ඛවෙ භික්ඛු සොතා ච හොති, සාවෙතා ච, උග්ගහෙතා ච, ධාරෙතා ච, විඤ්ඤාතා ච, විඤ්ඤාපෙතා ච, කුසලො ච සහිතාසහිතස්ස, න ච කලහකාරකො” යනුවෙන්] අට දෙනෙකි; තිත්ථියවත්තනං, තීර්ථකයන් විසින් පිළිපැදිය යුතු වත්; අට, [“නාතිකාලෙ ගාමප්පවෙසනා, නාතිදිවා පටික්කමනා, න වෙසිය ගොචරතා, සබ්‍රහ්මචාරීනං කිච්චෙසු දක්ඛතා, උද්දෙසාදිසු තිබ්බච්ඡන්දතා, තිත්ථියානං අවණ්ණෙ භණිතෙ අත්තමනතා, බුද්ධාදීනං අවණ්ණෙ භණිතෙ අනත්තමනතා, තිත්ථියානං වණ්ණභණිතෙ අනත්තමනතා, බුද්ධාදීනං වණ්ණභණිතෙ අත්තමනතා” යනුවෙන් අටෙකි.

295. උපසම්පදා, භික්ෂූණීන්ගේ උපසම්පදා තොමෝ; කති වාචිකා, කොතෙක් වාක්‍යයන්ගෙන් යුක්ත වන්නී ද? කතීනං, කී දෙනෙකුන්ට; පච්චුට්ඨාතබ්බං, දැක හුනස්නෙන් නැඟිටිය යුතු ද? කතීනං, කී දෙනෙකුන්ට; ආසනං, අසුන; දාතබ්බං, දියයුතු ද? භික්ඛුනොවාදකො, භික්ෂුණ්‍යවවාදක මහණ තෙමේ; කතීහි, (අඞ්ග) කීයකින් යුක්ත විය යුතුද?

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

296. අට්ඨවාචිකා උපසම්පදා–අට්ඨන්නං පච්චුට්ඨාතබ්බං
අට්ඨන්නං ආසනං දාතබ්බං–භික්ඛුනොවාදකො අට්ඨහි

---

296. උපසම්පදා, භික්ෂුණීන්ගේ උපසම්පදා තොමෝ; අට්ඨවාචිකා, [භික්ෂූන් කෙරෙහි ඤත්තිචතුත්ථක කර්ම වාක්‍යය, භික්ෂුණීන් කෙරෙහි ඤත්ති චතුත්ථක කර්මවාක්‍යය යනු වශයෙන්] අෂ්ට වාක්‍යයකින් යුක්තවන්නීය; අට්ඨන්නං, ["**අනුජානාමි භික්ඛවෙ භත්තග්ගෙ අට්ඨන්නං භික්ඛුනීනං යථා වුඩ්ඪං අවසෙසානං යථා ගතිකං,** යනුවදාළ හෙයින්] භත්තාග්‍රයෙහි දී වැඩිමහළු පිළිවෙළින් භික්ෂුණීන් අට දෙනෙකුට; පච්චුට්ඨාතබ්බං, දැක හුනස්නෙන් නැඟිටිය යුතුයි; අට්ඨන්නං, වැඩිමහළු පිළිවෙළින් භික්ෂුණීන් අටදෙනෙකුට; ආසනං, අසුන්; දාතබ්බං, සෙසු භික්ෂුණීන් විසින් දිය යුතුයි; [මේ දෙතැන්හි දීම භික්ෂුණීන් අටදෙනෙකු කෙරෙහි පමණක් වැඩිමහළු පිළිවෙළ සලකන්ට කියන ලද්දේ භත්තාග්‍රයෙහි දී පමණෙකි. වෘද්ධපරිපාටියෙන් අට දෙනෙකු වාඩිගත් පසු සෙසු භික්ෂුණීන්ට පැමිණි පැමිණි පිළිවෙළින් අසුන් ගැණීම වටී. **"අඤ්ඤත්‍ර සබ්බත්‍ර යථා වුඩ්ඪං න පටිබාහිතබ්බං; යො පටිබාහෙය්‍ය ආපත්ති දුක්කටස්ස"** යනු වදාළ හෙයින් සිවු පස බෙදීමාදියෙහි දී වැඩිමහළු පිළිවෙළ ඉක්ම වන්නියන්ට දුකුළා වේ] භික්ඛුනොවාදකො, භික්ෂුණ්‍යවවාදක භික්ෂු තෙමේ; අට්ඨහි, [(1) **සීලවා හොති පාතිමොක්ඛ සංවර සංවුතො විහරති ආචාර ගොචර සම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු;** (2) බහුස්සුතො **හොති සුතධරො සුත සන්නිචයො යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙ කල්‍යාණා පරියොසාන කල්‍යාණා සාත්ථං සව්‍යඤ්ජනං කෙවල පරිපුණ්ණං බ්‍රහ්මචරියං අභිවදන්ති තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා (3) උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො, (4) කල්‍යාණවාචො හොති කල්‍යාණ වාක්කරණො (5) යෙභුය්‍යෙන භික්ඛුනීනං පියො හොති මනාපො (6) පටිබලො හොති භික්ඛුනියො ඔවදිතුං, (6)න ඛො පනෙතං භගවන්තං**

297. කතීනං ඡෙජ්ජං හොති-කතීනං ථුල්ලච්චයං
කතීනඤ්චෙව අනාපත්ති- සබ්බෙසං එක වත්ථුකා

298. එකස්ස ඡෙජ්ජං හොති-චතුන්නං ථුල්ලච්චයං
චතුන්නං චෙව අනාපත්ති-සබ්බෙසං එක වත්ථුකා

299 කති ආඝාතවත්ථූනි කතීහි සඞ්ඝො භිජ්ජති
කතෙ'ත්ථ පඨමා පත්තිකා-ඤත්තියා කරණා කති

---

උද්දිස්ස පබ්බජිතාය කාසායවත්ථවසනාය ගරුධම්මං අජ්ඣාපන්න පුබ්බො හොති, (ඍ) වීසති වස්සො වා හොති අතිරෙක වීසති වස්සො වා" යන ] අටගින් යුක්ත විය යුතුයි]

297. සබ්බෙසං, සියල්ලවුන්ට; එකවත්ථුකා, සඞ්ඝභෙද සඞ්ඛ්‍යාත එකම වස්තුවක් ඇත්තී ද; [එබඳු වූ ] කතීනං, කී දෙනෙකුන්ට; ඡෙජ්ජං, පාරාජිකාව; හොති, වේ ද? කතීනං, කී දෙනෙකුන්ට; ථුල්ලච්චයං, තුලැසි වේ ද? කතීනඤ්ච එව, කී දෙනෙකුන්ට ම; අනාපත්ති, ඇවැත් නො වේ ද?

298. සබ්බෙසං, සියලු දෙනාහට; එකවත්ථුකා, සඞ්ඝභෙද සඞ්ඛ්‍යාත එක ම වස්තුවක් ඇත්තී ද; [ එබඳු වූ] එකස්ස, නව දෙනෙකුන් අතුරෙන් යමෙක් සලාක ගන්වා සඞ්ඝයා බිඳී නම් ඒ එක් කෙනාහට; ඡෙජ්ජං හොති, ඡෙදාපත්තිය වෙයි. හෙවත් හෙතෙම දෙව්දත්හු මෙන් පරිජි ඇවැතට පැමිණෙයි; චතුන්නං, භෙදකානුවර්තක සතර දෙනාහට; ථුල්ලච්චයං, තුලැසි වේ; [කොකාලිකාදීන්ට මෙනි ] චතුන්නං ච එව, ඉතිරි ධම්මවාදී සතර දෙනාහට; අනාපත්ති, ඇවැත් නො වේ.

299. ආඝාත වත්ථූනි, ආඝාත වස්තූහු; කති, කෙතෙක් ද? කතීහි, කී දෙනෙකුන්ගෙන්; සඞ්ඝො, සඞ්ඝ තෙමේ; භිජ්ජති, බිඳේ ද? එත්ථ, මෙහි; පඨමාපත්තිකා, ප්‍රථමාපත්තිකයෝ; කති, කෙතෙක් ද? ඤත්තියා කරණා, ඤත්තියෙන් කටයුතු කර්මයෝ; කති, කෙතෙක් ද?

300. නව ආඝාතවත්ථූනි–නවහි සඞ්ඝො භිජ්ජති
නවෙ'ත්ථ පඨමා පත්තිකා–ඤත්තියා කරණා නව

301, කති පුග්ගලා නා'භිවාදෙතබ්බා–අඤ්ජලි සාමීචෙන ච
කතීනං දුක්කටං හොති–කති චීවර ධාරණා

302. දස පුග්ගලා නාභිවාදෙතබ්බා-අඤ්ජලි සාමීචෙන ච
දසන්නං දුක්කටං හොති–දස චීවර ධාරණා

---

300. ආඝාත වත්ථූනි, ආඝාත වස්තූහු; නව, "**අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති**" යනාදී වශයෙන් නවයක් වෙත්; නවහි, [**"නවන්නං වා උපාලි අතිරෙක නවන්නං වා සඞ්ඝ රාජී චෙව හොති සඞ්ඝභෙදො ච" යනු** වදාළ හෙයින් ] භික්ෂූන් නව දෙනෙකුන්ගෙන්; සඞ්ඝො, සඞ්ඝතෙමේ; භිජ්ජති, බිඳෙයි; එත්ථ, මෙහි; පඨමාපත්තිකා, ප්‍රථමාපත්තිකයෝ; නව, නව දෙනෙකි; ඤත්තියා කරණා, ඥප්තියෙන් කටයුතු කර්මයෝ; නව, නවදෙනෙකි.

301. කති පුග්ගලා, කෙතෙක් පුද්ගලෝ; න අභිවාදෙතබ්බා, නො වැන්ද යුත්තෝ ද? අඤ්ජලිසාමීචෙ න ච, (කෙතෙක් දෙනෙකුන්ට) අඤ්ජලි කර්‍මසහිත සාමීචි කර්‍ම නො කට යුතු ද? චීවර ධාරණා, අතිරෙක සිවුරු දැරීම්; කති, කෙතෙක් ද?

302 දසපුග්ගලා, [පෙර උපසපන් භික්ෂුව විසින් පසුව උප සපන් භික්ෂුව ද, උපසපන් භික්ෂුව විසින් හෙරණහු ද, අධර්‍ම වාදී වෘද්ධ නානාසංවාසකයා ද, මාගම ද, පණ්ඩකයා ද, පිරිවෙස් පුරන්නා ද, මූලායපටිකස්සනාර්හයා ද, මානත්තට සුදුස්සා ද, මානත්හි හැසිරෙන්නා ද, අබ්භානාර්හයා ද යන] දස පුද්ගලෝ; න අභිවාදෙතබ්බා, නො වැන්ද යුත්තාහු; අඤ්ජලි සාමීචෙන ච, පැන් පිළිවිසීම, පවන් සැලීම, ඡත්‍රග්‍රහණාදී සාමීචිකර්‍ම සහිත ඇඳිලි බැඳීම ද ඔවුන්ට නො කට යුතුයි; දසන්නං, ඒ නොවැඳිය යුතු පුද්ගලයන් දසදෙනාට වැඳීමාදි වත් කරණ දස දෙනාහට; දුක්කටං හොති, දුකුලා වේ; චීවර ධාරණා, අතිරෙක සිවුරු දැරීම; දස, දිනක් පමණක් වෙති.

303\. කතීනං වස්සං වුත්ථානං–දාතබ්බං ඉධ චීවරං
කතීනං සන්තෙ දාතබ්බං–කතීනං චෙව න දාතබ්බං

304\. පඤ්චන්නං වස්සං වුත්ථානං–දාතබ්බං ඉධ චීවරං
සත්තන්නං සන්තෙ දාතබ්බං–සොළසන්නං න දාතබ්බං

305\. කති සතං රත්ති සතං–ආපත්තියො ඡාදයිත්වාන
කති රත්තියො වසිත්වාන–මුච්චෙය්‍ය පාරිවාසිකො

306\. දසසතං රත්තිසතං–ආපත්තියො ඡාදයිත්වාන
දස රත්තියො වසිත්වාන–මුච්චෙය්‍ය පාරිවාසිකො

---

303\. වස්සං වුත්ථානං, වැස නිම වූ වස් ඇති; කතීනං, කී දෙනෙකුන්ට; ඉධ, මෙහි; චීවරං, සිවුරු; දාතබ්බං, දියයුතු ද; කතීනං, කීදෙනෙකුන් අතුරෙන්; සන්තෙ, සුදුසු ප්‍රතිග්‍රාහක යෙකු ඇති කල්හි; දාතබ්බං, දිය යුතු ද? කතීනං, කී දෙනෙකුන්ට; න දාතබ්බං, නොදිය යුතු ද?

304\. වස්සං වුත්ථානං, විසූ වස් ඇති; පඤ්චන්නං, පස් සහ ධර්මියන්නට; ඉධ, මෙහි; චීවරං, සිවුරු; දාතබ්බං, සම්මුඛයෙහි දීම දිය යුතුයි; සත්තන්නං, [දිසාපක්කන්ත උම්මත්තක, ඛිත්තචිත්ත, වේදනාට්ට යන සිවු දෙනා සහිත ත්‍රිවිධ උක්ඛිත්ත පුද්ගලයෝ දූ සි යන]සත්දෙනා හට; සන්තෙ, සුදුසු ග්‍රාහකයෙකු විද්‍යමාන කල්හි දාතබ්බ පරාඞ්මුඛයෙහි දූ දිය යුතුයි; සොළසන්නං, පණ්ඩකාදී සෙසු සොළොස් දෙනා හට; න දාතබ්බං, සිවුරු නොදිය යුතුයි.

305\. රත්තිසතං, රාත්‍රි සියයක් තුළ දී; කති සතං ආපත්තියො, කී සියයක් ඇවැත්; ඡාදයිත්වාන, සඟවා; පාරිවාසිකො, පිරිවෙස් වසන තැනැත්තේ, කති රත්තියො, කී රැයක්; වසිත්වාන වැස; මුච්චෙය්‍ය, මිදෙන්නේ ද?

306\. රත්ති සතං,රාත්‍රි සියයක් තුළ දී; දස සතං ආපත්තියො, ඇවැත් දහසක්; ඡාදයිත්වාන, සඟවා; පාරිවාසිකො, පිරිවෙස් වසන තැනැත්තේ; දස රත්තියො, දස රැයක්; වසිත්වාන, වැස; මුච්චෙය්‍ය, මිදෙන්නේය; [යමෙකුට සඟවෙසෙස් ඇවැත් සිය යක් දස දවසක් පටිච්ඡන්න වී තිබේ. තව සියයක් දස දිනක් පටිච්ඡන්න වී තිබේ. තවත් සියයක් දස දවසක් පටිච්ඡන්න වී තිබේ. මෙ පරිද්දෙන් දස දවසකට සියය බැගින් දස වරක්

## විනය ගාථාණි ව්‍යාඛ්‍යාව.

307. කති කම්මදෙසා වුත්තා–බුද්ධෙනාදිච්චබන්ධුනා
චම්පායං විනය වත්ථුස්මිං–සබ්බෙ අධම්මිකා කතා

308. චා දස කම්මදෙසා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා
චම්පායං විනය වත්ථුස්මිං–සබ්බෙ ච ධම්මිකා කතා

309. කති කම්ම සම්පත්තියො වුත්තා–බුද්ධෙනාදිච්චබන්ධුනා
චම්පායං විනය වත්ථුස්මිං–සබ්බෙ ච ධම්මිකා කතා

---

ඇවැත් ප්‍රතිච්ඡන්න වී තිබේ. එවිට දින සියයක දී ඇවැත් දහ කට පැමිණ තිබේ. නමුත් ඔහු ඒවා සඟවා තිබෙනුයේ දස දවස කට සියය බැගින් දස රාත්‍රියක් තුළ දී බැවින් දස දවස් දහයම එක දස දවසක් කොට ඒ දස දවස පිරිවෙස් විසිය යුතුයි. එවිට එක දසදවසින් දවස් සියයක දී පැමිණ සිටි ඇවැත් දහසෙන් මිදෙන්නේය යනු එලිනාවී යි ]

307 සබ්බෙ, සියල්ලෝ ම; අධම්මිකා කතා, අධාර්මික වූ; කති කම්මදෙසා, කෙතෙක් කර්ම විපත්තීහු; ආදිච්ච බන්ධුනා බුද්ධෙන, ආදිත්‍යබන්ධු වූ බුදුන් විසින්; චම්පායං, චම්පා නම් නුවර; විනය වත්ථුස්මිං, විනය වස්තුවෙහි දී; වුත්තා, වදාරණ ලද්දාහු ද?

308 චම්පායං, චම්පා නුවර; විනය වත්ථුස්මිං, විනය වස්තු යෙහි; ආදිච්ච බන්ධුනා බුද්ධෙන, සූර්‍ය්‍ය බන්ධු වූ බුදුන් විසින්; සබ්බෙච, සියල්ලෝ ම; අධම්මිකා කතා, අධාර්මික වූ; චාදස කම්මදෙසා, [අපලොකන කම්ම, ඤත්ති කම්ම, ඤත්ති දුතිය කම්ම, ඤත්ති චතුත්ථ කම්ම යන සතර කර්මයන් එකක් එකක් අධම්මෙන වග්ග-අධම්මෙන සමග්ග – ධම්මෙන වග්ග යන තුන් තුන් ආකාරයෙකින්] දොළසක් කර්ම විපත්තීහු; වුත්තා, වදාරණ ලදහ.

309. චම්පායං, චම්පා නුවර; විනය වස්තුයෙහි; සබ්බෙච, සියල්ලෝ ම; ධම්මිකා කතා, ධාර්මික වූ; කති කම්ම සම්පත්ති යො, කර්ම සම්පත්තීහු කෙතෙක්; ආදිච්චබන්ධුනා බුද්ධෙන, සූර්‍ය්‍යබන්ධු වූ බුදුන් විසින්; වුත්තා, වදාරණ ලද්දාහු ද?

310. එතසෙසා සමපත්තියො වුත්තා-බුඉඩනාදිච්චබන්ධුනා
චම්පා ්‍ය ං විනය වත්ථුසම්ා-සබ්බෙ ච ධම්මිකා කතා

311. කති කම්මානි වුත්තානි-බුඩෙනාදිච්චබන්ධුනා
චම්පායං විනයවත්ථුසම්ං-ධම්මිකා අධම්මිකා කති

312. ඡ කම්මානි වුත්තානි-බුඩෙනාදිච්චබන්ධුනා
චම්පායං විනය වත්ථුසම්ං-එකෙත්ථ ධම්මිකා කතා
පඤ්ච අධම්මිකා වුත්තා-බුඩෙනාදිච්චබන්ධුනා

313. කති කම්මානි වුත්තානි-බුඩෙනාදිච්චබන්ධුනා
චම්පායං විනය වත්ථුසම්ං-ධම්මිකා අධම්මිකා කති

---

310. එතසෙසා සමපත්තියො, **අපලොකන**, **ඤත්ති**, **ඤත්ති දුතිය**, **ඤත්තිචතුත්ථ** යන සතර සමපත්තීහු; වුත්තා, වදාරණ ලදහ.

311. ආදිච්චබන්ධුනා බුඩෙන, සූය්‍ර්‍යබන්ධු වූ බුදුරජානන් වහන්සේ විසින්; චම්පායං, චම්පා නුවර; විනය වත්ථුසම්ං, විනය වස්තුයෙහි; කති කම්මානි, කෙතෙක් කර්මයෝ; වුත්තානි, වදාරණ ලද්දාහු ද; ධම්මිකා, ධාර්මික වූ වෝ; කති, කෙතෙක් ද? අධම්මිකා කති, අධාර්මික වූවෝ කෙතෙක් ද?

312. ආදිච්චබන්ධුනා බුඩෙන, සූය්‍ර්‍යබන්ධු වූ බුදුරජානන් වහන්සේ විසින්; චම්පායං, චම්පා නම් නුවර; විනය වත්ථුසම්ං, විනය වස්තුයෙහි; ඡ කම්මානි, [අධර්මයෙන් කරණ වර්‍ගකර්මය අධර්මයෙන් කරණ සමගග කර්මය, ධර්මප්‍රතිරූපකයා විසින් කරණ වර්‍ගකර්මය, ධර්මප්‍රතිරූපකයා විසින් කරණ සමගග කර්මය, ධර්මයෙන් කරණ වර්‍ග කර්මය; ධර්මයෙන් කරණ සමගග කර්ම යයි] කර්ම සයක්; වුත්තානි, කථිතයහ; එත්ථ, මෙහි; එකා, ධර්මයෙන් කරණ සමගග කර්මය යන එකම කර්මය; ධම්මිකා කතා, ධාර්මික යයි ප්‍රකාශිත යි; ආදිච්ච බන්ධුනා බුඩෙන, සූය්‍ර්‍යබන්ධු වූ බුදුන් විසින්; පඤ්ච, ඉතිරි කර්ම පස; අධම්මිකා වුත්තා, අධාර්මික යයි වදාරණ ලදහ.

313 මෙය 309 මෙනි.

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

314. චත්තාරි කම්මානි වුත්තානි-බුද්ධෙනාදිච්චබන්ධුනා
චම්පායං විනය වත්ථුස්මිං-එකෙ'ත්ථ ධම්මිකා කතා
තයො අධම්මිකා වුත්තා-බුද්ධෙනාදිච්චබන්ධුනා

315. * යානි දෙසිතා'නන්තජිනෙන තාදිනා-
ආපත්තික්ඛන්ධානි විවෙක දස්සිනා
කතෙ'ත්ථ සම්මන්ති විනා සමථෙහි-
පුච්ඡාමි තං බ්‍රෑහි විභඞ්ග කොවිද!

---

314. චත්තාරි කම්මානි, [**"අධම්මෙන වග්ගකම්මං, අධම්මෙන සමග්ගකම්මං, ධම්මෙන වග්ගකම්මං, ධම්මෙන සමග්ගකම්මං"** යී ] කර්ම සතරක්; වුත්තානි, වදාරණ ලදහ; එත්ථ, මෙහි; එකා, **ධම්මෙන සමග්ගකම්මං** යන එක ම කර්මය; ධම්මිකා කතා, ධාර්මික යයි ප්‍රකාශ කරණ ලදි; ආදිච්ච බන්ධුනා බුද්ධෙන, සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජානන් වහන්සේ විසින්; තයො, ඉතිරි කර්ම තුන; අධම්මිකා වුත්තා, අධර්ම කර්මයෝ යයි වදාරණ ලදහ.

315. අනන්තජිනෙන, නිවන් අරමුණු කොට අපමණ කෙලෙසුන් දිනූ හෝ අන්තයක් නොපෙණෙන නිර්වාණය අවබොධ කළා වූ; නොහොත් අනන්ත දෙව් බඹ මිනිසුන් නිවන් දක්වූ; තාදිනා, ඉෂ්ටානිෂ්ටාරම්මණයෙහි එකාකාර පැවතුම් ඇත්තාවූ; විවෙකදස්සිනා, තදඞ්ගාදී පඤ්චවිධ විවෙකය හෝ කායචිත්තොපධිසංඛ්‍යාත ත්‍රිවිධ විවෙකය දුටුවා වූ; (සර්වඥයන් වහන්සේ විසින්;) දෙසිතා, දෙසන ලද්දා වූ; යානි ආපත්තික්ඛන්ධානි, යම් බඳු ඇවැත් කඳු කොතෙක් වෙත් ද; එත්ථ, මෙහි; කති, කෙතෙක් ඇවැත්; සමථෙහි විනා, සමථයන්ගෙන් තොරව; සම්මන්ති, සංසිඳෙත් ද; (යන මෙය) විභඞ්ග කොවිද උභය විභඞ්ගයෙහි දක්ෂ තැනැත්තව! තං, තා; පුච්ඡාමි, විචාරමි; බ්‍රෑහි, එය කියව.

---

* යාං දෙසිතා-ස.

316 * යානි දෙසිතා අනන්තජිනෙන තාදිනා-
ආපත්තික්ඛන්ධානි විවෙක දස්සිනා
එකෙ'ත්ථ සම්මති විනා සමථෙහි -
එතන්තෙ අක්ඛාමි විභඞ්ග කොවිද!

317. කති ආපායිකා වුත්තා-බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොම තෙ

---

316 එත්ථ, මෙහි; එකො, එකම **සම්මුඛා** විනය නොහොත් එකම පාරාජිකාපත්ති**ස්කන්ධ**ය; සමථෙහි විනා, සමථයන්ගෙන් තොරව; **සම්මති**, සං **සිඳෙයි**; (යන) එතං, මෙය; විභඞ්ග කොවිද, විභඞ්ගයෙහි **දක්ෂ** ප්‍රාඥය; තෙ, ඔබට; **අක්ඛාමි**, කියමි; [“**එකෙත්ථ සම්මති විනා සමථෙහි**” යන මෙහි අදහස පිළිබඳව මත දෙකක් වේ. ස්පතාපත්ති**ස්කන්ධ**යන් අතුරෙන් එක ම ඇවැත කුදු **සමථයන්ගෙන්** තොරව සං **සිඳෙන්නේ** නො වේ. නමුත් සමථ සයත් අධිකරණ සතරත් යන මේ **සියලු** ධර්මයෝ ‘**සම්මුඛා විනය**’ සමග **එක්** වීමට යෙත් හෙවත් සං **සිඳෙත්. සම්මුඛා විනය** වනාහි **සමථයන්ගෙන්** තොරව **සං** සිඳෙයි, අනික් සමථයන්ගෙන් තොරව ‘**සම්මුඛාවිනය**’ යාගේ නො නිපදීමක් නැත. **එබැවින්** “**එකෙ'ත්ථ සම්මති විනා සමථෙහි**” යන මෙහින් ගත යුතු ‘එක’ නම් ‘**සම්මුඛාවිනය**’ නමැයි අර්ථකථාවන්හි කියන ලදි බුද්ධඝොසාචාර්‍ය්‍යපාදයෝ වනාහි ‘**එකෙත්ථ සම්මති විනා සමථෙහි**’ යන්නෙහි ‘**විනා**’ නිපාතයෙහි ප්‍රතිෂෙධාර්ථ මාත්‍රය ගෙණ එකම **පාරාජිකාපත්තිස්කන්ධය** පමණක් සමථයන් හැර සන් සිඳේ යයි කීහ. ස්වකීය මතයට නිදර්ශන වශයෙන් උන්වහන්සේ “**යා සා ආපත්ති අනවසෙසා සා ආපත්ති න කතමෙන අධිකරණෙන කතමම්හි ඨානෙ න කතමෙන සමථෙන සම්මති**” යන පාඨය **දක්වති** ]

317 ආදිච්චබන්ධුනා, සූර්‍ය්‍යබන්ධු වූ; බුද්ධෙන, බුදුන් විසින්; කති, කීදෙනෙක්; ආපායිකා; අපාය භාගී වන්නෝ යයි; වුත්තා, වදාරණ ලද්දාහු ද? විනයං පටිජානන්තස්ස, විනය දනිමි යි ප්‍රතිඥා කරන්නාවූ; තෙ, ඔබගේ; විසයානි, [මේ පැනය පිළිබඳ ] අදහස්; සුණොම, අසම්හ.

---

* යාංදෙසිතා.

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

318. ඡ ඌනා දියඩ්ඪසතා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා
ආපායිකා නෙරයිකා–කප්පට්ඨා සඞ්ඝභෙදකා
විනයං පටිජානන්තස්ස–විසයානි සුණොහි මෙ

319. කති නාපායිකා වුත්තා–බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පාටිජානන්තස්ස–විසයානි සුණොම තෙ

320. අට්ඨාරස නාපායිකා වුත්තා–බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස–විසයානි සුණොහි මෙ

---

318. ආදිච්චබන්ධුනා බුද්ධෙන, සූර්‍ය්‍යබන්ධු වූ බුදුන් විසින්; ආපායිකා, අපාය භාගී වන්නෝ යයි; නේරයිකා, නිරය ගති ඇත්තාහු යයි; කප්පට්ඨා, කල්පයක් පැසෙන්නාහු යයි; වුත්තා, වදාරණ ලද්දු වූ; සඞ්ඝභෙදකා, සඞ්ඝභෙදක පුද්ගලයෝ; ඡ ඌනා දියඩ්ඪසතා, සයක් අඩු එක්සිය පණසෙකි;(ඒ මෙසේයි:) **"ඉධ උපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, තස්මිං අධම්ම දිට්ඨි භෙද අධම්මදිට්ඨි, තස්මිං අධම්ම දිට්ඨි භෙදෙ ධම්මදිට්ඨි, තස්මිං අධම්මදිට්ඨි භෙදෙ වෙමතිකො, තස්මිං ධම්මදිට්ඨි භෙදෙ අධම්ම දිට්ඨි, තස්මිං ධම්මදිට්ඨිභෙදෙ වෙමතිකො, තස්මිං වෙමතික භෙදෙ අධම්මදිට්ඨි, තස්මිං වෙමතික භෙදෙ ධම්මදිට්ඨි, තස්මිං වෙමතික භෙදෙ වෙමතිකො"** යනුවෙන් අෂ්ටාදශ භෙදකර වස්තූන් අතුරෙන් එකඑකක අට අට දෙනා බැගින් සඞ්ඝභෙදකක්ඛන්ධකයෙහි විස්තර කරණ ලදී. එවිට සියල්ලම ( 18 × 8 = 144 ) එක් සිය සුසාළිසෙකි ] විනයං පටිජානන්තස්ස, විනය දනිමි යි ප්‍රතිඥා කරන්නා වූ; මෙ, මාගේ; විසයානි, අදහස්; සුණොහි, (මෙසේ) අසව.

319. කති, කීදෙනෙක්; න ආපායිකා, අපාය භාගී නොවන්නෝ යයි; වුත්තා, වදාරණ ලද්දේ ද;-

320. න ආපායිකා, අපාය භාගී නො වන්නෝ; අට්ඨාරස, [**"ඉධ උපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, තස්මිං ධම්මදිට්ඨි භෙදෙ ධම්මදිට්ඨි, අවිනිධාය දිට්ඨිං අවිනිධාය ඛන්තිං අවිනිධාය රුචිං අවිනිධාය භාවං අනුස්සාවෙති සලාකං ගාහෙති අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං ඉමං ගණ්හථ ඉමං රොචෙථා ති; අයම්පි ඛො උපාලි සඞ්ඝභෙදකො න ආපායිකො**

321. කති අට්ඨකා වුත්තා-බුද්ධේනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොම තෙ

322. අට්ඨාරසට්ඨකා වුත්තා-බුද්ධේනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොහි මෙ

323. කති කම්මානි වුත්තානි-බුද්ධේනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොම තෙ

324. සොළස කම්මානි වුත්තානි-බුද්ධේනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොහි මෙ

325 කති කම්මදොසා වුත්තා-බුද්ධේනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොම තෙ

326. ද්වාදස කම්මදොසා වුත්තා-බුද්ධේනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොහි මෙ

327. කති කම්මසම්පත්තියො වුත්තා-බුද්ධේනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොම තෙ

328. චතස්සො කම්මසම්පත්තියො වුත්තා-බුද්ධේනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොහි මෙ

---

**න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො"** යනුවෙන් එක එක භෙදකර වස්තුවෙහි එක එකතු කොට සඞ්ඝභෙදකක්ඛන්ධාවසානයෙහි කියනලද] අටලොස් දෙනා යයි; වුත්තා, වදාරණ ලදහ.

321. අට්ඨකා, අෂ්ටකයෝ හෙවත් අට බැගින් වූවෝ; කති, කෙතෙක් ද?

322. අට්ඨකා, අෂ්ටකයෝ හෙවත් අට බැගින් වූවෝ; අට්ඨාරස, අටලොසකි; [එක්සිය සුසාළිස් පුඟුලන් විස්තර කිරීමේදී උදෙසූ පරිදියි]

## විනය ගාථා සහ ව්‍යාඛ්‍යාව.

329. කති කම්මානි වුත්තානි-බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොම තෙ

330. ඡ කම්මානි වුත්තානි-බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොහි මෙ

331. කති කම්මානි වුත්තානි බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොම තෙ

332. චත්තාරි කම්මානි වුත්තානි-බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ

333. කති පාරාජිකා වුත්තා-බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොම තෙ

334. අට්ඨ * පාරාජිකා වුත්තා-බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොහි මෙ

335. කති සඞ්ඝාදිසෙසා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ

336. † තෙවීස සඞ්ඝාදිසෙසා වුත්තා-බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොහි මෙ

337. කති අනියතා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොම තෙ

338. ද්වෙ අනියතා වුත්තා-බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොහි මෙ

339. කති නිස්සග්ගියා වුත්තා-බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොම තෙ

340. ද්වෙ චත්තාරීස නිස්සග්ගියා වුත්තා-බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොහි මෙ

---

**340. භික්ෂු භික්ෂුණීන්ට ප්‍රඥප්ත නිසගි පචිති 60 න් උභය සාධාරණ 18 අහක් කළ විට මුළුගණන 42 කි.**

---

* භික්ෂු භික්ෂුණීන්ට සාධාරණ සතරත් භික්ෂුණීන්ට පමණක් සාධාරණ සතරත් යන අටයි.

† භික්ෂු භික්ෂුණී උභය පක්ෂයට සාධාරණ යන දෙපක්ෂයටම පණවන ලද 30 න් අහක් කළ විට මුළු සඟවෙසෙස් 23 කි.

341. කති / ාචිත්තියා වුත්තා-බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොම තෙ

342. අඩ්ඪාසීති සතං පාචිත්තියා වුත්තා-බුද්ධෙනාදිච්ච බන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොහි මෙ

343. කති පාටිදෙසනීයා වුත්තා-බුද්ධෙනාදිච්ච බන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොම තෙ

344 ද්වාදස පාටිදෙසනීයා වුත්තා-බුද්ධෙනාදිච්ච බන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොහි මෙ

345. කති සෙඛියා වුත්තා-බුද්ධෙනාදිච්ච බන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොම තෙ

346. පඤ්චසත්තති සෙඛියා වුත්තා-බුද්ධෙනාදිච්චබන්ධුනා
විනයං පටිජානන්තස්ස-විසයානි සුණොහි මෙ

347. යාවසුපුච්ඡිතං තයා-යාව සුවිස්සජ්ජිතං මයා
පුච්ඡාවිස්සජ්ජනාය වා-නත්ථි කිඤ්චි අයුත්තක'න්ති

**දුතිය ගාථා සඞ්ගණිකං නිට්ඨිතං.**

——//——

---

342. භික්ෂූන්ට ප්‍රඥප්ත 92 හා භික්ෂුණීන්ට ප්‍රඥප්ත 166 ද යි යන 258 ශුද්ධ පචිති සඞ්ඛ්‍යාවෙන් උභය සාධාරණ 78 අඩු කළ කල්හි මුළු ශුද්ධපචිති 180 කි.

343. භික්ෂූන්ට පණවන ලද 4 හා භික්ෂුණීන්ට පණවන ලද අටත් යන සියල්ල 12 කි.

347. තයා ඔබ විසින්; යාව, යම්තාක්; සුපුච්ඡිතං, මොනවට විචාරණ ලද්දේ ද; මයා, මා විසින්; යාව, යම්තාක්; සුවිස්සජ්ජිතං, මොනවට විසඳන ලද්දේ ද; (ඒතාක් ම) පුච්ඡාය, ප්‍රශ්න ඇසීමෙහි හෝ; විස්සජ්ජනාය වා, විසඳීමෙහි හෝ; කිඤ්චි අයුත්තකං, කිසියම් අයුත්තක්; නත්ථි, නැත්තේය. [පුච්ඡා විස්සජ්ජනයන් ඉතා මනායයි යූ සේයි]

**ද්විතීය ගාථාසඞ්ගණිකාඨී ව්‍යාඛ්‍යාව නිමි.**

348. අසංවාසො භික්ඛුහි ච-භික්ඛුනීහි ච සම්භොගො
එකච්චො තහිං න ලබ්භති-අවිප්පවාසෙන අනාපත්ති
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

349. * අවිස්සජ්ජිකං අවෙභඞ්ගිකං-පඤ්ච වුත්තා මහෙසිනා
විස්සජ්ජෙන්තස්ස පරිභුඤ්ජන්තස්ස-අනාපත්ති
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

---

348. භික්ඛුහි ච, භික්ෂූන්හා ද; භික්ඛුනීහිච, භික්ෂුණීන්හා ද; අසංවාසො, පොහෝ පවුරුණු ආදී සංවාසය නැත්තාවූ; එකච්චො, එක් තැනැත්තෙක් වෙයි; තහිං, ඒ පුඟුලා කෙරෙහි; සම්භොගො, නැහැවීම් පිළිදුගුම් ඇ ඇනුදත් කිස මීස අන් මෙවුන්දම් ආදි අකප්පිය සම්භොගයෙක්; න ලබ්භති, නොලැබේ; (එතකුදු උවත්) අවිප්පවාසෙන, සහාගාර සෙය්‍යාවෙන්; අනාපත්ති, ඇවැත් නොවේ; එසා පඤ්හා, මේ ප්‍රශ්නය; කුසලෙහි, විනයඥයන් විසින්; චින්තිතා, සිතනලද්දේය; [මෙයින් කියන ලද්දේ දරක මාතුභික්ඛුනියගේ පුත්‍රයායි. භික්ෂුණියකට දරුවෙක් උපන. ස්වශක්තියෙන් කෑම් පීම් නෑම් ආදිය කරන්ට සමර්ථවන තුරු ඔහු පොෂ්‍යය කටයුතුයයි බුදුහු වදාළෝ. දරුවා පොෂ්‍ය කරණ භික්ෂුණියට තනිව විසිය නුහුණු හෙයින් භික්ෂුණීහු ඈට දෙවැනි භික්ෂුණියක් දුන්හ. ඒ භික්ෂුණීන් දෙදෙනා සමග දරුවා ද එක් නිවෙස්නක වෙසේ. භික්ෂූන් හා භික්ෂුණීන් සමග ද සංවාසය රහිත තැනැත්තේ නම් මේ දරුවායි. දරුවා නෑවීම් කැවීම් පෙවීම් සැරසීමාදිය මවුභික්ෂුණිය විසින් කට යුතු. දෙවැනි භික්ෂුණිය විසින් සහාගාර සෙය්‍යාව හැර සෙසු තැන්හි අන් පුරුෂයෙකු කෙරෙහි මෙන් ඒ දරුවා කෙරෙහි පිළිපැදිය යුතු. අකැප සම්භොගයක් කරන්ට නොලැබේ. සහාගාර සෙය්‍යාවෙහි (එනම් පුත්‍රයා හා එකගෙයි විසීමෙහි) භික්ෂුණීන් දෙදෙනාට ම ඇවැත් නැති] (පඤ්හා මෙසා, යනු ලිඞ්ග විපය්‍යාස වශයෙන් කීයේයි )

349 මහෙසිනා, මහර්ෂිවූ බුදුරජානන් වහන්සේ විසින්; පඤ්ච, ගරු බඩු පසක්; අවිස්සජ්ජිකං, පුද්ගලයන්ට නොදීම් වශයෙන් වියදම් නොකට යුතු යයි ද, අවෙභඞ්ගිකං, සඞ්ඝ ගණ පුද්ගලයන් විසින් නො බෙදිය යුතු යයි ද; වුත්තා, වදාරණ ලදහ; (එතකුදු උවත්) විස්සජ්ජෙන්තස්ස, දෙන්නහුටද; පරි

---

* අවිස්සජ්ජියං අවෙභඞ්ගියං -ස- අවිස්සජ්ජිකා-අවෙභංගියා-ගැ-

350\. දස පුග්ගලෙ න වදාමි-එකාදස විවජ්ජිය
බුද්ධං වන්දන්තස්ස ආපත්ති පඤ්හාමෙසා කුසලෙහි
චින්තිතා

351\. න උක්ඛිත්තකො නව පන පාරිවාසිකො
න සඞ්ඝභින්නකො නව පන පක්ඛ සඞ්කන්තො
සමාන සංවාස භූමියා ඨිතො
කථන්නු සික්ඛාය අසාධාරණො සියා
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

---

භුඤ්ජන්තස්ස, ඉසුරුඬ පරිභොග කරන්නහුට ද; අනාපත්ති, ඇවැත් නොවේ; එසා පඤ්හා, මේ ප්‍රශ්නය; කුසලෙහි, විනයඥයන් විසින්; චින්තිතා, සිතන ලද්දීය; (මෙහි අවෙභඬියිය බඩු දෙන්නහුට ඇවැත් නොවේ යන්නෙහි අදහස නම් දුර්භික්ෂයෙහි සෙනසුන් රක්නා පිණිස ගරුබඩු තවත් ගරුබඩු හා මාරු කිරීම් වශයෙන් දෙන්නහුට ඇවැත් නොවේ යනුයි. එසේ දී මාරු කරගත් දෙය පරිභොග කිරීමෙහිදු ඇවැත් නැති ඒබව සෙනාසන රක්ඛණත්ථාය විස්සජ්ජෙත්වා පරිභුඤ්ජිතුං වට්ටති යි කීහු- මේ සම්බන්ධ විස්තරසමන්තපාසාදිකා චූ පා. 319 පිට බලා දතයුතු.)

**350.** දසපුග්ගලෙ, (සෙනාසනක්ඛන්ධකයෙහි කියන ලද) අනුපසම්පන්නාදී දශවිධ අවන්දිය පුද්ගලයන් ගැන; න වදාමි, නො කියමි; එකාදස විවජ්ජිය, මහාඛන්ධකයෙහි කියනලද පණ්ඩකාදී එකොළොස් වර්ජනීය පුද්ගලයන් ගැනද නො කියමි; බුද්ධං වන්දන්තස්ස, වෘද්ධභික්ෂුව වඳින්නහුට; ආපත්ති, ඇවැත් වේ; එසා පඤ්හා-පෙ-(නග්න භික්ෂුව මෙයින් කථිතයි)

**351.** [යම් භික්ෂුවක් තෙමේ] න උක්ඛිත්තකො, උත්ක්ෂෙපණීය කර්මය නො කරණ ලද්දේ; නව පාරිවාසිකො, පිරිවෙස් වසන්නෙක් ද නොවන්නේ; න සඞ්ඝභින්නකො, සඞ්ඝභෙදකයෙක් නොවන්නේ; නව පන පක්ඛසඞ්කන්තො, තීර්ථායතනයකට ද නො ගියේ; (මෙසේ) සමාන සංවාස භූමියා, භික්ෂූන් හා සමාන සංවාසක භූමියෙහි; ඨිතො, සිටියේම; සික්ඛාය, ශික්ෂාවෙන්; කථන්නු, කෙසේ නම්; අසාධාරණො සියා, අසමාන වන්නේ ද? එසා පඤ්හා = මේ ප්‍රශ්නය

352. උපෙති ධම්මං පරිපුච්ඡමානො කුසලං අත්ථූපසංහිතං
න ජීවති න මතො න නිබ්බුතො
තං පුග්ගලං කතමං වදන්ති බුද්ධා
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

353. උබ්භක්ඛකෙ න වදාමි අධො නාභිං විවජ්ජිය
මෙථුනධම්ම පච්චයා කථං පාරාජිකො සියා
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

---

නහාපිත පුබ්බක (=කරනැවැමිකුලයෙන් මහණවූ) භික්ෂුව සඳහා කියන ලදි. සෙසු සබ්‍රහ්මචාරීහු ක්ෂුරභාණ්ඩ පරිහරණය කිරීමට ලබතත් මේ භික්ෂුවට ඒ නො ලැබෙයි. පරිහරණය කෙරේනම් ආපත්ති කරවේ. එහෙයින් හෙතෙම ශික්ෂාවෙන් අසාධාරණයි.

352 අත්ථූපසංහිතං, අර්ථයෙන් (වැඩින්) යුක්ත වූ; කුසලං ධම්මං, කුශල ධර්මයන්; පරිපුච්ඡමානො, පිළිවිසින්නේ; උපෙති, පිරිසට එළඹෙන්නේ වේ ද; (හෙතෙම) න ජීවති, ජීවත් නොවෙයි; න මතො, මෙළේත් නො වෙයි; (එතකුදු උවත්) න නිබ්බුතො, පිරිනිවියේ නො වෙයි; බුද්ධා, බුදුවරයෝ; තං පුග්ගලං, ඒ පුඟුලා; කතමං, කවරෙකැයි; වදන්ති, කියත් ද? එසා පඤ්හා: පෙ- මේ ප්‍රශ්නය නිර්මිත බුදුන් සඳහා කියනලදි.

353. උබ්භක්ඛකෙ, අකු ඇටයෙන් මත්තෙහි; න වදාමි; මෛථුන ධර්මයක් ගැන නො කියමි; මෙයින් මුවෙහි මෙවුන් දම් අභාවය ප්‍රකාශිතයි) * අධොනාභිං, නැබින් යට ද; විවජ්ජිය, හැර; † (මෙයින් වච්චමග්ගපස්සාවමග්ගයන්හි මෛථුනා භාවය දර්ශිතයි) (එනම් නැබින් උඩ අකුඇටින් යට) මෙථුනධම්ම පච්චයා, මෛථුන ධර්ම හෙතුවින්; කථං පාරාජිකො සියා, කෙසේ ඔහු පාරාජික වන්නේ ද?-මෙයින් ලයෙහි ඇස් හා මුව ඇති (හිස් සුන්) කවන්ධ ශරීර ඇත්තහු කියනලදී. [කංසීසංඅක්ඛොරහිතො අස්සාති කවන්ධො යනු විග්‍රහයි.]

---

* උබ්භක්ඛකෙනවදාමීති ඉමිනා මුඛෙ මෙථුන ධම්මා භාවං දීපෙති- සාර—බු.

† අධොනාභිං විවජ්ජියාති ඉමිනා වච්චමග්ග පස්සාව මග්ගෙසු-සාර-බු

354. භික්ඛු, සඤ්ඤාචිකාය කුටිං කරොති-අදෙසිතවත්ථුකං
පමාණාතික්කන්තං
සාරම්භං අපරික්කමනං අනාපත්ති-පඤ්හාමෙසා
කුසලෙහි චින්තිතා

355. භික්ඛු සඤ්ඤාචිකාය කුටිං කරොති-දෙසිතවත්ථුකං
පමාණිකං
අනාරම්භං සපරික්කමනං ආපත්ති-පඤ්හාමෙසා
කුසලෙහි චින්තිතා

356. *න කිඤ්චි කායිකං පයොගමාචරෙ-න චාපි වාචාය
පරෙ භණෙය්‍ය
ආපජ්ජෙය්‍ය ගරුකං ඡෙජ්ජවත්ථුං-පඤ්හාමෙසා කුසලෙහි
චින්තිතා

---

354. භික්ඛු, මහණතෙම; සඤ්ඤාචිකාය, වෑ පොරෝ ආදී ස්වයං යාචිත උපකරණයෙන්; අදෙසිත වත්ථුකං, නොදෙසූ කුටිවත් ඇති; පමාණාතික්කන්තං, පමණ ඉක්මවූ; සාරම්භං, කිපිල්ලිකාසයාදි [=කුරු පහළ වල්] උපද්‍රව සහිත වූ; අපරික්කමනං, ගොණුන් යෙදූ ගැළකට නො යා හැකි බැවින් උපචාර රහිතවූ; කුටිං, කිළියක්; කරොති, කෙරේ ද; අනාපත්ති, (ඕහට එයින්) ඇවැත් නොවේ; එසා-පෙ- මේ ප්‍රශ්නය **කාණ කෙවෙනි කළ කිළිය** සඳහා කථිතයි. (විස්තර-විනයාර්ථ කථා 333 පිට බලා දත යුතු.)

355. භික්ඛු, භික්ෂුතෙමේ; සඤ්ඤාචිකාය, වෑ පොරෝ ආදී ස්වයං යාචිත උපකරණයෙන්; දෙසිත වත්ථුකං, දෙසන ලද කුටිවත් ඇති; පමාණිකං, ප්‍රමාණවත් වූ; අනාරම්භං, කුහු කිපිල්ලිකාසයාදී උපද්‍රව රහිත වූ; සපරික්කමනං, ගොණුන් යෙදූ රියකට සිසාරා යා හැකි බැවින් උපචාර සහිත වූ; කුටිං, කිළියක්; කරොති, කෙරේ නම්; ආපත්ති, (ඒ හෙතුවින් ඔහුට) ඇවැත් වේ. මෙය **ධනිය කුම්භකාර තෙරුන්ගේ** වැනි සර්වමෘත්තිකාමය කුටිය සඳහා ප්‍රකාශිතයි.

356. කායිකං, කායික වූ; කිඤ්චි පයොගං, කිසියම් ප්‍රයොගයක්; නච ආචරෙ, නො කරන්නේය; වාචාය, වචනින්; පරෙ, අනුන්ට; නච අපි භණෙය්‍ය, කිසිවකුත් නො කියන්නේය; (එත

---

* කායිකං කිඤ්චි.

## විනය ගාථාණි ව්‍යාඛ්‍යාව.

357. න කායිකං වාචසිකඤ්ච කිඤ්චි-මනසාපි සතෙ *
න කරෙය්‍ය පාපං
සො නාසිතො කිඤ්චි සුනාසිතො භවෙ-පඤ්හාමෙසා
කුසලෙහි චින්තිතා

358. අනාලපන්තො මනුජෙන කෙනචි-වාචා ගිරං නොච
පරෙ භණෙය්‍ය
ආපජ්ජෙය්‍ය වාචසිකං න කායිකං-පඤ්හාමෙසා කුසලෙහි
චින්තිතා

---

කුදු උවත්) ගරුකං, විනය ගරුකවූ; ඡෙජ්ජ වත්ථුං, ඡේද්‍ය වස්තු සඞ්ඛ්‍යාත පාරාජිකාවට; ආපජ්ජෙය්‍ය, පැමිණෙන්නේය- මෙය වජ්ජ පටිච්ඡාදක භික්ෂුණිය අරභයා කීහ‍යි.

357. සතෙතා, සත්‍වයෙක් තෙමේ; කායිකං, කායිකවූ ද, වාචසිකං ච,වාචසික වූ ද;කිඤ්චි පාපං, කිසි පවක්; න කරෙය්‍ය, නොකරන්නේය;මනසා අපි, සිතිනුදු; පාපං, පවක්;න කරෙය්‍ය, නො කරන්නේය; සො, හෙතෙම්; නාසිතො, නසන ලද්දේ, කිඤ්චි, කුමක් හෙයින්; සුනාසිතො භවෙ, මොනවට නසන ලද්දේ වෙයි ද? – මේ ප්‍රශ්නය පණ්ඩකාදි එකොළොස් අභව්‍ය පුද්ගලයන් සඳහා කියන ලදී. ඔව්හු ගිහිභාවයෙහි සිටියාහුම පාරාජික නම් වෙත්. මේ ජාතියෙහි දී ඔව්හු පව් නො කළාහු නමුත් අතීතයෙහි කළ පවින් මේ දූහි පැවිදි බැව් ලැබිය නොහැකි ලෙස වස්තු විපන්න හෙයින් ගිහිව සිටියෝම සසුනෙන් පරාජිතයහ.

358. කෙනචි මනුජෙන, කිසියම් මිනිසකු සමග; අනාල පන්තො, කථා නො කරන්නේ; වාචා, වාචා යි සේ යි; ගිරං, වචනයක්; පරෙ, මෙරමාගව; නොහොත් මෙරමා හා; නො ච භණෙ, නො බිණන්නේ වේද; (එනකුදු උවත්) න කායිකං,කාය චාරික නො වූ; වචසිකං, වාග්චාරික ඇවැතකට; [මුසාදයෙන් ඇවතකට] ආපජ්ජෙය්‍ය, පැමිණෙන්නේය.–මේ පැනය පොහෝ පවුරුණු කරණ විට පිරිසිදු බැව් විචාරණ ලදුව තෙමේ සාපත්ති කව සිට සඟ මැද එය ප්‍රකාශ නො කොට තුෂ්ණීම්භූතවන භික්ෂුව සඳහා කියන ලදී. අකිරිය සමුට්ඨාන වශයෙන් වාගචාර යෙන් [දුකුළා] ඇවත නගී.

---

* සතෙතා

359. සික්ඛාපදා බුද්ධවරෙන වණ්ණිතා-සඞ්ඝාදිසෙසා *චතුරෝ භවෙය්‍යුං

ආපජ්ජෙය්‍ය එකපපයොගෙන සබ්බ-පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

360. උභො එකතො උපසම්පන්නා උභින්නං හත්ථතො චීවරං පටිග්ගණ්හෙය්‍ය

සියා ආපත්තියො නානා-පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

359. බුද්ධවරෙන, සම්බුදුරජාණන් වහන්සේ විසින්; වණ්ණිතා, වර්ණනා කරණ ලද්දාවූ හෙවත් පණවන ලද්දාවූ; සඞ්ඝාදිසෙසා සික්ඛාපදා, සඞ්ඝාදිසෙස ශික්ෂාපදයෝ; චතුරෝ භවෙය්‍යුං, සතරක් වන්නාහ; (ඔවුන්) සබ්බ, සියල්ලන්; එකප්පයොගෙන එව, එකම ප්‍රයොගයකින්; ආපජ්ජෙය්‍ය, යමෙක් තෙම අවදනේය.=මේ ප්‍රශනය:- අරුණොදගමනයෙහි අන්ගමකට තෙම ඇතුලත් නදියක පරතෙරට පැමිණි භික්ෂුණිය අරබයා කිපිතයි. ඕතොමෝ සිය ගමින් අලුයම නික්ම අරුණ නැඟෙන වේලෙහි උකත ප්‍රකාර නදී පරතෙරකට පැමිණි මාත්‍රයෙහිම රත්තිවිප්පවාස, ගාමන්තර, නදීපාර, ගණම්හා ඔහියන (ඔහියන) යන සතර ලක්ෂණයෙන් එක විටම සඟ වෙසෙස් සතරකට පැමිණෙන්නීය.

360 උභො, දෙදෙනෙක්; එකතො උපසම්පන්නා, එකෙකී පක්ෂයෙන් උප සපන්වූහ; උභින්නං, ඒ දෙදෙනාගේ; හත්ථතො, අතින්; චීවරං, සිවුරක්; පටිග්ගණ්හෙය්‍ය, යමෙක් පිළිගන්නේය; (ඔහුට) නානා ආපත්තියො සියා, වෙන් වෙන් ඇවැත් වන්නේය;- මෙය එකවර උපසපන්වූ මෙහෙණින් දෙදෙනකු අරභයා කිපිතයි. ඔවුනතුරෙන් භික්ෂූන් සමීපයෙහි එකවර උපසපන්වූ මෙහෙණක අතින් සිවුරක් ගන්නහුට පචිති ද භික්ෂුණින් සමීපයෙහි උප සපන්වූ මෙහෙණක අතින් ගන්නහුට දුකුලාං ද වෙයි.

* සඞ්ඝාදිසෙසා.

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

**361. චතුරො ජනා සංවිධාය-ගරුභණ්ඩං අවහරුං**
**තයො පාරාජිකා එකො න පාරාජිකො-පඤ්හාමෙසා**
**කුසලෙහි චින්තිතා**

**362. ඉත්ථි ච අබ්භන්තරෙ සියා-භික්ඛු ච බහිද්ධා සියා**
**ඡිද්දං තස්මිං ඝරෙ නත්ථි මෙථුනධම්ම පච්චයා**
**කථං පාරාජිකො හොති* පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා**

---

**361.** චතුරො ජනා, සතර දෙනෙක්; සංවිධාය, එක එකාට විධාන කොට ගෙණ; ගරු භණ්ඩං, ගරු බඩුවක්; අවහරුං, සොරා ගත්හ; (ඔවුනතුරෙන්) තයො, තිදෙනෙක්; පාරාජිකා, පාරාජික වූහ; එකො, එකෙක්; න පාරාජිකො, පරිජි නොවූයේය; මෙය:-සාහත්ථික ආණත්තික භෙදයෙන් කියන ලදී. ඇදුරුය, අතැවැසි තිදෙනෙක්ය යන සිවු දෙන මසු සයක් සොරකම් කිරීමට ඔවුනොවුන් විධාන කර ගත්හ. ඇදුරු තෙමේ 'බුද්ධරක්ඛිතය! තෝ එකක් ගණුව, සඞ්ඝරක්ඛිතය! තෝත් එකක් ගණුව, මම තුණක් ගණිමියි කී. බුද්ධරක්ඛිත තෙමේ ආචාර්‍ය්‍යයෙනි! ඔබ තුණක් ගණු මැනවි ධම්මරක්ඛිතය! තෝත් එකක් ගණුව, සඞ්ඝරක්ඛිතය තෝත් එකක් ගණුව, මමත් එකක් ගණිමියි කී. ධම්මරක්ඛිත සඞ්ඝරක්ඛිත දෙදෙනද බුද්ධරක්ඛිත කී නියායෙන්ම කීහ. මෙසේ බැණ ගෙණ එසේ කළෝය. මෙහි ඇදුරුතෙම සියතින් තුණක් ද ඇණවීමෙන් තුණක් ද සොරකම් කෙළේ වෙයි එබැවින් ඔහුට දෙයාකාරයෙන් ම පරිජි නොවේ. තුලසි වේ. ගෝලයෝ තිදෙන සියතින් එක එක බැගින් ද ඇණවීමෙන් පස පස බැගින් ද ගත්තෝ වූහ. එබැවින් ආණත්තික වශයෙන් ඔව්හු පාරාජිකාවට පැමිණියහ.-(සමන්තපාසාදිකා. 214 පිට බලනු.)

**362.** ඉත්ථිච, ස්ත්‍රියක් තොමෝත්; අබ්භන්තරෙ සියා, ඇතුළු ගෙයි සිටියාය; භික්ඛුච, භික්ෂුවක් තෙමේත්; බහිද්ධා සියා, ගෙයින් පිටත සිටියේය; තස්මිං ඝරෙ, ඒ ගෙහි; ඡිද්දං, සිදුරකුත්; නත්ථි, නැත; (මෙසේ ඇති කල්හි) මෙථුන ධම්ම පච්චයා, මෛථුන ධර්ම ප්‍රත්‍යයයෙන්; කථං, කෙසේ; පාරාජිකො හොති, පරිජි වේ ද?- මේ ගෙය වස්ත්‍රයෙන් වටකළ එකකි. ඇතුළත හා පිටත සිට වස්ත්‍රය ඇතුළට වැද ගැණීම් වශයෙන් මාර්ගයෙන් මාර්ගය ප්‍රවෙශ කරන්නහුට පරිජි වේ. මෙය මෙයින් සුව්‍යක්තය.

---

* සියා.

363. තෙලං මධුං ඵාණිතං චාපි සප්පිං-සාමං ගහෙත්වාන
නික්ඛිපෙය්‍ය
අවීති වත්තෙන සත්තාහෙ සති පච්චයෙ පරිභුඤ්ජන්තස්ස
ආපත්ති පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

364. * නිස්සග්ගියෙන ආපත්ති සුද්ධකෙන පාචිත්තියං
ආපජ්ජෙය්‍ය එකතො-පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

---

363 තෙලං, තල තෙල් ආදි තෙල්ය; මධුං, මීය; ඵාණිතං, උක් සකුරුය; අපි, යළි; සප්පිං, ගිතෙල්ය; (යන මේ ද්‍රව්‍යයන්) සාමං, තෙමේ; ගහෙත්වාන, පිළිගෙණ; නික්ඛිපෙය්‍ය, තබන්නේය; සත්තාහෙ, සත් දවස; අවීතිවත්තෙන, ඉකුත් නොවූ කල්හිම; [සතිය තුළදීම] පච්චයෙ සති, ප්‍රයොජනයක් ඇති කල්හි; පරිභුඤ්ජන්තස්ස, වළඳන්නහුට; ආපත්ති, ඇවැත් වේ,- මෙය:-ලිඞ්ග පරිවර්ත්තිතයන් අරබයා කථිතයි. උපක්‍රමාභාවයෙන් සිටිවනම ලිඟු පෙරළුන හොත් හෙවත් භික්ෂුවක් භික්ෂුණී භාවයට පැමිණිය හොත් ඒ තෙල් ආදී ප්‍රත්‍යය නැවත පිළිගත යුතුයි. ලිඞ්ග පරිවර්ත්තණයෙන් ප්‍රථම ප්‍රතිග්‍රහණය නැසෙන හෙයිනි. භික්ෂුණියක ගේ ලිඞ්ගාන්තර ප්‍රාදුර්භාවයෙහි දු මෙම නයයි(විස්තර-මු සමන්ත පාසාදිකා 160 බලා දතයුතු.)

364 නිස්සග්ගියෙන ආපත්ති, නිසගි පචිති ඇවැතට ද; සුද්ධකෙනපාචිත්තියං, සුධ පචිති ඇවැතට ද; එකතො, එකවර; ආපජ්ජෙය්‍ය, පැමිණෙන්නේය; -යම් භික්ෂුවක් තෙමේ සඟනට පිරිනැමූ සිවුරු වලින් "එකක් මට, අනික අසවලාට"යයි කියා දෙකක් එකවර පිරිනම්යි නම් ඔහුට තමහට පිරිනැමීමෙන් නිසගි පචිති ද; අනික් අයට පිරි නැමීමෙන් පචිති ද යි ඇවැත් දෙකක් එකවර සිදු වෙයි.-විස්තරාර්ථිහු සමන්තපාසාදිකා 436 පිට බලත්වා)

---

* ආපජ්ජන්තස්ස.

## විනයගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

365. භික්ඛූ සියා වීසතියා සමාගතා–කම්මං කරෙය්‍යුං
සමග්ගා සඤ්ඤිනො
භික්ඛු සියා වාදස යොජනෙ ඨිතො–කම්මඤ්ච තං
කුප්පෙය්‍ය වග්ග පච්චයා–පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

366. පදවීතිහාර මත්තෙන වාචාය භණිතෙන ච
සබ්බානි ගරුකානි සප්පටිකම්මානි චතුසට්ඨි ආපත්තියො
ආපජ්ජෙය්‍ය එකතො පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

367. නිවත්ථො අන්තර වාසකෙන දිගුණං සඞ්ඝාටි පාරුතො
සබ්බානි තානි නිස්සග්ගියානි හොන්ති–පඤ්හාමෙසා
කුසලෙහි චින්තිතා

---

365. භික්ඛූ, භික්ෂූහු; වීසතියා, විංශතියකින් වග්ග වූ වාහු; සමාගතා සියා, රැස්වූවෝ වන්නේය; සමග්ග සඤ්ඤිනො, සමගි සංඥ ඇත්තෝව; කම්මං, සඞ්ඝකර්මය ද; කරෙය්‍යුං, කරන්නාහ; භික්ඛු, අන්භික්ෂුවක්; වාදස යොජනෙ, දෙළොස් යොදුනකින් ඈත; ඨිතො සියා, සිටියේ වන්නේය. (එකල) වග්ග පච්චයා, වර්ගී හෙතුවින්; තං කම්මඤ්ච, ඒසඞ්ඝ කර්මයද; කුප්පෙය්‍ය, කොප්‍ය වන්නේය; – මේ ප්‍රශ්නය වනාහි දෙළොස් යොදුන් පමණ ඇති බරණැස් නුවර ආදිය වැනි විශාල ගම් පිළිබඳ ග්‍රාම සීමාව සඳහා කමිත වේ.

365. පදවීතිහාර මත්තෙන, පියවර ඉමක්ම වූ පමණින් ද; වාචාය, වචනයෙන්; භණිතෙන ච, බිණූ පමණින් ද; ගරුකානි, ගරු ක වූ; සප්පටි කම්මානි, පිළියම් සහිත වූ; සබ්බානි, සියලු; චතු සට්ඨි ආපත්ති යො, සූ සැටක් ආපත්තීන්ට; එකතො, එකවර ආපජ්ජෙය්‍ය, පැමිණෙන්නේය; – මෙය සඤ්චරිත්තය සඳහා කියන ලදි. යම් පුරුෂයෙක් තෙම අසුවල් පහයෙහි වසන සූ සැටක් කුමරියන්ට මාගේ පරිචාරිකාවුන් වන්ට කියවයි භික්ෂුව කට කියා ද ඔහු ගොස් එසේ කී කල්හි එකවිට සූ සැටක් සඟ වෙසෙස් වෙති - (විස්තරය සමන්තපාසාදිකා 324 පිට බලා දත් නේය.)

367. අන්තරවාසකෙන, හඳනා සිවුරෙන්; නිවත්ථො, වසන ලද්දේ; හෙවත්=හඳනය ඇන්දේ; සඞ්ඝාටි, සඟළ සිවුර; දිගුණං, තනිපට සිවුර හා එක්කිරීමෙන් ද්විගුණකොට; පාරුතො, පොර වන ලද්දේ ම; (ඒතුණ ම කයින් ඉවත්වූයේ) තානි සබ්බානි, ඒ

368. න චාපි ඤත්ති න ච කම්ම වාචා–න චේ'හි භික්ඛූති
ජිනො අවොච
සරණාගමණම්පි න තස්ස අත්ථි උපසම්පනෙනා උපසම්පදා
චාස්ස අකුප්පා–පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

369. ඉත්ථිං හනෙ න මාතරං–පුරිසඤ්ච න පිතරං හනෙ
හනෙය්‍ය අනරියං මන්දො තෙන වා'නන්තරං ඵුසෙ
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

---

සියලු සිවුරු; නිස්සග්ගියානි හොන්ති, නිසඟි වෙත්;– මෙය නො නෑ මෙහෙණක ලවා සිවුරු දෙවීම අරබයා කියන ලදි. තුන් සිවුරින් එකක තැවරුණු කපුටු වසුරු හෝ මඩ හෝ සේදීමට සිවුරු කොණ ගෙණ භික්ෂුණීන් සතු දියෙන් සෝධා ද එකල සිවුරු ඇගෙහි ඇතත් සියල්ල නිසඟි වෙත්.

368. ඤත්ති, අපි ඤත්තිය ද; න ච, නැත්තේය; කම්ම වාචා අපි, කර්ම වාක්‍යය ද; න ච, නැත්තේය; ජිනො, සර්‍වඥ තෙමේ; එහි භික්ඛු ඉති, 'එව මහණැ' යි; න අවොච, නොවදළේය; සරණාගමණං අපි, සරණාගමණයකුත්; තස්ස, ඔහට; න අත්ථි, නැත; (එතකුදු උවත්) උපසම්පනෙනා, උපසපන්ය; අස්ස, ඔහුගේ; උපසම්පදා ච, උපසපුව ද; අකුප්පා, අකොප්‍ය යි; [මේ ප්‍රශනය:– මහා ප්‍රජාපති ගෞතමියගේ අෂ්ටගරුධර්ම ප්‍රතිග්‍රහණය අරබයා කියන ලදී. (උපග්‍රන්ථය බැලිය යුතු) අෂ්ට ගරුධර්මයන් පිළිගත් කෙණෙහිම උපසම්පදාවෙහි පිහිටි නමුත් ඒ පිණිස ඤත්ති අනුශාවන කර්මවාක්‍යාදිය නො වීය. එහෙයින් මෙසේ කීහ.]

369 ඉත්ථිං, ස්ත්‍රිය; හනෙ, නසත්තේය; (එතකුදු උවත්) න මාතරං, මව නො වෙයි; පුරිසඤ්ච, පුරුෂයාද; හනෙ, නසත්තේය; (එත කුදු උවත්) න පිතරං, පියා නො වෙයි; මන්දො, අඥාන පුද්ගල තෙමේ; අනරියං, මෙසේ ආයර්‍ය වූ ස්ත්‍රිය හෝ පුරුෂයා;හනෙය්‍ය,නසත්තේය;තෙන, ඒ හෙතුවින්; ආනන්තරං, ආනන්තරිය කර්මය; ඵුසෙ,(ඔහු)සපර්ශ කරත්තේය;[මෙය:– කර්ම විපාකයෙන් ලිඞ්ග පරිවර්තනයෙන් ස්ත්‍රී වූ පියා ද එසේම පුරුෂ ලිඞ්ගය ලැබූ මවු ද මරන්නහු සඳහා කියන ලදී.]

## විනය ගාථාණි ව්‍යාඛ්‍යාව.

370. ඉත්ථිං හනෙ මාතරං - පුරිසඤ්ච පිතරං හනෙ
මාතරං පිතරං හන්ත්වා - න තෙනා'නන්තරං ඵුසෙ
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

371. අචොදයිත්වා අසාරයිත්වා - අසම්මුඛීභූතස්ස කරෙය්‍ය කම්මං
කතඤ්ච කම්මං සුකතං භවෙය්‍ය කාරකො ච සඞ්ඝො
අනාපත්තිකො සියා - පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

372. චොදයිත්වා සාරයිත්වා - සම්මුඛීභූතස්ස කරෙය්‍ය කම්මං
කතඤ්ච කම්මං අකතං භවෙය්‍ය කාරකො ච සඞ්ඝො
සාපත්තිකො සියා පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

---

370. මාතරං, මවු වූ; ඉත්ථිං ච ස්ත්‍රිය ද; හනෙ, නසන්නේය; පිතරං, පියා වූ; පුරිසඤ්ච, පුරුෂයා ද; හනෙ, නසන්නේය; (මෙසේ,) මාතරං, මවු ද; පිතරං, පියා ද; හන්ත්වා, නසා; තෙන, ඒ හෙතු වෙන්, ආනන්තරං, ආනන්තරිය කර්මය; න ඵුසෙ, ස්පර්ශ නොකරන්නේය; [මේ ප්‍රශනය:- මිගලිඞ්ග තාපස, සීහකුමාරාදීන්ගේ මෙන් තිරිසන් ගත මවු පියන් සඳහා කියන ලදී.

371 අචොදයිත්වා, වචනයෙන් චොදනා නො කොට; අසාරයිත්වා, සිහි නො කරවා; අසම්මුඛීභූතස්ස, හමුයෙහි නූ වූ වහුට; කම්මං, විනය කර්මය; කරෙය්‍ය, කරන්නේය; කතං, කරණ ලද්දා වූ; කම්මං ච, කර්මය ද; සුකතං භවෙය්‍ය, මොනවට කරණ ලද්දක් වන්නේය; කාරකො ච සඞ්ඝො, කාරක සඞ්ඝ තෙමේ ද; අනාපත්තිකො සියා, අනාපත්තිකවන්නේය- මෙය දූතෙනුපසම්පදාව අරබයා කියන ලදී.

372. චොදයිත්වා, වචනින් කියා; සාරයිත්වා, සිහි කරවා; සම්මුඛීභූතස්ස, හමුයෙහි වූවහුට; කම්මං, විනය කර්මය; කරෙය්‍ය, කරන්නේය; කම්මං ච, කර්මය ද; අකතං භවෙය්‍ය, නොකරණ ලද්දක්වන්නේය; කාරකො සඞ්ඝො, කාරක සඞ්ඝ තෙමේ ද; සාපත්තිකො සියා, ඇවැත් සහිත වන්නේය; - මෙය: පණ්ඩකාදීන්ගේ උපසම්පදාව සඳහා කියන ලදී. ඇතැම් ආචාර්‍ය්‍යවරු මෙහි ප්‍රථම ගාථායෙන් අසම්මුඛ කර්මයන් ද ද්විතීය ගාථායෙන් අනාපත්තික සත්ථ කරණ තජ්ජනීයාදී කර්ම ද කියනලද සි කීහු.

373. ඡින්දන්තස්ස ආපත්ති-ඡින්දන්තස්ස අනාපත්ති
ඡාදෙන්තස්ස ආපත්ති-ඡාදෙන්තස්ස අනාපත්ති
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

374. සච්චං භණන්තො ගරුකං-මුසා ච ලහු භාසතො
මුසා භණන්තො ගරුකං-සච්චඤ්ච ලහු භාසතො
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

---

373. ඡින්දන්තස්ස, සිඳින්නහුට; ආපත්ති, ඇවැත් වේ; (යළිදු) ඡින්දන්තස්ස, සිඳින්නහුට; අනාපත්ති, ඇවැත් නො වේ; ඡාදෙන්තස්ස, වසන්නහුට; ආපත්ති, ඇවැත් වේ; (යළිදු) ඡාදෙන්තස්ස, වසන්නහුට; අනාපත්ති, ඇවැත් නො වේ; එසා පඤ්හා= මේ ප්‍රශ්නයෙහි **"සිඳින්නහුට ඇවැත් වේ"** යනු නම් වනස්පතී වෘක්ෂය සිඳින්නහුට පරිජි ද, තෘණ ලතාදිය සිඳින්න හුට පචිති ද, අඞ්ගජාතය සිඳින්නහුට තුලසි ද සිදුවේ. **"සිඳින්න හුට ඇවැත් නො වේ"** නම් සෙසෙ නිය සිඳින්නහුට ඇවැත් නොවේ. **වසන්නහුට ඇවැත් වන බව නම්:-** ස්වකීය ඇවැත හෝ පරකීය ඇවැත වසන්නහුට ඇවැත් වන බවයි **වසන්නහුට ඇවැත් නොවේ** යනු නම්:- ගෘහාදිය වසන්නහුට නොවේ යනුයි.

374. සච්චං භණන්තො, සත්‍යය කියන්නේ; ගරුකං, ගරු ඇවැතට පැමිණෙයි; මුසා භාසතො, බොරු කියන්නහුට; ලහු, ලඝු ඇවැත් වේ; (-හෙවත් සත්‍යය කියන්නේ සඟවෙසෙස් ඇවැතටද-අසත්‍යය කියන්නේ පචිති ඇවැතට ද පැමිණෙයි) (යළිදු) මුසා භණන්තො, බොරු කියන්නේ; ගරුකං, ගරු ඇවැතට හෙවත් පරිජි ඇවැතට පැමිණෙයි; සච්චං භාසතො, සත්‍යය කියන්නහුට; ලහු, ලඝු ඇවැත් හෙවත් තුලසි වෙයි; එසා පඤ්හා:- මෙහි **සත්‍යය කියන්නහු සඟ වෙසෙස් ඇවැතට පැමිණේ** යනු නම්:=**'සිඛරිණී'සි! උභතොබ්‍යඤ්ජන කො සි!"** යනාදී වශයෙන් ආක්‍රොශ කරන්නහුට සඟ වෙසෙස් වේ **බොරු කියන්නහුට පචිති ඇවැත් වේ** යනු සම්පජාන මුසාවාදියා සඳහා කියන ලදි. යළිදු **බොරු කියන්නේ ගරු ඇවැතට පැමිණේ** යනු අභූතාරෝචනයෙන් **උතුරු මිනිස් දම්** ප්‍රකාශ කරන්නහු සඳහා කියන ලදි. **සත්‍යය කියන්නේ තුලසි ඇවැතට පැමිණේ** යනු **භූතාරෝචනය** කරන්නහු සඳහා කියන ලදි.

## විනය ගාථා ඤ්ඤ ව්‍යාඛ්‍යාව.

375. අධිඨිතං රජනාය රත්තං-කප්ප කතම්පි සන්තං
පරිභුඤ්ජන්තස්ස ආපත්ති-පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

376. අත්ථඞ්ගතෙ සුරියෙ භික්ඛූ-මංසානි ඛාදති න
උම්මත්තො න ච පන ඛිත්තචිත්තො
න චාපි සො වෙදනට්ටො භවෙය්‍ය-න ච'ස්ස හොති ආපත්ති
සො ච ධම්මො සුගතෙන දෙසිතො-පඤ්හාමෙසා
කුසලෙහි චින්තිතා

377 න රත්තචිත්තො න ච පන ථෙය්‍යචිත්තො-
න චාපි සො පරම්මරණාය චෙතයී
සලාකං දෙන්තස්ස හොති ඡෙජ්ජං-පරිගණ්හන්තස්ස
ථුල්ලච්චයං පඤ්හාමේසා කුසලෙහි චින්තිතා

---

375. අධිඨිතං, අධිෂ්ඨාන කරණ ලද්දාවූ ද; රජනාය, කැප රඳනින්; රත්තං, රඳනා ලද්දාවූ ද; කප්පකතං සන්තං අපි, කප් බින්දු තබන ලද්දාවූ ද; (සිවුරක්) පරිභුඤ්ජන්තස්ස, පරිභොග කරන්නහුට; ආපත්ති, ඇවැත් වෙයි; එසාපඤ්හා= මෙය පළමු පරිභොග කරමින් සිටිය දී නිසඟි වූ සිවුර නො නිසඳ පරිභොග කරන්නහු සඳහා කියන ලදී.

376. සුරියෙ අත්ථඞ්ගතෙ, ඉරු අවරට ගිය කල්හි; භික්ඛූ, භික්ෂුවක්; මංසානි, මස්; ඛාදති, කයි; (ඒ භික්ෂුව) උම්මත්තො, උමතු වූවෙක්; නච, නො වෙයි; න ච පන ඛිත්තචිත්තො, විපර්‍යාස්ත සිත් ඇත්තේ ද නො වෙයි; සො, හෙතෙම; වෙදනා'ට්ටො, වේදනාවකින් පෙළෙන්නෙකුත්; න ච අපි භවෙය්‍ය, නොවන්නේය; (එසේ ද වුවත්) අස්ස, ඕහට; න ච ආපත්ති හොති, ඇවැත් නො වේ; සො ච ධම්මො, ඒ කාරණය; සුගතෙන, බුදුන් විසින්; දෙසිතො, දෙසන ලද්දේ ද වෙයි; එසා පඤ්හා- "අනුජානාමි භික්ඛවෙ රොමන්ථකස්ස රොමන්ථං" යනු වදාළ හෙයින් මෙහි කියන ලද්දේ රොමන්ථක භික්ෂුවය.

377. න රත්තචිත්තො, මෛථුන රාගයෙන් රත් වූ සිත් ඇත්තේ නො වේ; [=මෛථුන ධර්ම පාරාජිකා යට නො පැමුණුණේය] න ච පන ථෙය්‍යචිත්තො, සොරසිත් ඇත්තේ ද නො වේ; [අදත්තාදාන පාරාජිකායට නො පැමිණියේය] සො, හෙතෙම; න ච අපි පරම්මරණාය චෙතයී, මෙරමා නසනු පිණිස

378. න චා'පි ආරඤ්ඤකං සාසඞ්ක සම්මතං–න චා'පි
සඞ්ඝෙන සම්මුති දින්නා
න චස්ස කඨිනං අත්ථතං තත්‍ථෙ'ව චීවරං–නික්ඛිපිත්වා
ගවෙෂෙය්‍ය අඩ්ඪ යොජනං
තත්‍ථෙ'ව අරුණං උග්ගච්ඡන්තස්ස–අනාපත්ති
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

379. කායිකානි න වාචසිකානි–සබ්බානි නානා වත්ථුකානි
අපුබ්බං අචරිමං ආපජ්ජෙය්‍ය එකතො–පඤ්හාමෙසා
කුසලෙහි චින්තිතා

---

සිතන්නෙක් ද නො වේ; [–මනුෂ්‍ය විග්‍රහ පාරාජිකාවට නො පැමිණුනේය] (වැලිදු;) සලාකං දෙන්තස්ස, ලහ දෙන්නහුට; ඡෙජ්ජං හොති, ඡේද්‍යගාමිනී සඞ්ඛ්‍යාත පරිජි වේ; පටිග්ගණ්හන්තස්ස, පිළිගන්නහුට; ථුල්ලච්චයං, තුලසි වේ; එසා පඤ්හා =[මෙය සඞ්ඝ භෙදය සඳහා ලහ දීම අරභයා කියන ලදි]

378. සාසඞ්ක සම්මතං, සැක සහිත යයි 'දන්නා ලද; න ච අපි ආරඤ්ඤකං, අරණ්‍යයකුත් නොවෙයි; සඞ්ඝෙන, සඞ්ඝයා විසින්; සම්මුති, අවිප්පවාස සම්මුතිය; න ච අපි දින්නා, දෙන ලද්දේද නො වෙයි; අස්ස, ඒ පුද්ගලයා විසින්; කඨිනං, කඨිනයක්; න ච අත්ථතං, අතුරණ ලද්දේද නො වෙයි; (එසේ ඇති කල්හි) තත්‍ථෙව, එහිම හෙවත් ඒ සාසඞ්ක සම්මතාරණ්‍යයක් නු වූ තන්හි; චීවරං, සිවුරක්; නික්ඛිපිත්වා, තබා; අඩ්ඪ යොජනං, අඩ යොදුනක් තැන්; ගවෙෂෙය්‍ය, යන්නේය; තත්‍ථ එව, එහිම; අරුණං උග්ගච්ඡන්තස්ස, අරුණ නංවන්නහුට; අනාපත්ති, ඇවැත් නො වේ; එසා පඤ්හා= මෙය සුප්‍රතිෂ්ඨිත නිග්‍රොධ වෘක්ෂය වැනි එක්කුල රුක් මුලක් සඳහා කියන ලදි අඩ යොදුනක් තැන් ගියත් රුක් මුල නො ඉක්මෙන හෙයින් ඇවැත් නො වේ.

379. කායිකානි, කයින් සිදුවෙත්; න වාචසිකානි, වචනින් සිදු නො වෙත්; සබ්බානි, සියල්ලෝම; නානා වත්ථුකානි, වෙන් වෙන් වස්තු ඇත්තාහු වෙත්; [ඒ ඇවැතම අවදනෙත්] අපුබ්බං අචරිමං, පෙරපසු නොව; එකතො, එකවර; ආපජ්ජෙය්‍ය, (යම් කිසිවෙක්) අවදනේය; එසා පඤ්හා= මෙය බොහෝ මාගමුනගේ කෙස් හෝ ඇඟිලි හෝ එකට අල්වා සඟවෙසෙස් අවදනහු සඳහා කියනලදි. – (විස්තර කැමැත්තෝ – ස–පා, 507 පිට බලත්වා.

380 වාචසිකානි න කායිකානි-සබ්බානි නානා වත්ථුකානි
අපුබ්බං අචරිමං ආපජ්ජෙය්‍ය එකතො-
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

381. තිස්සිත්ථියො මෙථුනන්තං න සෙවෙ-තයො
පුරිසෙ තයො ච අනරිය පණ්ඩකෙ
නචාචරෙ මෙථුනං බ්‍යඤ්ජනස්මිං-ඡෙජ්ජං සියා
-මෙථුන ධම්මපච්චයා-පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

---

**380.** වාචසිකානි,වචනයෙන් සිදුවන හෙයින් වාචසික වෙත්; න කායිකානි, කයින් සිදු නොවන හෙයින් කායිකා නොවෙත්; නානා වත්ථුකානි, වෙන් වෙන් වූ වස්තු ඇති; සබ්බානි, ඒ සියලු ඇවැත් වලට; අපුබ්බං අචරිමං, පෙර පසු නොව; එකතො, එකවර;ආපජ්ජෙය්‍ය,පැමිණෙන්නේය; එසා පඤ්හා= මේ ප්‍රශ්නය "සබ්බාව තුම්හෙ සිඛරණීයා" යනාදී වශයෙන් තුළල් තෙපුල් කියන්නහු අරභයා කියන ලදි.

**381.** තිස්සො ඉත්ථියො, මිනිස්- අමිනිස්- තිරිසන් වශයෙන් යම් ස්ත්‍රීහු තුන් දෙනෙක් කියන ලද ද; තං මෙථුනං, ඒ පිළිබඳ මෛථුනය; න සෙවෙ, සේවනය නො කරන්නේය; තයො පුරිසෙ, මිනිස්-අමිනිස්- තිරිසන් යන පුරුෂයන් තුන් දෙනා කරා ගොසිනුත්; න සෙවෙ, මෙවුන් දම් නො සෙවුනේය; තයො ච අනරිය පණ්ඩකෙ, ත්‍රිවිධ උභතො බ්‍යඤ්ජනක සඞ්ඛ්‍යාත අනාර්‍ය්‍යයන් තුන්දෙනා හා පණ්ඩකයන් තුන්දෙනා යන සදෙනා කරාද; (මෛථුනය පිණිස නො එළඹෙන්නේය) බ්‍යඤ්ජනස්මිං, ලම්බී මුදුපිට්ඨිකාදී අනුලෝම පරිජී වස්තුයෙහි; න ච ආචරෙ, මෙවුන්දම් නො හැසිරෙන්නේය; (එසේ ද උවත්) මෙථුනධම්ම පච්චයා, මෛථුන ධර්ම ප්‍රත්‍යයෙන්; ඡෙජ්ජං සියා, පරිජී වන්නේය; එසා පඤ්හා= මෙය අෂ්ටවස්තුක පාරාජිකාව සඳහා කියන ලදී. මෛථුනයට පූර්වාංග වූ කාය සංසර්ගය පිණිස ව්‍යායාම කරණ භික්ෂුණියට මෛථුනධර්ම ප්‍රත්‍යයෙන් ඡේද්‍යගාමිනී ඇවැත වෙයි.

## සුජනප්පමොදනී.

382. මාතරං චීවරං යාචෙ-නො චෙ සඞ්ඝස්ස පරිණතං *
කෙනස්ස හොති ආපත්ති-අනාපත්ති ච ඤාතකෙ
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

383. කුද්ධො ආරාධකො හොති-කුද්ධො හොති ගරහියො
අථ කො නාම සො ධම්මො-යෙන කුද්ධො පසංසියො
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

384. තුට්ඨො ආරාධකො හොති-තුට්ඨො හොති ගරහියො
අථ කො නාම සො ධම්මො-යෙන තුට්ඨො ගරහියො
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

---

382. **සඞ්ඝස්ස**, සඞ්ඝයාහට; **පරිණතං**, පිරිනමන ලද; **චීවරං**, සිවුරක්; නො, නො ඉල්වන්නේය; චෙ, ඉදින්; මාතරං, මවගෙන්; **යාචෙ**, ඉල්වන්නේය; අස්ස, ඕහට; කෙන, කවර ශික්ෂා පදයකින්; ආපත්ති හොති, ඇවැත් වේ ද; ඤාතකෙ, නෑයන්ගෙන් ඉල්වීමෙහි දී, අනාපත්ති ච, ඇවැත් නොවේ අස්ස, ඕහට; කෙන, කවර ශික්ෂාපදයකින් ආපත්තිහොති, ඇවැත් වේ ද? එසා පඤ්හා:- මෙය **පිඹිසමය** සඞ්ඛ්‍යාත වූ **ඉල් මස පසළොස්වක** පටන් **පොසොන් පසළොස්වක** තෙක් ඇති සත් මස තුළ දී වස්සික සාටික චීවරය සඳහා **ඤතුපසාදකරණය** අරහයා කියන ලදි. මෙ කී කාලසීමාව තුළ මවගෙන් වැසිසළු සිවුරක් ඉල්වන්නහුට **වස්සිකසාටික** සිකපදයෙන් ඇවැත් වේ. නෑයන් විනවා වැසිසළු සිවුරක් නිපදවන්නහුට **අඤ්ඤාතක විඤ්ඤත්ති සික්ඛාපදයෙන්** ඇවැත් නො වේ. (මෙහි විස්තර **වස්සික සාටික ශික්ෂා** පද වර්ණනාවෙහි බලනු–ස- පා -4 8පිට.

383. කුද්ධො, කිපි තැනැත්තේ; ආරාධකො හොති, **සිත්** ගන්නෙක් වෙයි; (යළිදු) කුද්ධො, කිපි තැනැත්තේ; ගරහියො හොති, ගර්හා කටයුත්තෙක් වෙයි; යෙන (යම් හෙයකින්) කුද්ධො, කිපි තැනැත්තේ; පසංසියො, පැසසිය යුත්තේ වේ ද; අථ, එකල්හි; නොහොත්එබඳුවූ; සො කො නාම ධම්මො, ඒ කිනම් ධර්මයෙක්ද?

384. තුට්ඨො, **සතුටු** වූ තැනැත්තේ; ආරාධකො හොති, සිත් ගන්නෙක් වෙයි; (යළිදු) තුට්ඨො, සතුටු වූ තැනැත්තේ; ගරහියො හොති, ගර්හා කටයුත්තෙක් වෙයි; යෙන, යම් හෙය කින්; තුට්ඨො, සතුටු වූ තැනැත්තේ; ගරහියො හොති, ගර්හා කට යුත්තේ වේ ද; අථ, එකල්හි; සො කො නාම ධම්මො, ඒ කිනම් ධර්මයෙක්ද?

---

* නො චෙ සඞ්ඝපරිණතං-ස-

## විනය ගාථාර්ථ ව්‍යාඛ්‍යාව.

385. සඞ්ඝාදිසෙසං ථුල්ලච්චයං–පාචිත්තියං පාටිදෙසනීයං
දුක්කටං ආපජ්ජෙය්‍ය එකතො–පඤ්හාමෙසා
කුසලෙහි චින්තිතා

386. උභො පරිපුණ්ණ වීසති වස්සා–උභින්නං එකූ'පජ්ඣායො
එකාචරියො එකා කම්මවාචා-එකො උපසම්පන්නො
එකො අනුපසම්පන්නො පඤ්හා'මෙසා කුසලෙහි චින්තිතා

---

මේ ගාථා වයස තිත්ථිය වත උදෙසා කියන ලදහ. සම්ඥ ශාසනොපසම්පදාපෙක්ෂාවෙන් තිත්ථිය වත් පුරමින් සිටින අඤ්ඤ තිත්ථිය පුබ්බකයා තීර්ථකයන්ගේ ගුණ කී කල්හි කිපේ නම් හෙතෙම භික්ෂූන්ගේ සිත් ගන්නෙක් වේ. එය **"කුද්ධො ආරාධකො හොති"** යන්නෙන් කථිතයි. **තුණුරුවන් ගුණ කියන කල කිපේ නම්** ගර්හා කටයුත්තෙක් වෙයි **"කුද්ධො හොති ගාරය්හො"** යන්නෙන් එය කියන ලදි. තුණුරුවන්ගේ ගුණ කියන කල තුටු පහටු වේ නම් භික්ෂූන්ගේ සිත් ගන්නෙක් වෙයි. තීර්ථකයන්ගේ ගුණ කියන කල තුටු පහටු වේ නම් භික්ෂූන් විසින් ගර්හා කටයුත්තෙක් වෙයි. **"තුට්ඨො ආරාධකො හොති, තුට්ඨො හොති ගාරය්හො"** යන පද වශයෙන් ඒ බැව් සූචිතයි ]

385. සඞ්ඝාදිසෙසං, සඟ වෙසෙස් ද; ථුල්ලච්චයං, තුලසි ද; පාචිත්තියං, පචිති ද; පාටිදෙසනීයං, පාටිදෙසනීය ද; දුක්කටං, දුකුළා ද; (යන මේ ඇවැත් සමූහය) එකතො, එකවර; ආපජ්ජෙය්‍ය, අවදනේය; එසා පඤ්හා:- [මෛථුන රාගයෙන් තෙත් වූ මෙහෙණ එසේ ම තෙත් වූ පුරුෂයකු අතින් අහරක් ගෙණ- එය මිනිස් මස්- හුණු- පිණි බොජුන්, සෙසු අකැප මස් වශීනයක් යන මේ දේ හා අනා ගිලී ද ඇ සඳහා මේ ගාථාව කියන ලදි. ඕ තොමෝ උක්ත ප්‍රකාර පස් ඇවැතට එකවර ම පැමිණෙන්නීය.

**386.** උභො, දෙදෙනම; පරිපුණ්ණ වීසති වස්සා, පිරිපුන් විසි වයස් ඇත්තාහ; උභින්නං, දෙදෙනාටම; එකො උපජ්ඣායො, එකම උපජ්ඣායයෙක් වෙයි; එකො ආචරියො, එක ම ආචාර්‍ය්‍යයෙක් වෙයි; එකා කම්මවාචා, එක් කර්‍ම්ම වාක්‍යයක් වෙයි; (එතකුදු උවත්) එකො, ඔවුනතුරෙන් එකෙක්; උපසම්පන්නො; උපසම්පන්නය; එකො, එකෙක්; අනුපසම්පන්නො, අනුපසම්පන්නය; එසා පඤ්හා:

[මේ ප්‍රශ්නය ආකාශගත හෙරණහු අරභයා කියන ලදි. එක විට උපසම්පදා වන දෙදෙනා අතුරෙන් සෘද්ධිමත් හෙරණ කෙණෙක් කොත ගස් පමණකුදු බිමින් වෙන්ව අහස්හි හිඳී නම් හෙතෙම අනුපසම්පන්න වේ. සඞ්ඝයා ද අහසෙහි හිඳ බිම හිඳින හුට කර්‍මය නො කටයුතුයි. කළත් කොප්‍ය වේ.]

387\. අකප්පකතං නාපි රජනාය-රත්තං තෙන නිවත්ථො
යෙ[ ]ා කාමං වජෙය්‍ය-න චස්ස හොති ආපත්ති
සො ච ධම්මො සුගතෙන දෙසිතො-පඤ්හා මෙසා
කුසලෙහි චින්තිතා

388\. න දෙති න පටිගණ්හාති-පටිග්ගහො තෙන න විජ්ජති
ආපජ්ජති ගරුකං න ලහුකං-තඤ්ච පරිභොග පච්චයා
පඤ්හා මෙසා කුසලෙහි චින්තිතා

---

387\. [යම් සිවුරක්] අකප්පකතං, කප් බින්දු නො තබන ලද්දේ ද; අපි, නැවත; රජනාය, කැප රජනින්; න රත්තං, නො රඳනා ලද්දේත් වෙයි ද; තෙන, ඒ සිවුරෙන්; නිවත්ථො, සැරසුනේ=හැඳවත් ඒ සිවුර හැන්දේ; යෙන කාමං, කැමැති දෙස කට; වජෙය්‍ය, යන්නේ ද; තස්ස, ඒ භික්ෂුවට; න ආපත්ති, ඇවැත් නො වේ; සො ච ධම්මො, ඒ කාරණය ද; සුගතෙන, බුදුන් විසින්; දෙසිතො, දෙසන ලද්දේය; එසා පඤ්හා:-

[මෙය සොරුන් විසින් සිවුරු පැහැර ගන්නා ලද භික්ෂුව අරභයා කියන ලදි. ඒ භික්ෂුවට උක්ත ප්‍රකාර සිවුරු දැරීමෙහි ඇවැත් නැති, (විස්තර:-අඤ්ඤාතක විඤ්ඤත්ති සික්ඛාපද වණ්ණනාව බලනු. -සමන්තපාසාදිකා 391 වෙනි පිට.)

388 න දෙති, මෙහෙයන තැනැත්තී නො දෙයි; න න පටිගණ්හාති, මෙහෙයන ලද තැනැත්තී මෙහෙයන මෙහෙණ අතින් නොපිළිගණියි; තෙන, එහෙයින් ම; පටිග්ගහො, පිළිගැණීමක්; න විජ්ජති, විද්‍යමාන නො වේ; (එතකුදු උවත්) න ලහුකං, ලඝු ඇවැතකට නොව; ගරුකං, ගරු ඇවැතකට; ආපජ්ජති, තොමෝ පැමිණෙයි; තඤ්ච බො, හෙද; පරිභොග පච්චයා, අනික් තැනැත්තිය වැළඳීම හෙතු කොට ගෙණම පැමිණෙයි; එසා පඤ්හා =

[මෙය අවස්සුත පුරුෂයකු අතින් ආහාරයක් පිළිගැන්මට භික්ෂුණියක් මෙහෙයන මෙහෙණිය අරභයා කථිතයි. මෙහෙයනු ලැබූ භික්ෂුණිය ඒ පුරුෂයා අතින් අහරක් පිළිගෙණ වැළඳූ කල්හි මෙහෙයූ මෙහෙණ සඝාදිසෙස් ඇවැත් අවදියි ]

389\. න දෙති න පටිගණ්හාති–පටිග්ගහො තෙන න විජ්ජති
ආපජ්ජති ලහුකං න ගරුකං–තඤ්ච පරිභොග පච්චයා
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

390 ආපජ්ජති ගරුකං සාවසෙසං–ඡාදෙති අනාදරියං පටිච්ච
න භික්ඛුනී නො ච ඵුසෙය්‍ය වජ්ජං–පඤ්හා මෙසා
කුසලෙහි චින්තිතා

**සෙදමොචක ගාථා නිට්ඨිතා**

---

389 නදෙති,තොමෝ නො දෙයි; න පටිගණ්හාති, අනිත් තැනැත්තිය ද නො පිළිගණියි; තෙන, එහෙයින් ම; පටිග්ගහො, පිළිගැණීමක්; න විජ්ජති, විද්‍යමාන නො වේ; (එතකුදු උවත්) න ගරුකං, ගරු ඇවැතකට නොව; ලහුකං, ලඝු ඇවැතකට; ආපජ්ජති, තොමෝ පැමිණෙයි; තඤ්ච, හෙද; පරිභොග පච්චයා, අනිත් තැනැත්තිය පරිභොග කිරීම හෙතුකොට ගෙණ ම වෙ. එසා පඤ්හා,[මෙය ද යටකී පරිදි පුරුෂයකු අතින් දිය දූහැටි පිළිගැන්මට භික්ෂුණියක් මෙහෙයන භික්ෂුණිය අරභයා කියන ලදි. මෙහෙයනු ලැබූ භික්ෂුණිය දිය දූහැටි පිළිගෙණ පරිභොග කල කල්හි මෙහෙයූ භික්ෂුණිය දුකුළා ඇවැත් අවදී.]

390\. සාවසෙසං, ඉතිරියක් සහිත වූ; ගරුකං, ගරු ඇවැතකට[–සඝාවශෙෂකට] ආපජ්ජති, පැමිණෙයි;අනාදරියං පටිච්ච, අනදර නිසා; ඡාදෙති, ඇවැත සඟවයි. (හෙතෙම) න භික්ඛුනී, භික්ෂුණියක් ද නො වේ; වජ්ජං, ඇවැත සැඟවීමෙන් වරදකුත්; න ඵුසෙය්‍ය, සපශී නො කරන්නේය; එසා පඤ්හා, මේ පැනය තොමෝ; කුසලෙහි, විනයයෙහි දක්ෂයන් විසින්; චින්තිතා, සිතන ලද්දීය. මේ ප්‍රශනය උක්ඛිත්තක භික්ෂුව සඳහා කියන ලදි ඔහු හා විනයකර්මයක් නැති බැවින් හෙතෙම ඇවැත් ප්‍රතිච්ඡන්න කරන්නේ නමුදු ඒ හෙතුවෙන් වරදක් සපශී නො කරයි.

**සෙද මොචක ගාථා'දී ව්‍යාඛ්‍යාව නිමි.**

—//—

## “සුජනප්පමොදනී” නම්වූ
## විනය ගාථාදීපී ව්‍යාඛ්‍යාව සමාප්තයි.

# සුජනප්පමොදනී උපග්‍රන්ථය.

## සඞ්ඛ්‍යා ධර්ම සඞ්ග්‍රහය.

## පාචිත්තිය පාළි.

ගාථාව. 2-a **සප්තත්‍රිංශත්බොධපාක්ෂික ධර්ම** :—

(1) චත්තාරො සතිපට්ඨානා. (2) චත්තාරො සම්මප්පධානා. (3) චත්තාරො ඉද්ධිපාදා (4) පඤ්චින්ද්‍රියානි, (5) පඤ්චබලානි (6) සත්තබොජ්ඣඞ්ගා, (7) අරියො අට්ඨඞ්ගිකො මග්ගො.

(1) **සතර සතිපට්ඨාන** -(1) කායානු පස්සනා (2) වෙදනානු පස්සනා (3) චිත්තානු පස්සනා (4) ධම්මානු පස්සනා.

(2) **සතර සම්‍යක් ප්‍රධාන** : (1) අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති (2) උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහාණාය (3) අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය (4) උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය.

(3) **සතර ඍද්ධිපාද** :-(1) ඡන්ද (2)චිත්ත (3) විරිය (4) වීමංසා
(4) **පඤ්චෙන්ද්‍රිය** : (1 සද්ධින්ද්‍රිය (2) විරියින්ද්‍රිය (3) සතින්ද්‍රිය සමාධින්ද්‍රි.. (5) පඤ්ඤින්ද්‍රිය-

(5) **පඤ්චබල** :- (1) සද්ධා (2) විරිය (3) සති (4) සමාධි (5) පඤ්ඤා-

(6) **සප්තබොධ්‍යඞ්ග** (1) සති (2) ධම්ම විචය (3) විරිය (4) පීති (5) පස්සද්ධි (6) සමාධි (7) උපෙක්ඛා.

(7) **ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග්‍ය** :-(1)සම්මා දිට්ඨි(2)සම්මා සඞ්කප්ප (3) සම්මා වාචා (4) සම්මා කම්මන්ත (5) සම්මා ආජීව (6) සම්මා වායාම (7) සම්මා සති (8) සම්මා සමාධි.

2-b **ත්‍රිශික්ෂා** :- (1) අධිසීල (2) අධිචිත්ත (3) අධිපඤ්ඤා,
2-c **උභය ලොක** :- (1) දිට්ඨ ධම්මික (2) සම්පරායික
5 **සතර අපාය** :- (1) නරක (2) තිර්‍ය්‍යක් (3) ප්‍රෙත(4) අසුර

# මහාවග්ග පාළි.

---

**2-a නව ලොකොත්තර ධර්ම:-**

(1) සොවාන් මාර්ගය (2) සොවාන් ඵලය (3) සකෘදාගාමී මාර්ගය (4) සකෘදාගාමී ඵලය (5) අනාගාමී මාර්ගය (6) අනාගාමී ඵලය (7) අර්හත්මාර්ගය (8) අර්හත්ඵලය (9) නිර්වාණය.

**2-b සොළොස් කාංක්ෂා:-** (1) අහොසිං නු ඛො අහං අතීත'මද්ධානං (2) න නු ඛො අහොසිං (3) කිං නු ඛො අහොසිං (4) කථං නු ඛො අහොසිං (5) කිං හුත්වා කිං අහොසිං (6) භවිස්සාමි නු ඛො අහං අනාගත'මද්ධානං (7) න නු ඛො භවිස්සාමි (8) කිං නු ඛො භවිස්සාමි (9) කථං නු ඛො භවිස්සාමි (10) කිං හුත්වා කිං භවිස්සාමි (11) අහං නු ඛො'ස්මි (12) නො නු ඛො'ස්මි (13) කිං නු ඛො'ස්මි (14) කථං නු ඛො'ස්මි (15) අයං නු ඛො සත්තො කුතො ආගතො (16) සො කුහිං ගාමී භවිස්සති.

**2-c චතුරාර්ය සත්‍යය:-**(1) දුක්ඛ සත්‍යය (2) සමුදය සත්‍යය (3] නිරොධ සත්‍යය (4) මාර්ග සත්‍යය.

**(3)- එකොළොස් මාර සෙනඟ :-**

1 "කාමා තෙ පඨමා සෙනා-දුතියා අරති වුච්චති
තතියා ඛුප්පිපාසා තෙ-චතුත්ථී තණ්හා පවුච්චති

2 පඤ්චමී ථීනමිද්ධං තෙ-ඡට්ඨා භීරූ පවුච්චති
සත්තමී විචිකිච්ඡා තෙ-මක්ඛො ථම්භො ච අට්ඨමො

3 ලාභො සිලොකො සක්කාරො-මිච්ඡාලද්ධො ච යො යසො
යො ච'ත්තානං සමුක්කංසෙ-පරඤ්ච මවජානති' යි

ප්‍රකාශිත (1) කාමය (2) වනප්‍රස්ථ සෙනාසනාදියෙහි හා අධිකුසලයෙහි අනභිරතිය (3) සා පිපාසාව (4) රූපා'දී සාරම්මණෙහි පවත්නා අට'තුරා සියක් තෘෂ්ණාව (5) චිත්ත චෛතසික අකර්මන්‍යතා සඞ්ඛ්‍යාත ථීනය හා මිද්ධය (6) බියසුලුකම (7) බුද්ධ ධම්ම සඞ්ඝ පුබ්බන්ත අපරන්ත පුබ්බන්තා'පරන්ත සික්ඛා පටිච්චසමුප්පාද යන අට තැන්හි

පවත්නා සැකය (8) වෛරමා ගුණ නිගුහණය කොට කථා කිරීම වූ මක්ඛ ගුණය හා අවවාදානුශාසනයට නො නැමෙන ථම්භය (9) ලාභය තමා ගුණ කථනය වූ සිලෝකය හා සත්කාරය (10) කුටිල ප්‍රසිද්ධිය (11) අත්තුක්කංසනය හා පරවම්භනය යන එකාදශ ධර්මයයි.

4- **පඤ්චවිධ උස්සද** :- (1) රාග (2) දෝස (3) මෝහ (4) මාන (5) දිට්ඨි

8 -**ත්‍රිවිධ රාග**:- (1) කාම රාගය (2)භව රාගය(3)විභව රාගය

9- **ෂට්ශාස්තෲහු**:- (1) පූරණ කස්සප 2) මක්ඛලී ගෝසාල (3) නිගණ්ඨ නාතපුත්ත (4) සඤ්ජය බෙලට්ඨි පුත්ත (5) පකුධ කච්චායන (6) අජිත කෙසකම්බල.

13-a **ත්‍රෛභූමිකධර්ම**:- (1) කාම (2)රූප (3) අරූප.

13-b **චාතුර්භූමික** ධර්ම:- (1) කාම (2) රූප (3) අරූප (4) ලෝකුත්තර.

37- **චතුරෝඝය**:-(1) කාමෝඝ (2) භවෝඝ (3) දිට්ඨෝඝ (4) අවිජ්ජෝඝ.

44-a **දශාර්‍යවාස**:- (1) පඤ්චඞ්ග විප්පහීනො (2) ඡළඞ්ග සමන්නාගතො (3) එකාරක්ඛො (4) චතුරා පස්සෙනො (5) පනුණ්ණ පච්චෙක සච්චො (6) සමවය සට්ඨෙසනො (7) අනාවිල සඞ්කප්පො (8) පස්සද්ධ කාය සඞ්ඛාරො (9) සුවිමුත්ත චිත්තො (10) සුවිසුද්ධ පඤ්ඤො.

44-b **දසවිධ කාය** බල :-

**කාලාවකඤ්ච** ගඞ්ගෙය්‍යං-පණ්ඩරං තම්බ පිඞ්ගලං
ගන්ධ මඞ්ගල හෙම**ඤ්ච**-උපොසථ ඡද්දන්තිමෙ දස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | ප්‍රකෘති පුරුෂයන් දශ දෙනෙකුගේ බල එක කාලාවක ඇතෙකුට ඇත. | | | | | | |
| (2) | කාලාවකයන් | ,, | ,, | ,, | 1 | ගඞ්ගෙය්‍ය | ,, | ,, |
| (3) | ගඞ්ගෙය්‍යයන් | ,, | ,, | ,, | 1 | පණ්ඩර | ,, | ,, |
| (4) | පණ්ඩරයන් | ,, | ,, | ,, | 1 | තම්බ | ,, | ,, |
| (5) | තම්බයන් | ,, | ,, | ,, | 1 | පිඞ්ගල | ,, | ,, |
| (6) | පිඞ්ගලයන් | ,, | ,, | ,, | 1 | ගන්ධ | ,, | ,, |
| (7) | ගන්ධයන් | ,, | ,, | ,, | 1 | මඞ්ගල | ,, | ,, |
| (8) | මඞ්ගලයන් | ,, | ,, | ,, | 1 | හෙම | ,, | ,, |

(9) හෙමයන් ,, ,, ,, 1 උපොසථ ,, ,,
10) උපොසථයන් ,, ,, ,, 1 ඡද්දන්ත ,, ,,
ඡද්දන්තයන් ,, ,, ,, බුදුරජාණන් වහන්සේට ඇත්තේය.

ඒ නාරායණ බලය පුරුෂ ප්‍රමාණයෙන් කොටි දස දහසක බල ය යි.

44-c දශවිධ ඥාන බල.

"ඨානාඨානං විපාකො ච-මග්ගං සබ්බත්ථ ගාමිනං
නානාධාතු ච ලොකස්මිං සත්තානං අධිමුත්තියා
ඣානාදිකෙ සඞ්කිලෙස-වොදානෙ ච පරොපරෙ
පුබ්බනිවාසානුස්සති-දිබ්බචක්ඛා'සවක්ඛය-යි යු

| | |
|---|---|
| (1) ඨානාඨාන ඥාණය | (6) ඉන්ද්‍රිය පරොපරියත්ත ඥාණය |
| (2) කම්ම විපාක ඥාණය | (7) ඣානාදිසඞ්කිලෙස ඥාණය |
| (3) සබ්බත්ථ ගාමිණී පටිපදා ඥාණය | (8) පුබ්බෙ නිවාසානුස්සති ඥාණය |
| (4) නානාධාතු පටිවෙධ ඥාණය | (9) දිබ්බචක්ඛු ඥාණය |
| (5) නානා'ධිමුත්තික ඥාණය | (10) ආසවක්ඛය ඥාණය |

44 -d දශා'සෙඛ ධර්ම :-

| | |
|---|---|
| (1) අසෙඛ සම්මා දිට්ඨි | (6) අසෙඛ සම්මා වායාම |
| (2) අසෙඛ සම්මා සඞ්කප්ප | (7) අසෙඛ සම්මා සති |
| (3) අසෙඛ සම්මා වාචා | (8) අසෙඛ සම්මා සමාධි |
| (4) අසෙඛ සම්මා කම්මන්ත | (9) අසෙඛ සම්මා ඥාණ |
| (5) අසෙඛ සම්මා ආජීව | (10) අසෙඛ සම්මා විමුත්ති. |

44 =e දශ කර්මපථ ඥානය :- (1) පාණඝාත (2) අදත්තා'දාන (3) කාමමිච්ඡාචාර (4) මුසාවාද (5) පිසුණාවාචා (6) ඵරුසා වාචා (7) සම්ඵප්ඵලාප (8) අභිජ්ඣා (9) ව්‍යාපාද (10) මිච්ඡාදිට්ඨි—දන්නා නුවණ.

46=a පඤ්චස්කන්ධය:- (1) රූපස්කන්ධය (2) වෙදනාස්කන්ධය (3) සංඥාස්කන්ධය (4) සංස්කාරස්කන්ධය (5) විඥානස්කන්ධය.

**46=a අට්'තුරාසියක්තෘෂ්ණාව :-** රූප - සද්ද - ගන්ධ - රස - ඵොට්ඨබ්බ - ධම්ම - (6) කාම - භව - විභව - වශයෙන් තුන් පරිද්දෙවේ(18)ඒ අටළොස අජ්ඣත්තික-බාහිර වශයෙන්දෙප රිදිසි(18×2=36)ඒ සතිස අතීතයෙහි සතිසය වර්තමානයෙහි සතිසය - අනාගතයෙහි සතිස යයි (36+3=108) අටතු රාසියකි.

**79- නවා'ඝාත වස්තු :-** (1) අනත්ථං මෙ අචරි (2) අනත්ථං මෙ චරති (3) අනත්ථං මෙ චරිස්සති (4) අප්පියස්ස මෙ අත්ථං අචරි (5) අත්ථං චරති (6) අත්ථං චරිස්සති (7) පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි (8) අනත්ථං චරති (9) අනත්ථං චරිස්සති.

92- **අෂ්ටවිධ දූතාඞ්ග:-** 'ඉධ භික්ඛවෙ භික්ඛු (1) සොතා ච හොති (2) සාවෙතා ච (3) උග්ගහෙතා ච (4) ධාරෙතා ච (5) විඤ්ඤා තා ච (6) විඤ්ඤාපෙතා ච (7) කුසලො ච සහිතා'සහිතස්ස (8) න ච කලහ කාරකො යි දක්වන ලද අටඟ යි.

---

# චූලවග්ග පාළි.

---

35 **සතර යොග :-** (1) කාම (2) භව (3) දිට්ඨි (4) අවිජ්ජා.

45=a **පඤ්ච සුරාව :-** (1) පිට්ඨ සුරා (2) පූව සුරා (3) ඔදන සුරා (4) කිණ්ණ පක්ඛිත්ත සුරා (5) සම්භාර සංයුත්ත සුරා.

45=b **පඤ්ච මෙරය :-** (1) පුප්ඵාසව (2) ඵලාසව (3) මධ්වාසව (4) ගුලාසව (5) සම්භාර සංයුත්තාසව.

---

# පරිවාර පාළි.

---

3=a **පස් සඟි:-"දීඝ මජ්ඣිම සංයුත්ත අඞ්ගුත්තරික ඛුද්දකං"** යි ප්‍රකාශිත 1 දීඝ නිකාය (2) මජ්ඣිම නිකාය (3) සංයුත්ත නිකාය (4) අඞ්ගුත්තර නිකාය (5) ඛුද්දක නිකාය යන මොහු යි.

3=b **සප්ත ප්‍රකරණ** :– "ධම්ම සඞ්ගණී විභඞ්ගඤ්ච=කථාවත්ථු ච පුග්ගලං, ධාතු යමක පට්ඨානං, අභිධම්මං ති වුච්චති යි ප්‍රකාශිත (1) ධම්මසඞ්ගණී (2) විභඞ්ග (3) කථාවත්ථු (4) පුග්ගල (5) ධාතු (6) යමක (7) පට්ඨාන යනුයි.

3=c **ත්‍රිපිටකය** :– (1) සූත්‍ර පිටකය (2) අභිධර්ම පිටකය (3) විනය පිටකය.

18= **සමත්‍රිංශත්පාරමී** :– (1) පාරමී (2) උප පාරමී (3) පරමත්ථ පාරමී යන ත්‍රි භෙදයෙන් ගුණිත (1) දාන (2) ශීල (3) නිෂ්ක්‍රම්‍ය (4) ප්‍රඥා (5) වීර්‍ය්‍ය (6) ක්ෂාන්ති (7) සත්‍ය (8) අධිෂ්ඨාන (9) මෛත්‍රී 1(0) උපෙක්ෂා යන දශය යි.

**දානං සීලං ච නෙක්ඛම්මං–පඤ්ඤා විරියෙන පඤ්චමං**
**ඛන්ති සච්ච'මධිට්ඨාන-මෙත්තුපෙක්ඛා ඉමෙ දස.**

21= **උභය ප්‍රාතිමොක්ෂ** :– (1) භික්ෂු ප්‍රාතිමොක්ෂ (2) භික්ෂුණී ප්‍රාතිමොක්ෂ.

24= **උභය විභඞ්ග**:– (1) භික්ඛු විභඞ්ග (2) භික්ඛුණී විභඞ්ග

28= **පඤ්ච භොජන**:– (1) ඔදන (2) කුම්මාස (3) සත්තු (4) මච්ඡ (5) මංස.

36= **චතුර්විධ විනය කර්ම**:– (1) ඤත්ති (2) ඤත්තිදුතිය (3) ඤත්ති චතුත්ථ (4 අපලොකන.

49=**අෂ්ටවස්තුකයෝ**:– යා පන භික්ඛුනී අවස්සුතා අවස්සුතස්ස පුරිස පුග්ගලස්ස (1) හත්ථගහනං වා සාදියෙය්‍ය (2) සඞ්ඝාටිකණ්ණ ගහණං වා සාදියෙය්‍ය (3) සන්තිට්ඨෙය්‍ය වා (4) සල්ලපෙය්‍ය වා (5) සඞ්කෙතං වා ගච්ඡෙය්‍ය (6) පුරිසස්ස වා අබ්භාගමනං සාදියෙය්‍ය (7) ඡන්නං වා අනුපවිසෙය්‍ය (8) කායං වා තදත්ථාය උපසංහරෙය්‍ය එතස්ස අසද්ධම්මස්ස පටිසෙවනත්ථාය යි යු අටයි ]

50=a **සතර අගතිය**:– (1) ඡන්ද (2) දොස (3 භය (4) මොහ.

50=b **චතුර්විධ අධිකරණ**:– (1) විවාද (2) අනුවාද (3) ආපත්ති (4) කිච්ච.

53= **පස්සහ දැමියන්** :– (1) භික්ෂු (2) භික්ෂුණී (3) සාමණෙර (4) සාමණෙරී (5) සික්ඛමානා.

57=a **සිවුරඟ සෙනඟ**:- (1) හත්ථි (2) අස්ස (3) රථ (4) පදාති.

67=b **ත්‍රිවිධ දුර්වර්ණ කරණ** :- (1) නිල් (2) මඩ (3) අඟුරු ඈ කළු.

113=a **ත්‍රිවිධ විවේක** :- (1) කාය (2] චිත්ත (3) උපධි—යනු විවේකත්‍රය යි.

1 3=b **පඤ්චවිධ විවේක** :- ප්‍ර බ.

124=**ඡේදනක ශික්ෂා සය**:- [1] නවම්පන භික්ඛුනා මඤ්චං වා පීඨං වා කාරයමානෙන අට්ඨඞ්ගුල පාදකං කාරෙතබ්බං—පෙ—ඡේදනකං පාචිත්තියං [2] නිසීදනම්පන භික්ඛුනා කාරයමානෙන—පෙ—ඡේදනකං පාචිත්තියං—[3] කණ්ඩුපටිච්ඡාදිම්පන භික්ඛුනා කාරයමානෙන – පෙ – ඡේදනකං පාචිත්තියං [4] වස්සිකසාටිකම්පන භික්ඛුනා කාරයමානෙන-පෙ—ඡේදනකං පාචිත්තියං—[5] යොපන භික්ඛු සුගත චීවරප්පමාණං චීවරං කාරාපෙය්‍ය අතිරෙකංවා ඡේදනකං පාචිත්තියං— (භික්ෂුණී විභඞ්ගය) [6] උදකසාටිකම්පන භික්ඛුණියා කාරයමානාය පමාණිකා කාරෙතබ්බා.තත්‍රිදං පමාණං දීඝසො චතස්සො විදත්ථියො සුගත විදත්ථියා තිරියංවෙ විදත්ථියො තං අතික්කාමෙන්තියා ඡේදනකං පාචිත්තියං යි—යු සයයි

124= b **අනඤ්ඤද පාචිත්තිය සතර**:-(1)සඞ්ඝිකෙ විහාරෙ ජානං පුබ්බුපගතං භික්ඛුං යනාදී ශික්ෂාපදය (2) එහාවුසො ගාමං වා නිගමං වා යනාදී ශික්ෂාපදය (3) භික්ඛුස්ස සඤ්චිච්ච කුක්කුච්චං උපදහෙය්‍ය යනාදී ශික්ෂාපදය (4) භික්ඛූනං භණ්ඩන ජාතානං කලහ ජාතානං විවාදාපන්නානං යනාදී ශික්ෂාපදය යන මේ සතරෙහි දී නියම කරණ ලද පචිති ඇවැත් සතර යි.

124= c **භික්ෂු සම්මුති ශික්ෂා හතර** :- (1) "එකරත්තිම්පි චෙ භික්ඛු ති චීවරෙන විප්පවසෙය්‍ය" යනාදී ශික්ෂාපදය (2) නවම්පන භික්ඛුනා සන්ථතං කාරාපෙත්වා ඡබ්බස්සානි ධාරෙතබ්බං, යනාදී ශික්ෂාපදය (3) උපවස්සං ඛො පන කත්තික පුණ්ණමං" යනාදී ශික්ෂාපදය ද යන භික්ෂු සම්මුතිය නැති තන්හි ඒ ඒ කරුණෙහි නිසඟි පචිති නියමිත ශික්ෂා තුණ හා (4) යො පන භික්ඛු භික්ඛුස්ස දුට්ඨුල්ලාපත්තිං අනුපසම්පන්නස්ස ආරොචෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා පාචිත්තියං යන ශික්ෂාපදය ද යන සතර යි

124= d **සාමීචි ශික්‍ෂා හත** :- [1] "සො ච භික්ඛු අනබ්භිතො තෙ ච භික්ඛු ගාරය්හා අයං තත්ථ සාමීචි (2) යුඤ්ජන්තා ඝටමන්තා සකං මා වො සකං විනස්සා ති අයං තත්ථ සාමීචි [3] අයං තෙ භික්ඛු පත්තො යාව භෙදනාය ධාරෙතබ්බො ති අයං තත්ථ සාමීචි" [4] තතො නීහරිත්වා භික්ඛූහි සද්ධිං සංවිභජිතබ්බං අයං තත්ථ සාමීචි (5) අඤ්ඤාතබ්බං පරිපුච්ඡිතබ්බං පරිපඤ්හිතබ්බං අයං තත්ථ සාමීචි (6) යස්ස භවිස්සති සො හරිස්සති අයං තත්ථ සාමීචි යනුවෙන් (භික්‍ෂු ප්‍රාතිමොක්‍ෂයෙහි) සයක් හා (7) සා ච භික්ඛුනී අනවජ්ජිතා තා ච භික්ඛුනියො ගාරය්හා අයං තත්ථ සාමීචි යනුවෙන් (භික්‍ෂුණී ප්‍රාතිමොක්‍ෂයෙහි) එකක්ද යි සතකි.

124=e **පරම ශික්‍ෂාපද තුදුස**:- (1) දසාහපරමං අතිරෙක චීවරං (2) ඌනස්ස පාරිපූරියා මාස පරමං (3) සන්තරුත්තර පරමං (4) ඡක්ඛත්තු පරමං (5) ඡබ්බස්ස පරමං සන්ථතං (6) දසාහ පරමං අතිරෙක පත්තො (7) එළක ලොමානි ති යොජන පරමං (8) තෙලානි සත්තාහ පරමං [9] සන්නිධිකාරකං ඡාරත්ත පරමං (10) තෙන චීවරෙන චතුක්කංස පරමං (11) අඩ්ඪතෙය්‍ය කංස පරමං ( 2) වඞ්ගුලපබ්බ පරමං (13) අඞ්ගුල පරමං (14) දන්තකඨ පරමං යන තුදුස යි.

124=f **ජානන්ති ශික්‍ෂාපද සොළොස**:- (භික්‍ෂු ප්‍රාතිමොක්‍ෂය (1) අනභිජානං උත්තරිමනුස්ස ධම්මං අත්තූපනායිකං අලමරිය ඤාණදස්සනං (2) ජානං සප්පාණකං උදකං තිණං වා මත්තිකං වා සිඤ්චෙය්‍ය (3) ජානං භික්ඛුණී පරිපාචිතං පිණ්ඩපාතං භුඤ්ජෙය්‍ය (4) ජානං අසනාපෙබො (5) ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජෙය්‍ය (6) ජානං යථා ධම්මං නිහතාධිකරණං පුන කම්මාය උක්කොටෙය්‍ය (7) ජානං දුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙය්‍ය (8) ජානං ඌන වීසති වස්සං පුග්ගලං උපසම්පාදෙය්‍ය (9) ජානං ථෙය්‍ය සත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධාන මග්ගං පටිපජ්ජෙය්‍ය (10) ජානං තථාවාදිනා භික්ඛුනා අකතානුධම්මෙන තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨෙන සද්ධිං සම්භුඤ්ජෙය්‍ය වා සංවසෙය්‍ය වා සහ සෙය්‍යං කප්පෙය්‍ය (11) ජානං තථා නාසිතං සමණුද්දෙසං උපලාපෙය්‍ය වා උපට්ඨාපෙය්‍ය වා සම්භුඤ්ජෙය්‍ය වා සහ සෙය්‍යං කප්පෙය්‍ය (12) ජානං

සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමෙය්‍ය-පෙ (13) ජානං සඞ්ඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙය්‍ය (භික්ෂුණී විභඞ්ගයෙහි) (14) ජානන්තී පාරාජිකං ධම්මං අජ්ඣාපන්නං භික්ඛුනිං-පෙ (15) ජානන්තී චොරිං වජ්ඣං විදිතං-පෙ (16) ජානං සභික්ඛුකං ආරාමං සහසා පවිසෙය්‍ය-පෙ-යන මේ සොළොස යි.

129=a **සතර පාරාජිකා**:-ප්‍රස්තාවනාව බලනු

129=b **සඟාවසෙස් තෙළෙස**:- ප්‍ර. බ.

,, c **අනියත වශය**:- ප්‍ර බ

,, d **නිසගි තිස**:- ප්‍ර. බ.

130=a **ඛුද්දක දෙයානුව**:- ප්‍ර. බ.

,, b **පාටිදෙසනීය සතර**:- ප්‍ර බ.

,, c **සෙඛියා පන්සැත්තෑව**:- ප්‍ර බ

132=a **සඟාවසෙස් සතළොස**:- ප්‍ර බ

,, b **නිසගි තිස**:- ප්‍ර බ

,, c **ඛුද්දක එක්සිය සසැට**:- ප්‍ර බ

133 **පාටිදෙසනීය අට**:- ප්‍ර බ

135=B **ක්ෂුද්‍ර පාචිත්තියා'පත්ති දෙවිස්ස**:-

(1) “සකලො භික්ඛුනී වග්ගො=පරම්පරඤ්ච භොජනං,
අනතිරිත්තං අභිහටං=පණීතඤ්ච අචෙලකං
(2) විකාලෙ ගාමප්පවෙසො=ජානං දුබ්බල ඡාදනං,
මාතුගාමෙන සද්ධිඤ්ච=නාව අනික්ඛන්ත රාජකෙ
(3) සන්තං භික්ඛු අනාපුච්ඡා=විකාලෙ ගාමප්පවෙසනං,
නිසීදනෙච යා සික්ඛා=වස්සිකා යාච සාටිකා,
වා වීසති ඉමා සික්ඛා=ඛුද්දකා සු පකාසිතා'යි යූ දෙවිස්සයි.

135=A **නිසගි දෙළස**:-

“ධොවනඤ්ච පටිග්ගහො-කොසෙය්‍ය සුද්ධ වෙ භාගා
ඡබ්බස්සානි නිසීදනං-ද්වෙ ලොමා පඨමො පත්තො
වස්සිකා'රඤ්ඤකෙන ච”යි යූ දෙළොස යි.

137-a **නිස්සාරණීය සඟවෙසෙස් දශය**:-

“(1) යා පන භික්ඛුනී උස්සයවාදිකා විහරෙය්‍ය-පෙ- (2) යා පන භික්ඛුනී ජානං චොරිං වජ්ඣං-පෙ- (3) යා පන භික්ඛුනී එකා වා ගාමන්තරං ගච්ඡෙය්‍ය-පෙ-(4) යා පන භික්ඛුනී සමග්ගෙන සඞ්ඝෙන-පෙ- (5) යා පන

භික්ඛුනී අවස්සුතා-පෙ- (6) යා පන භික්ඛුනී එවං වදෙය්‍ය පෙ-(7) යා පන භික්ඛුනී කුපිතා අනත්තමනා-පෙ- (8) යා පන භික්ඛුනී කිස්මිඤ්චිදෙව අධිකරණෙ (9) භික්ඛුනියො පනෙව සංසට්ඨා විහරන්ති (10) යා පන භික්ඛුනී එවං වදෙය්‍ය සංසට්ඨා අය්‍යෙ තුම්හෙ විහරථ" යනාදී ශික්ෂා පද දශය යි (ප්‍රාතිමොක්ෂ 50 වෙනි පිට බලනු )

137-b **දෙලොස් නිසගි:-**

(1) යා පන භික්ඛුනී පත්තසන්නිචයං කරෙය්‍ය (2) යා පන භික්ඛුනී අකාල චීවරං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙය්‍ය (3) යා පන භික්ඛුනී භික්ඛුනියා සද්ධිං චීවරං පරිවත්තෙත්වා සා පච්ඡා එවං වදෙය්‍ය (4) යා පන භික්ඛුනී අඤ්ඤං විඤ්ඤාපෙත්වා අඤ්ඤං විඤ්ඤාපෙය්‍ය (5) යා පන භික්ඛුනී අඤ්ඤං චෙතාපෙත්වා (6) යා පන භික්ඛුනී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන-පෙ (7) යා පන භික්ඛුනී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන-පෙ (8) යා පන භික්ඛුනී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන-පෙ (9) යා පන භික්ඛුනී-පෙ සඤ්ඤාචිකෙන-පෙ (10) යා පන භික්ඛුනී-පෙ-පුග්ගලිකෙන (11) ගරු පාවුරණං පන භික්ඛුනියා චෙතාපෙන්තියා-පෙ (12) ලහු පාවුරණං පන භික්ඛුනියා-පෙ-යි කී දෙලොසයි (ප්‍රාතිමොක්ෂ 59 පිටබලනු )

137=c **සයාණු සුත්‍ර පවිති;-** ප්‍රශ්න වනාව බලනු

139=a **සඟපෙසෙස් ශෙසාළොස:—** ප්‍ර බ

139-b **අනියතවශය:-** ප්‍ර බ

139-c **නිසගි සුවිස්ස;-** භික්ෂුණීන්ට පමණක් සාධාරණ දෙලොස සහ භික්ෂූන්ට පමණක් සාධාරණ දෙලොසද ඇතුළුව සුවිස්සකි. භික්ෂුණීන්ට සාධාරණ දෙලොස 137 වෙනි ගාථාවේ පෙණේ. භික්ෂූන්ට පමණක් සාධාරණ ශික්ෂා මෙසේයි

(1) යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා පුරාණ චීවරං ධොවාපෙය්‍ය.

(2) යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං පටිග්ගණ්හෙය්‍ය.

(3) යො පන භික්ඛු කොසිය මිස්සකං සන්ථතං කාරාපෙය්‍ය.

(4) යො පන භික්ඛු සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං-පෙ.

(5) තවං පන භික්ඛුනා සනථතං කාරයමානෙන චෙ භාගා ... ප-

(6) නවං පන භික්ඛුනා සනථතං කාරාපෙත්වා ඡබ්බස්සානි ධාරෙතබ්බං

(7) නිසීදන සනථතං පන භික්ඛුනා කාරයමානෙන පුරාණ සනථතස්ස-පෙ.

(8) භික්ඛුනො පනෙව අඬානමග්ග පටිපන්නස්ස එළකලොමානි-පෙ

(9) යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා එළකලොමානි ධොවාපෙය්‍ය පෙ

(10) දසාහපරමං අතිරෙක චීවරං ධාරෙතබ්බං-පෙ.

(11) මාසො සෙසො ගිම්හානන්ති භික්ඛුනා වස්සික සාටිකං පරියෙසිතබ්බං-පෙ.

(12) උපවස්සං ඛො පන කත්තික පුණ්ණමං-පෙ-යි ප්‍රකාශිත දෙලොසයි

140=a සුඛ පාචිත්තිය එකසිය අටලොස:—

ල සුනවග්ග, අන්ධකාරවග්ග, තුවට්ටවග්ග, චිත්තාගාරවග්ග ආරාමවග්ග, ගබ්භිනීවග්ග, කුමාරී භූතවග්ග, ඡත්ත වග්ග, නග්ගවග්ග, යන නව වගෙහි සයානූවක් ශික්‍ෂා පද භික්‍ෂූන් හට අසාධාරණ යි. භික්‍ෂු ප්‍රාති මොක්‍ෂයෙහි උදෙසූ ඔවාද වග්ගයෙහිවූ ශික්‍ෂා දහය සහ 1 පරම්පර භොජන 2-3-පවාරිත ශික්‍ෂා වයය 4 පණීත භොජන 5 අචෙලක 6 දුළුල්ලා පත්ති 7 ජාතං ඌනවීසතිවස්ස 8 මාතුගාම 9 රාජ 10 අනාපුච්ඡා 11 නිසීදන කාරාපන 12 වස්සිකසාටික යන ශික්‍ෂා දෙලොස ද යන දෙවිසි ශික්‍ෂාවෝ භික්‍ෂුණීන් හට අසාධාරණයහ. ඔව්හු මෙහි කී සුද්ධපාචිත්තිය එක් සිය අටලොස යි (භික්‍ෂු අසාධාරණ (96) භික්‍ෂුණී අසාධාරණ (22)=118—යි

140=b පාටිදෙසනීය දෙළොස:-භික්‍ෂූන්ට නියමිත(4)භික්‍ෂුණීන්ට නියමිත 8 ත්-12 යි. ප්‍ර ඛ.

142-a (සාධාරණ) සඝාදිසෙස් හත:- (1) සඤ්චරිත්ත (2) සඞ්ඝභෙද (3) භෙදානුවත්තක (4) අමූල (5) අඤ්ඤභාගිය (6) දුබ්බච (7) කුලදූසක.

142-b නිසග්ගි පචිති අටලොස:- නිසගි සික දෙළොස හැර උභය විභඞ්ගයෙහි ලැබෙන අටලොසයි. (1) නිඨිත චීවරස්මිං

පන භිකඛුනා උබ්භතස්මිං කඨිනෙ-පෙ (2) නිඨිත චීවර ස්මිං පන භිකඛුනා උබ්භතස්මිං කඨිනෙ එකරත්ත් ම්පි-පෙ (3) නිඨිත චීවරස්මිං පන භිකඛුනියා උබ්භතස්මිං කඨිනෙ අකාල චීවරං උප්පජ්ජෙය්‍ය -පෙ-(4) යා පන භිකඛුනී අඤ්ඤාතකං ගහ පතිං වා ගහපතානිං වා-පෙ (5) තඤ්ඤෙව අඤ්ඤාතකො ගහපති බහූහි චීවරෙහි-පෙ-(6) භිකඛුනිං පනෙව උද්දිස්ස අඤ්ඤාතකස්ස ගහපතිස්ස වා-පෙ-(7) භිකඛුනිං පනෙව උද්දිස්ස උභින්නං අඤ්ඤාතකානං-පෙ (8) යා පන භිකඛුනී ජාතරූපරජතං පටිගණ්හෙය්‍ය-පෙ (9) යා පන භිකඛුනී නානප්පකාරකං රූපි ය සංවොහාරං පෙ- 10) යා පන භිකඛුනී නානප්පකාරකං කය වික්කයං සමාපජ්ජෙය්‍ය-පෙ (11) යා පන භිකඛුනී ඌනපඤ්චබන්ධ නෙන පත්තෙන අඤ්ඤං නවං පත්තං චෙතාපෙය්‍ය-පෙ (12) යානි ඛො පන තානි ගිලානානං භිකඛුනීනං-පෙ (13) යා පන භිකඛුනී භිකඛුනියා සාමං චීවරං දත්වා-පෙ (14) යා පන භිකඛුනී සාමං සුත්තං විඤ්ඤාපෙත්වා-පෙ (15) භිකඛුනිං පනෙව උද්දිස්ස අඤ්ඤාතකො ගහපතී වා ගහ පතානී වා තන්තවායෙහි-පෙ (16) භිකඛුනිං පනෙව උද්දි ස්ස රාජා වා රාජ භොග්ගො වා-පෙ (17) දසාහානාගතං කත්තික තෙමාසි පුණ්ණමං භිකඛුනියා-පෙ (18) යා පන භිකඛුනී ජානං සඞ්ඝික ලාභං පරිණතං අත්තනො පරිණා මෙය්‍ය-පෙ

142=c **ශුඛ පචිති සැත්තෑව:**- (18 මුසාවාදවග්ග (2) භූතගාම වග්ග (3) භොජනවග්ග (4) චරිත්තවග්ග (5) දිඨිවග්ග (6) ජොතිවග්ග (18) ධම්මිකවග්ග යන වර්ග සතෙහි ඇතුළත් ශික්ෂා (70) යි

147=a **අධර්ම වර්ගාදි කර්ම සතර** - (1) අධම්මෙන වග්ග කම්මං (2) අධම්මෙන සමග්ගකම්මං (3) ධම්මෙන වග්ග කම්මං. (4) ධම්මෙන සමග්ග කම්මං.

147=b **ප්‍රාතිමොක්ෂෝද්දෙශ පස:**- (1) නිදානුද්දෙස (2) පාරාජිකු ද්දෙස (3) සඞ්ඝාදි සෙසුද්දෙස (4) අනියතුද්දෙස (5) විත්ථාරු ද්දෙස.

147=c **ප්‍රාතිමොක්ෂෝද්දෙශ සතර:**- (භික්ෂුණීන්ගේ) අනියතය හැර සතරයි.

147=d **සප්තාපත්තිස්කන්ධ;**- (1) පරාජික (2) සාඞ්ඝදිසෙස (3) පාචිත්තිය (4) ථුල්ලච්චය (5) ඛුද්දක (6) දුක්කට (7) දුබ්භා සිත.

**148=a. සජ්ක සමථ:-** ප්‍ර. බ.

**148=b සඳ 5 මහා ප්‍රදෙශ:-** ප්‍ර. බ.

239=a **කායිකා'පත්ති සය:-(1)** භික්ඛු මෙථුනං ධම්මං පටිසෙවති ආපත්ති පාරාජිකස්ස (2) භික්ඛු අකප්පිය සඤ්ඤී සඤ්ඤ විකාය කුටිං කරොති අදෙසිත වත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං පයොගෙ දුක්කටං (3) එකං පිණ්ඩං අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස (4) තස්මිං පිණ්ඩෙ ආගතෙ ආපත්ති සංඝාදිසෙසස්ස (5) භික්ඛු අකප්පිය සඤ්ඤී විකාලෙ භොජනං භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස (6) භික්ඛු අකප්පිය සඤ්ඤී අඤ්ඤාතිකාය භික්ඛුනියා අන්තර ඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනියං වා භොජනියං වා සහ ත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජති ආපත්ති පාටිදෙසනීයස්ස.

239=b **වාචසිකා'පත්ති සය**:- (1) භික්ඛු පාපිච්ඡො ඉච්ඡා පක තො අසන්තං අභූතං උත්තරිමනුස්ස ධම්මං උල්ලපති ආප ත්ති පාරාජිකස්ස (2) භික්ඛු අකප්පිය සඤ්ඤී සමාදිසති කුටිං මෙ කරොථාති තස්ස කුටිං කරොන්ති අදෙසිත වත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං පයොගෙ දුක්කටං (3) එකං පිණ්ඩං අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස (4) තස්මිං පිණ්ඩෙ ආගතෙ ආපත්ති සඞ්ඝාදි සෙසස්ස (5) භික්ඛු අකප්පිය සඤ්ඤී අනුපසම්පන්නං පද සොධම්මං වාචෙති ආපත්ති පාචිත්තියස්ස (6) න බ්‍රූහෙතු කාමො න වම්භෙතු කාමො න මංකු කත්තුකාමො දවක ම්‍යතා හිතෙ න හිනං වදෙති ආපත්ති දුබ්භාසිතස්ස.

239=c **ඡාදනකා'පත්ති තුන;-** (1) වජ්ජපටිච්ඡාදනයෙන්පරිජි (2) භික්ෂුවකට සඟවෙසෙස් සැඟවීමෙහි පචිති (3) තමන්ගේ දුකුළා ඇවැත් සැඟවීමෙහි ද දුකුළා.

239-d **සංසග්ගා'පත්ති පස;-** (1) භික්ෂුණියට කාය සංසග්ග යෙන් පරිජි (2) භික්ෂුවට සඟවෙසෙස් (3) කයින් හෝ කය පිළිබඳින් තුලසි (4) නිස්සග්ගියෙන් කාය ප්‍රතිබද්ධයෙහි දුක්කට (5) අංගුලිපතොදකයෙහි පචිති.

249-a **ලඝු ඇවැත් පස;-** (1) පචිති (2) තුලසි (3) බුද්‍රක (4) දුක්කට (5) දුබ්භාසිත

249=b **සප්‍රතිකර්මා'පත්ති සතර;-** (1) සඞ්ඝාදිසෙස (2) ථුල්ලච්ච ය (3) බුද්‍රක (4) පාචිත්තිය.

**255=a ප්‍රථමා'පත්ති අවලොස:—**

භික්ෂු භික්ෂුණී—සඞ්ඝාදිසෙසයන්හි ප්‍රථමයෙන් සඳහන් නවය භික්ෂුණී සඞ්ඝාදි සෙසයන්හි නවයත් අවලොසයි. (ප්‍රස්තාවනාව බලනු).

**255=b කර්මය පවතින නව තැන**:-(1) ඔසාරණ, (2) නිස්සාරණ, (3) උපොසථ, (4) පවාරණ, (5) 5සම්මුති, (6) දාන, (7) පටිග්ගහණ, (8) පච්චුක්කඩ්ඪන, (9) කම්මලක්ඛණ.

**255=c කර්මපාදය පවතින දෙ තැන**:-(1) අපලොකන (2) ඤත්ති.

259=**දණ්ඩ කම්ම වාසනා දසා**'ඞ්ග:-(1) විකාල භොජන (2) නච්චගීතවාදිත විසූක දස්සන (3) මාලාගන්ධවිලෙපනධාරණ (4) උච්චාසයන මහාසයන (5) ජාතරූප රජත පටිග්ගහණ (6) භික්ඛූනං අලාභාය පරිසක්කන (7) භික්ඛූනං අනත්ථාය පරිසක්කන (8) භික්ඛූනං අවාසාය පරිසක්කන (9) භික්ඛූනං අක්කොසනපරිභාසන (10) භික්ඛු භික්ඛුනී භෙදන.

290=a **නෙවත්තනාර්හ සම්මාවත්තන**;-(1) න උපසම්පාදෙතබ්බං (2) න නිස්සයො දාතබ්බො (3) න සාමණෙරො උපට්ඨාපෙතබ්බො (4) න භික්ඛුනොවාදක සම්මුති සාදිතබ්බා (5) සම්මතෙන පි භික්ඛුනියො න ඔවදිතබ්බා (6) යාය ආපත්තියා සඞ්ඝෙන ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයකම්මං කතං හොති සා ආපත්ති න ආපජ්ජිතබ්බා (7) අඤ්ඤා වා තාදිසිකා (8) තතො වා පාපිට්ඨතරා (9) කම්මං න ගරහිතබ්බං (10) කම්මිකා න ගරහිතබ්බා (11) න පකතත්තස්ස භික්ඛුනො අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචි කම්මං ආසනාභිහාරො සෙය්‍යා'භිහාරො පාදොදකං පාදපීඨං පාදකඨලිකං පත්තචීවර පටිග්ගහණං නහානෙ පිට්ඨි පරිකම්මං සාදිතබ්බං (12) න පකතත්තො භික්ඛු සීල විපත්තියා අනුද්ධංසෙතබ්බො (13) න ආචාරවිපත්තියා අනුද්ධංසෙතබ්බො (13) න දිට්ඨිවිපත්තියා අනුද්ධංසෙතබ්බො (15) න ආජීව විපත්තියා අනුද්ධංසෙතබ්බො (16) න භික්ඛූ භික්ඛූහි භෙදෙතබ්බො (17) න ගිහි ධජො ධාරෙතබ්බො (18) න තිත්ථිය ධජො ධාරෙතබ්බො (19) න තිත්ථියා සෙවිතබ්බා (20) භික්ඛූ සෙවිතබ්බා (21) භික්ඛු සික්ඛාය සික්ඛිතබ්බං (22) න පක

තත්තෙන භික්ඛුනා සද්ධිං එකච්ඡන්නෙ ආවාසෙ වත්ථබ්බං (23) න එකච්ඡන්නෙ අනාවාසෙ වත්ථබ්බං (24) න එකච්ඡන්නෙ ආවාසෙ වා අනාවාසෙ වා වත්ථබ්බං (25) පකතත්තං භික්ඛුං දිස්වා ආසනා වුට්ඨාතබ්බං (26) න පකතත්තෙන භික්ඛුනා ආසාදෙතබ්බා අන්තො වා බහි වා (27) න පකතත්තස්ස භික්ඛුනො උපොසථො ඨපෙතබ්බො (28) න පවාරණා ඨපෙතබ්බා (29) න සවචනීයං කත්තබ්බං (30) න අනුවාදො පට්ඨපෙතබ්බො (31) න ඔකාසො කාරෙතබ්බො (32) න චොදෙතබ්බො (33) න සාරෙතබ්බො (34) න භික්ඛූහි සම්පයොජෙතබ්බං යන මොහු යි.

290=b **අෂ්ට ආපත්තිදෙසනානි'ශංස:-**

(1) න මයා සද්ධිං පවාරෙස්සන්ති විනා මයා සද්ධිං පවාරෙස්සන්ති, (2) න මයා සද්ධිං සඞ්ඝකම්මං කරිස්සන්ති විනා මයා සඞ්ඝකම්මං කරිස්සන්ති, (3) න මයා සද්ධිං ආසනෙ නිසීදිස්සන්ති, විනා මයා සද්ධිං ආසනෙ නිසීදිස්සන්ති (4) න මයා සද්ධිං යාගුපානෙ නිසීදිස්සන්ති, විනා මයා යාගුපානෙ නිසීදිස්සන්ති, (5) න මයා සද්ධිං භත්තග්ගෙ නිසීදිස්සන්ති විනා මයා භත්තග්ගෙ නිසීදිස්සන්ති, (6) න මයා සද්ධිං එකච්ඡන්නෙ වසිස්සන්ති විනා මයා එකච්ඡන්නෙ වසිස්සන්ති, (7) න මයා සද්ධිං යථා බුඩ්ඪං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කරිස්සන්ති, විනා මයා යථා බුඩ්ඪං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලි කම්මං සාමීචි කම්මං කරිස්සන්ති, (8) භවිස්සති සඞ්ඝස්ස තතො නිදානං භණ්ඩනං කලහො විග්ගහො විවාදො සඞ්ඝභෙදො සඞ්ඝරාජී සඞ්ඝවවත්ථානං සඞ්ඝ නානාකරණං.

293 **සදොළොස් පාටිදෙසනීය;-** උ. ශු. ඞ.

304 **පණ්ඩකාදී සොළොස් දෙන;-** (1) පණ්ඩක (2) ථෙය්‍යසංවාසක (3) තිත්ථිය පක්කන්තක (4) තිරච්ඡානගත (5) මාතුඝාත (6) පිතුඝාත (7) අරහන්තඝාත (8) භික්ඛුනීදූසක (9) සඞ්ඝභෙදක (10) ලොහිතුප්පාදක (11) උභතොබ්‍යඤ්ජනක (12) විබ්භමති (13) කාලංකරොති (14) සාමණෙරො පටිජානාති (15) සික්ඛංපච්චක්ඛාතකො පටිජානාති (16) අන්තිමවත්ථුං අජ්ඣාපන්නකො පටිජානාති.

349 **පඤ්ච අවිස්සජ්ජිය අවෙභඞ්ගිය භාණ්ඩ:-**

(1) ආරාමො ආරාමවත්ථු (2) විහාරො විහාරවත්ථු (3) මඤ්ච

පීඨ භිසි බිම්බොහණ (4) ලොහකුම්භී ලොහභාණක ලොහවාරක ලොහකටාහ වාසි ඵරසු කුඨාරි කුද්දාල නිඛාදන (5) වල්ලි වෙළු මුඤ්ජබබ්බජ තිණ පණ්ණ දාරු භණ්ඩ මත්තිකා භණ්ඩ.

350- A **දශ අවන්දිය පුද්ගලයෝ**;– (302) ගාථා ව්‍යාඛ්‍යාව බලනු

350–B **වජ්ජනීය පුද්ගලයෝ එකොළොස් දෙන**;–

(1) පණ්ඩක (2) ථෙය්‍යසංවාසක (3) තිත්ථියපක්කන්තක (4) තිරච්ඡානගත (5) මාතුඝාතක (6) පිතුඝාතක (7) අරහන්තඝාතක (8) භික්ඛුනී දූසක (9) සඞ්ඝභෙදක (10) ලොහිතුප්පාදක (11) උභතොබ්‍යඤ්ජනක.

368 **අෂ්ට ගරු ධර්ම**;–

(1) වස්ස සතුපසම්පන්නාය භික්ඛුනියා තදහුප සම්පන්නස්ස භික්ඛුනො අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචි කම්මං කාතබ්බං (2) න භික්ඛුනියා අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසිතබ්බං (3) අන්වඩ්ඪමාසං භික්ඛුනියා භික්ඛු සඞ්ඝතො ද්වෙධම්මා පච්චාසිංසිතබ්බා උපොසථ පුච්ඡකඤ්ච ඔවාදූ සඞ්කමනඤ්ච (4) වස්සං වුත්ථාය භික්ඛුනියා උභතො සඞ්ඝෙ තීහි ඨානෙහි පවාරෙතබ්බා දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා [5] ගරුධම්මං අජ්ඣාපන්නාය භික්ඛුනියා උභතො සඞ්ඝෙ පක්ඛමානත්තං චරිතබ්බං [6] ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිත සික්ඛාය සික්ඛමානාය උභතො සඞ්ඝෙ උපසම්පදා පරියෙසිතබ්බා [7] න භික්ඛුනියා කෙනචි පරියායෙන භික්ඛු අක්කොසිතබ්බො පරිභාසිතබ්බො [8] අජ්ජතග්ගෙ ඔවටො භික්ඛුනීනං භික්ඛූසු වචනපථො අනොවටො භික්ඛූනං භික්ඛුනීසු වචනපථො.

372 **අෂ්ටාසම්මුඛ කර්ම** :–

(1) දූතෙනූපසම්පදා (2) පත්තනික්කුජ්ජන (3) පත්තුක්කුජ්ජන (4) උම්මත්තකස්ස භික්ඛුනො උම්මත්තකසම්මුති (5) සෙක්ඛානං කුලානං සෙක්ඛ සම්මුති (6) ඡන්නස්ස භික්ඛුනො බ්‍රහ්මදණ්ඩො (7) දෙවදත්තස්ස පකාසනීය කම්මං (8) අප්පසාදනීයං දස්සෙන්තස්ස භික්ඛුනො භික්ඛුනී සංඝෙන අවන්දනීය කම්මං.

**උප ග්‍රන්ථය නිමි.**

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු